ශ්‍රී ලංකාවේ ළමයින්ට එරෙහි

සයිබර් අපරාධ

හඳුනා ගැනීම, නීති ක්‍රියාත්මක කිරීම, මැදිහත්කරණය සහ මැඩලීම

චම්පික කේ අයගම

ශ්‍රී ලංකාවේ ළමයින්ට එරෙහි

සයිබර් අපරාධ

(හඳුනාගැනීම, විමර්ශනය, නීතිය ක්‍රියාත්මක
කිරීම, මැදිහත්කරණය හා වැළැක්වීම)

ශ්‍රී ලංකාවේ ළමයින්ට එරෙහි සයිබර් අපරාධ හඳුනාගැනීම, විමර්ශනය,නීතිය ක්‍රියාත්මක කිරීම, මැදිහත්කරණය හා වැළැක්වීම

චම්පික කේ. අයගම

ප්‍රථම මුද්‍රණය - 2023

ISBN- 978-624-94561-0-5

පිටකවර සැකසුම - ධනුෂ්ක සේනාරත්න

පරිගණක අකුරු සංයෝජනය - අසංකා ශිරෝමාලා

මුද්‍රණය - **E- Copy @**

ප්‍රකාශනය - කතෘ ප්‍රකාශන

පිදුම.......

නිලි වැස්ස වෙලා හද කෙතට වැටෙන
පිනි වැස්ස සලා සිත් දලුලා වැඩෙන
වී බිස්ස පුරාලන කෙතක පැසුන
අස්වැන්න ඔබෙයි - මා නෙළා ගෙනෙන

ඉර හඳට හොරා තරු අහස පුරා
ඉකි ගසන පැයේ මා ළඟට වෙලා
ගඟුලැලි දැඩියා බෑමේ තෙමිලා
අස්වද්දන්නට යායම නැහිලා
අස්වැන්න ඔබෙයි - මා නෙළා ගෙනෙන

මා නැකත වඩා- බිජු මලිති සලා
දෙපෙති බලා- නව පෙති විහිදා
කිරි පැන් ඉසලා නෙලා ගෙනා
බුද්ධ භෝගයම නුබට පුදා
අස්වැන්න ඔබෙයි - මා නෙළා ගෙනෙන

(කලවිටි පිරිත)

පටුන

01	**ළමයා වැඩිහිටියා හා අන්තර්ජාලය**		1-25
	01.1.	ළමුන්ගේ අන්තර්ජාල භාවිතය පිළිබඳ සංඛ්‍යා දත්ත	
02	**සයිබර් අපරාධ හා අපරාධ විද්‍යාත්මක න්‍යායන් පිරික්සීම**		26-53
	02.1.	පොදු න්‍යායවාදී අදහස් හා සයිබර් අපරාධ	
	02.2.	සයිබර් අපරාධ පිළිබඳ න්‍යායවාදී අදහස්	
03.	**ළමයින්ට එරෙහිව ක්‍රියාත්මක වන සයිබර් අපරාධ හඳුනා ගැනීම**		54-100
	03.1.	Online හා Offline අපයෝජනයේ වෙනස	
	03.2.	අන්තර්ජාල සයිබර් අපරාධ වර්ගීකරණය	
04.	**අන්තර්ජාල භාවිතයේ අවධානම් සාධක**		101-139
	04.1.	පුද්ගල මට්ටමේ අවධානම් සාධක	
	04.2.	සමීප සබඳතා මට්ටමේ අවධානම් සාධක	
	04.3.	ප්‍රජා මට්ටමේ අවධානම් සාධක	
	04.4.	සමාජ/සංස්කෘතික මට්ටමේ අවධානම් සාධක	
05.	**ළමුන්ට එරෙහි සයිබර් අපරාධ කෙරේ යොදා ගත හැකි ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍ර හා විමර්ශන ක්‍රියාවලිය**		140-215
	05.1.	ජාත්‍යන්තර නීති මූලාශ්‍ර	
	05.2.	දේශීය නීති මූලාශ්‍ර	
	05.3.	ළමුන්ට එරෙහි සයිබර් අපරාධ විමර්ශන ක්‍රියාවලිය	
	05.4.	ළමුන්ට එරෙහි සයිබර් අපරාධවලට අදාළව නීතිය ක්‍රියාත්මක කරණ ආයතන හා තාක්ෂණික /සහයක ආයතනයන්හී කාර්යයභාරය	
06.	**ළමයින් හා යෞවනයින් අන්තර්ජාලයට ඇබ්බැහි වීම වැලැක්වීම හා අධීක්ෂණය, නියාමනය හා මැදිහත්කරණය**		216-294

	06.1.	ළමයාගේ අන්තර්ජාල රචිකත්වය හඳුනා ගැනීම	
	06.2.	ළමයින් අන්තර්ජාලයට ඇබ්බැහි වීම	
	06.3.	අන්තර්ජාලයට ඇබ්බැහි වූ අයෙකු හඳුනා ගැනීම	
	06.4.	අන්තර්ජාලයට ඇබ්බැහි විය හැක්කේ කවරෙකු ද	
	06.5.	අන්තර්ජාල ඇබ්බැහිවීම නවතාලීමට ගත හැකි ක්‍රියාමාර්ග	
	06.6.	ළමයින්ගේ අන්තර්ජාල භාවිතය අධීක්ෂණය නියාමනය හා පසුවිපරම් සිදු කිරීම	
	06.7.	අන්තර්ජාල භාවිතයට ආචාර ධර්ම	
	06.8.	සුරක්ෂිත පරිසරයක් නිර්මාණයකර දීමේ මාර්ග සිතියම	
	06.9.	අන්තර්ජාල අවභාවිතය භියෝගාත්මක චර්යාවක් ලෙස වර්ධනය විය හැකිද	
	06.10.	සයිබර් අපරාධකරුවන් වින්දිතයින් අවභාවිත කරන්නන් විෂයෙහි මනෝ විද්‍ය උපදේශනය	
	06.11.	මනෝ විද්‍යා උපදේශන ප්‍රවේශයන් ඔස්සේ අන්තර්ජාල ගැටළු අවබෝධකර ගැණීම හා මැදිහත්කරණය	
	ආශ්‍රිථ ග්‍රන්ත නාමාවලිය		295-301

පොත ගැන ....

ළමයන්ට එරෙහි අපරාධ යන්න සමාජයට අලුත් දෙයක් නොවන මුත් එය සිදු වන ආකාරය කලින් කලට වෙනස් වන බව පැහැදිලිය. ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය ප්‍රවේසමෙන් අධ්‍යයනය කර බැලුවහොත් ඒ පිළිබඳ සාක්ෂි සපයාගත හැකිය. 1980 දශකයේ අග භාගයට වන්නට අපේ රටේ ළමා හිංසන පිළිබඳ රතු කලාපයක් නිර්මාණය කරනු ලැබුවේ විදේශීය සංචාරකයින් විසින් වෙරළබඩ කළාප ආශ්‍රිතව ළමයින් ලිංගික කටයුතු සඳහා යොදවා ගැනීමෙනි. ඉන් අනතුරුව 1990 දශකයේ අගභාගය වන විට යුධමය කළාප ආශ්‍රිතව ළමා සොල්දාදුවන් ලෙස බඳවා ගැනීමෙන් ළමයින් දැඩි අනාරක්ෂිත තත්ත්වයකට පත් කිරීම දැකගත හැකිය. කාලය ගෙවී ගොස් ඇත. මිනිසා වෙනස් වී ඇත. ගැටළු නවීකරණය වී ඇත. සමාජය තාක්ෂණික යුගයකට වේගයෙන් ඇදී ගොස් තිබේ. මේ සියල්ලගේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ දී ළමා අපයෝජන සිදු වීමේ නව ඉසව්වකට සමාජය මාරුවෙමින් සිටී. එනම් අන්තර්ජාලය තුළ ගොදුරු සොයන්නන්ගේ ඉලක්කයක් බවට ළමයා පත්ව තිබීමයි.

අන්තර්ජාල පහසුකම් දිවයින පුරා ප්‍රචලිත වීමත්, වේගවත් වීමත් සමගම ළමයින් අන්තර්ජාලය භාවිත කිරීම ද වේගවත් වී ඇත. සමාජ සංවර්ධනයේ මෙන්ම ළමා සංවර්ධනයේ සාධනීය ප්‍රවේශයක් අන්තර්ජාලය හරහා ගොඩනගා ගත හැකි වුවත් වර්තමාන භාවිතය පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී ඇත. ඒ අනුව පවත්නා අන්තර්ජාල අවභාවිතය හා අපරාධකාරී බව වර්තමාන ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන සිදු වීමේ වේගය වැඩි කිරීමට හෝ ප්‍රමාණය ඉහළ දැමීමට හෝ ස්වභාවය ගතික කිරීමට හෝ සිදු වීමේ උපක්‍රම වෙනස් කිරීමට හෝ අපයෝජන පිළිබඳ ආකල්ප සාමාන්‍යකරණය වීමකට බලපෑම් සිදු වන්නේ ද යන්න විමසා බැලිය යුතුය.

එකී සංරචකයන් තේරුම් ගැනීමට යාමේ දී අන්තර්ජාල අවභාවිතය හා සයිබර් අපරාධ පිළිබඳ න්‍යායාත්මක තේරුම් ගැනීමක් මෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ශ්‍රී ලංකාවේ නීතිමය පද්ධතිය පිළිබඳ විමසුමක් ද මේ තුළ අන්තර්ගතය. එසේම අන්තර්ජාලය තුළළමයින් අපයෝජනයට පත්වීමට ඇති ඉඩ කඩ හෙවත් අවධානම් සාධක පිළිබඳ තක්සේරු කර බැලීමක් මෙන්ම අන්තර්ජාල අවභාවිතයට හා හිංසනයට පත් වූ ළමයෙකු විෂයෙහි මනෝසමාජීය මැදිහත්කරණය සිදු කිරීමේ ස්වභාවය පිළිබඳ මූලික විමසා බැලීමක් ද මෙහි දී ඔබගේ අවධානයට යොමු කර තිබේ.

"ළමයින්ට එරෙහි කිසිදු ප්‍රචණ්ඩත්වයක් සාධාරණීකරණය කළ නොහැකිය" (Poulo)

එබැවින් බිම් මට්ටමේ මෙන්ම සයිබර් අවකාශය තුළ වුව ද ළමයින්ට එරෙහිව යම් හිංසනයක් සිදු වන්නේ නම් ඒ වෙනුවෙන් සටන් කිරීම අප කාගේත් යුතුකම වන්නේය. එහෙත් ඒ සඳහා අප තුළ පවත්නා දැනුම කුසලතාවය හා තාක්ෂණික හැකියාව ප්‍රමාණවත් මට්ටමක නොමැතිකමින් ළමයින් තවමත් අන්තර්ජාලය තුළ හිංසනයට ලක් වෙමින් සිටී. සටනක් කිරීමට නම් ඒ සඳහා අප සතුව ප්‍රබල ආයුධ පැවතිය යුතුය. එකී අඩුව පුරවාලමින් අන්තර්ජාලය හරහා ළමයින්ට එරෙහිව සිදු වන සයිබර් අපරාධ මැඩලීම උදෙසා මේ පොත ඔබට ප්‍රබල අවියක් සපයනු ඇත.

"ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අහඹු සිදුවීමක් නොවේ. එය සිදු වන බව කල්තියා දැනගත හැකිය. කල්තියා දැනගත හැකි නම් එය වැළැක්විය හැකිය."

(ලෝක සෞඛ්‍ය සංවිධානය)

එබැවින් අන්තර්ජාලය හරහා ළමයින්ට එරෙහි හිංසා සිදු වන්නේ කෙසේද? වළක්වන්නේ කෙසේද? කළ යුත්තේ

කුමක්ද? යන්න පිළිබඳව මැසිවිලි නගන ඔබට මෙම පොත මගින් ප්‍රමාණවත් දැනුමක් උකහාගත හැකියි. අන්තර්ජාල ගැටළුව දෙස බොහෝ දෙනෙකු අවධානය යොමු කරනුයේ තාක්ෂණික දෘෂ්ඨිකෝණයෙනි. සැබැවින්ම මෙම ගැටළුව තාක්ෂණික ප්‍රශ්නයක් පමණක් නොවේ. තාක්ෂණය හරහා සිදු වුවද එය පුද්ගලාබද්ධ ගැටළුවකි. එබැවින් මෙම පොත සමාජ විද්‍යාත්මක, අපරාධ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක දෘෂ්ඨිකෝණ ඔස්සේ අන්තර්ජාල අවභාවිතයන් හා අපරාධ දෙස බැලීමට අවශ්‍ය මූලික පදනම සකසනවා මිස තාක්ෂණික හෝ තාක්ෂණික අධිකරණ විද්‍යාත්මක, ව්‍යවහාරික කරුනු පිළිබඳව කිසිදු විග්‍රහයක් සිදු නොකරයි. ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුන තාක්ෂණික පොත් පත් රැසක් පැවතියත් තාක්ෂණික භාවිතය දෙස සමාජීය විද්‍යා දෘෂ්ඨිකෝණයෙන් බැලීමට මෙකී පොත උපකාරි වේ.

"සමාජයේ ඉතාමත් අනතුරු අවධානමක සිටින පුරවැසියන් වන අපේ ළමයින්ට ප්‍රචණ්ඩත්වයෙන් හා බියෙන් තොර ජීවිතයක් ලබාදීමට අපි බැඳී සිටිමු"

(නෙල්සන් මැන්ඩලා)

ඒ සඳහා කැපවෙන ළමා ආරක්ෂක නිලධාරීන්, පරිවාස නිලධාරීන්,ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්, පොලිස් නිලධාරීන්, උපදේශන නිලධාරීන්ට, නීතිඥයින්, විශ්වවිද්‍යාල සිසුන්, ගුරුබවතුන්, සමාජ සේවකයින්, දෙමාපියන් ඇතුළු ළමයින් විෂයෙහි වැඩකරන සියලු ප්‍රජාවට මෙම පොත භාවිතයට ගෙන දැයේ දරුවන්ගේ සුරක්ෂිත බව ඇති කිරීමට හැකිවේවායි මාගේ ප්‍රාර්ථනයයි.

"දැනට ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂක ක්ෂේත්‍රය තුළ අන්තර්ජාල අවභාවිතයන් හා අපරාධ මැඩලීම වෙනුවෙන් ලියවී ඇති පොත් පත් ඉතාම විරලය. එකී අඩුව සපුරාලමින් වසර

දොළහක මාගේ ළමා ආරක්ෂක ජීවිතයේ ලද දැනුම හා අත්දැකීම් පදනම් කර ගනිමින් ඔබ වෙත මෙම පොත සෙනෙහසින් තිළිණ කරමි.

"ළමයින්ට සුරක්ෂිත ළමා වියක් ලබා දෙන්නට අප අපොහොසත් වුව හොත් මානව හිමිකම් හා ආර්ථික සංවර්ධනය සඳහා පවා ඇති අපගේ ඉලක්ක වෙත ළඟාවීමට අප අපොහොසත් වනු ඇත. ළමයින් ගමන් කරනුයේ යම් ආකාරයකට ද ඒ ආකාරයෙන්ම දේශය ද ගමන් කරනු ඇත. එය ඒ තරමට ම සරලය."

(Caral Bellamy)

ළමයින් වේගයෙන් ඉදිරියට යැවීමට වෙහෙසෙන ඔබ ළමයින් පසුපස හෝ ළමයින් ඉදිරියෙන් ගමන් කිරීම පසෙකලා ළමයින් සමග එකට එක්ව ගමන් කරන්නට පුරුදු වන්න. එය අනාගතය ළමයින්ට භාරදීමට බලාපොරොත්තුවෙන් සිටින සැම වැඩිහිටියෙකුගෙන්ම බලාපොරොත්තු වන්නකි.

චම්පික කේ. අයගම
වේරගම
උඩ-නිරිඇල්ල
රත්නපුර
2023/03/08

පෙරවදන ....

"ඔබ සිතන්නේ මාස හයක් ඉදිරියට නම් ඔබට යෝජනා කරන්නේ වී වගා කිරීමටය. ඔබ සිතන්නේ අවුරුදු විස්සක් ඉදිරියට නම් මා ඔබට යෝජනා කරන්නේ ගසක් සිටුවීමටය. ඔබ සිතන්නේ සදාකාලයට නම් මා ඔබට යෝජනා කරන්නේ දරුවන් නිර්මාණය කරන්නේ කෙසේදැයි සිතීමටය".

මෙය හුදු ප්‍රකාශයක් වුවද ඉන් කියවෙන බැරෑරුම් හා ගැඹුරු යථාර්ථය වන්නේ දරුවන් ඕනෑම රටක එරටේ අනාගතයේ තීන්දුකාරක සාධකය වන බවයි.

එය එසේ වුවද දේශපාලනික, ආර්ථික, සංස්කෘතික, තාක්ෂණික හා නීතිමය කරුණුවල බලපෑම මත දරුවන්ගේ නිර්මාණයේ වෙනස්කම් අනිවාර්යයෙන්ම ඇති වනු ඇත.

එම වෙනස්කම් අතර අධි තාක්ෂණයේ සුහුරු මෙවලම් මතින් වැඩිහිටියන් අභිබවා ගොස් අධිතාක්ෂණය හැසිර වීමේ අපූර්ව හැකියාවක් ලොවපුරා දරුවන් වර්තමානයේ අත්කරගෙන සිටිති.

එහෙත් ඒ බහුතරයක භාවිතය දරුවන්ගේ හෙට දවස වර්ණවත් වීම සඳහා යොදා ගන්නවා වෙනුවට ඔවුන්ගේ

හෙට දවස අඳුරුකර ගැනීම සඳහා වන භාවිතයක් දැකිය හැකියි. එය එසේ වන්නේ බොහෝ දරුවන්ගේ මේ සම්බන්ධව ඇති දැඩි උනන්දුව හා ආශාව මෙන්ම වැරදි භාවිතය විය හැකිය. තාක්ෂණය සමග නීති ක්ෂේත්‍රයට අලුතින් එක්ව ඇති සයිබර් අපරාධ දරුවන්ට ඍජුව හා වක්‍රව වර්තමානයේ බලපෑම් කරයි.

චම්පික කේ. අයගම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වසර දහතුනක් විමර්ශන හා අන්තර්ජාල ළමා අපරාධ සම්බන්ධයෙන් කටයුතු කරන දක්ෂ අවන්ක හා කැපවීමෙන් කටයුතු කරන කාර්යක්ෂම නිලධාරියෙකි. ඔහුගේ සයිබර් අපරාධ පිළිබඳ දැනුම දරුවන් හා උනන්දු වන්නන්ට ලබා ගැනීම සඳහා සිංහල භාෂාවෙන් පළ කිරීම ප්‍රශංසනීය කටයුත්තකි. මෙම පොත දැයේ දරුවන් සයිබර් අපරාධවල වින්දිතයින් හෝ ඒවාට ගොදුරු නොවන්නන් වීමට ප්‍රබල පිටුවහලක් වනු නිසැකය. දරුවන් අපේය. ඔවුන් අපි අපේ දෑස් මෙන් රැක ගත යුතුය. චම්පික කේ. අයගම මහතාගේ දක්ෂතාවයන් අගයමි.

නීතිඥ එච්. එම්. අබයරත්න
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
2018. 08. 08

ස්තුතිය..........

වැඩිහිටියන් ලෙස මොහොතකට ඔබේ කුඩා කාලයට එබී බලන්න යැයි ආරාධනා කරමි. එහිදී එකවරම ප්‍රීතිමත් අද්දැකීමකින් යමෙකුගේ මතකය උද්ධීපනය කළ හැකි අතර තවකෙකු ශෝක ජනක අද්දැකීමකින් මුසපත් කරනු ඇත. නමුත් කිසිවෙකු සමස්ත ළමා කාලය තුළම දුකම හෝ සතුට පමණක් බුක්ති නොවිඳුනු ඇත. මාගේ ළමා කාලයට එබී බලන්නේ නම් එය මල් යහන් මත මෘදු සේල ඇතිරූ සොඳුරු ළමා වියකට වඩා කටුක අමිහිරි මතක ගොන්නක් සමග ලියවුන එහෙත් සොඳුරු පුස්ථකයක් වැනිය. අන් ළමයින්ගෙන් වෙනස්ව යහපත් බොහෝ දෑ මා ඉගෙන ගනු ලැබුවේ හොඳ දේ දෙස බලා නොව, නරක යැයි සම්මත බොහෝ දේ දැක එය ප්‍රතික්ෂේප කිරීමෙනි. මන්ද එවන් යහපත් පරමාදර්ශී චරිත මා හැදුනු පරිසරය තුළ එතරම් සුලබ නොවූ බැවිනි. එබැවින් හොඳ කුමක්ද යන්න මට කියාදුන් අයහපත් අද්දැකීම්වලටත් නරක කුමක්ද යන්න මට කියා දුන් යහපත් අද්දැකීම්වලටත් මා පළමුව කෘතවේදීත්වය පුද කරමි.

මෙකී පරිසරය තුළ කළු සුදු ලෝකය වෙන්කර වටහා ගැනීමට මට කියා දුන් තාත්තාටත් කළු සුදු ලෝකයේ වර්ණ ඇති බව පසක්කර දුන් ආදරණීය අම්මාටත් කෘතවේදීත්වය පුද කරමි.

මගේ ගමනට අත්වැලක් වූ දයාබර ගුරුවරුන් හා සෙනේබර සහෝදරියන් දෙපලටත් මගේ ළමා විය සොදුරු ඉසවුවක් කළ කුඩා කළ සිට මේ දක්වා මා සමගම සිටින සියලු සහෝදර සහෝදරියන්ටත් ස්තූතිය පුද කරමි.

මෙම පොත ලියා පලකරන්නට නිබඳ ශක්තිය ලබා දෙමින් අගනා පෙරවදනක් සැපයූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති නීතිඥ එච්.එම්. අබයරත්න මැතිඳුන්ටත් අන්තර්ජාලයෙන් ළමයින්ට සිදු වන හිංසා වැළැක්වීමට උනන්දුවක් දැක් වූ මා හට ප්‍රායෝගිකව නිවාරණයේ යෙදෙන්නට මූලික අවස්ථාව සලසා දුන් හිටපු සභාපතිනී නීතීඥ අනෝමා දිසානායක මැතිනිය ඇතුලු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සියලුම සභාපතිවරු හා අධ්‍යක්ෂ ජනරාල් හා කාර්යය මණ්ඩලයටත් විශේෂයෙන් මා දිරිමත් කර ලස්සන පසු වදනක් සැපයූ නීතිවේදී සමාජවිද්‍යාඥ ශානිකා මලල්ගොඩ මහත්මියටත් ස්තූතිය පුද කරමි.

අන්තර්ජාල අපරාධ වැළැක්වීම උදෙසා තාක්ෂණික උපදෙස් ලබා දෙමින් මේ පොත කියවාබලා අවශ්‍ය සංශෝධන ලබා දුන් ජ්‍යේෂ්ඨ පරිගණක ඉංජිනේරු රෝෂාන් චන්ද්‍රගුප්ත මහතාටත් මෙම පොත ලිවීමට අදහස් කළ දා සිට නිරන්තර මා දිරිමත් කළ සරසවි කළණ මිතු ක්‍රිෂාන්ත ජයවික්‍රම සොයුරාටත් පොතේ සෝදු පත් බලාදුන් සරසවි කළණ මිතු මනෝ වෛද්‍ය සමාජ සේවක චන්දන ජයවික්‍රම සොයුරාටත් ලස්සන පිටකවරයක් සකසා දුන් ධනුෂ්ක සේනාරත්න මහතාටත් පොත පරිගණක ගත කර දුන් අසංකා

ගුරුතුමියටත් අන්තර්ජාල සුරක්ෂිතතාව ගොඩනැගීමේ අමිල මෙහෙයක් සිදු කරමින් මහත් සහයක් ලබා දෙන කණිෂ්ක යාපා, පූර්ණ වික්‍රමසිංහ, රවිදු මිගස්මුල්ල, වාසනා එදිරිසූරිය දිල්හානී, අනූෂා යන මහත්ම මහත්මීන්ටත් නිබඳ සහය දුන් ගයාන් කේ. විතානගේ, හිමත්, චමෝද්, තමාලී, තරුෂි හිරුණි ශලනී ලොකුගේ දූලා පුතාලටත් ස්තුතිය පුදකරමි.

<u>පළමුවන පරිච්ඡේදය</u>

ළමයා, වැඩිහිටියා හා අන්තර්ජාලය

යම් ස්ථාන කිහිපයක් එකිනෙකට සම්බන්ධ වූ තැන ජාලයක් නිර්මාණය වනු ඇත. එමෙන්ම පරිගණක කිහිපයක් එකිනෙකට සම්බන්ධ වූ කල්හී පරිගණක ජාලයක් නිර්මාණය වේ. එපරිද්දෙන්ම පරිගණක ජාල රාශියක් එකිනෙකට සම්බන්ධ වීමෙන් අප කථා කරන අන්තර්ජාලය නිර්මානය කරයි.

එවන් වූ ජාලයකට පිවිසෙන ලෝකයේ ඕනෑම ස්ථානයක සිටින අවුරුදු 18 අඩු පුද්ගලයෙකු (එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමයා යනු අවුරුදු 18 අඩු පුද්ගලයෙකි)[1] අන්තර්ජාලය පරිහරණය කරනු ලබන ළමයෙකු ලෙස හදුන්වා දිය හැකි අතර ඔහුට හෝ

[1].ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය 1989,(පළමු ව්‍යාස්ථාව)

ඇයට විවිධාකාරයේ අත්දැකීම් ලැබීමට එයින් ඉඩ කඩ විවර වේ.

සමාජය තුළ අන්තර්ජාලය සම්බන්ධයෙන් විවිධ විවේචන පැවතියත් අන්තර්ජාලය වර්තමාන මිනිස් ජීවිතයේ එදිනෙදා කටයුතුවලදී නැතිවම බැරි අංගයක් බවට පත්ව තිබේ. බොහෝ විවේචන හමුවේ වුවද අන්තර්ජාලය ප්‍රයෝජනවත්, පුදුම සහගත, හරි අපූරු තැනක් බව නොකිවමනාය. මන්දයත් එය ලෝක ප්‍රගමණය සඳහාත්, පුද්ගල සංවර්ධනය උදෙසාත්, ධනාත්මකව යොදා ගැනීමේ ඉහළ ශක්‍යතාවයක් පවත්නා වූ මෙවලමක් වන නිසාවෙනි. එකී ප්‍රගමණය උදෙසා අන්තර්ජාලය

- දැනුම හා තොරතුරු ගවේෂණය කිරීමටත්
- ලෝකය පිළිබඳව ඉගෙන ගැනීමටත්
- තොරතුරු සංනිවේදනය කර ගැනීමටත්
- මානව සම්බන්ධතා ගොඩනගා ගැනීමටත්

ඉතා සාර්ථක ලෙස යාදාගැනීමට හැකියාව පවතී. මෙවන් වූ විශ්මය ජනක අපූරු හැකියාවන් රැසක් පැවතිය ද එකී හැකියාවන් පවා පසෙකලා අන්තර්ජාලය අවභාවිතයේ යොදවන ආකාරය බහුලව දැකගත හැකිය.

දැනුම මත පදනම් වූ වර්තමාන අධ්‍යාපනය ජයගැනීමේ දී නවීනතම වූ දැනුම උකහාගත හැකි ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස අන්තර්ජාලය පෙන්වා දිය හැකිය. විවිධ

දැනුම් සම්භාරයන්ගෙන් යුතු හා තොරතුරු උකහා ගත හැකි අන්තර්ජාලය, පුද්ගල සංවර්ධනයේ දී ඉතා වැඩි වශයෙන් සහය කර ගත හැකිය. එහෙත් එම දැනුම අතර ළමා සංවර්ධනයට බාධා කළ හැකි තොරතුරු පවත්නා බැවින් තොරතුරු හා දැනුම ගවේෂණයේදී ද ඉතා ප්‍රවේසම් සහගත විය යුතුය. මන්ද අන්තර්ජාලයට නායකයෙකු නැත. පාලකයෙකු නැත. මෙහෙයවන්නෙකු නැත. නායකයාත්, පාලකයාත්, මෙහෙයවන්නාත් වනුයේ එකී ඉලෙක්ට්‍රොණික උපකරණය මෙහෙය වන්නාම වේ. එබැවින් දරුවන්ට, දියෙන් කිරි වෙන්කරගන්නා හංසයෙකු සේ වඩාත් නිවැරදි හා වැරදි දේ මෙන්ම, ගතයුතු හා නොගතයුතු දේ පිළිබඳව අවබෝධයක් ලබා දීම වගකීම් සහගත වැඩිහිටියන් විසින් සිදු කළ යුත්තකි.

ලෝකයේ විවිධ චාරිත්‍ර වාරිත්‍ර, විලාසිතා, නීති රීති, සාරධර්ම, භාෂා, ආගම්වලින් සැදුම් ලත් සංස්කෘතීන් පිළිබඳව ඉගෙන ගැනීමටත්, විවිධ සිතුම් පැතුම් අධ්‍යයනය කරමින් මිනිසා හා ලෝකය පිළිබඳව නිවසේ සිට ගවේෂණය කිරීමටත් වඩාත් සුමට හා පහසුම ක්‍රියාවලිය වනුයේ අන්තර්ජාලයයි. එහෙත් ගෝලීයකරණය තව තවත් තීව්‍ර කරමින් අපගේ සංස්කෘතික සීමාවන් පවා උල්ලංඝණය කරමින් විදෙස් සංස්කෘතීන් අප අතරට කඩා පනිමින් ලාංකීය සාම්ප්‍රදායික සංස්කෘතිය උඩු යටිකුරු කරන්නට අන්තර්ජාලයට ඇත්තේ පුදුම සහගත හැකියාවකි. එබැවින් ලෝකය පිළිබඳව ගවේෂණය පවා වඩාත් විචක්ෂණශීලීව හා

සිහි නුවණින් යුතුව සිදු කිරීමට දරුවන් මෙහෙය විය යුතු වන්නේය.

තොරතුරු සංනිවේදනය යුග කිහිපයක් පසුකර වර්තමානයට පැමිණ ඇතත් තවත් ඉදිරි පිමි කිහිපයක් වේගයෙන් පසුකරමින් සිටින කාලවකවානුවකට පිවිස තිබේ. තැපැල් සේවයේ සිට දුරකථනය හරහා ඊ තාක්ෂණයට පිවිස, තොරතුරු හුවමාරුව සිය ගුණයකින් වේගවත් කර ඇති මොහොතක ලොව උත්තර ධ්‍රැවයත්, දක්ෂිණ ධ්‍රැවයත්, එක් ඇසිල්ලකින් සම්බන්ධ කිරීමට තරම් තොරතුරු සංනිවේදන තාක්ෂණය දියුණු වී තිබේ. සමස්ත ලෝකයම එකම විශ්ව ගම්මානයක් බවට පත් කරමින් තොරතුරු තාක්ෂණයේ නවමු පිටුවක් වර්තමානයේ ලියවෙමින් පවතී. අතීතයේ මාස ගණනාවක්, සති ගණනාවක්, දවස් ගණනාවක්, පැය ගණනාවක්, ගත වූ බොහෝ දේවල් වර්තමානයේ එක් ඇසිල්ලකින් සිදු කිරීමට තරම් තොරතුරු සන්නිවේදනය වේගවත් වී ඇත. අතීතයේ හොඳ හෝ නරක සන්නිවේදනය හරහා තවෙකෙකු වෙතට ළඟාවීමට වැඩි කාලයක් ගත වුවත්, සන්නිවේදනයේ වේගය හා දියුණුව මත වර්තමානයේ හොඳ හෝ නරක දරුවන් අතට පත්වීමට ගත වන්නේ ඉතා කෙටි කාලයකි. එබැවින් එහි වාසිය පමණක් දරුවන් අතට පත්වන්නේද? නොඑසේ නම් එහි අවාසි සහගත තත්තවයන්ට දරුවන් ලක් නොවන්නේ ද යන්න විමසා බැලිය යුතුය.

මෙකී සන්නිවේදනය හරහා නිදහස් අදහස් එළිදැක්වීමටත් ඒවා සමාජගත කිරීමටත් බොහෝ දෙනෙකුට අවස්ථාව ලැබී ඇතත් ඒ හරහා එළිදක්වන්නා වූ අදහස් සියල්ලම සමාජයට සුහදයි ද යන්න පිළිබඳව සිතා බැලීමට දරුවන් හුරුකළ යුතුයි.

විවිධ මානව සබඳතා සමාජයේ පැවැත්මට හා ප්‍රගමණයට අවශ්‍යව ඇත. ජීවිත ජයගැනීමට එම සබඳතා ද පුද්ගල ශක්තීන් ලෙස විශාල කාර්ය භාරයක් ඉටු කරයි. එය පුද්ගලයාගේ සමාජ ක්‍රියාකාරීත්වය පහසු කරයි. එහෙත් මතක තබා ගතයුතු ඉතා වැදගත් දෙයක් ඇත. එනම් බොහොමයක් සබඳතා ව්‍යාජ විය හැකි බවයි. එය නිවැරදිව තේරුම් නොගත හොත් පුද්ගල සංවර්ධනයට බාධා විම් ඇති කළ හැකිවා සේම සමාජ සංවර්ධනය ද බිඳ වැටිය හැකිය. උපක්‍රම ශීලීව වැරදි, කුඨ, මානව සම්බන්ධතා හරහා දරුවන් නොමඟට රැගෙන යාමේ හැකියාවක් අන්තර්ජාළය සතු වන බැවින් ඉතා කුළුපග සබඳතා තුළ පවා අපයෝජකයින් සැඟවී පැමිණිය හැකි බැවින් ඒ පිළිබඳව දරුවන් දැනුවත් කර අවදියෙන් තැබීම සිදු කළ යුතුම දෙයකි.

වර්තමාන ළමා ප්‍රජාවට සාපේක්ෂව අතීත වැඩිහිටි ප්‍රජාවේ ළමා කාලයේ දී නවීන තාක්ෂණික මෙවලම් භාවිතය ඉතා අඩු බවක් දැකිය හැකිය. මීට පරම්පරා දෙක තුනක් ඔබ්බෙහි වූ ළමා ප්‍රජාව බොනික්කන් සමඟ සෙල්ලම් බත් උයමින්, වෙල් ඉපනැල්ලේ දුව පැන ඇවිදිමින් ලද සමාජ අනුයෝජනය වීමක් අප අසා ඇත. එහෙත් වර්තමාන ළමා

ප්‍රජාව නවීන තාක්ෂණික උපකරණ සමග නිරන්තරයෙන් ගැටෙමින් ඔවුන්ගේ සමාජ අනුයෝජනය සිදු වනු දැක ගත හැකිය. වර්තමාන ලෝකය දෙස බලන විට අන්තර්ජාලයට ප්‍රවේශවිය හැකි උපකරන (Internet of Things) ඉතා විශාල ලෙස ඉහළ ගොස් තිබේ. 2018 වර්ෂය වන විට එවැනි උපකරණ බිලියන 34 වන බවත් එය 2019 වන විට බිලියන 42 ඉක්මවන බවත් 2020 වන විට බිලියන 50 දක්වා වර්ධනය වන බවටත් අනාවැකි පලකර තිබේ.එවන් පරිසරයක් තුළ වර්තමාන ළමා පරපුරට අන්තර්ජාලය පරිහරණය කිරීම තහනම් කරන්නේ නම් හෝ එම පහසුකම්වලට ළඟාවීමට ඉඩකඩ අහිමි කරන්නනේ නම් නවීන තාක්ෂණික ලෝකය ජයගැනීමට වෙහෙසෙන හා මෙහෙය වන ළමයින් වෙනුවෙන් අප කරනුයේ දැඩි අසාධාරණයකි.

අන්තර්ජාලය ළමයින්ට ලගාකරලීම පිළිබඳ විවිධ මත පළව තිබේ. දරුවෙකුට මාස 18 වන තෙක් කාළය තුළ රූපවාහිනී පරිගණක දුරකථන වැනි Digital තිර ඉදිරියට නිරාවරණය කරීම ගැටළු රැසක් නිර්මාණය කරලීමට හැකි බව වෛද්‍ය මතයයි. මාස 18 සිට 24 දක්වා ඉතා කලාතුරකින් සුළු වේලාවක් සඳහා දරුවා මේ සඳහා නිරාවරණය කරනු ලැබුවත් එයද දෙමාපිය අධීක්ෂණය යටතේ සිදු කිරීම යහපත්ය. පෙර පාසල් වයසේ දරුවන් දිනකට පැයකට අඩු කාලයක් සංනිවේදන Digital තිරයන්ට දෙමාපිය අධීක්ෂණය යටතේ නිරාවරණය කිරීම වෛද්‍ය මතයයි. මන්ද යත් මෙම වයසේදී දරුවන් ඊට ඇබ්බැහිවීමට

ඇති ඉඩ කඩ වැඩිකරණවා සේම අධික්‍රියාශීලී, ඔටිසම්, කතා බහ අඩු, අක්‍රිය, තරබාරු, ප්‍රචණ්ඩ හා වැඩිහිටිකරණයට ලක් වූ දරුවෙකු නිර්මාණය කරලීමට ඊට හැකියාව පවත්නා බැවිනි. වයස අවුරුදු 0 සිට 05 දක්වා වූ පූර්ව ළමා විය තුළ දී ළමයෙකුගේ මොළයේ ඇති ස්නායුවලින් 80% ක් වර්ධනය වන බවට විද්‍යාත්මක පිළිගැනීමයි. එම කාලය තුළ දී ළමයාගේ බුද්ධි වර්ධනය උදෙසා අන්තර්ජාලය කෙබඳු බලපෑමක් කරන්නේද යන්න පිළිබඳව බුද්ධිමත් විය යුතුය. ගහ, කොළ, ඇළ, දොළ, සතා සිවුපාවුන් බැඳි ස්වභාවික පරිසරය හා සමාජීය පරිසරය සමග නිරන්තර ගැටීමෙන් අත්විඳින අද්දැකීම් තුළින් ළමා මනස පෝෂණය වීමට ඉඩ හැරීම තරම් ධනාත්මක මෙවලමක් මිහිපිට තවත් නොමැත. එකී අද්දැකීම්වලට කිසිසේත්ම සම වීමට පරිගණකයට හෝ අන්තර්ජාලයට නොහැක. දැකීමෙන්, ශ්‍රවනයෙන්, ආග්‍රහණයෙන්, ඇල්ලීමෙන් දැනීමෙන් හා පරිකල්පනයෙන් ලබන පූර්ණ ඉගෙනීමක් කිසිසේත්ම අන්තර්ජාලයට ලබා දිය නොහැකිය. නමුත් අන්තර්ජාලය ළමයාගේ අධ්‍යාපනික සංවර්ධනයට හා හසුරු කුසලතා වර්ධනයට බල නොපාන්නේ යැයි එයින් අර්ථවත් නොවේ.

වැඩිහිටියන් වන අපගේ ළමා කාලයට අනුව වර්තමාන ළමා සංවර්ධනය ක්‍රියාත්මක විය යුතු යැයි සිතන්නේ නම් හෝ යමෙකු කුඩා වියේ ලද සමාජ අනුයෝජනයට අනුව වර්තමාන ළමයා ද සමාජ අනුයෝජනයට යොමු කළ යුතු යැයි සිතන්නේ නම් එය

ප්‍රායෝගික නොවේ. අතීතයේ වැඩිහිටි ඔබට රේෂින් කාර් නොතිබෙන්නට ඇත. එහෙත් ඔබ කරත්තයක් තුලින් එකී වින්දනය අත්පත්කර ගන්නට ඇත. ඔබ එසේ කළ නිසාවෙන් වර්තමාන ළමයාද කරත්තයක් පැදිය යුතු යැයි සිතන්නේ නම් ගැටළුවකි. මේ සඳහා පරම්පරා පරතරය (Generation Gap) බලපෑම් කරයි. කාලයත් සමග මෙම පරම්පරා පරතරය ක්‍රමයෙන් අඩු වන අතර එදා අවුරුදු පහක ළමයෙකුට වඩා වර්තමාන අවුරුදු පහක ළමයෙකු සතු දැනුම, කුසලතාවය, ආකල්ප, බුද්ධිය, දරාගැනීම ආදී මානව හැකියාවන් වෙනස් වනු ඇත. එවන් තත්ත්වයක් මත අන්තර්ජාලය භාවිතය පිළිබඳ ගන්නා තීන්දු තීරණ වඩාත් බුද්ධිමත් විය යුතුය. විද්‍යාත්මක විය යුතුය.

තවත් පසෙකින් දරුවන් අන්තර්ජාලයට කිසිදු පාලනයකින් තොරව මුදාහැරීම ද ගැටළු සහගතය. බොහෝ නව යෞවනයින් නවීන තාක්ෂණය ඉදිරියේ හසරක් නොමැතිව ඉබාගාතයේ සැරිසරන බව දැකගත හැකියි. නවීන තාක්ෂණික මෙවලම්වල වහලෙකු වී, නවීන තාක්ෂණය ජයගැනීමට වෙහෙසෙන බවක් බොහෝ විට දකින්නට ලැබේ. එකී තාක්ෂණය කිසිසේත් ජයගැනීමට නොහැකි බව ළමයින්ට අවබෝධ කර දිය යුතුය. එහෙත් විය යුතු වනුයේ නවීන තාක්ෂණය ජය ගැනීමට වෙහෙසෙනවා වෙනුවට තමාගේ ජීවිතය ජය ගැනීමට නවීන තාක්ෂණය යොදා ගන්නා ආකාරය පිළිබඳව ළමයින් දැනුවත් කිරීමයි. එවන් විට දී ළමයින් හා යෞවනයින් නවීන තාක්ෂණික

මෙවලම්වල වහලෙකු නොවී තාක්ෂණය තමාගේ යටත් වැසියෙකු බවට පත්කර ගනිමින්, ජීවිත ඉලක්ක කරා ළඟා වීමට ළමයාට හැකි වේවි. එය ඉබේ සිදු නොවන අතර ඒ සඳහා වැඩිහිටියන් විසින් ළමයින් මෙහෙයවිය යුතුය.

නමුත් ශ්‍රී ලංකීය සන්දර්භයේ තවමත් අපගේ දෙමාපියන් හා වැඩිහිටියන් තුළ පවත්නා අන්තර්ජාලය සම්බන්ධ අඩු දැනුම හා ඒ පිළිබඳව පවත්නා වැරදි ආකල්පයන් මත දරුවන් ඉන් සම්පූර්ණයෙන් ඈත්කර තැබීම හෝ සම්පූර්ණයෙන් ඒ සඳහා නිදහස විවර කර තැබීම යන අන්තයන් හි සැරිසරන ස්වභාවයක් දැක ගත හැකිය. එකී අන්තයන්ගෙන් අත් මිදී නිවැරදි මඟපෙන්වීම, අධීක්ෂණය, අවබෝධයෙන් යුතුව අන්තර්ජාලය භාවිත කිරීමට ළමයින්ට යම් ඉඩ කඩක් සපුරා දීම දෙමාපියන් ලෙස ඔබ සතු යුතුකමකි. එහිදී ළමයින් අන්තර්ජාලය පරිහරණය කිරීමේ කාලය හා රටාව, භාවිත කරන ස්වභාවය, උපක්‍රම හා ස්වයං හික්මීම පිළිබඳව දරුවා මූලික වශයෙන් සූදානම් කර තැබිය යුතුය. එබඳු සුරක්ෂිත පරිසරයන් හා උපක්‍රමයන් මඟින් අන්තර්ජාලය භාවිත කිරීමට යොමු කරනු ලබන දරුවාට මූලික වශයෙන් ස්වයං එකඟතාවයකට ලක් කරවීම ඉතා වැදගත්ය. එනම් තමා විසින් අන්තර්ජාලය තුළ සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකින්

- තමාට හානි නොවිය යුතුයි,
- වෙනත් කෙනෙකුට හානි නොවිය යුතුයි,

- සමාජයට හානි නොවිය යුතුයි

යන මූලික එකඟතාවයේ ළමයා පිහිටුවීමට හැකි නම් වඩාත් යෝග්‍ය වේ. අන්තර්ජාලය පරිහරණයේදීත්, සමාජ ක්‍රියාකාරීත්වයේදීත් ළමයෙකු සඳහා ලබාදිය හැකි පළමු පාඩම මෙයයි.

01.1. ළමයින්ගේ අන්තර්ජාල භාවිතය

අන්තර්ජාලය යනු ලොව පුරා පරිගණක පද්ධති සම්බන්ධකරන ගෝලීය පුළුල් ජාලයකි.[2] තොරතුරු තාක්ෂණයේ ප්‍රධාන ප්‍රවාහය අන්තර්ජාලයයි. තොරතුරු තාක්ෂණය යන්න වර්තමානයේ භාවිත වන ප්‍රචලිත වචනයකි. තොරතුරක් යනු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අනුව දත්ත සැකසුමේ, මෙහෙයවීමේ හා සංවිධානයේ ප්‍රතිඵලයකි. මෙවැනි තොරතුරු වර්ථමානයේ වත්කමක් වන බැවින් එකී තොරතුර ආරක්ෂාකරලීම උදෙසා උනන්දු වේ. තොරතුරු සුරක්ෂිතතාවය ලෙස හඳුන්වනුයේ එම තොරතුරුවල වටිනාකම අවබෝධකර ගනිමින් ඒවා ආරක්ෂා කිරීමකි. එහිදී රහස්‍යභාවය, පරිපූර්ණත්වය, සුලබත්වය ආරක්ෂාකර ගැනීම උදෙසා කටයුතු කරයි. මෙකී තොරතුරු නිතර හුවමාරු කරගනු ලබන ජනප්‍රිය මාධ්‍යක් ලෙස සමාජ ජාල වෙබ් අඩවි හඳුන්වා දිය හැකිය. සමාජ

[2] https://techterms.com/definition/internet,(2018/10/20)

මධ්‍යයක් (SocialMedia) යනු "ප්‍රජා පාදක යෙදවුම් අන්තර් ක්‍රියාකාරීත්වය අන්තර්ගත බෙදා හැරීම හා සහයෝගීතාව සඳහා කැප වූ මාර්සගත සන්නිවේදන නාලිකා එකතුවකි".[3] එසේත් නොමැතිනම් "භාවිත කරන්නන්ට තමාගේම අන්තර්ගතයන් සකස් කරගනිමින් එම අන්තර්ගතයන් විවිධ සම්බන්ධතා ඔස්සේ හුවමාරු කරගැනීමට ඉඩ සලසන ඒකාබද්ධ තාක්ෂණයකි".[4]

උදා- Facebook, Instagram, WhatsApp, Viber, Twitter, YouTube, Snapchat

අන්තර්ජාලය, භාවිත කිරීම, ගමන් කිරීම, රුදී සිටීම යන අර්තය ලබා දෙන වෙබ් අර්ථ දැක්වීමේ වචනය වනුයේ Internet Surfing හෙවත් අන්තර්ජාල රළ මත ලිස්සා යාම යන්නයි. එය ඉතා සුරක්ෂිත බව අර්ථවත්කරන වචනයකි.Surfing යනු සමබරව සුරක්ෂිතව නොවැටී මුහුදු රළ මත ලිස්සා යමින් සිය ඉලක්කය වෙත ගමන් කරනු ලබන ක්‍රීඩාවකි. එම ක්‍රීඩාව කිරීමට පෙර නොගැඹුරු අනතුරුදායී නොවන ස්ථානයක යම් අධීක්ෂණයක් යටතේ මූලික පුහුණුවීමක් සිදු කරමින් සිය ස්ථාවරබව, සමබරතාවය හා ලිස්සායාමේ ක්‍රමවේද හුරුකර ගැනීමෙන් පසුව මුහුදේ ස්වභාවය, සුළගේ තත්ත්වය, රළෙහි දිග, පළල, උස,

---

[3]http://whatis.techtarget.com/definition/social-media

[4] Educsirt පුහුණු අත්පොත (2015)

පරතරය, දිශාව පරීක්ෂා කරමින් එමෙන්ම Surf Bord හෙවත් ලිස්සා යනු ලබන ලෑල්ලෙහි තත්ත්වය පරීක්ෂා කර බලමින් මෙන්ම Surf Sport හෙවත් තමා බහින ස්ථානයෙහි තත්ත්වය සලකා බලමින් කොහේ සිට කොතනට යා යුතුද යන්න කල්තියා තීරණය කරමින් සිදු කරනු ලබන ක්‍රීඩාවකි. එමෙන්ම අන්තර්ජාලය තුළ රැඳී සිටීම හා ගමන් කිරීමද surfing ක්‍රීඩාව මෙනි. මන්ද අන්තර්ජාලයට පිවිසීමට ප්‍රථම ඒ පිළිබඳ පුහුණුවෙමින් හා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ අචාර ධර්ම පිළිපැදීමකින් පසුව සිය ස්ථාවරබව, සමබරතාවය පුහුණු කළ යුතුය. ඒ අනුව අන්තර්ජාලයේ ස්වභාවය හා යායුතු දිශානතිය අනතුරුදායී බව හොදින් අවබෝධකර ගනිමින් ඉතා සූක්ෂම, සමබර, සැලසුම්සහගත, අභියෝගාත්මක, අරමුණුගත, ක්‍රමාණුකූල, ධනාත්මක ක්‍රියාවලියක් ලෙස Internet Surfing හෙවත් අන්තර්ජාලය මත ගමන් කිරීම සිදු කළ යුතුය. එසේ නොවුව හොත් මුහුදේ ගිලී මිය යන්නාක් සේම අන්තර්ජාලයේ ගිලී විනාශ වීමට ද හැකිය.

අන්තර්ජාල භාවිතය ආශ්‍රිත ලාංකීය, කලාපීය හා ලෝක තත්ත්වය මැනවින් හඳුනා ගැනීමට නම් ඒ පිළිබඳ සංඛ්‍යාන විද්‍යාත්මක දත්ත ගවේශනය ඉතා වැදගත්ය. 1840 වර්ෂයේ දී පරිගණකය සොයා ගැනීමත් සමග ලෝකය පුරා පරිගණක තාක්ෂණය වේගයෙන් ප්‍රචලිත විය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වන විට කලාපයේ ජන ගහනයේ ප්‍රතිශතයක් ලෙස 85.2% ක් පරිගණක භාවිත කරමින් ලොව

විශාලතම පරිගණක භාවිත කරන කලාපය බවට පත්ව ඇත්තේ යුරෝපයයි. එහෙත් අන්තර්ජාලය භාවිත කරන සමස්ථ ලෝක ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස සලකා බලන විට 50.2% ක පමණ ප්‍රතිශතයක් වාසය කරනුයේ ආසියාතික කලාපයේ වීම සුවිශේෂී තත්ත්වයකි (Internet World Statistics-2016).

ශ්‍රී ලංකාවේ 2004 වර්ෂයේ පරිගණක පහසුකම් සහිත නිවාස 5% ට අඩු සංඛ්‍යාවක් පැවති මුත් එය 2014 වර්ෂය වන විට 15% ක් දක්වා ඉහළ ගොස් තිබුනි. නමුත් ජංගම දුරකථන ග්‍රාහකයින් 2005 වර්ෂයේ 10% ක් ව තිබූ අගය 2013 වර්ෂය වන විට 90% ඉක්මවා තිබීම සීඝ්‍ර ඉහළයාමකි (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2004, 2006/07, 2009, 2014). එමෙන්ම Internet Usage Statistics වෙබ් අඩවිය එලකර තිබූ දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ මිලියන හයකට වැඩි අන්තර්ජාලය භාවිත කරන්නන් සිටින බවත් ජංගම දුරකථන සම්බන්ධතා මිලියන 25 වැඩි ප්‍රමාණයක් භාවිත වන බවත් මෙන්ම ජනප්‍රිය සමාජ ජාල මාධ්‍යක් ලෙස Facebook ගිණුම් මිලියන 4.5 කට වැඩි ප්‍රමාණයක් පවත්නා බවටත් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරයි (InternetUsage Statistics-2017).මෙම තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය විමසා බැලීමේ දී ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත අනුව 2006/2007

වර්ෂය තුළ 16% ක් ව පැවති පරිගණක සාක්ෂරතාවය 2014 වර්ෂය වන විට 25% ක් බවට පත්ව ඇති බව වාර්තා කරයි.

වයස් කාණ්ඩය	**සාක්ෂරතා ප්‍රතිශතය**
5-9	12.3%
10-14	36.5%
15-19	54.4%
20-24	49.3%
25-29	40.3%
30-34	30.3%
35-39	23.5%
40-49	15.4%
50-59	9.3%
60-69	6.0%

වගු අංක 01

පරිගණක හා අන්තර්ජාල භාවිතය පිළිබඳ පොදු ප්‍රවනතාවය එසේ වුවත් ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය එක් එක් වයස් කාණ්ඩ අනුව විමසා බැලීමේ දී 54.4% ලෙස ඉහළම අගය වාර්තා වනුයේ අවුරුදු 15-19 අතර වයස් කාණ්ඩය තුලින් වීම සුවිශේෂීය. ඊට අමතරව අවුරුදු 5-9 ත් අතර වයස් කාණ්ඩයේ පරිගණක සාක්ෂරතාවය 12.3% ක් ද අවුරුදු 10-14 ත් අතර වයස් කාණ්ඩයේ සාක්ෂරතාවය 36.5% ක් ද වේ. ළමා හා තරුණ ප්‍රජාවේ පරිගණක සාක්ෂරතාවය සාමාන්‍යයෙන් ඉහළ අගයක් දරනු ලැබුවත් වැඩිහිටි ප්‍රජාවේ සාක්ෂරතාවය තරුණ ප්‍රජාවට සාපේක්ෂකව පහළ අගයක පැවතීම දැකිය හැකිය. (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2014,වගු අංක 01)

ශ්‍රී ලංකාවේ ළමයින්ගේ අන්තර්ජාල භාවිතය පිළිබඳ සිදු වී ඇති අධ්‍යයන ඉතාමත්ම සීමිත වුවත් 2017 වර්ෂයේ යුනිසෙෆ් සංවිධානය විසින් එළි දක්වනු ලැබූ අවුරුදු 11 ත් 18 ත් අතර

ළමයින්ගේ අන්තර්ජාල භාවිතය පිළිබඳ වූ UNICEF (2017)[5] අධ්‍යයනය ඉතා වැදගත් කරුණු රැසක් අනාවරණය කරයි.



ප්‍රස්ථාර 01

මෙම අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාවේ ළමයින්ගේ අන්තර්ජාල භාවිතය 52.8% කි. අන්තර්ජාලය භාවිත නොකරනු ලැබුවත් තොරතුරු තාක්ෂණය ආදී පරිගණක ක්‍රියාකාරකම් තුළ නිරත වන ප්‍රමාණය 39.8% ක් වේ. ඒ අනුව ළමයින්ගෙන් 92.6% ක් ම අන්තර්ජාලය හෝ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත කුමන හෝ ක්‍රියාකාරකමක නිරත වීම තුලින් ළමා පරිගණක සාක්ෂරතාවය ඉහළ යාමක් පෙන්නුම් කරනු ලැබුවත් අනෙක් පසින් ළමයින්ගෙන් 92.6% ක් අන්තර්ජාලය ආශ්‍රිත අවධානමට මුහුණ දීමට ඇති අවකාශය ඉහළ යාමක් ද ඉන් ගම්‍ය වේ.

ළමා ජනගහණයේ ස්ත්‍රී පුරුෂ භේදය මත අන්තර්ජාල භාවිතය සලකා බැලීමේ දී පිරිමි ළමයින් ගැහැණු ළමයින්ට

[5] .A study on Sri Lanka’s digital landscape: Potential risks to children and young people who are online (20117), Published by Unicef

වඩා අන්තර්ජාලය තුළ ක්‍රියාත්මක බව 2017 යුනිසෙෆ් සමීක්ෂණ වාර්තාව පැහැදිළි කරයි.

සංඛ්‍යාත්මකව සලකා බැලීමේ දී ගැහැණු ළමයින්ගෙන් 33.1% ක් ද පිරිමි ළමයින්ගෙන් 67.6% ක් ද අන්තර්ජාලය භාවිත කරයි. භාවිතය පිළිබඳ දත්ත එසේ වුවත් 2017 වර්ෂයේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අන්තර්ජාල ළමා අපයෝජන සම්බන්ධයෙන් ලද පැමිණිලිවලින් 73% ක් ම වාර්ථා වනුයේ ගැහැණු ළමයින්ට එරෙහිව බව වාර්ෂික දත්ත පැහැදිළි කරයි.



ප්‍රස්ථාර අංක - 02

ලෝක තත්ත්වය පිළිබඳව සලකා බැලීමේ දී 2015 වර්ෂයේ දී ළමයින් අපයෝජනයට ලක් කරනු ලැබූ URL 68,092 ක් වාර්තා වූ බවත් එකී අපයෝනයන්ගෙන් 85% ක් ම සිදුව ඇත්තේ ගැහැණු ළමයින්ට එරෙහිව බව වාර්තා වේ (Internet World Stats,2015).අන්තර්ජාල භාවිතය වැඩි වශයෙන් පිරිමි ළමයින් විසින් සිදු කරනු ලැබුවත් අන්තර්ජාල අපයෝජනවලට වැඩි වශයෙන් ලක් වන බවට පැමිණිලි ලැබී ඇත්තේ ගැහැණු ළමයින් සම්බන්ධයෙනි.

අන්තර්ජාලයෙන් සිදු වන අපයෝජනවලට අමතරව භෞතිකව සිදු වන අපයෝජන දෙස බැලුවද වැඩි වශයෙන් වාර්ථා වනුයේ ගැහැණු ළමයින්ට එරෙහි අපයෝජන බව පැහැදිළිය. එහෙත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2007 වසරේ එළිදක්වනු ලැබූ ලංකාවේ ළමයින්ට එරෙහි ලිංගික අපයෝජන සම්බන්ධයෙන් වූ සමීක්ෂණයකට අනුව අනාවරණය කරනු ලැබුවේ ගැහැණු ළමයින් 10% ක් ලිංගික අපයෝජනයට ලක් වන විට පිරිමි ළමයින් 20% ක් ලිංගික අපයෝජනයන්ට ලක් වන බවයි. නමුත් වාර්තාකරණය මෙකී සැබෑ ස්වභාවයට වඩා වෙනස් ස්වභාවයක් ගනු ඇත. අන්තර්ජාලය තුළින් වන අපයෝජනයන් සම්බන්ධයෙන් ද මෙවන් ස්වභාවයක් පවතින්නේ ද යන්න පිළිබඳව සමීක්ෂණයන් කලින් කළට සිදු විය යුතුය. ළමයින්ගේ වයස් මට්ටම් අනුව අන්තර්ජාල සාක්ෂරතාවය, භාවිතය හා අපයෝජනයට ලක්වීම දෙස බලන විට මෙකී ක්‍රියාවලියේ තවත් සුවිශේෂී ස්වභාවයක් අනාවරණයකර ගත හැකිය. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ඉහත වගු අංක 01 මගින් පැහැදිළි වනුයේ අවුරුදු 15-19 අතර වයසේ පසුවන්නන්ගේ ඉහළ පරිගණක සාක්ෂරතාවයක් පවත්නා බවයි.

අවුරුදු 11-18 අතර වයසේ පසුවන ළමයින් පිළිබඳ 2017 යුනිසෙෆ් සමීක්ෂණයට අනුව කාණ්ඩ තුනක් ඔස්සේ සිදු කරනු ලැබූ විග්‍රහය දෙස බලන විට 6-9 ශ්‍රේණිවල ළමයින්ගෙන් 34.9% ක ප්‍රතිශතයක් අන්තර්ජාලය භාවිතකරන

බවත් සාමාන්‍ය පෙළ ශ්‍රේණිවල ළමයින්ගෙන් 58.7% ක ප්‍රතිශතයක් අන්තර්ජාලය භාවිත කරන බවත් උසස් පෙළ ශ්‍රේණිවල ළමයින්ගෙන් 70.5% ක ප්‍රතිශතයක් අන්තර්ජාලය භාවිත කරන බවත් අනාවරණය කරයි.

පාසල් ශ්‍රේණි අනුව තොරතුරු තාක්ෂණය භාවිතය



Unicef - 2017, ප්‍රස්ථාර අංක 03

ශ්‍රී ලංකාවේ 2017 වර්ෂයේ ළමයින්ට එරෙහි සයිබර් අපරාධ වාර්තාවීම දෙස බලන විට අවුරුදු 10 ට අඩු ළමයින්ට එරෙහි සයිබර් අපරාධ 15.9% ක් ද අවුරුදු 11-15 අතර ළමයින්ට එරෙහිව 36.5% ක ප්‍රතිශතයක් ද අවුරුදු 16-18 අතර ළමයින්ට එරෙහිව 47.6% ක ප්‍රතිශතයක් ද වාර්තා වී ඇත (NCPA-2017). මෙම වාර්තාව තවදුරටත් පෙන්වා දෙනුයේ වයස් ඒකක වශයෙන් අවුරුදු 14 සිට අවුරුදු 17 දක්වා ළමයින්ට එරෙහිව වැඩි වශයෙන් අන්තර්ජාල අපයෝජන වාර්තා වී ඇති බවය.



ප්‍රස්ථාර අංක 04

නමුත් ඉහත අංක 02 ප්‍රස්ථාරයට අනුව අන්තර්ජාලය හරහා සිදු වන ළමා අපයෝජන වැඩි වශයෙන් වාර්ථා වී පවතිනුයේ අවුරුදු 10 ට අඩු ළමයින් සම්බන්ධයෙනි. එහි අගය 69% කි. ඒ අනුව වයස අනුව අන්තර්ජාල ළමා අපයෝජන සිදු වීමේ ලෝක ප්‍රවනතාවය හා ශ්‍රී ලංකාවේ ප්‍රවනතාවය අතර විශාල වෙනසක් දක්නට ලැබේ.

ශ්‍රී ලංකාව තුළ පරිගණක සාක්ෂරතාවය ඉහළම අගය බස්නාහිර පළාත මගිනුත් අවම අගය උතුරු පලාත තුළිනුත් (2014- ජන හා සංඛ්‍යා ලේඛන දේපාර්තමේන්තුව) වාර්තා වනු ලැබුවත් ළමයින්ගේ අන්තර්ජාල භාවිතය පිළිබඳ යුනිසෙෆ් සමීක්ෂණය (2017) පෙන්වා දෙනුයේ ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් අන්තර්ජාලයට ළමයින් පිවිසෙනුයේ (Online) දකුණු පළාතෙන් බවයි. අවම පිවිසුම සබරගමුව පළාතෙනි.



ප්‍රස්ථාර අංක-5

ඒ අනුව මධ්‍යම පළාතේ ළමයින්ගෙන් 57.8% ක් ද, නැගෙනහිර පළාතේ ළමයින්ගෙන් 43.4% ක් ද, උතුරු මැද පළාතේ ළමයින්ගෙන් 55.9% ක් ද, උතුරු පළාතේ ළමයින්ගෙන් 55.4% ක් ද, සබරගමුව පළාතේ ළමයින්ගෙන් 30.6% ක් ද, දකුණු පළාතේ ළමයින්ගෙන් 61.1% ක් ද, ඌව පළාතේ ළමයින්ගෙන් 54.0% ක් ද, වයඹ පළාතේ ළමයින්ගෙන් 52.8% ක් ද, බස්නාහිර පළාතේ ළමයින්ගෙන් 54.3% ක් ද අන්තර්ජාලය භාවිත කරන බව වාර්ථා වේ. ජාතිකත්වය අනුව ළමයින්ගේ අන්තර්ජාල භාවිතය පිළිබඳව යුනිසෙෆ් සමීක්ෂණය ඉදිරිපත් කරන දත්තවලට අනුව මුස්ලිම් ළමයින්ගෙන් 66% ක් අන්තර්ජාලය භාවිත කරන අතර සිංහල ළමයින්ගෙන් 51.7% ක් ද දමිළ ළමයින්ගෙන් 50.3% ක් ද අන්තර්ජාලය භාවිත කරන බවට දත්ත ඉදිරිපත් කරයි. යුනිසෙෆ් වාර්තාව තවදුරටත් පෙන්වා දෙනුයේ ශ්‍රී

ලංකාවේ නාගරික ළමයින් අන්තර්ජාලයට පිවිසීම ඉහළ අගයක් ගන්නා බවකි. ඒ අනුව නාගරික ළමයින්ගෙන් 67.8% ක් ද ග්‍රාමීය ළමයින්ගෙන් 47.1% ක් ද වතු ආශ්‍රිත ළමයින්ගෙන් 39.3% ක් ද අන්තර්ජාලයට පිවිසෙයි.

ළමයින්ගේ අන්තර්ජාල භාවිතය හා සාක්ෂරතාවය කෙසේ වෙතත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ළමයින්ට එරෙහි සයිබර් අපරාධ පිළිබඳ 2017 විශ්ලේෂණයට අනුව අන්තර්ජාල ළමා අපයෝජනවලට ලක් වූ ළමයින් වැඩි වශයෙන් වාර්ථා වනුයේ බස්නාහිර පළාත තුළිනි. එම අගය සමස්ථ අන්තර්ජාල ළමා අපයෝජනවලින් 73% කි. එයින්ද වැඩිම වාර්ථාකරණය කොළඹ (46%) දිස්ත්‍රික්කයෙන් වන අතර ඉහළම වාර්තාකරණය සිදු වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක වනුයේ පිළිවෙලින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකය.

රටින් රටට කලාපයෙන් කලාපයට සමාජ ජාල වෙබ් අඩවි භාවිතයේ වෙනස්කම් දක්නට ලැබෙතත් ශ්‍රී ලංකාවේ ළමයින් අතර වඩාත් ජනප්‍රිය සමාජ ජාල මාධ්‍යය බවට Facebook වෙබ් අඩවිය පත්ව ඇත. එකී සාමාන්‍ය මතය සංඛ්‍යාන විද්‍යාත්මකව තහවුරුකර ගත් 2017 යුනිසෙෆ් වාර්තාව පෙන්වා දෙනුයේ ශ්‍රී ලංකාවේ ළමයින්ගෙන් 61.7% ක් Facebook වෙබ් අඩවිය භාවිත කරන බවයි. ඊට අමතරව එම වාර්ථාව පෙන්වා දෙන ළමයින්ගේ ජනප්‍රිය සමාජ ජාල වෙබ් අඩවි ලෙස පිළිවෙලින් Skype (47.5%), Viber

(45%),WhatsApp (37.2%),Twitter (20.3%),Instagram (12.7%) වේ. සමාජ ජාල වෙබ් අඩවි වැඩි වශයෙන්ම භාවිත කරන ළමයින් එකී සමීක්ෂණයට අනුව වාර්ථා වනුයේ නැගෙනහිර පළාතෙන් වන අතර එහි ප්‍රතිශතය 95% කි. අවම සමාජ ජාළ වෙබ් අඩවි භාවිත කරන ළමයින් ඌව පළාතෙන් වාර්ථා වන අතර එහි අගය 74.8% කි. සමාජ ජාල භාවිතය පිළිබඳ පුළුල් විග්‍රයක නිරත වන මෙම සමීක්ෂණය ඒ ඒ සමාජ මාධ්‍ය බහුලව භාවිත වන ළමා ප්‍රජාවන් පිළිබඳව ද කරුනු දක්වයි. Skype හා Twitter යන සමාජ මාධ්‍යයන් බහුලව භාවිත කරනුයේ දමිළළමයින් වන අතර WhatsApp හා Instagram භාවිතය ඉහළ අගයක් වාර්තා වනුයේ මුස්ලිම් ළමා ප්‍රජාවෙනි. ජනප්‍රියතම සමාජ මාධ්‍යය වූ Facebook වෙබ් අඩවිය වැඩි වශයෙන් භාවිත කරනුයේ සිංහළළමා ප්‍රජාව විසිනි. තවද ගැහැණු ළමයින්ට සාපේක්ෂව පිරිමි ළමයින් විසින් සමාජ මාධ්‍යය භාවිතය ඉහළ අගයක් පෙන්වන බවත් ජාතීන් ලෙස මුස්ලිම් ළමා ප්‍රජාවේ සමාජ ජාල භාවිතය වැඩි බවත් ග්‍රාමීය නාගරික බවට සාපේක්ෂව වතු ළමා ප්‍රජාවේ සමාජ ජාල භාවිතය ඉහළ බවත් පාසල් ශ්‍රේණි තුළින් උසස් අධ්‍යාපනය හදාරනු ලබන සිසුන්ගේ සමාජ ජාල භාවිතය සුලභ බවත් මෙම වාර්ථාව දත්ත ඉදිරිපත් කරයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2017 සංඛ්‍යා දත්ත තුළින් ළමයින්ට එරෙහි සයිබර් අපරාධ බහුල ලෙස වාර්තා

වනු ලැබුවේ Facebook වෙබ් අඩවිය හරහා බව තහවුරු කරයි.(ප්‍රස්ථාර 06)ළමයින්ගේ ජනප්‍රියම සමාජ ජාල වෙබ් අඩවි හා අපයෝජන වාර්ථා වන සමාජ ජාල වෙබ් අඩවි අතර සහසම්බන්දයක් පවත්නා බව මෙම තොරතුරු මත දකගත හැකිය.

අන්තර්ජාලය භාවිත වනුයේ කුමන කාර්යක් උදෙසාද යන්න ඉතා වැදගත් සොයා බැලීමකි. ඒ අනුව යුනිසෙෆ් වාර්ථාව කාර්යයන් එකොළහක් ඔස්සේ විමසා බැලීමක් සිදු කර ඇති අතර එහි ඉහළම අගය ලෙස ළමයින්ගෙන් 86.2% ක් අන්තර්ජාලය අධ්‍යාපන තොරතුරු ගවේශනය සඳහා භාවිත කිරීමක් වාර්ථා වේ.



ප්‍රස්ථාර අංක-06

ළමා ප්‍රජාවෙන් 71.8% තවදුරටත් අන්තර්ජාලය තොරතුරු මෘදුකාංග හා වීඩියෝ බාගත කිරීම සඳහා භාවිත

කරයි. චිත්‍රපට හා වීඩියෝ නැරඹීම සඳහාද 60.8% ක් භාවිත කරන අතර සමාජ ජාල වෙත පිවිසීම සඳහා 60.3% ක් අන්තර්ජාලය භාවිතයට ගනී. මේ ආකාරයට 55.5% සංගීතයට සවන් දීමට හා රේඩියෝ ඇසීමටත් 54.4% අන්තර්ජාල ක්‍රීඩා තුළ නිරත වීමටත් 40.7% ක් සිය ආදරවන්තයින් ආදර වන්තියන් යහලුවන් හා නෑදෑයින් සමග කථා කිරීමටත් 34.8% පිංතූර හා වීඩියෝ හුවමාරු කිරීම සඳහාත් 34.8% ක්‍රීඩා නැරඹීම සඳහාත් 30.9% ක් මිළ දී ගැනීම් සඳහාත් 28.3% ක් විද්‍යුත් පනිවුඩ හුවමාරු කර ගැනීම සඳහාත් භාවිතයට ගන්නා බව ට දත්ත ඉදිරිපත් වී ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 2017 වසරේ වාර්ථා වූ අන්තර්ජාල ළමා අපයෝජන දෙස බැලීමේ දී එම අපරාධවලින් 81% ක්ම වාර්ථා වනුයේ ලිංගිකත්වය මත පදනම් වූ සයිබර් අපරාධයි. එසේම එකී අපරාධවලින් 93.6% ක ප්‍රතිශතයක් වාර්ථා වනුයේ ප්‍රචණ්ඩකාරී සයිබර් අපරාධයන් ලෙසයි. තවත් වර්ගීකරනයක් ලෙස බලන කළ මෙම අපරාධ සියල්ලම එනම් 100% ක්ම වාර්ථා වී පවතිනුයේ පරිගණකය ආශ්‍රිත සයිබර් අපරාධ ලෙස වන අතර පරිගණකය ඉලක්ක කරගත් සයිබර් අපරාධ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 2017 වර්ෂයේ වාර්ථා වී නොමැත.

ශ්‍රී ලංකාවේ මෑත කාලීන දත්ත දෙස බලන විට 2017 වාර්තා වන ළමා අපයෝජනවලින් 01% ක්ව පැවති සයිබර් ළමා අපයෝජන ප්‍රමාණය 2022 වන විට එය 3% දක්ව ඉහළ ගොස් ඇති බව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දත්ත

වාර්තා කරයි. එසේම 2021 වර්ශයේ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් එළි දක්වන ලද වාර්තාවට[6] අනුව ලංකාවේ ළමයින් 10 කුගෙන් 03 ක් අන්තර්ජාල හිංසනයන්ට ලක්ව ඇති බව වාර්තා කරයි. එසේම එම වාර්තාවට අනුව අන්තර්ජාල හිංසනයට ලක් වන ළමයින්ගෙන් ගැහැණු ළමුන් 29% ක් ද පිරිමි ළමුන් 27% ක් ලෙසද හිංසන අත්දැකීම් ඇති බව පෙන්වා දෙයි. මෙහි සදහන් සුවිශේෂී අනාවරණයක් වනුයේ මෙසේ සිදූ වන හිංසනවලින් 92% ක්ම නීතිමය කටයුතු සදහා යොමු නොවන බවයි.

මෙකී සංඛ්‍යා දත්ත මත පිහිටා ලෝකයේ කලාපයේ මෙන්ම ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය හරහා ළමයින්ට ඇති අවධානම් තත්ත්වය පිළිබඳ දිශානතිය හඳුනා ගැනීමට විද්‍යාත්මකව ප්‍රවේශයක් සපයයි. මෙම දත්ත මත පදනම්ව ශ්‍රී ලංකාවේ ළමයින්ට එරෙහි සයිබර් අපරාධ හඳුනාගැනීම, වැළැක්වීම, විමර්ශනය, නීතිය ක්‍රියාත්මක කිරීම හා මැදිහත්කරණය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ඇත.

---

[6] Online Violence Against Children in Sri Lanka-2021

දෙවන පරිච්ඡේදය

සයිබර් අපරාධ සහ අපරාධ විද්‍යාත්මක න්‍යායන්

අපරාධයක් යන්න දෘෂ්ටිකෝණ දෙකක් ඔස්සේ විමසා බැලිය හැකිය. එනම් නෛතික දෘෂ්ටි කෝණය හා සමාජීය දෘෂ්ටි කෝණයයි. නෛතික දෘෂ්ටි කෝණයට අනුව අපරාධ යනු "පනවන ලද අපරාධ නීතියක් කඩා බිඳ දැමීමකි".[7] සමාජීය දෘෂ්ටි කෝණය අනුව අපරාධයක් යනු "යම් කිසි සමාජ විරෝධී ක්‍රියාවක් සමාජයක් තුළ දැඩි කම්පනයක් ඇති කරන්නේ නම් එය අපරාධයක් වන බවයි".[8] නෛතික නිර්වචනය අනුව සයිබර් අපරාධ දෙස බලන විට ශ්‍රී ලංකා නීතියේ ඇතැම් සයිබර් අපරාධ නිර්වචනය වී නොතිබිය හැකිය. එබැවින් සමාජයට හානිදායී වූ එහෙත් නීතිය තුළ නිර්වචනය නොවුන අන්තර්ජාල ක්‍රියා ශ්‍රී ලංකාව

[7] රත්නපාල නන්දසේන(2003) අපරාධ විද්‍යාවේ මූලධර්ම 1 පි. 09
[8] රත්නපාල නන්දසේන(2003) අපරාධ විද්‍යාවේ මූලධර්ම 1 පි. 12

තුළ අපරාධයක් ලෙස නො-ගැනිය හැකි ද? සමාජීය දෘෂ්ටි කෝණයෙන් ඒ දෙස බැලීමේ දී නීතියේ සදහන් නොවුවත් සමාජයට වන බලපෑම මත ඒවා අපරාධ බවට පත් වනු ඇත. එබැවින් අන්තර්ජාලය තුළ සිදු වන සමාජ විරෝධී මෙන්ම සමාජය තුළ දැඩි කම්පනයක් ඇති කරන සියලු ක්‍රියා අපරාධ ලෙස නීතියට එකතු විය යුතුය.

පරිගණකයක් සහ ජාලයක් සම්බන්ධ ඕනෑම අපරාධයක් සයිබර් අපරාධයක් ලෙස හඳුන්වනු ලබයි. එහිදී සමහර අවස්තාවල දී අපරාධය කිරීම සඳහා පරිගණකය භාවිත කළ හැකි අතර වෙනත් අවස්තාවල දී පරිගණකය අපරාධයේ ඉලක්කය විය හැකිය.[9] මෙම නිර්වචනය හා උක්ත අපරාධ නිර්වචන සලකා බැලීමේ දී පරිගණකයක් හෝ ජාලයක් හරහා සමාජ විරෝධී ක්‍රියාවක් මගින් සමාජය දැඩි කම්පනයට පත් කිරීම හා පවත්නා නීතියක් උල්ලංඝනය කිරීම සයිබර් අපරාධයක් වනු ඇත. එහි දී අපරාධ සිදු කිරීම සඳහා පරිගණකය භාවිත කළ හැකි අතර ඇතැම් අවස්ථාවල දී පරිගණකය අපරාධයේ ඉලක්කය බවට පත් විය හැකිය. මෙකී සංකල්පය ද පෙරදැරිකර ගනිමින් අපරාධ නිර්මාණය වීමට බලපාන සාධක ඔස්සේ සයිබර් අපරාධ නිර්මාණය වීම සොයා යමු.

---

[9]https://study.com/academy/lesson/what-is-cyber-crime-definition-types-examples.html

02.1. පොදු න්‍යායවාදී අදහස් හා සයිබර් අපරාධ

අපරාධ දෙස බලන විට ඒ සඳහා බලපාන මතු පිට හේතු කිහිපයක් මූලිකව හඳුනා ගත හැකිය. විශේෂයෙන්ම එවන් අපරාධ බොහොමයක් මූල්‍යමය, ලාභ ප්‍රයෝජන, දේශපාලන පෙළඹවීම්, ලිංගික ආවේගයන්, පළිගැනීම්, තරහ, දුක, වේදනාව වැනි භාවාත්මක පෙළඹීම් මෙන්ම හුදු විනෝදාස්වාදය වෙනුවෙන්ද සිදු කරන බවක් පෙනෙන්නට ඇත. සැබවින්ම මතු පිටින් එවන් තත්තවයක් ප්‍රදර්ශනය කළද අපරාධවලට යොමු වන්නන්ගේ ස්වභාවය දෙස වඩාත් ගැඹුරින් විමසා බැලිය යුතුය. නමුත් "සයිබර් අපරාධ" යන්න අපරාධ සිදු කිරීමේ තවත් එක් නවීනතම ක්‍රමවේදයක්, උපක්‍රමයක් හා මෙවලමක් මිස වෙනස්ම ආකාරයේ අපරාධකාරි මානෝභාවයක් නොවන බව පසක් කරන අතරම සාමාන්‍යයෙන් පුද්ගලයෙකු අපරාධ සඳහා පොළඹවන හේතු සාධක මේ සඳහා ද බලපෑම් කරයි. එබැවින් සයිබර් අපරාධ සිදු කිරිම පිළිබඳ සුවිශේෂී වූ ප්‍රබල න්‍යායවාදී අදහස් ඉතා අල්ප වන මුත් පවත්නා අපරාධ විද්‍යාත්මක න්‍යායයන් ඇසුරින් අන්තර්ජාල අපරාධකරුවන්ගේ මානසිකත්වය ගොඩ නැගීමේ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක සාධක පිරික්සා බලමු.

අපරාධවලට යොමු වන්නන් මානසික ව්‍යාධීන්වලින් පෙළෙන්නන් බව මනෝ චිකිත්සක මතධාරීන්ගේ මතයයි. ඔවුන් විසින් පැහැදිළි කරනු ලැබුවේ පුද්ගලයා කුඩා කාලයේ

ලඳ අමිහිරි අත්දැකීම් මෙන්ම ආදරය, දයාව, කරුණාව නොලැබීම, කුඩා කාලයේ සිය මූලික අවශ්‍යතා සංතෘප්ත නොවීම වැනි කරුණු මත අපරාධකාරී මානසිකත්වයන් ගොඩනැගෙන බවයි. එමෙන්ම මානසික දුර්වලතාවලින් යුතු පවුල් තුළින් ද අපරාධකරුවන් බිහිවිය හැකි බවත්, මානසික ගැටීම් හා බිදවැටීම් තුළින් ද අපරාධකරුවන් බිහිවීමට සුදුසු පරිසරයක් නිර්මාණය වන බවත් වැඩිදුරටත් පෙන්වා දෙයි. නමුත් අපරාධ සිදු කරනු ලබන සියලු දෙනාම මානසික ව්‍යාධීන් විය හැකිද? නැතහොත් අපගේ විමසා බැලීමට අනුව සයිබර් අපරාධ සිදු කරන්නන් මානසික රෝගීන් විය හැකිද? ඒ පිළිබඳ විවේචන ඇත.

මනෝවිද්‍යාත්මක මතධාරියෙකු ලෙස "සිග්මන් ෆ්‍රොයිඩ්"[10] විසින් අපරාධකරුවන් බිහිවීම උදෙසා ළමා කාලයේ සිදුවන සංවර්ධන අවධිවල අක්‍රමතා බලපෑම් කරන බවට වූ මතයක් ඉදිරිපත් කරයි. මුඛ අවධිය, ගුධ අවධිය, ලිංගික අවධිය, අනුශය අවධිය හා ජනනේන්ද්‍රිය අවධිය ලෙස ෆ්‍රොයිඩ් හඳුන්වා දෙනු ලැබූ සංවර්ධන අවධි තුළළමයින් නිසි තෘප්තිමත් භාවයකට පත් නොවීමේ තත්තවයන් මත අපරාධකරුවන් බිහිවීමට බලපෑම් කරනු ලබන බව පැහැදිලි කරයි. එසේම පුද්ගලයින්ගේ මනස ගොඩ නැගී ඇති ඉඩ් (Id) ඊගෝ (Ego) සුපර් ඊගෝ (Supper Ego) නිවැරදිව සංකලනය නොවීමත්, සුපර් ඊගෝ නිසි ලෙස සංවර්ධනය

---

[10] . රත්නපාල,නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම 1,(2003),ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්,ගනේමුල්ල.

නොවීමත් අපරාධකරුවන් නිර්මාණය වීමට බලපාන බව ඔහුගේ න්‍යායන් තුළින් පැහැලි කෙරේ.

නව යෞවන වයසේ පසු වන ළමයින් තුළ හටගන්නා කායික, මානසික හා හෝර්මෝන ක්‍රියාකාරිත්වය වෙනස්වීම් නිසා ලිංගික අවශ්‍යතා හා කුතුහලය මතු වීම ස්වභාවිකය. එකී ජීවවිද්‍යාත්මක අවශ්‍යතාවයන් සමග ලිංගික පීඩනය සමනය කර ගැනීම සඳහා ස්වයං වින්දනය ඉක්මවා ගිය අන්තර්ජාලය හරහා අසභ්‍ය වීඩියෝ නැරඹීම, චැට් රූම් සමග ගනු දෙනු කරමින් වීඩියෝ මඟින් ලිංගික ක්‍රියාකාරකම් සිදු කිරීම, අන්තර්ජාලය හරහා විවිධ ලිංගික ක්‍රියාකාරකම්වල නිරත වීම මෙන්ම ඇතැම් විට Off line ලිංගික ක්‍රියාකාරකම් තුළ නිරත වීමට ද ඇතැම් ළමයින් පෙළඹෙමින් සිටියි. ඉඩ් (Id) හෙවත් තිරිසන් සිත විසින් එකී සදාචාර විරෝධී ක්‍රියාකාරකම සිදු කරන ලෙස ඉල්ලීම් කරනු ලැබුවත් ඔහුගේ upper Ego හෙවත් සුපහන් සිත මඟින් එය සිදු නොකරන ලෙස ඉල්ලීම් කරනු ඇත. එසේ තිරිසන් සිත හා සුපහන් සිත අතර සිදු වන ගැටුමෙන් පසු එකී පීඩනය ඔහු හෝ ඇය විසින් පිට කරනු ලබන ආකාරය Ego හෙවත් තාර්කික මනස වේ.

උදා- *තිලිණ අන්තර්ජාලය හරහා Facebook ගිණුමක් සකසා ගෙන යහලුවන් සමඟ මිතුරු ඇසුරක් පවත්වමින් සිටියා. දිනක් ඉතා ලස්සන ගැහැණු ළමයෙක් සිය ගිණුමට මිතුරු ඇරයුමක් ලබා දී තිබෙනු දුටු තිලිණ එක වරම එය*

අනුමත කරනු ලැබුවා. ඇය කෙරේ දැඩි ලිංගික ආශාවක් පහළ වූ තිලිණ ඇයගෙන් ලිංගික ඇරයුමක් සිදු කරන ලෙස ඔහුගේ යටි සිත හෙවත් ඉඩ් (Id) බලකරනු ලැබුවත් තිලිණගේ සුපහන් සිත හෙවත් Supper Ego එසේ නොකරන ලෙස යොජනා කරනු ලැබුවා. මෙම අදහස් දෙකේ ගැටීම මත එකී ලිංගික ආතතිය තෘප්තිමත් කර ගැනීම සඳහා තිලිණ ඔහුගේ ව්‍යාජ Facebook ගිණුම හරහා ඇයට ලිංගික යෝජනාවක් යොමු කළ අතර එකී ලිංගික ආවේගය වෙනත් ක්‍රමයකින් පිටකර හැරීමට කටයුතු කළා. එය ඔහුගේ Ego හෙවත් තාර්කික බුද්ධියයි.

පුද්ගලයින් විසින් ක්‍රියාත්මක වන සෑම අවස්ථාවකදීම මෙකී ගැටීම සිදු වන අතර එම අවස්ථාවලදී Id සහ Supper Ego අතර ගැටුම තුළ සමපාතයක් නිර්මාණය නොවී යම් හෙයකින් ඉඩ්(Id) බලවත් වුව හොත් එවැනි අවස්ථාවලදී සදාචාර විරෝධී, සමාජ විරෝධී, ප්‍රචණ්ඩකාරී හෝ අපරාධකාරී චර්යාවන් එළි දැක්වීමට හැකියාව පවතී. එබැවින් මනෝ විශ්ලේෂණවාදීන්ට අනුව ළමයින්ගේ Supper Ego වර්ධනය කිරීමට අවශ්‍ය වටපිටාව සැකසීම අපරාධ පිටුදැකීමේ දී වඩාත් ප්‍රතිඵලදායී විය හැකිය. අන්තර්ජාල අපරාධ නිර්මාණය වීම සම්බන්ධයෙන් ද මෙකී ක්‍රියාවලිය බලපෑම් කරනු ලබන හෙයින් කුඩා කළ සිටම SupperEgo නිසි පරිදි වර්ධනය කිරීමට අවශ්‍ය වටපිටාව සකසනවා සේම අන්තර්ජාල ආචාර ධර්ම පද්ධතියකට

ළමයින් හුරුකරවීම ද මෙහිදි අත්‍යවශය කරුණක් විය හැකිය.

පෞරුෂාංග විවරණවාදී මතය[11] වුයේ යම් අපරාධයක් සිදු වීමේදී ඒ සඳහා බලපාන සාධක දෙකක් පවත්නා බවයි. එනම් අපරාධ සඳහා ඇදගැනීමේ සාධක (PullFactors)හා තල්ලු කිරීමේ සාධකයි (Push Factors). පුද්ගලයෙකු වටා සිටින නරක යහලුවන් හා ඔහු වටා ඇති අපරාධකාරි උප සංස්කෘතිය වැනි සාධක ඇදගැනීමේ සාධක ලෙසත්, පුද්ගලයෙකු තුළ ඇති වන මානසික ගැටීම්, ඔහු තුළ ඇති ආක්‍රමණශීලී බව, හීනමානය, ඉච්ඡාභංගත්වය වැනි කරුණු තල්ලු කිරීමේ සාධක ලෙසත් පෙන්වා දිය හැකිය. එම සාධක ප්‍රබලව ක්‍රියාත්මක වීම මත පුද්ගලයා අපරාධවලට යොමු වන බව මෙකී න්‍යායවාදීන් විසින් පැහැදිලි කරනු ලැබුවත් මේ සඳහා ද දැඩි විවේචන එල්ල වී තිබේ. එහෙත් මෙකී ඇදගැනීමේ හා තල්ලු කිරීමේ සාධක දෙක අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් කෙසේ බලපානු ඇත්ද යන්න විමසා බලමු. අන්තර්ජාලය යනු උප සංස්කෘතියකි. ඒ තුළ අපරාධ සඳහා ඇදගැනීමේ සාධක බහුලව ක්‍රියාත්මකය. මන්ද අන්තර්ජාලය තුළ පවත්නා සැඟවී පහරදීමට ඇති අවකාශය හා වින්දිතයා වෙතට ක්ෂණිකව ළඟාවීමට ඇති හැකියාව මෙන්ම එකී අපරාධකාරී යහළුවන් හා පුද්ගලයින් ඕනෑ තරම් අන්තර්ජාලය තුළ හමුවීම, ආදී අන්තර්ජාලය තුළළමයා ඒ

---

[11] . රත්නපාල,නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම 1,(2003),ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්,ගනේමුල්ල.

දෙසට ඇදගැනීමට සමත් ඕනෑ තරම් සාධක දැක ගත හැකිය. එසේම ලාංකීය අන්තර්ජාල භාවිතය පිළිබඳ ප්‍රජාව තුළ ගොඩනැගී ඇති ආකල්පය ද සතුටුදායක නොවේ. අන්තර්ජාලය යහපත්දේ සඳහා යොදා ගත හැකිය යන මතයට වඩා අයහපත් දේ සඳහා භාවිතා කළ හැකිය යන මතය සමාජගත වී ඇත. එම නිසා අන්තර්ජාලය තුළින් අපරාධ සිදු කිරීමට පුද්ගලයාට තවදුරටත් එකී මතය ඇදගැනීමේ සාධකයක් ලෙස උපස්ථම්භනයක් ලබා දෙයි. ලාංකීය ළමා හා තරුණ ප්‍රජාවගේ අන්තර්ජාල හැසිරීම දෙස බලන විට ඔවුන්ගේ මානසික බිඳවැටීම් හා ඉච්ඡාභංගත්වයන් සඳහා අන්තර්ජාලය තුළින් විසඳුම් ලබා ගැනීමට උත්සාහ දරන බවක් දක්නට ලැබේ. කවියක්, නිසදැසක්, චිත්‍රයක් හෝ වෙනයම් නිර්මාණයක් තුළින් සිය චිත්තවේග පිටකර හැරීම වෙනුවට එකී ආවේග, පළිගැනීම, අපහාස කිරීම, හිංසා කිරීම, හානි කිරීම, ප්‍රතිරූපය විනාශ කිරීම වැනි තත්ත්වයන් හරහා ආවේග පිටකර හරින ස්වභාවයක් දක්නට ලැබේ. අන්තර්ජාලයේ පවත්නා ගොදුරු වෙත ළඟාවීමට ඇති පහසුව නිසාම මෙය ආක්‍රමණශීලී කටයුතු වෙනුවෙන් භාවිතා කරන බවක් දැකිය හැකිය. ලාංකීය අන්තර්ජාල භාවිතය දෙස විමසිල්ලෙන් බලන අයෙකුට එය භාවිත කරන්නන්ගේ හීනමානය කොපමණද යන්න පහසුවෙන් අවබෝධ කර ගත හැකිය. එබැවින් අන්තර්ජාලය තුළ අපරාධ සඳහා ඇදගැනීමේ සාධක මෙන්ම තල්ලුකිරීමේ සාධක ද ප්‍රබලව ක්‍රියාත්මක වන බවක් දක්නට ලැබේ.

පුද්ගල චර්යා ගොඩනැගීමේ දී ඔහු ලබන ප්‍රසාද හා අප්‍රසාද බෙහෙවින් බලපෑම් කරනු ලබන බව ආරෝපිත ප්‍රතිචාර න්‍යායවාදීහු පෙන්වා දෙති. එනම් ළමයෙකු යමක් සිදු කළ විට එයට ලැබෙන ප්‍රතිචාරය ඔහුගේ චර්යාව නිර්මාණය කිරීමට ඉවහල් වන බවකි. අන්තර්ජාලය පරිහරණය කරන ළමයාගේ එකී භාවිතයට දෙමාපියන්, වැඩිහිටියන් දක්වන්නා වූ ප්‍රතිචාර ළමයාගේ අන්තර්ජාල හැසිරීම සම්බන්ධයෙන් බලපෑම් සිදු කරයි. ශ්‍රී ලංකාවේ දෙමාපියන් හා වැඩිහිටියන් ළමයින්ගේ අන්තර්ජාල භාවිතය සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේ ආකාර කිහිපයක් ප්‍රදර්ශනය වේ. ඇතැම් දෙමාපියන් හොඳ හෝ නරක වේවා කිසිදු සොයා බැලීමකින් තොරව ළමුන්ගේ අන්තර්ජාළ භාවිතයට සෘණාත්මක ප්‍රතිචාර දක්වන බව පෙනේ. ඇතැම් දෙමාපියන් හොඳ හෝ නරක වේවා කිසිදු සොයා බැලීමක් ළමයාගේ අන්තර්ජාල භාවිතය සම්බන්ධයෙන් නොදක් වති. එහෙත් සුලු පිරිසක් ළමයාගේ අන්තර්ජාල භාවිතයේ හොඳ හා නරක තෝරා බේරා ගනිමින් ළමයා නිසි අධීක්ෂණයකින් යුක්තව අන්තර්ජාල පරිහරණයට ප්‍රතිචාර දක්වති. එබැවින් ළමයා අන්තර්ජාලය තුළ නිවැරදි භාවිතයකට හුරුවීම කෙරෙහි දෙමාපියන්ගේ අධීක්ෂණය හා මගපෙන්වීම තුළින් දක්වන්නා වූ ප්‍රතිචාරය ඉතා වැදගත් එකක් වන බව ඔබට පැහැදිළි විය යුතුය.

මෙකී න්‍යායවාදීන්ම ළමයාගේ චර්යා හැඩගැසීමේ දී ආදර්ශ ආකෘති හෙවත් භූමිකා ආදර්ශ (Role-Models)

හෙවත් මොඩලයන් බලපානු ලබන බවද පෙන්වා දෙයි. දරුවා ආදර්ශයට ගනු ලබන අන්තර්ජාලයට සම්බන්ද යහපත් චර්යා එළිදක්වන හෝ අයහපත් චර්යා එළිදක්වන පුද්ගලයින් මෙහිදී වැදගත් වේ. එකී පුද්ගලයාගේ ආදර්ශයන් මත ළමයාගේ චර්යාව හැඩගැසීම සිදු විය හැකිය. එකී පුද්ගලයා අපරාධකාරී හෝ අන්තර්ජාලය අවභාවිතා කරන්නෙකු නම් ළමයාගේ අන්තර්ජාල භාවිතය ද අපරාධකාරි අවභාවිතාවන්ගෙන් යුතු හිංසාකාරී එකක් වීමට ඇති ඉඩකඩ බහුලය. එබැවින් ළමයින් අන්තර්ජාල භාවිතය තුළ ඔහුගේ හෝ ඇයගේ අන්තර්ජාල මොඩලය හෙවත් ආකෘතිය පිළිබඳව දෙමාපියන් විසින් නිසි විමසිල්ලෙන් යුක්තව සිටීම ඉතා වැදගත්වේ.

අපරාධ සම්බන්ධයෙන් ප්‍රබල න්‍යායයන් රැසක් ඉදිරිපත් කර ඇත්තේ සමාජ විද්‍යාත්මක න්‍යායවාදීන්ය. ඒ අතර පරිසරය හා සම්බන්ධ සමාජ විදයාත්මක මතය, සමාජ ඉගෙනුම් න්‍යාය, අනෝමීය සිද්ධාන්තය, ලේබල් කරණය,සට්ටනවාදී න්‍යාය ප්‍රබල කරුනු රැසක් ඉදිරිපත් කරයි.

පරිසරය හා සම්බන්ධ සමාජ විද්‍යාත්මක මතධාරියෙකු වූ "එමිල් ඩුර්කයිම්"[12] අපරාධ සිදුවීමේ දී සමාජයේ වෙනස්වීම ප්‍රබලව බලපෑම් කරන බව පෙන්වා දෙයි. යම් සමාජයක් සංකීර්ණත්වයට හා වෙනස්වීමට

---

[12] . රත්නපාල,නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම 1,(2003),ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්,ගනේමුල්ල.

ලක්වීමේ දී එකී සමාජයේ සමාජ සබඳතා බිඳවැටීමත් සාම්ප්‍රධායික සමාජය සතු ගණචර්යා හා ජනචර්යා (සාරධර්ම) සඳහා වූ වටිනාකම් වෙනස්වීමත් මත අපරාධකාරී චර්යාවන් සමාජය තුළ මතුවීමට ඇති ඉඩ කඩ ඉහළ යන බව ඔහු පෙන්වා දෙයි. ඩුර්කයිම්ගේ සමාජ වෙනසත් සමගම ඇති වන ධර්මතා ශූන්‍යත්වය හෙවත් ධර්මතා බිදවැටීම අනෝමීයත්ව සංකල්පය ලෙස හඳුන්වනු ලැබේ. මෙකී තත්ත්වය මත සමාජය වේගයෙන් වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජ බැමි වේගයෙන් ලිහීයාම නිසා අපරාධ සමාජය තුළ වර්ධනය වන බව පෙන්වා දෙයි. මෙම මතයට අනුව ගම්‍ය වනුයේ අපරාධ යනු සමාජයට අළුත් දෙයක් නොව සමාජය බිහි වූ දා සිට පැවත එන සංසිද්ධියක් බවයි. නමුත් සමාජය වෙනස් වීමේ දි අපරාධවල ස්වභාවය ද වෙනස් වන අතරම උපක්‍රම, ක්‍රමවේද මෙන්ම එහි ප්‍රමාණයද වෙනසකට ලක් විය හැකිය. එනම් අළුත් කණ්ඩායම් අළුත් අපරාධ නිර්මාණය කරන බවක් මෙන්ම සමාජය වෙනස් වීමේ දී අපරාධවල ස්වභාවය ද අළුත් මුහුණුවරක් ගන්නා බව නොවේද? ඒ අනුව සයිබර් අපරාධ යනු අළුත් කණ්ඩායම් විසින් නිර්මාණය කළ අළුත් ප්‍රවණතාවයක්, අපරාධ සිදු කිරීමේ නව ක්‍රමවේදයක් හෝ උපක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය.

අපරාධ යනු පුද්ගලයා උපතින් හෝ උරුමයෙන් ලද දෙයක් නොවන බවත් එය සමාජ ඉගෙනීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බවත් සමාජ ඉගෙනුම්වාදීන්ගේ අදහසයි. අපගේ

සියලු චර්යාවන් ඉගෙනීමේ ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කරන ඉගෙනුම් න්‍යායවාදීහු අපරාධ චර්යාවන් ද සමාජය තුළින්ම සිදු වන සංනිවේදන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස හටගනු ලබන බව පැහැදිළි කරති. මෙහි දී ප්‍රාථමික සමූහ තුළින් හා ජනමාධ්‍ය හරහා ජනතාව අතරට යන ප්‍රචණ්ඩ චර්යා හා ප්‍රචණ්ඩ චිත්‍රපට, සිනමා හා පුවත් මගින්ද මේ සඳහා අවශ්‍ය පරිසරය සකසන බව පෙන්වා දෙති. එහිදී මේකී ක්‍රම හරහා අපරාධ චර්යාවන් හී ක්‍රමවේද ඉගෙනීමත්, ආකල්පමය ප්‍රේරණයන් උකහා ගැනීමත් සමාජය හරහා නිරන්තරයෙන් සිදු වනු ඇත. ඇතැම් විට නීතිය කැඩීම තුළින් ලබන වාසි සහගත තත්ත්වයන් ඉගෙන ගැනීම හරහා ද අපරාධ සඳහා යොමු වන ආකාරයක් පිළිබඳවද මොවුහු පැහැදිළි කරති. අන්තර්ජාලය කිසි දිනෙක භාවිත නොකරන්නෙකු විසින් අන්තර්ජාල අපරාධ සිදු කිරීමට හැකියාවක් නොමැත. අන්තර්ජාල අපරාධ සිදු කිරීමට නම් ඔහු හෝ ඇය අන්තර්ජාලය පිළිබඳ දැනුම මෙන්ම ඒ හරහා අපරාධ සිදු කරන ක්‍රමවේදය පිළිබඳවද දැනුම පැවතිය යුතුයි. එකී දැනුම ලබා ගැනීමට නම් අන්තර්ජාලය පරිහරණය කළ යුතු වේ. එසේම අපරාධ සිදු කරන ක්‍රමය ඉගෙන ගත් පමණින් සියලු දෙනාම අපරාධ සිදු නොකරයි. එකී අපරාධ සඳහා මානසික පෙළඹවීමක් හෙවත් අපරාධකාරී මානසිකත්වය ද ඉගෙන ගත යුතුය. මෙම විග්‍රහය හරහා මතු වන ඊළග ගැටළුව නම් අන්තර්ජාලයට පැමිණෙන හෝ එකී අපරාධ චර්යාවන් අත්දකින සෑම දෙනාම අන්තර්ජාල අපරාධ සිදු කිරීමට නො-පෙළඹෙන්නේ මන්ද යන්නයි. මකී න්‍යායට අනුව පිළිතුරු

සෙවීමේදී අන්තර් ආශ්‍රය පිළිබඳ සිද්ධාන්තයේ පහත සඳහන් කරුණු ඒ සඳහා ඉතා වැදගත් වේ. යම් අපරාධකාරී චර්යාවක් අභ්‍යන්තරීකරණය වීමේ දී ඉතා වැදගත් කරුණු කිහිපයක් Sutherland(1939)[13] පෙන්වා දෙයි. එනම් එකී තැනැත්තා

01- නීති විරෝධී චර්යාවන් සමඟ ගැටෙන වාර ගණන
02- එවැනි අපරාධ චර්යා තුළ රඳා පවත්නා කාලය
03- එවැනි චර්යා අත්විඳින කාල වකවානුව(ළමා කාලයේ නම් එහි බලපෑම වඩා වැඩි බව)
04- කුමන මුලාශ්‍රයක් ඔස්සේ පැමිණේද (ප්‍රබල මුශ්‍රයක් ඔස්සේ පැමිනෙනනේ නම් ඉහළ බලපෑමක් ඇත) යන්නයි.

අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් මෙකී කරුණු හතර පිළිබඳව අවධානය යොමු කිරීමේ දී අන්තර්ජාලයේ නීති විරෝධී චර්යාවන් සමඟ ළමයා ගැටෙන වාර ගණන වැඩි නම් හෝ එවැනි නීති විරෝධී චර්යා තුළ රඳා පවත්නා කාලය වැඩි නම් හෝ ළමා කාලයේ එකී අත්දැකීම් බහුලව අත්විඳී නම් හෝ ළමයාට අන්තර්ජාලය ප්‍රබල මුලාශ්‍රයක් වී ඇත්නම් අන්තර්ජාල අපරාධකාරී චර්යාවන්

[13] රත්නපාල,නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම 1,(2003),ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්,ගනේමුල්ල.

අභ්‍යන්තරීකරණය වීමට ඇති ඉඩ කඩ වැඩි බව පැහැදිළි වනු ඇත.

ඕනෑම සමාජයක් සතුව සාරධර්ම පවතී. එම සාරධර්ම මත සමාජ පාලනය ගොඩ නැගේ. නමුත් එකී සාරධර්ම බිඳටැටුණු කල සමාජ පාලනය ද බිඳ වැටීමට ලක් වීමෙන් අපරාධ සිදු වන බව සමාජ පාලන න්‍යායවාදීන්ගේ මතයයි. එයින් ගම්‍ය වනුයේ සමාජය විසින් මිනිසා පාලනය කළ යුතු බවයි. එම පාලනය නිවැරදිව සිදු නොවුව හොත් අපරාධ කරුවන් එකී සමාජය තුළින් මතු විය හැකියි. එබැවින් සමාජ පාලනයේ මුලික වගකීමක් සමාජයේ කුඩාම ඒකකය වූ පවුල තුළට හිමි වේ. ළමයින් හෝ යෞවනයින් සිය පවුල් පරිසරයෙන් හෝ වැඩිහිටි පාලනයෙන් හෝ සමාජපාලනයෙන් ගිලිහී ගිය විට අපරාධකාරි චර්යාවන්වලට යොමුවීමට ඇති ඉඩ කඩ වැඩි බව මෙකී න්‍යාය පැහැදිළි කරයි. එය වළකාලීමට නම් දෙමාපියන් හෝ වැඩිහිටියන් ළමයින් හරියාකාරව අධීක්ෂණය, පසුවිපරම් සිදු කිරීම හා රැකබලා ගැනීම සිදු වීම අත්‍යවශ්‍ය බව පෙන්වා දිය හැකිය. සමාජය සතු පුරුෂාර්ථ හා ධර්මතාවලට අනුව ළමයා හික්මවීමත්, ඒවා ආරක්ෂා කිරිමට ළමයා හැඩගැස්වීමත්, ධර්මතා බිඳී ගියහොත් කටයුතු කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව දරුවා පුහුණු කර පැවතීමත් පවුලේ යුතුකමකි. ක්‍රමයෙන් වැඩෙත්ම දරුවා සමාජගත වන අතර එකී සමාජය තුළ අපචාරි චර්යාවන් කරා දරුවන් ඇදීයාම නිරායාසයෙන්ම සිදු විය හැකිය. යම් සමාජයක අඩු සමාජ පාලනයක් පවතී

නම් ළමයින් අපරාධකාරී කටයුතු සඳහා ඇදී යාම වේගවත් විය හැකියි. එබැවින් දරුවන් අයත් සමාජයේ සාධු ධර්මතා ළමයින් තුළට අභ්‍යන්තරීකරණය කිරීම එම ධර්මතා ආරක්ෂා කිරීමට අවශ්‍ය පුහුණුව ලබා තිබීම ඉතා වැදගත් වනු ඇත. ඒ සඳහා ළමයා කරුණු පහක් යටතේ බාහිර සමාජයෙන් එල්ල වන බලපෑම්වලට අභ්‍යන්තරික පාලනය සකසා ගත යුතු බව Reckless[14] පෙන්වා දෙයි.

01. තමා පිළිබඳ ස්ව සංකල්පය යහපත් විය යුතුය

02. ජීවිතයට නිශ්චිත ඉලක්කයක් ගොඩනගා ගෙන තිබීම

03. යථාර්ථවාදී ළඟාවිය හැකි පරමාර්ථ තබා ගැනීම

04. ඉච්ඡාභංගත්වයට මුහුණදීමට හැකි වීම

05. නීතිය සමග අනන්‍යතාවයක් ගොඩනගා ගැනීම

ඉහත කරුණු පහ දුර්වල වුවහොත් ළමයා අපරාධ හෝ අපචාරී චර්යාවන් කෙරේ යොමුවීමට ඇති හැකියාව වර්ධනය වේ. නමුත් මෙම කරුණු පහ ශක්තිමත් නම් බාහිර හා අභ්‍යන්තරිකව ඇති වන බලපෑම් හමුවේ ඉතා ශක්තිමත්ව ඒ සඳහා මුහුණ දෙන අතර ඔහු අතින් අපරාධකාරී චර්යාවන් මතු වීම බොහෝදුරට අඩු වන බව පෙන්වා දෙනු ලබයි.

මෙකී සමාජ පාලන මතවාදය අන්තර්ජාල අපරාධකාරී චර්යා එළිදැකිවීමේදී ද ප්‍රබල උත්පේරකයක්

---

[14] . රත්නපාල,නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම 1,(2003),ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්,ගනේමුල්ල.

සපයන බව ඒ සඳහා යොමු වූ ළමයින්ගේ හා අපරාධකරුවන්ගේ පවුල් පරිසර අධ්‍යයනය කිරීමේ දී පැහැදිළි වේ. මන්ද අන්තර්ජාල අපරාධ සිදු කළ හා අපරාධවලට ලක් වූ ළමයින්ගේ සිද්ධි අධ්‍යයනය කර බැලීමෙන් ඔවුන්ගේ පවුල් හා සමාජ පාලනය බිඳ වැටී ඇති බව මනාව පෙන්නුම් කරයි. එකී ළමයින් සිය සමාජ සාරධර්මවලට පවත්නා ළැබැදියාව, එකී ළමයින්ගේ පවුල් පරිසරය තුළළමයින් රැකබලා ගැනීම,ළමයින් පිළිබඳ පසු විපරම් සිදු කිරීම ආදි පාලන ක්‍රම ශිල්ප ඉතා දුර්වල මට්ටමක පවතින බව පෙනේ. එසේම ලාංකීය සමාජය තුළ අන්තර්ජාලය පිළිබඳව පවත්නා පාලනය මෙන්ම වැඩිහිටියන් තුළ පවත්නා අඩු දැනුම ආදි බොහෝ කරුණු නිසා ළමයින් අන්තර්ජාලය තුළ පාලනය කිරිමට ඇති නොහැකියාව මත මෙකී අපරාධ හා අපචාර ඉහළ යන බවක් පැහැදිළිව දක්නට තිබේ. ජීවිතයට නිශ්චිත ඉලක්කයක් ඇති ළමයෙකු හෝ යථාර්ථවාදි පරමාර්ථ පවත්නා ඇති කිසිවෙකු අන්තර්ජාලය තුළ අසීමිත ලෙස පාලනයකින් තොරව කටයුතු සිදු නොකරනු ඇත. එසේම අන්තර්ජාල අපරාධ දෙස බලන විට එකී අපරාධ බොහෝ විට සිය බලාපොරොත්තු බිඳ වැටීම නිසා මතු වු ඉච්ඡාභංගත්වයේ ලක්ෂණයන් බව දැකිය හැකියි. තවද අන්තර්ජාල භාවිතය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන්නා සේම ලංකීය සමාජයේ සයිබර් අපරාධ පිළිබඳ නීතිමය පසුබිම පිළිබඳවද බොහෝ දෙනෙකුට පවත්නා දැනුමද අල්ප බව පෙනේ. එබැවින් අන්තර්ජාල අපරාධ මෙන්ම අනිකුත් අපරාධකාරී චර්යාවන් පාලනය කිරීම

උදෙසා ද මෙකී කරුණු පහ ට අනුව ළමයින් සමෝධානය කිරීම සෑම සමාජයකම වගකීමක් හා යුතුකමක් වනු ඇත.

යම් සමාජ විරෝධී චර්යාවක් එක් වරක් පමණක් සිදු කරනු ලැබූ පමණින් ඔහු හෝ ඇය සදාතනික අපරාධකරුවෙකු බවට පත්වන්නේ නැත. එහෙත් සමාජය විසින් ඔහුට හෝ ඇයට නිතර නිතර එකී ලේබලය ඇලවීම නිසා සමාජය ඉදිරියේ අපරාධකරුවෙකු ලෙස හන්වඩු ගැසීම සිදු වන බව Backer,Erickson,Kituse (1960)[15] වැනි සමාජ විද්‍යාඥයින් පැහැදිළි කරයි. එය ඔහු එකී අපරාධය තුළ නිතර නිතර නිරතවීමට බලපෑමක් විය හැකිය. එහෙත් ලාංකීය සමාජ සංදර්භය තුළ පුද්ගල ලේබල්කරණයට වඩා අන්තර්ජාලයට ලබා දී ඇති පොදු ලේබලය යහපත් නොවේ. එකී අයහපත් ලේබලය නිසාම අන්තර්ජාලයට පිවිසෙන නවකයින් අන්තර්ජාලය දෙස බලනුයේ වැරදි දෘෂ්ටිකෝණයෙනි. ඔවුන් ඒ තුළ හැසිරෙනුයේ ද ඒකී මතයට අනුව විය හැකිය. එබැවින් ලාංකීය ප්‍රජාවේ අන්තර්ජාල භාවිතය වෙනස් කිරීමට ප්‍රථම අන්තර්ජාලය පිළිබඳ වූ ආකල්පමය වෙනසක් ගොඩනැගීම ඉතා වැදගත් වනු ඇත.

---

[15] . රත්නපාල,නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම 1,(2003),ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්,ගනේමුල්ල.

වෙබර් Weber(1991)[16] සඳහන් කරනුයේ අතීත සමාජය සාම්ප්‍රධායික ආකෘතියකට අනුව ක්‍රියාත්මක වනු ලැබුවත්, වර්තමාන සමාජය එසේ ක්‍රියා නොකරන බවයි. එනම් වර්තමාන සමාජය තර්කානුකූලව සිතා බලා තීරණවලට එලැඹීමේ ප්‍රවණතාවක් පවත්නා බවකි. එකී තර්කානුකූලව සිතා බලා කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නවීණ තාක්ෂණයේ ප්‍රගතිය ද දිනෙන් දින ඉහළ යන බව වැඩි දුරටත් වෙබර් පෙන්වා දෙයි. මෙකී තර්කානුකූල පරිකල්පනය අන්තර්ජාල අපරාධ කෙරෙහිද බලපෑම් කරන බව තාර්කික තේරීමේ න්‍යායවාදීහු පැහැදිලි කරති. ඔවුන්ගේ මතය වුයේ පුද්ගල තනි තීරණ අපරාධ බිහිවීමට බොහෝදුරට බලපෑම් කරනු ලබන බවකි. එනම් පුද්ගලයින්ගේ පෞද්ගලික වාසි ඉලක්ක කරගනිමින් (මුදල් හෝ වෙනත්) ක්‍රියාකිරීමේ දී අපරාධ සිදු විය හැකි බවය. ඉතා හොඳ අධ්‍යාපනයක් හිමි අය මෙන්ම, දැන උගත්කමක් නොමැති එහෙත් තාර්කිකව සිතන්නට හැකි පුද්ගලයින් ද මෙකී අපරාධවල නිරත වන බව වෙබර් පැහැදිලි කරයි. උදාහරණයක් ලෙස මෙතෙක් අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් බොහෝ පිරිසක් සමජයේ ඉහළ අධ්‍යාපනයක් ලද හෝ සාපේක්ෂව යම් දැන උගත්කමක් සහිත තාර්කික බුද්ධියක් හිමි පුද්ගලයින් වන බව විමර්ශන වාර්තා අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ.

---

[16] Weber,Max(1991),The Nature of Social Action in Runciman,W.G.Weber:Selections in Translation,p7,Cambridge University Press,UK

සම්භාව්‍ය සමාජවිද්‍යා න්‍යායවාදීන් ලෙස Comte, Durkhein, Weber, Mart, Pareto, යන විද්‍යාඥයින් බොහෝ කරුණු සමාජ සබඳතා පිළිබඳව ගෙන හැර දක්වනු ලැබුවත් මෙහිදී අවධානය යොමු කරනුයේ Veblen (2003)[17] ගේ මතය වෙතය. මොහුට අනුව "සමාජය වෙනස් වීම කිසි විට නවතාලිය නොහැකිය. එසේම එකී වෙනස තහනම් කිරීමටද නොහැකිය. එබැවින් එක් සමාජ වෙනසක් තවත් සමාජ වෙනසක් නිර්මාණය කරනු ලබන බව පෙන්වා දෙයි. යම් සමාජ වෙනසක් චක්‍රාකාරයෙන් පෙන්නුම් කරනුයේ එකී සමාජයේ තාක්ෂණයයි". මෙම ප්‍රකාශ තුළින් ගම්‍ය වනුයේ සමාජයක් වෙනස් කිරීමේ ප්‍රබල බලපෑමක් තාක්ෂණය සතු වන බවය. වර්තමාන සමාජ ගැටළු බොහොමයක් සමාජය වෙනස්වීමත් සමඟ නිර්මාණය වී ඇති බවත් එකී සමාජ වෙනසට තාක්ෂණය දැඩි බලපෑමක් එල්ල කර ඇති බවත් මේ අනුව පැහැදිලි වේ. අන්තර්ජාලය වර්තමාන සමාජය කිහිප ගුණයකින් වෙනස් කිරිමට බලපෑම් කර ඇති අතර විවිධාකාර ප්‍රශ්න රැසක්ද නිර්මාණය කර තිබේ. අන්තර්ජාල ළමා අපයෝජනයන්ද එහි එක් ප්‍රතිඵලයකි. මෙකී විශ්ලේෂණය හරහා වැඩිදුරටත් පැහැදිලි වනුයේ තාක්ෂණය මිනිසා අතට පත්වීම යනු තවත් අපරාධයක් නිර්මාණය වීමට ඇති ඉඩ කඩ විවර කිරීමක් විය හැකිය. එහෙත් ඒ සඳහා

[17] Brette,Olivier.(2003) Thorstein Veblen's Theory of Institutional Change:Beyond Technological Determinism' European Journal of the History of Economic Thought, Vol 10(3)455-477.

විසඳුම වනුයේ තාක්ෂණය මිනිසා අතට පත්වීම වළකාලීම නම් නොවේ.

විශේෂයෙන්ම සයිබර් අපරාධ පිළිබඳවම අදහස් දැක් වූ සමාජ විද්‍යාඥයෙකු ලෙස Ritzer (2008)[18] මේ පිළිබඳ කදිම අදහස් මතු කරයි. ඔහු සඳහන් කරනුයේ සයිබර් අපරාධ වැඩි වීම කෙරෙහි හේතු හතරක් බලපෑම් කරන බවයි. එනම්;

01. සමාජයේ කාර්යක්ෂමතාව ඉහළ යාම
02. පුද්ගලයින් අතර අනවශ්‍ය විශ්වාසයන් ගොඩ නැගීම
03. ගුණාත්මකභාවයට වඩා ප්‍රමාණාත්මක බව කෙරෙහි වැඩි ඇගයීම
04. මානුෂවාදී නොවන තාක්ෂණය පිළිබඳ විශ්වාසය ඉහළ යාම යන්නයි

නවීන තාක්ෂණය හා අන්තර්ජාලය නිසා සමාජයේ කාර්යක්ෂමතාව කිහිප ගුණයකින් ඉහළ ගොස් ඇත. සන්නිවේදනය වේගවත් වී ඇත. එබැවින් අතීතයට සාපේක්ෂව වර්තමාන ළමා ප්‍රජාව වෙත හොඳ හෝ නරක තොරතුරු ළඟාවීම වේගවත් වී තිබේ. එම තාක්ෂණික ප්‍රගමණය ළමයාගේ සංවර්ධනයට යොදා ගැනීමට නම් ළමයා වෙත ඇදී එන අනවශ්‍ය තොරතුරු සීමා කිරීමට අවශ්‍ය වටපිටාව සකසා තැබිය යුතුය.

---

[18].Ritzer, George (2008).The McDonaldization of Society, pp.351-384,pine Forge Press,Los Angeles.

අනවශ්‍ය විශ්වාසය ඉතා භයානකය. බොහෝ වැඩිහිටියන් මෙන්ම ළමයින් ද සජීවී ලෝකය තුළ මෙන්ම අන්තර්ජාලය හරහා ගනුදෙනු කිරීමේ දී පුද්ගලයින් කෙරෙහි අනවශ්‍ය ලෙස විශ්වාසය තබමින් තම අතිශය පෞද්ගලික කාරණා පවා බෙදාහදා ගැනීමට යාමෙන් විවිධාකාර හිංසාවලට ලක් වී ඇති බව අන්තර්ජාල අපරාධ පිළිබඳව විශ්ලේෂණය කර බැලීමේදී හඳුනා ගත හැකිය.

වර්තමාන සමාජයේ සාරධර්ම හා සිරිත් විරිත් පිළිබඳව පවත්නා ඇගයුමට වඩා මිළ මුදල් මෙන්ම භෞතික සම්පත් කෙරේ තබා ඇති ඇගයුම නිසා මිනිසාගේ හෘද සාක්ෂියට අනුව සානුකම්පිතව කටයුතු කිරීම අඩු වී ගොස් තිබේ. එබැවින් බොහෝ විට සහකම්පනයෙන් තොර සමාජ සබඳතා හරහා අපරාධ ඉහළයාම නිතැතින්ම සිදු විය හැකිය.

තාක්ෂණය යනු හිතක් පපුවක් ඇති යමක් නොවේ. එය දෙන විධානයට අනුව කටයුතු කරන මෙවලම් රැසකින් තැනී ඇත. නමුත් එය භාවිතා කරන්නා තුළ හිතක් ඇත. හදවතක් ඇත. සංවේදී සිතුවිලි ඇත. එකී මානුෂවාදී ගුණාංග පසෙක ලා මානවවාදී නොවන තාක්ෂණය කෙරේ දැඩි විශ්වාසයක් තබා කටයුතු කිරීමට යාමෙන් අන්තර්ජාල හිංසා සිදු වීමට ඇති ඉඩකඩ වර්ධනය විය හැකිය. ඒ අනුව Ritzer ඉහත කරුණු හතර අන්තර්ජාල හිංසාවන් හී තීව්‍රතාවය වැඩි කිරීමට සමත් වන බව පැහැදිලි කරයි.

The Routing Activity Theory හෙවත් මාර්ගගත ක්‍රියාකාරී අදහස ඉදිරපත් කළ කොහේන් සහ ෆෙල්ෂන් (Cohen/Felson,1979)[19] ප්‍රකාශ කරනුයේ අපරාධයක් සිදු කිරීම සඳහා කරුණු තුනක් බලපෑම් කරන බවයි. එනම්;

01. අපරාධයට පෙළඹවීමක් ඇති අයෙකු සිටීම
02. ඒ සඳහා සුදුසු ඉලක්කයක් පැවතීම
03. එකී වරද වළක්වා ගත හැකි දක්ෂ ආරක්ෂකයෙකු නොමැති වීම

යන කරුණු ත්‍රිත්වය කාලය හා අවකාශය සමඟ සංචලනය වන විට අපරාධ සිදු විය හැකි බවකි. මෙම අදහස තව දුරටත් පැහැදිළි කිරීමේ දී යමක් වැරදි ලෙස වටහා ගත් අපරාධකරුවෙකු විසින් ඒ සඳහා සුදුසු ගොදුරක් සමඟ ඉලක්කගත වී ඇති විට එකී අපරාධය වැළැක්වීම සඳහා දක්ෂ ආරක්ෂකයින් එකී සිද්ධිය වටා නොමැත්තේ නම් අපරාධයක් සිදු වීමට ඉඩ කඩ පවත්නා බව මෙවුන්ගේ අදහසයි. මෙකී සාධක තුනෙන් එකක් හෝ නොමැති වූ විට අපරාධයක් සිදු වීමට ඉඩ කඩක් නොමැති බව මෙහිදී විග්‍රහ වේ.

- අපරාධයකට පෙළඹුණ අපරාධකරුවෙකු සිටින මුත් ඒ සඳහා සුදුසු ගොදුරක් පවතින මුත් එම වරද

19.Behzat Yucedal,VICTIMIZATION IN CYBERSPACE: AN APPLICATION OF ROUTINE ACTIVITY AND LIFESTYLE EXPOSURE THEORIES,2010, pp,28-31

වළක්වාලන්නට හැකියාව ඇති දක්ෂ ආරක්ෂකයින් සිටී නම් එකී වරද සිදු නොවිය හැකිය.

- අපරාධකාරී හැඟීම් ඇති අයෙකු සිටින මුත් අපරාධය වළක්වාලිය හැකි දක්ෂ ආරක්ෂකයින් නොසිටි මුත් ඒ සඳහා සුදුසු ඉලක්කයක් නොමැත්තේ නම් අපරාධ සිදු නොවනු ඇත.
- සුදුසු ඉලක්කයක් හා දක්ෂ ආරක්ෂකයින් නොමැති මුත් අපරාධයකට පෙළඹවිය හැකි අපරාධකරුවෙකු නොමැත්තේ නම් එවිට ද අපරාධ සිදු නොවනු ඇත.

සයිබර් අපරාධ සම්බන්ධයෙන් මෙකී අදහස විමසා බැලීමේ දී අපරාධකාරී ගොදුරු සොයන්නෝ අන්තර්ජාලය තුළ කොතෙකුත් සැරිසරති. එසේම සුදුසු ගොදුරු ද අන්තර්ජාලය තුළින් නිතැතින්ම ඉලක්ක ගත කර ගත හැකිය. එහෙත් ඒම අපරාධයන් වළක්වාලිය හැකි සුදුසු දක්ෂ ආරක්ෂකයින් ප්‍රමාණවත් මට්ටමකින් ශක්තිමත් වී ඇති බවක් නොපෙනේ. එය වර්තමාන සයිබර් අපරාධ සිදුවීම උදෙසා ප්‍රබලව බලපෑම් කෙරෙන බව පැහැදිළිය. මෙකී ආරක්ෂක පද්ධතිය තාක්ෂණික ආරක්ෂක ජාලයන් හා තාක්ෂණික නොවන ආරක්ෂක ජාලයක් ලෙස හඳුනාගත හැකි අතර ඒ තුළ නීතිය, නීතිය ක්‍රියාත්මකවීම, අචාරධර්ම පද්ධති, අධීක්ෂණයන් හා වැළැක්වීමේ ආරක්ෂක මෙවලම් සුදුසු මට්ටමක නොමැතිවීම සයිබර් අපරාධ සිදුවීම උදෙසා ක්‍රියාත්මක වන බව මෙකී න්‍යාය මත පැහැදිළි කළ හැකිය.

පශ්චාත් නූතනවාදී සමාජයක පවත්නා ලක්ෂණ පිළිබඳව විමසා බැලීමේදී එකී සමාජයක ජනයා අන්තර්ජාලය හා සම්බන්ධ ක්‍රියාකාරකම් තුළ බහුලව නිරත වන බවත්, හැඟීම්වලට පවත්නා ඉඩ ප්‍රස්ථා ඉතා අවම මට්ටමක පවත්නා බවත්, ඒ වෙනුවට තාක්ෂණය හෝ තාක්ෂණික උපකරණවලට වැඩි වශයෙන් සමීප වී ඇති බවත් පැහැදිළි කරයි. එසේම ඓතිහාසික කාරණා සඳහා ඇති අවධානය අඩු වෙමින් පවත්නා බවත් පශ්චාත් නූතනවාදි සමාජයක් තාක්ෂණය මත පදනම් වන බවත් මොවුන්ගේ මතය වේ (Jamsan-1991)[20]. සැබැවින්ම වර්තමානය තාක්ෂණය මත රඳා පවතී. එබැවින් මෙම යුගයේ හැදී වැඩෙන ළමයා තාක්ෂණයෙන් දුරස් කර ගොඩනැගීම යනු අනුවනකමකි. එහෙත් තාක්ෂණික ලෝකය තුළ අතරමං වීමට ඉඩ නොදී සමාජ ප්‍රතිමාන හා අගයන්වලින් සුපෝෂිතව තාක්ෂණික ඥාණය උකහාගත් ළමයෙකු තැනීම මෙකී සමාජය හමුවේ ඇති අභියෝගයකි.

ඉහතින් සඳහන් කළ විවිධ න්‍යායාත්මක මතවාද පිළිබඳ නොයෙකුත් විවේචන පැවතියද අපරාධකරුවන් නිර්මාණය වීම, අපරාධ සිදු වීමේ ස්වභාවය හඳුනා ගැනීම හා අපරාධවලට බල පවත්නා හේතු සොයා බැලීම සඳහා ඒවා භාවිතයට ගත හැකිය. සයිබර් අපරාධ පිළිබඳව වෙනස් වූ න්‍යායයන් නොමැතිව වුවද මෙකී ගැටළුව පුළුල්ව දැකීමට

---

[20] .jameson,Fredric(1991) postmodernism,Or the Cultural Logic of Late Capitalism, pg IV,Duke University Rress.

ඉහතින් විස්තර කරන ලද පොදු න්‍යායයන් අවකාශය සලසනු ඇත.

02.2. සයිබර් අපරාධ පිළිබඳ න්‍යායවාදී අදහස්

ජයශංකර් (Jaishankar k.) (2008)[21] පෙන්වා දෙනුයේ මිනිසා එක් අවකාශයක සිට තවත් අවකාශයකට සංක්‍රමණයවීමේදී වෙනස් ලෙස හැසිරෙන බවයි. එය අවකාශීය සංක්‍රාන්ති න්‍යාය (Space Transition Theory) ලෙස හඳුන්වා දෙන අතර සයිබර් අපරාධ සම්බන්ධයෙන් පොදු න්‍යායයන් යටතේ විමසා බැලීම ප්‍රමාණවත් නොවන බව පෙන්වා දෙමින් ඒ සඳහා සුවිශේෂී න්‍යායක් ලෙස මෙම න්‍යාය ඉදිරිපත් කරයි. අපරාධ විද්‍යාව (Criminology) වින්දිතවිද්‍යාව (Victimology) සමාජ විද්‍යාව (Sociology) පරිගණක තාක්ෂණවේදය (Computer Science) අන්තර්ජාල තාක්ෂණවේදය (Internet Science) වැනි බහුවිධ විද්‍යාවන් රැසක් සම්බන්ධ කරමින් "සයිබර් අපරාධවිද්‍යාව (Cyber Crimenology) නමින් අලුත් විෂය ක්ෂේත්‍රයක් හඳුන්වා දෙමින් මෙම න්‍යාය ඉදිරිපත් කරයි.

මෙම සංකල්පය ළමා අපයෝජන සම්බන්ධයෙන් ද සලකා බැලිය හැකිය. ළමා අපයෝජන සඳහා ඉඩකඩ නොමැති අවකාශයක සිට අපයෝජන සඳහා ඉඩකඩ ඇති

---

[21] .Jaishankar,k (2007)Establishing a Theory of Cyber Crime,pg7-9 International Journal of Cyber Criminology Vol 1 Issue 2

අවකාශයකට හෝ රටකට සංක්‍රමණයවීමේදී එය පැහැදිළිව හඳුනා ගත හැකිය. අන්තර්ජාලයද අවකාශයකි. භෞතික සමාජයේ ජීවත් වන අප අන්තර්ජාල සමාජයට යොමු වීමේදී අපගේ අනන්‍යතාවය යම් මට්ටමකින් වෙනස් ස්වභාවයකට පරිවර්ථනය වන බව අන්තර්ජාලය පරිහරණය කරන්නෙකු හට අවබෝධ වනු ඇත. එපරිද්දෙන්ම යමෙකු භෞතික සමාජයේ ඉතා හික්මුණු පුද්ගලයෙකු ලෙස කටයුතු කළද සයිබර් අපරාධ සහිත අන්තර්ජාල අවකාශයකට මාරුවීමේදී එකී අපරාධ අරමුණු කර ගනිමින් කටයුතු කරනවා විය හැකිය. ජයශංකර් ඔහුගේ අවකාශීය සංක්‍රාන්ති න්‍යාය අනුව පුද්ගලයෙකු සයිබර් අපරාධ සිදු කිරීමට තුඩු දෙන වෙනස් ලෙස හැසිරීමේ හේතු කිහිපයක් ඉදිරිපත් කරයි. එකී සාධක සයිබර් අපරාධ සිදු වන ආකාරය අවබෝධකර ගැනීමට උපකාරී වේ.

01- බොහෝ පුද්ගලයින්ගේ තත්ත්වය හා තනතුරු හේතුවෙන් භෞතික පරිසරයේදී සිත තුළ ගොඩ නැගෙන අපරාධකාරී සිතුවිලි ඉටු කර ගැනීමට නොහැකිව යටපත් කර ගනු ඇත. එකී මර්ධනය කළ සාපරාධී සිතුවිලි සයිබර් අවකාශය හරහා සාපරාධී හැසිරීම් ලෙස මුදා හැරිය හැකි බව ජයශංකර් පෙන්වා දෙයි.

02- අන්තර්ජාලය හරහා කටයුතු කිරීමේ දී පුද්ගලයින්ගේ අනන්‍යතාවය හෙළි නොවීම, නිර්ණාමිකව කටයුතු කළ හැකි වීම, ප්‍රතිවිපාක නොමැති වීම වැනි හේතු

මත අපරාධකරුවන් සයිබර් අපරාධ සිදු කිරීමට පෙළඹෙන බවත්

03- භෞතික අවකාශයේ පුද්ගල සාපරාධී හැසිරීම් සයිබර් අවකාශයට රැගෙන යාමෙන් මෙන්ම සයිබර් අවකාශයේ සාපරාධී හැසිරීම් භෞතික අවකාශයට රැගෙන ඒමෙන් සයිබර් අපරාධ සිදු වන බවත්

04- සයිබර් අවකාශයේ ඇති ක්ෂණිකව වෙනස් වනසුළු ගතික ස්වභාවය හා සයිබර් අපරාධකරුවන්ගේ ඇති කූට බව නිසා සයිබර් අපරාධවලින් බේරී පලායාමට ඇති හැකියාව නිසාත්

05- භෞතික ලෝකයේ අපරාධ සිදු කිරීමේ අටියෙන් සයිබර් අවකාශය තුළ එකතු වීමත් භෞතික ලෝකයේ එකතු වූ අය එක්ව සයිබර් අවකාශයේ අපරාධ සිදු කිරීමත්

06- විවෘත සමාජයේ සිටින පුද්ගලයින්ට වඩා සංවෘත සමාජයේ සිටින පුද්ගලයින් අතින් සයිබර් අපරාධ සිදු විය හැකි බවත්

07- භෞතික ලෝකයේ ප්‍රතිමාන සහ අගයන් සමඟ සයිබර් අවකාශයේ ප්‍රතිමාන සහ අගයන් අතර ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස සයිබර් අපරාධ සිදු වන බවත්

යන කරුණු හත මත පදනම්ව සයිබර් අපරාධ සිදු වන බව අවකාශීය සංක්‍රාන්ති න්‍යායවාදීන්ගේ අදහස් සංක්ෂිප්තව පැහැදිලි කළ හැකිය.

සමාජ ජාල වෙබ් අඩවි බහුල ලෙස භාවිතය සඳහා බොහෝ විට හුදකලාව ජීවත් වන පුද්ගලයින් ඇදීයාමේ ප්‍රවණතාවක් පවත්නා බවට ජාලගත න්‍යායවාදීන් (Net Work Theory) පෙන්වා දෙයි. එහිදී ඔවුන් අවධාරණය කරන්නේ එසේ ඇදගනු ලබන අය විසින් අපගාමී චර්යා සඳහා නැඹුරුවීමට ඇති ඉඩ කඩ වැඩි බවයි. අන්තර්ජාල හිංසාවන් සිදු කරන බොහෝ දෙනෙකු පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී අනාවරණය කරගැනීමට හැකි වූයේ ඔවුන් සමාජ සම්බන්ධතාවලින් දුරස්වූ හුදකලා ජීවිතයකට පුරුදුවූ පුද්ගලයින් මෙන්ම විවිධ/විකල්ප විනෝදාංශ නොමැති එළිමහන් ක්‍රීඩා කටයුතුවලට අඩු සහභාගීත්වයක් සහිත හෝ සමීප සබඳතා බිඳවැටුණු හුදකලා පුද්ගලයින් වන බවය.

තුන්වන පරිච්ඡේදය



ළමයින්ට එරෙහිව ක්‍රියාත්මක වන සයිබර් අපරාධ හඳුනා ගැනීම

03.1.Online හා Offline අපයෝජනයේ වෙනස

අපයෝජනය යන වචනය සමාජය අතරට පත්වුයේ මෑත කාලයේ වුවත් ළමයින් අපයෝජනයට පත්වීම මිනිස් ප්‍රජාවේ ආරම්භයේ පටන් මේ මිහිතලය මත පැවති බව අසන්නට ලැබේ. එය විවිධ සමාජවල හා විවිධ සංස්කෘතීන් තුළ විවිධ මට්ටමින් තිබූ බවට සාක්ෂි ඇත. මීට වසර දෙදහස් හයසියයකට පෙර බුදුන් දවස භාරතයේ "සුනීත හා

සෝපාකගේ" කථා වස්තු, "මට්ට කුණ්ඩලීගේ" කතා වස්තුව පිළිබඳව බෞද්ධ සමාජය අසා ඇත. එසේම ඉන්දියාවේ " දේවදාසි" හා නේපාලයේ "දේවුකී" ලෙස කෝවිල් තුළ ලිංගික වහලියන් බවට පත්කර සිටි කුඩා ගැහැණු දරුවන් පිළිබඳ හිංසනය හිංදු සාහිත්‍යය පසක්කරයි. එසේම පකිස්ථානයේ "බාල්කි" ලෙසත් ඇෆ්ගනිස්ථානයේ "අෂ්නාස්" ලෙසත් රැවුල නොවැඩුණු පිරිමි ළමයින් ලිංගික කටයුතුවලට යොදා ගත් ආකාරය පිළිබඳව උක්ත ප්‍රදේශවලිනුත් සාක්ෂි ලැබේ. බටහිර ලෝකයට වන්නට ස්ත්‍රී පුරුෂ ළමා ගණිකා නිවාස 19 සියවසයේ යුරෝපය පුරා පැවතුණු බවට සාධක හමු වේ. මිසරයේ ආගමික ව්‍යවහාරයක් ලෙස සිය ප්‍රථම මාස් ශුද්ධිය තෙක් ගණිකා වෘත්තියේ නිරත වීමට ළමයින් යොදා ගත් බවටත් රෝමයේ තරුණ පිරිමි ළමයින් ලිංගික උත්තේජනය සඳහා යොදා ගත් බවටත් වැඩිදුරටත් සාක්ෂි මතු කරයි.

නමුත් සමාජය දියුණුවත්ම මේ පිළිබඳව අවධානය යොමු විය. මෙකී ක්‍රියාවන් හිංසනයක් බවට හඳුනා ගැනීමත් සමඟ විවිධ වැළැක්වීමේ ක්‍රම උපායන් කාලාන්තරයක් පුරා පැවතියද වර්තමානයේත් ළමා හිංසනය විවිධ මට්ටම්වලින් ක්‍රියාත්මකව පවතී. එකී ක්‍රියාවලිය ළමා අපයෝජනය ලෙස අර්ථකථනය කර ඇති අතර "සියලු ආකාරයේ කායික මානසික අඩු සැලකීම හෝ අනිසි ලෙස සැලකීම ලිංගික අපයෝජනය, නොසලකා හැරීම හෝ වානිජ හෝ වෙනත් අකාරයේ සූරාකෑමක් නිසා පැවැත්ම සංවර්ධනය, ගෞරවය

පිළිබඳ වගකීම විශ්වාසය හෝ බලයට බලපානු ලබන්නා වූ සත්‍ය හෝ විය හැකි තත්තවයකි. දෙමාපියන් හෝ වෙනත් රැකබලාගන්නන් විසින් කරනු ලබන ඕනෑම ආකාරයේ ක්‍රියාවක් හෝ නොකර හැරීමකි. ළමා නිවාසයකදී, වෙනත් ආයතනයකදී, ජාලයකදී හෝ ළමයින් ගැවසෙන ප්‍රජාවක දී මෙවැනි අපයෝජන විය හැකිය”.[22](ලෝක සෞඛ්‍ය සංවිධානය) ඒ අනුව ළමයින්ට විරුද්ධව සිදු වන ළමා අපයෝජනය මූලික කොටස් හතරකි.

01 කායික අපයෝජනය (Physical Abuse)

02 මානසික අපයෝජනය (Mental Abuse)

03 ලිංගික අපයෝජනය (Sexual Abuse)

04 නොසලකාහැරීම (Neglect)

එකී කොටස් හතරයි.

නමුත් මෙකී අපයෝජන සිදුවීමේ ප්‍රමාණය, සිදුවීමේ වේගය, සිදු කරන උපක්‍රම, එහි තීව්‍රතාව හා ගතිකත්වය කලින් කලට වෙනස් වීමක් දැකිය හැකිය. එබැවින් මීට වසර දහයකට පෙර ළමා අපයෝජනයක් සිදු වූ ආකාරයටම වර්තමානයේත් සිදුවේ යැයි සිතිය නොහැක. සමාජය වෙනස්වත්ම ළමා අපයෝජකයින් ද ළමයින් හිංසනයට ලක් කරන ආකාරය වෙනස් කරන බව පෙනේ. එහිදී ඒ සඳහා පවත්නා තාක්ෂණය අවභාවිතයට ගනු ලබන බවක් පෙනෙන්නට

---

[22] ලෝක සෞඛ්‍ය සංවිධානය -

ඇත. තාක්ෂණයේ නවතම දිශානතිය වූ තොරතුරු තාක්ෂණය දියුණුවත්ම අන්තර්ජාලය මාධ්‍යයක් කරගනිමින් වර්තමානයේ ළමා අපයෝජකයින් සිය අපයෝජන කාර්යය වඩාත් සුමට කරගෙන ඇති බවක් දක්නට ඇත. එබැවින් වර්තමාන සමාජයේ හැදී වැඩෙන අන්තර්ජාලය භාවිතා කරන ළමා ප්‍රජාව අවධානම් සහිත ළමයින් ලෙස හඳුනා ගත හැකිය.

මෙකී අවධානම ලෝකයේ දියුණු රටවල් තුළ කලක පටන් දක්නට ලැබුණ මුත් ශ්‍රී ලංකාව වැනි රටවලට එහි බලපෑම මෑතකාලීනව බහුලව දැනෙන්නට විය. එය පහත සංඛ්‍යා ලේඛන මගින් පැහැදිළිව හඳුනා ගත හැකිය. ලෝකයේ විශාලතම අන්තර්ජාල භාවිතා කරන්නා වූ බටහිර ලොකය පරදා වර්තමානය වන විට ආසියානු කලාපය එකී තැනට පත් වී ඇත. අන්තර්ජාලය භාවිත කරන්නන්ගෙන් 50.2% ප්‍රමාණයක් ජීවත් වනුයේ ආසියාතික කළාපයේය. (Internet World Stats- 2016) එකී වර්ධනයත් සමගම ළමා අපයෝජන බල ප්‍රදේශවලින් (වෙබ් අඩවි පදනම් වූ ප්‍රදේශ) 7.4% පිහිටා ඇත්තේ ද ආසියාතික කළාපයේය (Internet World Stats- 2003). සෑම සතියකම ළමා අසභ්‍ය ජායාරූප 20000 ට අධික සංඛ්‍යාවක් අන්තර්ජාලය හරහා ප්‍රදර්ශනය වන බවට කරුණු සනාථ කරනු ලබයි (Renold etal,2003). එක්සත් ජනපදයේ අතුරුදහන් වූ සහ සූරාකන ළමයින් පිළිබඳ මධ්‍යස්ථානය විසින් කරන ලද අධ්‍යයනයකට අනුව අනවශ්‍ය අන්තර්ජාල ලිංගික ආයාචනා සෑම යෞවනයින් 7

දෙනෙකුගෙන් එක් අයෙකුට ලැබෙන බවත් සෑම යෞවන ළමයින් 11 ක ගෙන් එක් අයෙකු අන්තර්ජාලය හරහා හිංසනයට පත් වී ඇති බවත් අනාවරණය කර තිබේ. මෙකී සංඛ්‍යාවන් දකුණු ආසියාතික කළාපයට වන්නට හෝ ශ්‍රී ලංකාව දෙසට වන්නට වෙනස් ස්වභාවයක් ගන්නා අතරම මේ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා ඉහත පළමු පරිච්ඡේදය බලන්න.

අන්තර්ජාල ළමා අපයෝජන කලින් කලට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට, සමාජයෙන් සමාජයට, වෙනස් ස්වභාවයක් ගන්නා බවත්, යම් සමාජයක පවත්නා තාක්ෂණය එකී සමාජය වෙනස් තත්තවයකට පත් කරීමෙහි ලා විශාල කාර්ය භාරයක් ඉටු කරන බවත් ඉහත සංඛ්‍යා ලේඛනවලින් විද්‍යමාන වේ. එහිදී තාක්ෂණයේ ස්වභාවයට වඩා එකී තාක්ෂණය අත්පත් කරගන්නා ස්වභාවය මෙහිදී වෙසෙසින් කැපී පෙනේ. බටහිර ලෝකයට වඩා ආසියාතික ලෝකය තාක්ෂණය අත්පත් කරගන්නා ආකාරය වෙනස් විය හැකි අතරම දකුණු ආසියාව ඊට වෙනස්ම වූ ආකාරයකින් තාක්ෂණය භාවිතයේ යෙදවිය හැකි ය. ශ්‍රී ලංකාව තුළ ද අන්තර්ජාල තාක්ෂණය බහුලව ප්‍රචලිත වීමත් සමග අප ජීවත්වන ආකාරය වර්තමානයේ වෙනස් වෙමින් පවතී. එම වෙනස් වීමේ සීඝ්‍රතාවයේ ඉදිරියෙන්ම සිටිනුයේ ළමුන් හා යෞවනයින්ය. මන්ද ඔවුන් වැඩිහිටි පරපුරට වඩා වෙනස් ආකාරයෙන් නවීන තාක්ෂණය දෙස බැලීමට පුරුදුව සිටීම යි. අන්තර්ජාලය ඉතා භයානක අවධානම් සහගත මෙවලමක්

හෝ අධ්‍යාපනික මෙවලමක් ලෙස වැඩිහිටි පරපුර හඳුනාගෙන පැවතිය ද ළමයින් හා යෞවනයින් මෙය අත්පත්කර ගෙන සිටිනුයේ සමාජ අනුයෝජනයේ තවත් එක් මෙවලමක් ලෙස යි. ළමයින් හා යෞවනයින් අන්තර්ජල තාක්ෂණය භාවිත කරමින් විවිධ සබඳතා පවත්වාගෙන යාමටත්, සමාජගත වීමටත්, විනෝදවීමේ, පාලුව, තනිකම මකා දැමීමේ මෙවලමක් ලෙසත් එයට ජීවයක් සපය යි. එකී දැනුමේ පරතරය හා පරම්පරා පරතරය තුළ මෙකී ගැටළුව ළමයින් යෞවනයින් හා වැඩිහිටියන් අතර දෝළනය වෙමින් පවතී.

දකුණු ආසියාතික කලාපය තුළ ද අන්තර්ජාල ළමා අපයෝජන බල ප්‍රදේශයක් නිර්මාණය වෙමින් පවතී. එයට මුලිකවම බලපානු ලබනුයේ මෙකී කලාපය තුළ බිම් මට්ටමේදී ද ළමා අපයෝජන බහුලව සිදු වීමේ වැඩි නැඹුරුතාවක් පැවතීම යි. එම ළමා අපයෝජන මානසිකත්වය හා අපචාරී මානසිකත්වය වඩාත් ලෙහෙසියෙන් හා පහසුවෙන් අන්තර්ජාලය ඔස්සේ මුදා හැරීමට පවත්නා ඉඩකඩ වැඩි වීමත් සමග මෙකී ගැටළුව උග්‍ර තත්තවයට පත් ව ඇත. අතිත් පසින් අපයෝජන අත්දැකීම් සහිත හෝ අපයෝජන අවධානම් සහිත ළමයෙකු අන්තර්ජාලයට පිවිසෙන්නේ නම් එකී ළමයාද අන්තර්ජාලය තුළ හිංසනයට ගොදුරුවීමේ ඉඩ ප්‍රස්ථා ඉහළ අගයක් ගනී. මන්ද පෙර අපයෝජන අත්දැකීම් සහිත ළමයි තුළ ගොඩ නැගෙන;

- චිත්තවේගික වශයෙන් නොමේරූ හෝ ලැජ්ජාශීලී බව
- පහළ ආත්ම සම්මානනය
- සම වයස් සගයින් පිළිබඳ ගැටළු මතු වීම
- කරදරයට හෝ විෂාදයට පත්ව සිටීම
- වැඩිහිටි තත්තවයට දැඩි ගරු කිරීමක් හෝ දැඩි හික්මීමක් පැවතීම
- අපේක්ෂා කරන ත්‍යාගයක් සඳහා හෝ වරප්‍රසාද සඳහා දැඩි කැමත්ත

වැනි මානසිකත්වයන් අන්තර්ජාල ළමා අපයෝජකයින්ට ද ළමයා ඒ සඳහා නැඹුරුකර ගැනීමට පහසු වටපිටාවක් සපයයි. මීට අමතරව දරිද්‍රතාවයෙන් පෙළෙන ළමයින් පවුලේ අධීක්ෂණයෙන් ගිලිහුණ ළමයින්, පවුල තුළ හුදකලා වූ ළමයින්, ආදරය සෙනෙහස අහිමි ළමයින් ද තමාට අහිමිවීමේ රික්තකය අන්තර්ජාලය හරහා සපුරාලීමට යාමෙන් විවිධ හිංසකයින්ගේ ගොදුරක් බවට පත් විය හැකිය.

අපගේ දරුවන් වටා ඇති හිස් අවකාශය පවා වර්තමානයේදී දරුවා අනතුරට ලක් කළ හැකිය. මන්ද සයිබර් අවකාශය යනු හුදු හිස් අවකාශයක් නොවේ. ඒ තුළ ද ළමා අපයෝජන අවධානම් සාධක රැසක් ගැබ්ව තිබේ. අතීතයේ ළමා අපයෝජකයින් කඩපිල්, බස්නැවතුම්, පාසල්, නිවෙස්, අවන්හල්, මහමග හෝ වෙනත් භෞතික ස්ථානයක රැඳී සිටිය ද වර්තමානයේ එය එසේ ම සිදු නොවේ. ළමයින් ඩැහැගැනීමේ ගොදුරු සොයන්නෝ බොහොමයක් අද වන

විට නවීන තාක්ෂණය භාවිතා කරමින් සයිබර් අවකාශය තුළ සැරිසරති.

සජීවී ලෝකය තුළ බිම් මට්ටමේ දී භෞතික වශයෙන් ඇති වන (Offline)ළමා අපයෝජන ක්‍රියාවලියත්, සයිබර් අවකාශය තුළ(Online) ඇති වන ළමා අපයෝජන ක්‍රියාවලියත් අතර විවිධ සමානකම් හා අසමානකම් රැසක් දක්නට ලැබේ. බිම් මට්ටමේ දී ඇති වන ළමා අපයෝජන කායික, මානසික, ලිංගික හා නොසලකා හැරීම යන ආකාර හතර ඔස්සේම සිදු වුවද, අන්තර්ජාලය හරහා වැඩි වශයෙන් සිදු වනුයේ මානසික හා ලිංගික අපයෝජන වීම පැහැදිළිව දැක ගත හැකි ය. විශේෂයෙන්ම ලිංගික අපයෝජන පිළිබඳව අවධානය යොමු කිරීමේ දී බිම් මට්ටමේ දී ඒ සඳහා ළමයෙකු හා අපයෝජකයෙකු නෙතට නෙත මුණ ගැසිය යුතු ය. නැතහොත් සමීප හමුවීමක් පැවතිය යුතු ය. නමුත් අන්තර්ජාල ළමා ලිංගික අපයෝජනයේ දි ඔවුන් භෞතිකව මුණ ගැසීමට අවශ්‍ය නොවේ. මන්ද ලිංගික අපයෝජන ස්පර්ශයක් සහිතව මෙන්ම ස්පර්ශයක් රහිතව ද සිදු විය හැකි බැවිනි. එබැවින් මෙම වෙනස හඳුනාගැනීම සඳහා ස්ග්‍රොයි ගේ (Sgroi-1988)[23] ලිංගික වරදක් සිදු කිරීමේ ගතිකත්වය හඳුනා ගැනීම සඳහා හඳුන්වා දුන් අවධි පහකින් යුත් ආකෘතිය විමසා බලමු.

[23] .ෆෙයාර්හොල්ම් ජූඩ්, සහ සිං ගුරුවින්දර්,අපි සුරකෙමු,ප්‍රධාන පුහුණුකරුවන්ගේ අත්පොත,කැනේඩියානු රතුකුරුස සමාජය,(2008).

01 පළමු අවධිය - ළමයා එකී කාර්යයට හවුල් කර ගැනීම

උප අවධිය - වින්දිතයෙකු බවට පත්කර ගත හැකි කෙනෙකු ඉලක්ක කරගනී

ඒ සඳහා අපයෝජකයා ළමයා අනතුරු අවදානමක සිටීදැයි මූලිකව නිරීක්ෂණය කරයි. ළමයාගේ රහස්‍යභාවය සුරැකීමේ විශ්වාසනීයත්වය පරීක්ෂා කරන මොහු ළමයා පහසුවෙන් ග්‍රහණයට ගත හැකි ලක්ෂණ පරීක්ෂා කරයි. ඒ අනුව ළමයා සමග මිත්‍රත්වයක් ඇති කර ගනිමින්, තම මගපෙන්වීම් පිළිගැනීමට හැකි වන ලෙස ළමයා හැඩගස්වා ගනිමින්,ළමයා කෙරෙහි ප්‍රිය මනාප බවක් පෙන්නුම් කරමින්, සියුම් පාලන ක්‍රමයක් යොදා ගනු ඇත. මෙකී මුල් අදියරේ දී අපයෝජනය සඳහා මූලික අඩිතාලමක් යොදා ගනිමින් ළමයා සිය ග්‍රහණයට ගනී.

උප අවධිය - විශ්වාසය හා මිත්‍රත්වය ගොඩ නැගීම

මෙහිදී ළමයා කෙරෙහි මිත්‍රත්වයක් දක්වමින්, සුවිශේෂත්වයක් පෙන්නුම් කරමින් ළමයාට ත්‍යාග හා ප්‍රධාන ලබාදෙයි. ළමයා සමග කාලය ගත කරයි. එසේම තනිව ගත කිරීමේ අවස්ථා උදා කර ගනී. සෑම හමුවීමක් සඳහාම කොන්දේසි තීරණය කර ගනිමින්,ළමයාට සවන් දෙමින්, අමතර අවධානයක් සපයමින්, තමා කෙරෙහි යැපීමට අවශ්‍ය පරිසරය සකසමින්, අවසානයේ දී කේවල් කිරීම ආරම්භ කරයි.

උදා:- "මම ඔයාට මේ උදව්ව කළ නිසා ඔයා මට මේක කරන්න ඕනි"

උප අවධිය - පක්ෂපාතීත්වය ගොඩනංවා ගනී, හුදකලා කරයි, පාලනය කරයි

ළමයාගේ අවධානය ලබා ගැනීම සඳහා එක් අවස්ථාවක ප්‍රීතිය හා බලාපොරොත්තු ඇති කරවන අතර තවත් අවස්ථාවක විවේචනය කරයි. ඒත් සමගම ළමයාගේ කැපවීම පක්ෂපාතී බව සුළු පරීක්ෂණ මගින් පරීක්ෂාවට ලක් කරයි. ඒත් සමගම ළමයා වැදගත් පුද්ගලයින්ගෙන් හුදකලා කරයි. අතීත සම්බන්ධතා හා සහයන් පහත් කොට සලකමින් දෙමාපියන්ගෙන් හෝ රැකබලා ගන්නන්ගෙන් යැපීම විවේචනය කරයි. එසේම සම වයස් කණ්ඩයම්වලට ප්‍රවේශ වීමට ඇති අවස්ථා මෙම අවධියේ දී සීමා කරයි.

02. දෙවන අවධිය - ලිංගික ක්‍රියාකාරකම්

උප අවධිය- මුල පිරීම

මෙම අවධියේ දී ක්‍රමයෙන් අපැහැදිළි ලිංගික ක්‍රියාවලින් ප්‍රවේශවීම සිදු වන අතර ආදරයෙන් කරන අතගෑම්වල සිට ඉතාමත් සුහද ලිංගික ක්‍රියාකාරකම් දක්වා මෙය වර්ධනය කර ගනී. එහිදී පගාව (වාචික/භෞතික) පීඩනය, දඬුවම්, දොස් තැබීම්, රැවටීම් සහ ලැජ්ජාව හරහා

සහයෝගය ඇයැද සිටිමින් ලිංගික ක්‍රියාකාරකම් නැවත නැවත සිදු කරනු ඇත.

03. තුන්වන අවධිය - රහස්‍යභාවය

උප අවධිය- උපාය මාර්ග

මුදල් ත්‍යාග හෝ විවිධ වරප්‍රසාද ලබා දෙමින් හෝ ළමයාට ආරක්ෂාව පිරිනමමින් හෝ ළමයාට නිගරු කරමින් හෝ තර්ජනය කරමින් මෙකී ක්‍රියාවලිය දිගින් දිගටම සිදුකිරීමට අවශ්‍ය වාතාවරණය ගොඩනගා ගනී.



(Mathews,1993)

රූප සටහන් - 01

ලිංගික අපරාධයක් සිදු කිරීමේ චක්‍රය වේගයෙන් හෝ එකවර හෝ දීර්ඝ කාලයක් මුළුල්ලේ පැවතිය හැකිය. ලිංගික අපයෝජනයක් සිදු කිරීමට යාමේ දී ඒ පිළිබඳව සිතුවිලි ගොඩ නගා ගනු ලැබූ එකී වරද පිළිබඳ සිහින මවා ගත් පුද්ගලයෙකු සිටිය යුතුය. ඉන් පසු එකී පුද්ගලයා විසින් එම වරද කිරීමට තීරණ ගත යුතුයි. ඒ සඳහා ඔහුගේ වරදකාරී හැඟීම හා බිය ක්‍රමයෙන් අඩු කර ගනී. ළමයින්ට ත්‍යාග, ප්‍රශංසා, වරප්‍රසාද ලබා දෙමින් අපයෝජකයින් සිදු කරනුයේ එකී කාර්යයයි.

මෙම ක්‍රියාවලියේ තුන් වන පියවර වනුයේ ඔහු වටා ඇති සමාජ නිශේධන ජය ගැනීමයි. මන්ද ලිංගික අපයෝජනය යනු ප්‍රසිද්ධියේ සිදු කළ හැක්කක් නොවේ. ඒ සඳහා රහසිගත බව රැකගත යුතුය. එම නිසා ළමයා සමාජයෙන් වෙන්කර ගැනීම, අන් අය දැන ගැනීමෙන් වැළැක්වීම,ළමයා හුදකලා කර ගැනීම,ළමයා වටා ඇති අනාරක්ෂිත සාධක පිළිබඳව සලකා බලමින් වරද සැලසුම් කිරීමෙන් පසු ඊළඟ පියවරේදී ළමයාගේ ප්‍රතිරෝධය හෙවත් විරුද්ධ බව අඩු කර ගත යුතුය.

මුල් පියවරයන් තුනම සාර්ථක වුවත් හතරවන පියවර සාර්ථක නොවුව හොත් ලිංගික අපයෝජනයක් වීමට ඇති ඉඩ කඩ බොහෝ සේ අවම වේ. යම් හෙයකින් මෙකී පියවර හතරම සාර්ථක වුවහොත් ලිංගික අපයෝජනයක් සිදු වන බැවින් ළමා ආරක්ෂාව පිළිබඳව කටයුතු කරන දෙමාපියන්, ගුරුවරුන්, වැඩිහිටියන්, නිලධාරීන් මෙන්ම

සමස්ථ සමාජයම මෙකී චක්‍රය බිඳහෙළීම උදෙසා ලෙහෙසි හා පහසු තැනින් පටන් ගත යුතුයි. එහිදී ලෙහෙසි හා පහසුම පියවර වනුයේ ළමයාගේ ප්‍රතිරෝධය වැඩිකිරීමට අවශ්‍ය පියවර ගැනීමයි. දෙවනුව සමාජ ප්‍රතිරෝධය වැඩි කිරීමයි. මේ සඳහා ළමුන් දැනුවත් කරමින් ඔවුන්ගේ කුසලතා දියුණු කිරීම ළමයින් ශක්තිමත් කිරීම සමාජය තුළළමයා අනාරක්ෂිත වන්නට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම මෙකී පියවරයන්ට ඇතුළත් වේ.

අන්තර්ජාලය හරහා සිදු වන ලිංගික අපයෝජනයකදී වුවද මෙකී චක්‍රය ක්‍රියාත්මක වන අතර මෙහිදී වඩාත් වැදගත් වනුයේ ළමයාගේ ප්‍රතිරෝධය ඉතා හොඳින් ශක්තිමත්කර තැබීමයි. බාහිර නිශේධන ලෙස දෙමාපියන්ගේ අධීක්ෂණය, මගපෙන්වීම හා අන්තර්ජාල පරිසරය ළමා හිතකාමී ලෙස සකසා තැබීමද සලකා බැලිය යුතුය. මන්ද අන්තර්ජාලයේ බහුල ලෙස ළමා ලිංගික ගොදුරු සොයන්නන් සැරිසර නිසාත් ඒ සඳහා නොයෙකුත් උත්සාහයන් ඔවුන් දරන නිසාත් ළමයා අවධානම්කාරී අන්තර්ජාල පරිහරණයකට යොමු නොවන ලෙස අවශ්‍ය දැනුවත්භාවය ලබා තිබීම ඉතා වැදගත් වේ.

ලිංගික අපයෝජනයකට වරක් ළමයෙකු යොමුකර ගැනීමෙන් පසු එකී ළමයාට අවමන් කරමින් හෝ ප්‍රතික්ෂේප කරමින් හෝ ලැජජාවට පත් කරමින් හෝ බිය වැද්දවීමෙන් හෝ බොරු පොරොන්දු දෙමින් හෝ ළමයා නැවත නැවත ලිංගික අපයෝජනයට ලක් කිරීමට අපයෝජකයින් උත්සාහ

දරනු ඇත. අන්තර්ජාලය හරහා සිදු වන ළමා ලිංගික අපයෝජනවල දී එකී ළමයාගේ නිරුවත් පිංතූර හෝ වීඩියෝ ඔහු සතු කරගනිමින්, ඒවා අන්තර්ජාලයට මුදා හරින බවට තර්ජනය කරමින් හෝ බිය වද්දවමින් ළමයින් ලිංගික අපයෝජනයට යොදාගනු ලබන බවක් කොතෙකුත් දකින්නට ලැබේ. මෙකී චක්‍රය Offline සිදු වීමට වඩා Online සිදු වීමේ වේගය වැඩි වී ඇත. එසේම සමාජ ප්‍රතිරෝධයද අඩු වී ඇත. රහසිගතව සිදු වීමේ හැකියාව වැඩි වී ඇත. දෙමාපිය, වැඩිහිටි අධීක්ෂණය දුර්වල වී ඇත. එවැනි අවධානම් සාධක රැසක් ඒ සඳහා බලපෑම් කරයි.

උක්ත පියවරයන් හා ක්‍රියාකාරකම්වල නිරත වෙමින් අපයෝජකයින් විසින් ළමයෙකු ලිංගික අපයෝජනය සඳහා යොමු කර ගැනීම සිදු වේ. ඒ සඳහා දීර්ඝකාලීන ක්‍රියාවලියක නිරත වන අපයෝජකයින් ළමයා හොඳින් දන්නා හඳුනන පුද්ගලයෙකු වන අතර 90% ළමා අපයෝජකයින් මෙකී ක්‍රියාදාමයන් පසු කරයි. අපයෝජකයා තුළ මතු වන වරදකාරී හැඟීම හා බිය හේතු කරගෙන තමාට සුදුසු අවස්ථාව එන තෙක් මේ සඳහා සැලකිය යුතු කාලයක් අපයෝජකයින් විසින් ලබා ගනු ලැබේ. නමුත් අන්තර්ජාලය හරහා ළමා ලිංගික අපයෝජනයන්ට උත්සාහ දරන්නෙකු තුළ මෙකී වරදකාරී හැඟීම හෝ බිය එලෙසම බලපෑම් නොකරනු ඇත. මන්ද යත් අන්තර්ජාලය හරහා සැඟවී සිට සිය අනන්‍යතාවය හෙළි නොවන අයුරින් ළමයාගේ කැමැත්ත පරීක්ෂා කර බලා

ළමයා සූදානම් කිරීම හා ස්පර්ශයක් නොමැති පූර්ව ලිංගික අපයෝජන රැසක් සිදු කළ බැවිනි. එහිදී

- ලිංගික කථා බහට සවන්දීමට බල කිරීම
- ලිංගික අවයව පෙන්වීම
- ලිංගික ක්‍රියා දෙස බලා සිටීමට සැලැස්වීම
- ලිංගික පින්තූර හා වීඩියෝ පෙන්වීම

ආදී ක්‍රියාකාරකම් ඔස්සේ මූලික වශයෙන් ළමයාට ස්පර්ශයක් රහිත ලිංගික අපයෝජන රැසක් සිදු කළ හැකිය. එබැවින් ළමා අපයෝජකයෙකුට ළමයෙකු වෙත ඉතා පහසුවෙන් ප්‍රවේශ වීමටත්, සැඟවී සිට අනන්‍යතාවය හෙළි නොවන අයුරින් ළමයෙකු පෙළඹවා ගැනීමටත්, ස්පර්ශයක් රහිත ලිංගික අපයෝජන මූලික වශයෙන් සිදු කිරීමටත්, වැඩිහිටියන්ට හෝ සමාජයට නොදැනෙන ලෙස ළමයා පරීක්ෂාකර බැලීමටත්, අපයෝජනය සඳහා වේගවත් පිවිසුමක් ලබා ගැනීමටත් අන්තර්ජාලය ළමා අපයෝජකයින් සඳහා පහසුකම් සපයනු ඇත. එය රඳාපවතිනුයේ ළමයාගේ කැමැත්ත හා විරුද්ධ වීමට ළමයා තුළ පවත්නා දැනුම මෙන්ම තාක්ෂණික හැකියාව මතයි. ඇතැම් විට මෙවැනි ස්පර්ශයක් රහිත ලිංගික අපයෝජනයන් අන්තර්ජාලයේ දී ළමයාගේ කැමැත්ත නොමැතිව වුවද සිදු විය හැකිය. ළමයෙකු Online සිටින විට මෙන්ම Offline සිටින විට ද අවධානම එක සේ පැවතිය ද සිය දෙමාපියන් අතරේ සිටිය දී පවා අන්තර්ජාලය ඔස්සේ අපයෝජකයින්ට ළමයා වෙත

ළඟාවීමට හැකි වීම මත අන්තර්ජාලයට ළමා අපයෝජන සිදු කිරීම කෙරෙහි ඇති සක්‍යතාවය වඩාත් බරපතළ වේ.

ළමා ලිංගික අපයෝජනවලින් 90% ක් දන්නා හඳුනන පුද්ගලයින් විසින් සිදු කරන බව මා මීට පෙර සඳහන් කරනු ලැබුවා. නමුත් නොදන්නා පුද්ගලයින් විසින් ළමයින් ලිංගික අපයෝජනයට ලක් කිරීමේ ප්‍රවණතාවය 10% කි. අන්තර්ජාලය තුළ මෙකී සාධකය ඊට වෙනස් මුහුණුවරක් ගන්නා අතර සැඟවී පහර දෙන්නන් හෙවත් ව්‍යාජ ලෙස පෙනී සිටින්නන් වැඩි වශයෙන් දක්නට ලැබේ. නමුත් එළිපිට පහර දෙන්නන් ඉතා සුළු වශයෙන් අන්තර්ජාලය තුළ ක්‍රියාත්මකය.

ඉහතින් සඳහන් කරනු ලැබුවේ Offline සිටින විට දී ළමයෙකු අපයෝජන ක්‍රියාවලියකට ලක් වීම හා අන්තර්ජාලය තුළOnline හැසිරෙන විට ලිංගික අපයෝජනයන්ට ළමයෙකු නතුවිය හැකි ආකාරයන් හි වෙනසයි. එබැවින් අන්තර්ජාලය හරහා ළමයින් සම්බන්ධයෙන් සිදු විය හැකි අපයෝජන තත්තවයන් හා අපචාරී තාත්තවයන් නිවැරදිව හඳුනාගැනීමට උත්සාහ දරමු.

03.2. අන්තර්ජාල (සයිබර්) අපරාධ වර්ගීකරණය

පහතින් දක්වා ඇත්තේ අන්තර්ජාල හෙවත් සයිබර් අපරාධ පිළිබඳ සංක්ෂිප්ත සටහනකි. මෙකී සියලුම අපරාධ

ළමයින් විෂයෙහි ක්‍රියාත්මක නොවන මුත් ඒවා ළමයාගේ ආරක්ෂාව කෙරේ යම් බලපෑමක් ඇති කළ හැකිය. එබැවින් මෙවැනි අපරාධ හෝ ළමා අපයෝජන සිදු වන ආකාරය හා එහි ස්වභාවය පිළිබඳව හඳුනා ගැනීම වඩාත් වැදගත් වේ.

සයිබර් අපරාධ (Cyber Crimes)[24]

ප්‍රචණ්ඩකාරී සයිබර් අපරාධ (Violent Cyber Crimes)

- ප්‍රතිරූපක මිත්‍රත්වයන්/ Grooming
- සයිබර් බුලින්/ Cyber bullying
- සයිබර් ස්ටෝකින්/ Cyber Stalking
- කාමුක පණිවිඩ / Sexing
- අවුටින්/ Outing
- ළමා අපයෝජන රූප/වීඩියෝ Child Abuse Image /Video
- අන්තර්ජාල කප්පම් Cyber Extortion
- සයිබර් ත්‍රස්තවාදය/CyberTerrorism

ප්‍රචණ්ඩකාරී නොවන සයිබර් අපරාධ (Nonviolent Cyber Crimes)

- සයිබර් සොරකම්/ Cyber Theft
- දත්ත වෙනස් කිරීම (Embezzlement)
- නීති විරෝධී අයිතිකර ගැනීම්(Unlawful appropriation)
- මුල්‍යමය දත්ත සොරකම (Corporate Espionage)
- රචනා චෞරත්වය (Plagiarism)
- නීත්‍යනුකූල නොවන පිටපත් කිරීම(Piracy)
- අනන්‍යතා සොරකම (Identity Theft)
- අන්තර්ජාල රැවටිලි(Cyber Fraud)
- අනවසරයෙන් ඇතුළු වීම්(Cyber Tresspass)
- විනාශකාරී සයිබර් ප්‍රහාර (Destructive Cyber Crimes)
- මිලේච්ඡත්වය (Cyber Vandalism)
- වෛරස් (Viruses)
- සයිබර් ගණිකා ව්‍යාපාරය (Cyber Prostitution)
- අන්තර්ජාල සූදු (Online Gambling)
- අන්තර්ජාල කුට්ටනය (Online Trafficking)
- අන්තර්ජාල මත්ද්‍රව්‍ය වෙළඳාම (Internet Drug Sales)

ගැළීම් සටහන් - 01

[24] .CyberCrime:A Conceptual and Theoretical Framework,Chapter 1,

03.2.1. ප්‍රතිරූපක මිත්‍රත්වයන්/ Grooming

අයුතු ප්‍රයෝජන වෙනුවෙන් යහළු වීම මෙහි මූලික අරමුණයි. මෙකී පියවර ළමයා අපයෝජනයට නතු කර ගැනීමේ මූලිකම අඩිතාලම විය හැකිය. ළමා අපයෝජකයින් ඉතාමත් කපටි, රූවටිලි සහගත, සූක්ෂම ක්‍රියාවලියකට අවතීර්ණ වීමේ දී මෙම ක්‍රියාවේ නිරත වේ. ඉතා ආදරණීය බසකින් මිත්‍රත්වයක් ගොඩ නගා ගනු ලබන අතර ළමයා පිළිබඳ නිරන්තරයෙන් සොයා බලමින් ළමයාගේ යහපත වෙනුවෙන් නිරන්තරයෙන් කැපවීමක් පෙන්වීමට උත්සාහ දැරීම මොවුන්ගේ ස්වභාවය යි.

මෙවැනි පුද්ගලයින් වෙන්කර හඳුනා ගැනීම ළමයින්ට ඉතා අසීරු කටයුත්තක් වන අතර ඇතැම් විට වැඩිහිටියන්ට ද මොවුන්ගේ ක්‍රියා කලාපය හඳුනා ගත නොහැකිය. පවුලේ තොරතුරු පෞද්ගලික තොරතුරු නිතර කථා කරන මොවුන් ඇතැම් විට ළමයාගේ පවුලේ හිතවතෙකු බවට ද පත් විය හැකි ය. කිසිදු අයුරකින් ඔහු කෙරේ අවිස්වාසයක් ඇති නොවන අයුරින් කටයුතු කරන මොවුන්, ඔහුට විරුද්ධ නොවන සේ ළමයා සූදානම් කිරීමට මෙකී අවස්ථාව ප්‍රයෝජනයට ගනී. එය කෙටිකාලීනව හෝ දිගු කාලීනව සිදු විය හැකිය. ළමයා අපයෝජනය සඳහා සූදානම් කර ගන්නා තෙක්,ළමයා ඒ සඳහා අවනතවන තෙක් මෙකී ක්‍රියාවලිය ඉතා සූක්ෂම ලෙස ළමා අපයෝජකයින් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. අනතුරුව ළමයා

අපහසුතාවයට පත් වන ආකාරයේ ඉල්ලීම් හමුවීම් හා ක්‍රියාවන් සිදු කිරීම ප්‍රතිරූපක මිත්‍රත්වයන් හෙවත් Grooming සිදු කරන්නන්ගේ ස්වභාවය යි.

උදා- *තිමිරට වයස අවුරුදු 14යි. ඔහු ට Facebook ගිණුමක් තිබුණා. දිනක් එම ගිණුම හරහා අවුරුදු 29 ක විශ්වවිද්‍යාල ආචාර්ය වරයෙක් මුණ ගැසුණා. දෙදෙනා බොහෝ පෞද්ගලික දේවල් කථා කළා. දැන හඳුනා ගත්තා. කිසිදු විට තිමිරට කිසිදු නරක දෙයක් ඔහු ප්‍රකාශ කළේ නැහැ. තිමිරට අධ්‍යාපනයට උදවු උපකාර කළ හැකි බවත්, අවශ්‍ය නම් ඔහුගේ ආර්ථික තත්ත්වය ගැන සලකා බලා මුදල්වලින් වුවද උපකාර කළ හැකි බවත් එකී ආචාර්යවරයා ප්‍රකාශ කළා. ඒ අනුව ඇතැම් විට මොහු සිය දැනුම උපයෝගී කර ගනිමින් තිමිරට පාසල් කටයුතුවලටද උපකාර කළා. ඔහු මානසිකව බිඳ වැටුන විට ඉන් නගාසිටුවීමටත් කටයුතු කිරීමට උත්සාහ කළා. දෙමාපියන්ගෙන් අහිමි වූ ආදරය රැකවරණය අන්තර්ජාලය ඔස්සේ ලබා දීමටත් මොහු කටයුතු කළා.*

දිනක් තිමිර හමුවීමට එන බවද පවසා සිටියා. කෙසේ නමුත් දැන් තිමිර නව යෞවන වයසේ පසු වන බවත් මේ කාලයට අධ්‍යාපන වැඩ කටයුතුවලට වැඩි උනන්දුවක් ඇති නොවිය හැකි බවත් එය මෙම

වයසේ ඇති වන ලිංගික පීඩනය නිසා සිදු වන්නක් බවත් ප්‍රකාශ කර සිටියා. මේ කාලයේ ලිංගික හැඟීම් මතුවීම ස්වභාවිකයි. නමුත් ඒ පීඩනය නිසා ඔයාගේ අධ්‍යාපන කටයුතු අතපසු කර ගත යුතු නැහැ. ඒ නිසා එම පීඩනය පිට කරන්න ඕනි. "මල්ලි, මම ඔයත් එක්ක Sex කරන්නේ ඒ පීඩනය අඩු කරගෙන ඔයාගේ අධ්‍යාපන කටයුතු පහසුවෙන් කරගෙන යන්න උදවු වීමකට මිසක් කැත හිතකින් නොවෙයි" තිමිරට එකී අචාර්ය වරයා ප්‍රකාශ කර සිටියා.

ඉහත උදාහරණය තුළ සිටින පුද්ගලයාගේ ක්‍රියා කලාපය හොඳින් අධ්‍යයනය කර බලන්න. ඔහු කිසිදු විටෙක ළමයාට අනවශ්‍ය දෙයක් මුල් කාලය තුළ ප්‍රකාශ කළේ නැත. ඉතා යහපත් ගුණ ගරුක පුද්ගලයෙකු ලෙස ළමයාගේ මෙන්ම එම පවුලේ අයගේද හිත දිනා ගනිමින් කටයුතු කළ මොහු ගේ අභිප්‍රාය වුයේ වෙනත් දෙයකි.

එනම් ළමයා සමග ලිංගික සම්බන්ධතාවයක් ඉතා සූක්ෂම ලෙස ගොඩ නගා ගැනීමයි. එය ප්‍රතිරූපක මිත්‍රත්වය හෙවත් අයුතු ප්‍රයෝජන වෙනුවෙන් යහළු වීම හෙවත් Grooming ලෙස හඳුන්වා දිය හැකිය. එබැවින් ඔබේ දරුවන් පිළිබඳ වැඩි උනන්දුවක්, උද්යෝගයක්

දයාවක්, සෙනෙහසක්, කරුණාවක් දක්වන සියලු දෙනාම සැබෑ යහළුවන් නොවිය හැකි බැවින් අන්තර්ජාල ප්‍රතිරූපක මිතුරන්ගෙන් ආරක්ෂා වන්නට අවශ්‍ය දැනුම ළමයින් අතට පත් කිරීම ඉතා වැදගත් වේ.

03.2.2. සයිබර්බුලීයින් (Cyberbullying)/ සයිබර්ස්ටෝකින් (Cyberstalking) හෙවත් අන්තර්ජාල හිංසා

අන්තර්ජාලය තුළින් යමෙකු අපහසුතාවයට පත් වන අයුරින් යම් යම් ක්‍රියා සිදු කිරීම හා එවැනි ක්‍රියා සඳහා බලකර සිටීම මේ යටතේ කථා කෙරේ. එසේ "හිංසාවක් සිදු වන අයුරින් බලකර සිටින පුද්ගලයා ළමයෙකු නම් එය සයිබර් බුලීයින් ලෙසත් එසේ බලකර සිටින පුද්ගලයා වැඩිහිටියෙකු නම් එය සයිබර්ස්ටෝකින් ලෙසත් හඳුන්වා දිය හැකිය".[25] එසේ බලකර සිටින පුද්ගලයා විසින් යමෙකුට යම් හිංසාවක් සිදු කරන බවට හෝ ඔහු මුණ ගැසෙන ලෙසට හෝ යමක් සිදු කරන ලෙසට තර්ජනය කිරීමක් හෝ බලපෑමක් සිදු කරනවා විය හැකිය. ඇමරිකා එක්සත් ජනපදයේ අතුරුදන් වූවන් සහ සූරාකන ළමයින් පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සිදු කළ සමීක්ෂණයක් මගින් තහවුරු කරනු ලැබුවේ සෑම යෞවන ළමයින් එකොළොස්

[25] ඉලංගකෝන් කාන්වන,ආරක්ෂාකාරී ලෙස අන්තර්ජාලය භාවිතයට උපදෙස්,2016,එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දෙනෙකුගෙන් එක් අයෙකුම අන්තර්ජාලය හරහා කුමනාකාරයක හෝ හිංසාවකට ලක්ව ඇති බවයි (2006). අන්තර්ජාලය හරහා ළමයින්ට සිදු වන බොහෝ හිංසාකාරී අපරාධ තුළ සයිබර් බුලීයින්/සයිබර්ස්ටෝකින් යන්න අන්තර්ගත විය හැකි අතර ශ්‍රී ලංකාවේ සිදු වන බොහොමයක් සයිබර් අපරාධ තුළ මෙකී ලක්ෂණයන් අන්තර්ගතය.

උදා- සයිබර් බුලීයින් **(Cyber bullying)**

පවනී අවුරුදු 16 ක ගැහැණු ළමයෙකි.ඇය අන්තර්ජාලයේ සමාජ ජාල වෙබ් අඩවි තුළ නිතර යහළුවන් සමග මිතුරු ඇසුරට හුරුව සිටියා. ඇගේ පංතියේම තවත් පිරිමි ළමයෙකු වන නිම්සර අන්තර්ජාලයේ මුහුණු පොත හරහා ඇගේ ආදරය ඇයැද සිටියා. ඇය ඊට එක හෙළාම අකමැති වුණා. එහෙත් එකී පිරිමි ළමයා ඇගේ ආදරය තදින්ම බලාපොරොත්තු වුනා.

එය දිගින් දිගටම සිදු වීම නිසා ඇය දැඩි අපහසුතාවයට පත් වුණා. එයට පිළියමක් ලෙස ඇය අන්තර්ජාලය ඔස්සේම පිරිමි ළමයාට අපහසුතාවට පත් වන ආකාරයේ සැලැස්මක් අන්තර්ජාල යහළුවන් සමග සැලසුම් කළා පමණක් නොව

පිරිමි ළමයා ව දැඩි ලෙස දෝෂදර්ශනයට ලක් කරනු ලැබුවා. මෙම හැසිරීම නිසා එකී පිරිමි ළමයා තුළ තිබූ ආදරය වෛරයක් බවට පත් වුණා. ඔහු ඇයගෙන් පළිගැනීමට තීරණය කළා. ඒ අනුව පිරිමි ළමයා වෙනත් Facebook *ගිණුමක් ගැහැණු ළමයෙකුගේ නමින් නිර්මාණය කර පවතී සමග මිතුරු ඇසුරක් ආරම්භ කළා. දැන් දෙදෙනා ඉතා කුළුපග මිතුරියන් ලෙස ගනු දෙනු කළත් ඒ පිටුපස සිටිනුයේ නිම්සර නැමති පිරිමි ළමයා බව ඇය දැන සිටියේ නැහැ.*

දිගින් දිගටම මෙකී යහළුකම අළුත් වූ අතර දෙදෙනා ඉතා පෞද්ගලික රහසිගත දේවල් පවා අන්තර්ජාලය ඔස්සේ හුවමාරු කළා. කෙසේ හෝ විවිධ උපක්‍රම හරහා ගැහැණු ළමයාගේ ලිංගික අත්දැකීම් පවා හුවමාරු කරනිමින් ලබා ගත් තොරතුරු හරහා ඇය සමලිංගික තැනැත්තියක්ය **(Lesbian)** *යන තැනට අවශ්‍ය සාධක ඉතා සූක්ෂම ලෙස සකසා ගනිමින් එකී සංවාද සියල්ල අන්තර්ජාල ඔස්සේ අන් අයට පෙනෙන ලෙස පළකිරීමට ඔහු ක්‍රියා කළා. මෙකී ක්‍රියාවෙන් පවතී දැඩි අපහසුතාවයට පත් වූ අතර නිවසට, පාසලට, යහලුවන්ට, සමාජයට මුහුණ දිය නොහැකිව දැඩි මානසික පීඩනයකට පත් වුණා.*

උදා- සයිබර්ස්ටෝකින් **(Cyberstalking)**

"මල්ෂා" වයස අවුරුදු 15 ක ගැහැණු ළමයෙකි. අන්තර්ජාලය හරහා හමු වූ යෂින්ත සමග දෙදෙනාගේම කැමැත්තෙන් ප්‍රේම සම්බන්ධතාවයක් ආරම්භ කෙරිණි. දෙදෙනා බොහෝම ආදරයෙන් අන්තර්ජාලය හරහා නිතර නිතර කථා කළා. මල්ෂාට යෂින්ත කෙරේ දැඩි විශ්වාසයක් ගොඩ නැගුණි. යෂින්තගේ වයස අවුරුදු 24කි. ඔහු විශ්ව විද්‍යාල ශිෂයෙකි. කාලය කෙමින් ගෙවී ගියා. මල්ෂා සාමාන්‍ය පෙළ විභාගයට සුදානම් විය.

ඔවුන් පෞද්ගලික පංති සඳහා සහභාගී වන අවස්ථා කිහිපයකදී මුණ ගැසුනා. කාලය ගත වීමත් සමග දෙදෙනා අතර ප්‍රශ්න මතුවෙන්න පටන් ගත්තා. ඒ අනුව යෂින්ත මල්ෂාගෙන් වෙන්ව විශ්වවිද්‍යාලයේම වෙනත් ගැහැණු ළමයෙකු සමඟ සම්බන්ධ උනා. ටික දිනකට පසු මල්ෂාගේ අන්තර්ජාල ගිණුමට Chat මගින් ඇයගේ අඩ නිරුවත් පින්තූර ගලා එන්නට උණා. මෙයින් මල්ෂා දැඩි කම්පනයට පත් වුනා. මෙය තනිවම විසඳා ගැනීමට ඇය උත්සාහ කළා. තවත් දිනක් ඇගේ නිරුවත් ජායාරූපයක් ඇගේ ගිණුමට Chat මගින් තවත් අයෙකු විසින් එවා ඔහු සමග ලිංගිකව එකතු වන ලෙස බලපෑම් කළා. මේ ආකාරයට කිහිප

දෙනෙකුම ඇයට Chat *මගින් ඇගේ මුහුණ සහිත නිරුවත් පින්තූර එවා අන්තර්ජාලයේ පළකරන බවට තර්ජනය කළා. නමුත් ඇය කිසිදු දිනෙක එවන් පින්තූර කිසිවෙකුට ලබා දී නැති බව පසක් වුවත් ඇය එයින් දැඩි භීතියකට පත් වුනා. කළ යුත්තේ කුමක් දැයි ඇයට සිතා ගැනීමට නොහැකිව ඇය සියදිවි නසාගැනීමට තීරණය කළා. නමුත් ඇගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට ඇය අවසන් මොහොතට පෙර 1929 ළමා දුරකථන සේවයට කථා කළා. ඒ අනුව ඇයට අවශ්‍ය සහය ලබා දෙනු ලැබූ අතර ඒ පිටුපස ඔහුගේ පැරණි පෙම්වතා මෙන්ම ඔහුගේ යහළුවන් කිහිප දෙනෙකුම සිටින බව අවබෝධ වුණා. ඔවුන් දැරියගේ පින්තූර සහ මුහුණ වෙනත් නිරුවත් පින්තූරවලට බද්ධ කරමින් ඇය අපහසුතාවයට පත් කිරීමට ගත් උත්සාහය ට විරුද්ධව ක්‍රියාත්මක වෙන්නට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට හැකියාව ලැබී ඇත.*

03.2.3. කාමුක පණිවුඩ යැවීම (Sexting)

කුමන හෝ ඉලෙක්ට්‍රොනික උපකරණයක් මගින් ලිංගිකත්වය උද්දීපනය වන ආකාරයේ පණිවිඩ ළමයා වෙත Chat මගින් හෝ SMS මගින් හෝ පින්තූර ලෙස යොමු කිරීම කාමුක පණිවුඩ යැවීම හෙවත් Sexting ලෙස හඳුන්වනු ලබයි. මේ හරහා ළමයාගේ මානසිකත්වයට යම් බලපෑමක් හෝ කැළඹිලි සහගත තත්ත්වයක් උදා කිරීම හරහා ළමයා

අපහසුතාවයට පත් කිරීම හෝ ලිංගික කටයුතු සඳහා පොළඹවා ගැනීමට කටයුතු කිරීම එහි අරමුණයි.



උදා- දෙවුමි වයස අවුරුදු 15 ගැහැණු දැරියෙකි. ඇය FaceBook ගිණුමක් මගින් යහළුවන් සමග මිත්‍ර ඇසුරක් පවත්වාගෙන ගියා. ඇයට දිනක් නාඳුනන ගිණුමකින් මිතුරු ඇසුරකට ආරාධනා ලැබී තිබුණා. ඇය එම ඇරයුම පිළිගත් අතර ඒකී ගිණුම මගින් ඇයට ලිංගික කරුණු නිතර නිතර ප්‍රකාශ කළා. ඇයට ඒ පිළිබඳව බියක්, පිළිකුලක් දැනුණ මුත් එම අළුත් අත්දැකීමක් නිසා එයින් ඉවත් වීමට ඇය කටයුතු කළේ නැහැ. එම නිසා දිගින් දිගටම ඇයට එකී ගිණුමෙන් අනවශ්‍ය ලිංගික කරුණු යොමු කළා. ඇතැම් විට ලිංගික පින්තූර පවා එවා තිබූ අතර ඇය ඒ පිළිබඳව රහසක් ලෙස තබා ගැනීමට කටයුතු කළා. මෙකී ක්‍රියාව දිගින් දිගටම සිදු වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇයට එය සාමාන්‍ය දෙයක් බවට පත් වූ අතර අවසානයේ ඇගේ නිරුවත් ඡායාරූප ද ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබූවා. ඇය එයින් දැඩි කම්පනයට පත් වුණා.

කාමුක පණිවිඩ හෙවත් Sexting ළමයින්ට එරෙහිව අන්තර්ජාලය තුළ බහුලව ක්‍රියාත්මක වේ. ඇමරිකා එක්සත්

ජනපදයේ අතුරුදහන් වූ සහ සූරාකෑමට ලක් වන ළමයින් පිළිබඳ මධ්‍යස්ථානය මේ පිළිබඳව සිදු කරන ලද සමීක්ෂණයකින් 2006 වසරේ සනාථ කරනු ලැබුවේ සෑම යෞවනයින් 07 දෙනෙකුගෙන් එක් අයෙකුටම මෙවැනි අයුතු ලිංගික ආරාධනා ලැබෙන බවයි. ශ්‍රී ලංකාව තුළද ළමයින්ට එරෙහිව සිදු වන අන්තර්ජාල අපයෝජන ක්‍රියාවලියේ දී කාමුක පණිවුඩ ක්‍රියාත්මක වීම දැක ගත හැකිය.

03.2.4. ළමා අපයෝජන රූප / වීඩියෝ (Child Abuse Images/ Videos)

ලොව පුරා ළමයින් බිලියන ගණනකගේ අසභ්‍ය පින්තූර අන්තර්ජාලයට ඇතුළත් කර ඇති බව දකින්නට හා අසන්නට ලැබේ. ළමයෙකුගේ ලිංගික ආකර්ෂණය හුවා දක්වමින්, කාමුකත්වය විදහා දක්වමින්, නිර්මාණය කරන සෑම දෘෂ්‍යමය වාර්ථාවක්ම ළමා අපයෝජන රූප/වීඩියෝ හෙවත් Child Abuse Images/ Videos ලෙස හඳුන්වනු ඇත. අපි එම රූප පමණක් අපරාධයක් යැයි සලකා බැලීමට එහා ගොස් එම සෑම රූපයක් පිටු පසම සිටිනුයේ ළමයෙකු බව සිහියට නගා ගත යුතුය. එකී ළමයා ප්‍රසන්න ලෙස සිනාමුසු මුහුණින් ඡායා රූපයට හෝ දර්ශනයට මුහුණ දෙනු ලැබුවත් කිසිදු සත්‍ය ළමා අපයෝජන රූපයක් ළමයෙකු වේදනාවට පත් නොකර හෝ ලිංගික සූරාකෑමට ලක් නොකර නිර්මාණය කළ නොහැකිය. ඇමරිකා එක්සත් ජනපදයේ Internet watch foundation ආයතනයේ 2003 සංගණනයකට

අනුව සෑම සතියකම ළමා අසභ්‍ය ඡායාරූප 20,000 ට අධික සංඛ්‍යාවක් අන්තර්ජාලයට මුදාහරින බවට තොරතුරු සපයයි. මීට වසර 14 පෙර තත්ත්වය එසේ නම් වර්තමානය වන විට එහි තත්ත්වය බොහෝ සේ ඉහළ ගොස් තිබේ.

මෙම තත්ත්වය ළමයින්ට විරුද්ධව අන්තර්ජාලය තුළ සිදු වන බරපතළ හිංසනයක් වන අතර මේ ජාවාරමක් ලෙස ගොදුරු සොයන්නන් විසින් නිවෙස්වල සිදු කරන පටිගත කිරීමේ සිට මැදිරිගත (Studio) රූපකරණය දක්වා විහිදී යයි. මෙසේ නිර්මාණය වන ළමා ලිංගික අපයෝජන රූප විවිධ ස්වරූපයන්ගෙන් හඳුනා ගත හැකිය. ඒවා අඩ නිරුවත්, නිරුවත්, අනුරාගී, කාමුක ලිංගික ඉරියවු ප්‍රදර්ශනය, ඉතා පැහැදිළි ලිංගික හෝ කාමුකත්වය ප්‍රදර්ශනය හා ක්‍රියාවල නිරත වීම මෙන්ම අඩත්තේට්ටම් කිරීම හා බරපතළ අඩත්තේට්ටම් සිදුකරන ක්‍රියා රඟදැක්වීම පමණක් නොව සතුන් සමග කාමුක සංසර්ගයේ යොදවන දෘශ්‍යමය වාර්ථා ඉදිරිපත් කිරීම ද මේ යටතේ සිදු විය හැකිය.

ලාංකීය සංස්කෘතියට අනුව ඉතා කුඩා දරුවෙකුගේ සාමාන්‍ය නිරුවත් ඡායා රූපයක් අපගේ මනස තුළ ගැටළුසහගත තත්තවයක් මතු නොකරනු ලැබුවත් එකී දරුවාම ලිංගික ආකර්ශනයක් ඉස්මතු වන පරිදි හෝ ලිංගික ක්‍රියාවක් සඳහා යොදවා ගනු ලබන අයුරු දක්වන පින්තූරයක් දැකීමෙන් මනස වික්ෂිප්ත වනු ඇත. එබැවින් තවත් පුද්ගලයෙකුගේ හෝ ඡායාරූපයට හෝ දර්ශනයට මුහුණ දෙන තැනැත්තාගේ මානසිකත්වයට බලපෑමක් සිදු

වන ආකාරයේ ඉහත කී ස්වභාවයේ පින්තූරයක්, චිත්‍රයක්, ලියවිල්ලක්, කාටූනයක්, ඇනිමේෂන් එකක්, චිත්‍රපටයක් හෝ වීඩියෝවක් ළමා අසභ්‍ය ප්‍රකාශනයක් ලෙස හඳුන්වා දිය හැකිය. ළමා අපයෝජන රූප යන්නද ඒ යටතට ගැණෙනු ඇත. අන්තර්ජාලයේ ශ්‍රී ලංකීය සංදර්භය තුළ නිර්මාණය වන බොහෝ ළමා අපයෝජන රූපවල මුහුණ පෙනෙන්නට නැත. එහෙත් ඒ තුළ ලිංගික ආකර්ෂණයක්, කාමුකත්වයක් මතු කරයි නම් එය ද ළමා ලිංගික අපයෝජන රූප ගණයට ගැනේ.

මෙවැනි රූප නිර්මාණය වනුයේ කුමක් නිසාද? ඒවා භාවිතයට ගැණෙනුයේ කුමක් සඳහාද? මේවා හරහා කුමක් සිදු කරන්නේද? යනුවෙන් ඔබ තුළ ගැටළු රැසක් මතුව ඇත. සැබැවින්ම මේ සඳහා ලොව පුරා විවිධාකාරයේ ඉල්ලුමක් පවතී. බොහෝ විට පින්තූර එකතු කරන අය සිටිති. ඔවුන් ඒවා විවිධ මානසිකත්වයන් මත ළඟ තබා ගනී. මේ සඳහා ළමයින් සමඟ ලිංගික කටයුතු කිරීමෙන් තෘප්තිමත් වන කුමර කාමය හෙවත් පිඩෝෆිලියා (Pedophilia) රෝගයෙන් පෙළෙන පුද්ගලයින් මෙකී රූප ළඟතබා ගැනීම බහුලව දැක ගත හැකියි. ඇතැම් විට ඒවා යොදා ගනිමින් ළමයින් පොළඹවා ගැනීමට ද මොවුන් විසින් මෙම රූප භාවිතයට ගනී. එසේ නොමැති නම් විවිධ වානිජමය පරමාර්ථයෙන් මේවා අලෙවි කරන්නන්ද සිටිනු ඇත. නැති නම් තමා අතින් ළමයෙකු අපයෝජනය වෙතැයි බිය මත මෙවැනි පින්තූර දෙස බලා සැනසීමටද ඇතැම්හු භාවිත කරති.

කෙසේ වෙතත් මේවා එකතු කරන පුද්ගලයින් දෙස බලන විට ඔවුන් මේවා වර්ගකර ලඟ තබා ගනී. එහිදී සමහර පුද්ගලයින් ඔවුන්ගේ රුචිකත්වය මත කුඩා ගැහැණු දරුවන්ගේ පින්තූර, නැතිනම් පිරිමි ළමයින්ගේ පින්තූර, නැතිනම් යෞවන වයසේ පසු වන්නන්ගේ පින්තූර, ලෙස වයස් සීමා අනුව, ස්ත්‍රී පුරුෂ බව අනුව, කළු සුදු බව අනුව, එකතු කිරීමට පෙළඹෙනු ඇත. මෙවැනි අසභ්‍ය පින්තූර හෝ වීඩියෝ නැරඹීමට ඇබ්බැහි වී ඇති පුද්ගලයින් අතින් ළමයින් අපයෝජනයට ලක් වීමේ ප්‍රවණතාවයක් පවත්නා බවත් එය 30% ත් 40% ත් අතර අගයක් ගන්නා බවත් සමීක්ෂණ දත්ත වාර්ථා කරයි. එවැනි අයගෙන් අඩුම තරමින් කුඩා දරුවෙකු හෝ අපයෝජනය වීමට ඇති ඉඩ කඩ ඉහළ අගයක් ගනී.

මෙකී පින්තූර හෝ වීඩියෝ නරඹන පුද්ගලයින් අතර මෙකී පින්තූර හුවමාරු කර ගැනීමත්, බෙදා හදා ගැනීමත් හෝ ලිංගිකත්වය මුල් කර ගත් සංචාරක කර්මාන්තය තුළ මේ සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීමත් නිසා මෙය ව්‍යාපාරයක් ලෙස ලොව පුරා ව්‍යාප්තව ඇත. ලිංගිකත්වය මුල්කරගත් ඇතැම් සංචාරකයින් මෙවැනි අසභ්‍ය පින්තූර මතක සටහන් ලෙස රැගෙනයාමට ද කටයුතු කරයි. ලිංගිකත්වය මුල්කරගත් සංචාරක කර්මාන්තයක් පවත්නා සෙනගල්, මැඩගස්කරය, තායිලන්තය, කාම්බෝජය, ඉංදියාව, බ්‍රසීලය, මෙක්සිකෝව මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද මේ සඳහා වැඩි ඉඩකඩක් නිර්මාණය වී ඇත. නමුත් සංවිධානාත්මක ලෙස Studio තුළ

නිර්මාණය වන අසභ්‍ය චිත්‍රපට හෝ පින්තූර ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වීම බහුලව දැක ගත නොහැකිය.

මෙකී සමාජයන් තුළ පවත්නා දිළිඳුබව, සමාජ අනෝමියත්වය, යුද්ධය, ජන සංයුතියේ වෙනස් කම්, මෙන්ම මුල් බැස ගත් සංස්කෘතික මතවාද හා පිළිගැනීම් මේ සඳහා පරිසරය නිර්මාණය කරයි. ලිංගිකත්වය මුල් කර ගත් සංචාරක කර්මාන්තය හෙවත් එක් රටක සිට තවත් රටකට ගොස් ළමයින් ලිංගික කටයුතු සඳහා යොදවා ගැනීමට වැඩිපුරම පෙළඹෙනුවේ යුරෝපා ජාතීන් වන අතර ළමයින් එසේ ලිංගික කටයුතුවලට යොදවා ගන්නා යුරෝපිකයින් ප්‍රමාණය අන් ජාතීන්ට සාපේක්ෂව 35% පමණ වේ. මේ සාධක මත පැහැදිලි වනුයේ ලොව පුරා ළමයින්ට විරුද්ධව සිදු වන ප්‍රචණ්ඩත්වය සම්බන්ධ රූපවල මෑතකාලීනව වැඩි වීමක් වාර්ථා වන බවයි (Ruethling-2005). නවසීලන්තයේ මේ සම්බන්ධව සිදු කරන ලද නීතිය ක්‍රියාත්මක කිරීමක දී එක් පුද්ගලයෙකු ළඟ තිබී ලොව විශාලතම අසභ්‍ය ඡායාරූප ප්‍රමාණය අත්අඩංගුවට ගැනීමට හැකි වූ අතර එම ප්‍රමාණය 65, 000 කි. ඒ තුළ වයස අවුරුදු 5 ට අඩු වයසේ පසු වන ළමයින්ගේ අසභ්‍ය පින්තූර 17, 000 ක් පමණ තිබී ඇත.

03.2.5. වෙනත් කෙනෙකු නමින් පෙනී සිටීම (Identity Theft)

වෙනත් කෙනෙකු ලෙස පෙනී සිටිමින් විවිධ අකටයුතුකම් සිදු කිරීම මෙනමින් හැඳින්වේ. බොහෝ විට ළමයින් අපයෝජනයට ලක් කිරීම මෙකී ගිණුම් හිමියන්ගේ අරමුණ විය හැකිය. සමහර විට ප්‍රසිද්ධ පුද්ගලයින් නමින් පෙනී සිටිමින්, නැතහොත් ළමයෙකු ලෙස පෙනී සිටිමින්, විවිධ උපක්‍රම හරහා ළමයින් පොළඹවා ගැනීම මොවුන්ගේ අරමුණයි. මෙහිදී මතක තබා ගත යුතු වැදගත් දෙය වනුයේ මෙකී ගිණුම් පිටුපස සිටිනුයේ සැබෑ පුද්ගලයා නොවන බවයි. ළමා අපයෝජනවලට උත්සාහ දරන බොහෝ පුද්ගලයින් මෙලෙස අන්තර්ජාලය තුළ පෙනී සිටීම බහුලව දැකිය හැකියි. ව්‍යාජ ගිණුම් ලෙස හඳුන්වනුයේ ද මෙයයි. මෙලෙස පෙනී සිටිමින් ඇතැම් විට පුද්ගලයින්ගේ තොරතුරු සොරා ගැනීම ද සිදු වන අතර අවසානයේ ඔවුහු කරදරකාරී ලෙස හැසිරීමටද උත්සාහ දරති. මොවුන් සංගීතඥයෙකු, කලා කරුවෙකු, ක්‍රීඩකයෙකු, ගායකයෙකු හෝ ගුරුවරයෙකු ලෙස ළමයින්ට ආකර්ෂණීය චරිතයක් ලෙස පෙනී සිටිමින් ළමයින් පොළඹවා ගත හැකිය. ක්‍රිඩා ඉගැන්වීමේ මුවාවෙන් හෝ සංගීතය ඉගැන්වීමේ මුවාවෙන් ළමයින් වෙතට ආකාර්ෂණය කරගන්නා මොවුහු

ළමා අපයෝජනයට සුදුසු වාතාවරණයක් ගොඩ නගා ගනිති. කලින් සඳහන් කළ බොහොමයක් උදාහරණවලදී ළමා අපයොජකයින් අනුගමනය කරනු ලැබුවේ මෙකී ක්‍රමයන්ය.

උදා- යුරේනි වයස අවුරුදු 14 දැරියකි. ඇය නමින් Facebook ගිණුමක් පැවතුණි. ඒ හරහා ඇය මිතුරු ඇසුරකට මෙන්ම සිය පාලුව, කාංසිය මකා ගැනීමටත් විනෝදය ලබා ගැනීමටත් උත්සාහ කළාය. දිනක් ඇයට අවුරුදු 21 ක සඳුන් නැමති පුද්ගලයෙකුගෙන් මිතුරු ඇරයුමක් ලැබුණි. ඔහු විශ්වවිද්‍යාලයක ඉගෙනුම ලබන වෛද්‍ය ශිෂ්‍යයෙකු බව අනාවරණය කෙරිණි.

ඔවුන් ඉතා කුළුපගුව ඇසුරු කළ අතර එය නොදැනීම ආදර සම්බන්ධතාවයක් බවට පෙරලුණි. ඇයගේ ප්‍රථම ආදර සම්බන්ධය නිසාවෙන් ඔහු කෙරේ දැඩි ආදරයක් ඇති කර ගත් ඇය ඔහුව දැඩි ලෙස විශ්වාස කළාය. සාමාන්‍යයෙන් පින්තූර හුවමාරු කිරීම පුරුද්දක් ලෙස සිදු වුවත් දිනක් සඳුන් යුරේනිට අසභ්‍ය පින්තූරයක් එවන ලදී. එදා පටන් අසභ්‍ය පින්තූර පමණක් නොව අසභ්‍ය වීඩියෝ පවා ඔවුන් හුවමාරු කර ගන්නා ලදී. ඔවුනොවුන් මුණගැසීමට දිනයක් වෙන් කර ගනු ලැබූ අතර එකී දිනයට යුරේනිද සිය පෞද්ගලික පංති හැර දමා ඔහු මුණගැසීමට ගියාය. සඳුන් විසින් යෝජනා කළ ස්ථානයට ඇය නියමිත වෙලාවට පැමිණ සිටියත් සඳුන් ප්‍රමාද විය. පැය භාගයක් පමණ බලා සිටි යුරේනි ආපසු හැරී යාමට උත්සාහ ගත් අවස්ථාවේ එම ස්ථානය පැමිණි වයස අවුරුදු 40 පමණ පුද්ගලයෙකු ඇගේ අතින් අල්ලා ඇයට

තර්ජනය කර ඇය එවන ලද සියලු ඡායාරූප හා වීඩියෝ අන්තර්ජාලයට මුදා හරින බවත් නිවසට යවන බවත් තර්ජනය කර ඇය බිය ගන්වා එම ස්ථානයෙන් රැගෙන යන ලදී. ඇය රැවටී ඇති බව තේරුම් ගියත් මෙම කුඩා දැරියට වෙන කළ හැකි දෙයක් කල්පනා නොවිණි. ඒ ඇසිල්ලෙන් මෙම වංචනිකයා දැරියගෙන් අයුතු ප්‍රයෝජන ලබා ගත් අතර කුඩා යුරේනී එදින ගැහැණියක් බවට පත් විය. වෙනත් කෙනෙකු ලෙස පෙනී සිටිමින් කරන අපරාධයකට මෙය කදිම නිදසුනකි.

03.2.6. අනවසරයෙන් ඇතුල්වීම (Hacking)

අන්තර්ජාලයේ පවත්නා ඕනෑම ගිණුමක් සඳහා මුරපදයක් පැවතීම ආරක්ෂක විධික්‍රමයකි. නමුත් මෙකී මුරපදය ඇතැම් පුද්ගලයින් විසින් සොරා ගැනීමට උත්සාහ දරන අවස්ථා ඇත. එසේ මුරපද සොරා ගෙන අන් අයගේ ගිණුම් තව කෙනෙකු සතු කර ගැනීම මුරපද සොරා ගැනීම හරහා සිදු වන අනවසර ඇතුලු වීමක් (Haking) ලෙස හඳුන්වයි. මෙසේ මුරපද සොරා ගෙන වෙනත් අයෙකුගේ ගිණුමක් තමා සතු කර ගනිමින් විවිධ වංචා සිදු කරයි. ඔහු හෝ ඇයගෙන් පෞද්ගලිකව පළිගැනීම් සිදු කරයි. නාමයට හානි සිදු කරයි. නැතහොත් අයුතු ප්‍රයෝජන ගනී. මෙවැනි මුරපද සොරා ගනු ලැබූ අවස්ථා කොතෙකුත් අසන්නට ඇත. මේ හා සම්බන්ධ පැමිණිලි බොහොමයක් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය වෙතත් අපාරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුව වෙතත් මෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙතත් ලැබී ඇති බව වාර්තා වේ. එවැනි හිංසාවලින් ආරක්ෂා වීමට නම් පුද්ගලයින් මෙවැනි මුරපද සොරා ගනු ලබන ආකාරය පිළිබඳව යම් වැටහීමක් තිබීම ඉතා වැදගත්ය. එවැනි ක්‍රම කිහිපයක් ඇත.

01 අනුමාන කිරීම (Guessing)



ඔබගේ මුරපදය ඉතා ලෙහෙසි හා පහසු මුරපදයක් නම් එය අනුමාන කර භාවිතා කර ඔබගේ අන්තර්ජාල ගිණුම ඔවුන් අතට පත් කර ගැනීම මෙයින් අදහස් කෙරේ. බොහෝ මුරපද සොරා ගෙන ගිණුම් අත්පත් කර ගන්නෝ මෙම ක්‍රමය භාවිතයට ගනිති. ඊට හේතු වනුයේ ඔබගේ මුරපදය ඉතා දුර්වල ගණයේ එකක් වීමයි. ඔබ යොදා ගනු ලබන මුර පදය ඔබගේ දුරකථන අංකය නම් හෝ 1,2,3,4,5 වැනි පහසු ගණයේ දුර්වල මුරපදයක් නම් හෝ ඔබගේ නම ඒ සඳහා භාවිතා කර ඇත්නම් හෝ ඔබගේ ගිණුම සොරා ගැනීමට ඔවුනට ඉතා පහසුය.

මෙවැනි මුර පද යෙදීමෙන් අන්තර්ජාල ගිණුම් සොරා ගැනීමට පහසු වන බැවින් ඉතා හොඳ ශක්තිමත් මුරපදයක් භාවිත කිරීම ඉතා වැදගත්ය.

02 හොරෙන් බලා සිට ලබා ගැනීම (Shoulder Surfing)

ඔබ අන්තර්ජාල ගිණුමට ඔබගේ මුරපදය ඇතුළත් කරන අවස්ථාවේ දී හොරෙන් බලා සිට මුරපදය සොරා ගැනීම ද තවත් ක්‍රමයකි. සමහරවිට ඔබගේ පරිගණකය ඉදිරිපිට රහසිගත කැමරාවක් (Hidden Camera) සවිකර තබා හෝ එසේත් නොමැති නම් ඔබගේ ඉතා කුළුපඟු මිතුරෙකු ලෙස ළඟින් සිට හොරෙන් බලා හෝ ඔබගේ මුරපදය අත්පත්කර ගත හැකිය. එබැවින් මුරපදය ඉතා ප්‍රවේශමෙන් තබා ගැනීමට භාවිතකරන්නා වගබලා ගත යුතුයි.

03 සෝෂල් ඉංජිනියරින් (Social Engineering)

අන්තර්ජාල ගිණුම් හිමියන් සමඟ උපක්‍රමශීලී ලෙස දැඩි මිත්‍රත්වයක් හෝ විශ්වාසයක් ගොඩනගා ගනිමින් ඉතා වංචනික ලෙස ඔබව රවටා ඒ මගින් ඔබගේ මුරපදය හා පරිශීලන නාමය සොරා ගැනීම මෙයින් අදහස් කරයි.

සැබැවින්ම මෙය සොරා ගැනීමක් නොවන අතර ගිණුම් හිමියා විසින්ම තම ගෙළ සිරකර ගැනීමක් වැනිය. මෙය යෞවනයේ සිටින බොහෝ දෙනෙකු විසින් සිදු කර ගනු ලබන වරදකි. ආදර සම්බන්ධතාවය හෝ දැඩි මිත්‍රත්වය මත ඇති වන විශ්වාසය මත පදනම්ව ඔබගේ මුරපදය ඔහු සමඟ හුවමාරුකර ගැනීමට පෙළඹෙන අතර අනෙකාගේ අරමුණ ඔබට හානි කිරීම විය හැකියි. එයින් අයුතු ප්‍රයෝජන ගන්නා පුද්ගලයා ඔබගේ මුරපදය වෙනස් කර ඔහු විසින් එකී ගිණුම ඔහුගේ ග්‍රහණයට රැගෙන ඔබට අන්තර්ජාල ගිණුම හරහා හානි කිරිමට කටයුතු කරනවා විය හැකිය. මුරපදයක් ගිණුම් හිමියාට අමතරව තවත් කෙනෙකු අතට පත් වනවා යනු එයින් පසු එය තවදුරටත් ශක්තිමත් මුරපදයක් නොවේ. එබැවින් අන්තර්ජාල මුරපදයක් සිකිම හේතුවක් මත තවත් කෙනෙකුගේ අතට පත්වීමට ඉඩ නොතැබිය යුතුය.

04 ෆිෂින් (phishing)

ඉහතින් සඳහන් කළ මිනිස් ක්‍රියාකාරකම් අභිබවා ගොස් නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් මුරපද සොරා ගනු ලබන ක්‍රමවේදයක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය. වර්තමාන නවීන තාක්ෂණික ලෝකය තුළ මෙකී ක්‍රමවේදය අන්තර්ජාල සොරුන් අතර වඩාත්

ජනප්‍රියව පවතී. මෙහිදී සිදු වනුයේ ඔබගේ වෙබ් අඩවියට ඉතාමත් සමාන තවත් වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ තුළට ඔබගේ පරිශීලන නාමය හා මුරපදය ඇතුළු කිරීමට ඔබට ඉඩකඩ සැලසීමයි.

නමුත් ඔබ තොරතුරු ලබා දී ඇත්තේ ඔබගේ නියම වෙබ් අඩවියට නොව ඊට සමාන වෙනත් ව්‍යාජ වෙබ් අඩවියකටය. ඒ හරහා ඔබගේ ගිණුමේ පරිශීලන නාමය හා මුරපදය උපක්‍රමශීලීව ඔවුන් අතට පත් කර ගනී.

උදාහරණයක් ලෙස ඔබ Facebook.com වෙත ඔබගේ මුරපදය හා පරිශීලන නාමය ඇතුළු කරනවා වෙනුවට ඔබගේ නොසැලකිල්ල නිසා ඔබ දත්ත ඇතුළත් කරනු ලබන වෙබ් අඩවිය Facebooks.com විය හැකිය. නමුත් ඔබ එහි අමතර s අකුර නොදකිනවා විය හැකිය. මෑත කාලයේ දී එවැනි සිදු වීමක් පෙන්වා දිය හැකිය. සමාජ ජාල වෙබ් අඩවියක් වන twitter.com වෙත පිවිසෙන බොහෝ දෙනෙකු නොමග යවා තිබූ ව්‍යාජ වෙබ් අඩවියක් හඳුනා ගත හැකි විය. එම ව්‍යාජ වෙබ් අඩවිය වූයේ tvvitter.com යන්නයි. නිවැරදි වෙබ් අඩවිය යැයි නොසැලකිලිමත් ලෙස දෙවැනි ව්‍යාජ වෙබ් අඩවියට තොරතුරු ඇතුළත් කළ බොහෝ දෙනෙකුගේ මුරපද සමඟ එම ගිණුම් සොරා ගෙන තිබුණි. එබැවින් ඔබ කිසිදු විටක හදිස්සියෙන් විමසිලිමත් බවින් තොරව නොසැළකිලිමත් ලෙස ඔබගේ මුරපදය හා පරිශීලන නාමය ඇතුළත් කිරීමෙන් වළකින්න. හැම විටම

කල්පනාකාරීව මුරපදය ඇතුළත් කරනුයේ නිවැරදිම වෙබ් අඩවියට ද යන්න එලඹ සිටි සිහියෙන් යුතුව කටයුතු කිරීමට උත්සාහ ගන්න.

05 ස්පෑමින් (Spamming)

දිගින් දිගටම අනවසරයෙන් පනිවුඩ එවීමකි. මෙය කරදරකාරී ක්‍රියාවක් වන අතර ඒ තුළ සැගවී යම් ගිණුමකට එනු ලබන පණිවිඩයක් මඟින් හෝ මෘදුකාංගයක් මඟින් මුරපදය හා පරිශීලන නාමය සොරාගැනීමක් මේ යටතේ සිදු විය හැකිය. එම පණිවිඩයට අනුව එකී ගිණුමට තොරතුරු ඇතුළත් කිරීම මත හෝ එකී මෘදුකාංගය ඔබගේ ඉලෙක්ට්‍රෝනික උපකරණයට ඇතුළත් කර ගැනීම හරහා හෝ ඔබටද නොදැනීම ඔබගේ තොරතුරු සොරා ගත හැකිය.

නවීනතම තාක්ෂණික උපක්‍රමයක් ලෙස මෙම සූක්ෂම ක්‍රමවේදය භාවිතයට ගනු ලබන අන්තර්ජාල සොරුන්ගෙන් ප්‍රවේශම් වීමට ඉතා කල්පනාකාරී විය යුතුයි.

03.2.7. නොමඟ යවන වෙබ් අඩවි භාවිතය

අන්තර්ජාලය තුළ පවත්නා සෑම වෙබ් අඩවියක්ම ළමා මනසට සුදුසු මට්ටමේ නොමැති බව ඔබ දැනටමත්

හොඳින් අවබෝධ කර ගෙන ඇත. ළමයින්ගේ මනස විකෘති කරන වෙබ් අඩවි රැසක් අන්තර්ජාලය තුළ තිබේ. ළමයින් එම ඉසව්වලට ඇදී යාම වැඩිහිටියන් විසින් පාලනය කළ යුතුය. නමුත් එයින් ආරක්ෂා කිරීමට යැයි සිතා ළමයින් අන්තර්ජාලයෙන් දුරස්කර තැබිය යුතු යැයි එයින් අදහස් නොකෙරේ. මේ විශ්වයේ පවත්නා සෑම දැනුමක්ම ළමා කාලයේ ලැබිය යුතු නොවේ. එබැවින් දැනුම පවා පාලනය කළ යුතුය. දැනුම සෙවීමට යැයි අන්තර්ජාලයට පිවිසෙන ළමයින්ගේ මානසිකත්වය පහත හෙළිය හැකි ඇබ්බැහි විය හැකි, ඉසවු කිහිපයක් පිළිබඳව මෙහිදී අවධානය යොමු කරමු.

01 අසභ්‍ය වෙබ් අඩවි හා අන්තර්ජාල සම්භාහන මධ්‍යස්ථාන

02 මත්ද්‍රව්‍ය ජාවාරම් සහිත වෙබ් අඩවි

03 සූදු / ක්‍රීඩා වෙබ් අඩවි

අසභ්‍ය වෙබ් අඩවි

නව යෞවන වයසේ පසු වන ළමයින්ගේ කායික මානසික හා සමාජීය සංවර්ධනයත් සමඟ ලිංගික උද්දීපනයක් ඇතිවීම හා ලිංගිකත්වය පිළිබඳව සොයා බැලීමට යොමු වීමත් අසාමාන්‍ය නොවේ. එහෙත් ළමයෙකු අසභ්‍ය වෙබ් අඩවිවලට හුරුවීම හෝ ඒවා බැලීමට ඇබ්බැහි වීම ළමා මානසිකත්වය විකෘති තත්තවයට පත් කළ හැකියි. ඔබේ දරුවා අන්තර්ජාලය තුළින් අසභ්‍ය වෙබ් අඩවියක්

නරඹමින් සිටිනවා ඔබ දැක්කෙහි නම් දෙමාපියන් ලෙස ඔබ ඊට කෙසේ ප්‍රතිචාර දැක්විය යුතුද? එය කිසිසේත් සිදු නොවිය යුතු බරපතල වරදක් සේ සළකා හැසිරෙන දෙමාපියන් ද දැක ගත හැකිය. එසේම ඇතැම් දෙමාපියන් එය එතරම් ගණන් ගත යුතු දෙයක් නොවන බව සළකා එය නොසළකා හරින අවස්ථාද දැකිය හැකිය. සැබැවින්ම එය විශාල වරදක් හෝ නොසළකා හැරිය යුතු තත්ත්වයක් නොවේ. එවැනි දෙයක් ළමයා නරඹනු ඔබ දුටුව හොත් කළබල නොවන්න. මදක් නිහඬව එම ස්ථානයෙන් ඉවත් වන්න. සන්සුන් වන්න. එම අවස්ථාවේ එකී ගැටළුවට විසඳුම් ලබා දීමට යාමෙන් වළකින්න. මන්ද, එම අවස්ථාවේ ඔබත් ළමයාත් සිටිනුයේ නොසන්සුන් තත්වයකය. ටික වේලාවකින් ඔබ සන්සුන් වූවාට පසු සුදුසු පරිසරයකට ළමයා කැඳවා ගන්න. මන්ද මෙවැනි දේවල් වෙනත් අය ඉදිරියේ විසඳීමට යාම ළමයා දැඩි ලෙස අපහසුතාවයට පත් විය හැකි බැවිනි. ප්‍රසිද්ධියේ කථා නොකරන්න. ළමයාට ආදරෙන් යථාර්ථවාදීව කථාකරන්න. මෙහිදී ලිංගිකත්වය සෑම සත්වයෙකුම සිය වර්ගයා බෝ කිරීම සඳහා සිදු කරන්නක් බවත් ඒ සඳහා නියමිත කාලයක්, අවස්ථාවක් පවත්නා බවත් මෙවැනි දේවල් අත්හදා බැලීමට යාමෙන් බොහෝ දරුවන්ට සිය ළමා කාලය අහිමි වී යන බවත් උදාහරණ සහිතව කාරුණිකව පහදා දෙන්න. එසේම මෙවැනි දර්ශන මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් තැනූ චිත්‍රපටයක් බවත් එම චිත්‍රපට තුළ පවත්නා දර්ශන ප්‍රායෝගික නොවන බවත් දීර්ඝ කාලයක් තුළ අවස්ථා කිහිපයක දී පටිගතකර ගත් දර්ශන කිහිපයක්

එක දිගට පෙළගස්වා තැනූ චිත්‍රපටයක් බවත් එවැනි ක්‍රියා ප්‍රායෝගික නොවන බවත් එහි පවත්නා බොහෝ දේ සැබෑ ලෝකයේ දී සිදු කළ නොහැකි බවත් පැහැදිළි කරන්න. මන්ද බොහෝ අසභ්‍ය දර්ශන නරඹීමට ඇබ්බැහි වූ පුද්ගලයින් එහි තිබෙන දේවල් ප්‍රායෝගිකව සිදු කිරීමට නොහැකි වූ විට මානසිකව බිඳ වැටී සිය ලිංගික ජීවිතය අතෘප්තිකර තත්වයට පත්කර ගන්නා බවත් එසේම එවැනි ක්‍රියා අත්හදා බැලීමට යාමෙන් පුද්ගල ජීවිත බිඳවැටීම්වලට ලක් වන බවත් උදාහරණ සහිතව පැහැදිළි කරන්න. තවද මෙවන් සිද්ධීන් සමාජගත නොකර දරුවාට එහි ඇති සෘණාත්මක ප්‍රතිවිපාක ධනාත්මක ප්‍රවේශයකින් කියාදීමට දෙමාපියන් කටයුතු කළ යුතුව තිබේ. ඔබගේ අවවාද පිළිනොගනිමින් නැවත නැවත එවන් සිදුවීම් සිදු වන බවට හැඟී යන්නේ නම් ඒ පිළිබඳ විශේෂඥයෙකුගේ සහය ලබා ගැනීමට කටයුතු සිදුකිරීම වඩාත් සුදුසුය.

අන්තර්ජාල සම්භාහන මධ්‍යස්ථාන

අන්තර්ජාලය තුළළමයින් සම්භාහන මධ්‍යස්ථාන තුළට කැදවා ගැනීමේ කූඨ ජාවාරම් ද ක්‍රියාත්මකයි. එවැනි තැන්වලට ළමයින් කැඳවා ඔවුන් ලිංගික අපයෝජනයන්ට යොමු කර ගැනීමේ සිදුවීම්ද වාර්ථා වේ. නැතහොත් තනි පුද්ගලයින් ලෙස සම්භාහනය කිරීමේ සේවාවන් ලබාදෙන මුවාවෙන් ළමයින් වෙතට පිවිස ලිංගික සූරාකෑමට ලක්කර ගන්නා අවස්ථා ද දැකිය හැකිය. එබැවින් එවැනි ලිංගික ගොදුරු සොයන පුද්ගලයින්ගෙන් ඔබේ ළමයා ආරක්ෂා කර

ගැනීමට ළමයා දැනුවත්කර තැබීම ඉතා වැදගත්ය. මෙවැනි ක්‍රියාවන්ට යොමු වීම තුළ ඇති විය හැකි අවධානම ද ළමයාට පහදා දෙන්න. ලිංගික අපයෝජනවලට ලක් වුව හොත් ඇති විය හැකි කායික, මානසික අපහසුතා මෙන්ම එවැනි දේවලට ඇබ්බැහි වීම නිසා සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට පවත්නා අභියෝගය ද අධ්‍යාපනයට, පෞරුෂයට ඇති විය හැකි බලපෑම ද පහදා දීම ඉතා වැදගත්ය.

අන්තර්ජාල මත්ද්‍රව්‍ය ජාවාරම්

වර්තමානයේ අන්තර්ජාලය මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ප්‍රධාන තිප්පොලක් බවට පත්ව ඇත. මත් ද්‍රව්‍ය ප්‍රචාරණයට, වෙළදාමට, බෙදාහැරීමට හා ගනුදෙනුකරුවන් සොයා ගැනීමට වර්තමානයේ අන්තර්ජාලය ප්‍රධාන මාධ්‍යයක් බවට පත් ව තිබේ. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අන්තර්ජාලය හරහා ළමයින් සමඟ සම්බන්ධවී හොර රහසේ ළමයින් අතට මත්ද්‍රව්‍ය පත් කිරීම පිළිබඳ විමර්ශන කිහිපයක්ම සිදුව ඇත.

එමෙන්ම Credit Card / ezcash හරහා ගෙවීම් කර මත්ද්‍රව්‍ය ගෙන්වා ගැනීමේ හැකියාවක් ද පවත්නා අතර පළමුව මත්ද්‍රව්‍ය හෝ මත් පෙති නොමිළේ ලබාදීමට තරම් මෙම

පුද්ගලයින් උපායශීලී වේ. එබැවින් මෙකී අනතුර පිළිබඳවද ඔබගේ අවධානය යොමු වීම ඉතා වැදගත්ය.

අන්තර්ජාල සූදු

ඔබගේ දරුවා ඔබගේ හෝ තමන්ගේ ම Credit Card පත හෝ Debit Card පත භාවිත කරමින් මුදල් ගෙවීම් කර අන්තර්ජාලය ඔස්සේ සූදු ක්‍රීඩාවල නිරත විය හැකියි. එයින් තම ගිණුමට මුදල් ලැබෙන විට ඉන් උද්දාමයට පත් වන ළමයා දිගින් දිගටම එකී ක්‍රීඩාවේ නිරත වීමට යාමෙන් ළමයාටද නොදැනී ඔහු ඊට ඇබ්බැහි විය හැකිය.

පසුව කූඨ ක්‍රම මගින් දිනුම් අවස්ථා ක්‍රමයෙන් අඩු කරමින් ළමයාගේ මුදල් සූරාකෑමට මෙකී ව්‍යාපාරිකයින් කටයුතු කරයි. සමහර විට ළමයාගේ Credit Card පත ඔවුන් සතු කර ගැනීමෙන් මුදල් වංචා කිරීමටද පෙළඹිය හැකිය. එබැවින් ළමයාට අන්තර්ජාලය හරහා Credit Card හෝ Debit Card භාවිතයට ඉඩ ලබා නොදීම ළමයාගේත් ඔබගේත් ආරක්ෂාවට යහපත් වනු ඇත.

අන්තර්ජාල ක්‍රීඩා

ජාලගත ක්‍රීඩාවක් යනු ආංගිකව හෝ මූලිකව අන්තර්ජාලය හරහා හෝ වෙනත් පරිගණක ජාලයක් හරහා ක්‍රීඩා කරනු ලබන ක්‍රීඩාවකි.[26] මුදල් වංචා බහුල ලෙස සිදු නොවුවද ඇතැම් අන්තර්ජාල ක්‍රීඩා ළමයාගේ මානසික යහපැවැත්ම ට දැඩි බලපෑමක් එල්ල කළ හැකිය. විශේෂයෙන්ම ළමා මනසට ගෝචර නොවන, මනස විකෘති කරන, ප්‍රචණ්ඩත්වයට ඉඩකඩ සලසන පරිගණක ක්‍රීඩා හා අන්තර්ජාල ක්‍රීඩා රැසක් වර්තමානයේ දක්නට ලැබේ.

ඇතැම් විට මනෝවිද්‍යාත්මක ත්‍රස්තවාදය වැපිරීමට සමත් අන්තර්ජාල ක්‍රීඩා ද ඇතැම් සමාජ විරෝධී පුද්ගලයින් විසින් නිර්මාණය කර ඇත. උදාහරන ලෙස Blue Whale, Momo Challenge වැනි ක්‍රිඩා පෙන්වා දිය හැකිය. මෙවැනි ක්‍රීඩා පිළිබඳව ද අප රටේ වැඩිහිටි පරපුරට පුළුල් අවබෝධයක් නොමැත. එබැවින් ළමයින් ඉල්ලා සිටි විට දී එම ක්‍රිඩා රැගෙන දීමට ඔවුහු උත්සුක වෙති.

[26] EDUCSIRT පුහුණු අත් පොත -2015

නමුත් ඇතැම් ක්‍රීඩා ළමයාගේ වයසට නොගැළපිය හැකිය. ඇතැම් පරිගණක හෝ අන්තර්ජාල ක්‍රීඩා දිගින් දිගටම පරාජයට පත් වීමේ ප්‍රතිඵලයක් ලෙස අභියෝග ජය ගැනීමට නොහැකිව "මට ජයගත නොහැකිය" යන සෘණාත්මක සිතුවිලි දිගින් දිගටම ළමා මනස තුළ තැන්පත් වීම නිසා ළමයා තුළ ඉච්ඡාභංගත්වය වර්ධනය වී සෘණාත්මක සිතුවිලි මනස තුළ මුල් බැස ගත හැකියි. එසේම ප්‍රචණ්ඩකාරී හෝ සමාජ විරෝධී චර්යා සහිත ක්‍රීඩා තුළ නිරත වීම නිසා ළමා මනස ද ඊට අනුව අනුවර්ථනය විය හැකිය. නමුත් ළමයින්ට සුදුසු පරිගණක ක්‍රීඩා ද නැතිවාම නොවේ. ඒ තුළින් ළමයාගේ හසුරු කුසලතාව, තීරණ ගැනීමේ හැකියාව, නිර්මාණශීලීත්වය, බුද්ධිය, වේගය ඉහළ තත්වයකට රැගෙන ඒමට සමත් ක්‍රීඩා ද පවතී.Chess,Brain Champ,Typing Master, Scrabble වැනි ක්‍රීඩා ඒ සඳහා පෙන්වා දිය හැකියි. එබැවින් වයස් සීමාව අනුව සුදුසු පරිගණක ක්‍රීඩාවක් ඔබේ ළමයාට ලබා දීමට පහත සඳහන් (වගු අංක 02) ප්‍රමිතිකරණය අනුව තෝරා බේරා ගත හැකිය.

වෙළඳ පොළේ ඇති CD තැටියේ ඇති කවරයේ මෙකී ප්‍රමිති සලකුණ සටහන් කර තිබේ දැයි සොයා බලා ඔබගේ ළමයාගේ වයසට සරිලන ආකාරයේ ක්‍රීඩාවක් තෝරා දීමට බුද්ධිමත් විය හැකිය.

අදාළ සලකුණ	**වයස් සීමාව**
E- (Every one)	ඕනෑම වයස් කාණ්ඩයකට සුදුසුයි.
EC–(Early Childhood)	අවුරුදු 03 හා ඊට ඉහළ අයට සුදුසුයි.
10+E- (Every one)	අවුරුදු 10 හා ඊට ඉහළ අයට සුදුසුයි.
T – (Teen)	අවුරුදු 10 හා ඊට ඉහළ අයට සුදුසුයි. (ගැටුම් පැවතිය හැකිය)
M- (Mature)	අවුරුදු 17 හා ඊට ඉහළ අයට සුදුසුයි. (සැහැසි ක්‍රියා හා ප්‍රචණ්ඩ ක්‍රියා අන්තර්ගත විය හැකිය)
AO– (Adults Only)	අවුරුදු 18 හා ඊට ඉහළ අයට සුදුසුයි. (සැහැසි ක්‍රියා ප්‍රචණ්ඩ ක්‍රියා ලිංගික දර්ශන ඇතුළත් විය හැකිය.)
RP–(Rating Pending)	අත්හදා බැලීම සඳහා වෙළඳ පොළට ඉදිරිපත් කර ඇති/ESBR හී අනුමැතිය තවම ලැබී නැති

වගු අංක- 02

හතරවන පරිච්ඡේදය

අන්තර්ජාල භාවිතයේ අවධානම් සාධක

අන්තර්ජාලය යනු පද්ධතියකි. එකී පද්ධතියේ පාර්ශවකරුවන් විශාල සංඛ්‍යාවක් සිටිති. එවන් එක් පාර්ශ්වකරුවෙකුගේ යම් ක්‍රියාවක් මුලු පද්ධතියම අනාරක්ෂිත කළ හැකිය. එබැවින් පද්ධතියක් සුරක්ෂිත කිරීම පහසු කටයුත්තක් නොවේ. එහෙත් එය කළ නොහැක්කක්ද නොවේ.

පද්ධතියක් සුරක්ෂිත කරනවාට වඩා එකී පද්ධතිය සුරක්ෂිතව භාවිතා කිරීම ඉතා ලෙහෙසි හා පහසු කටයුත්තකි. මුලු සමාජයක් එක්වර වෙනස් කිරීමට වඩා එකිනෙකා තනි තනිව නිවැරදි කිරීම පහසුය. එපරිද්දෙන්ම අන්තර්ජාල පද්ධතිය සුරක්ෂිත කිරීමේ ලෙහෙසිම හා පහසුම ක්‍රමය වනුයේ එකිනෙකා සුරක්ෂිතව භාවිතා කිරීමයි. සුරක්ෂිතව භාවිතා කිරීම යනු පෞද්ගලික කාරණයකි. එහෙත් සුරක්ෂිත කිරීම යනු සාමූහික කාරණයකි. ඒ සඳහා බහුපාර්ශ්වීය එළඹුමක්

අවශ්‍ය කරයි. මෙකී සංදර්භය තේරුම් ගැනීමටත් එකී සංදර්භය තුළ විය යුත්තේ කුමක්ද යන්න දැන ගැනීමටත් අන්තර්ජාල සුරක්ෂිතතාවය ඇති කිරීම කෙරෙහි පිවිසුම් මාර්ගයක් ලෙස පරිසර විද්‍යාත්මක ආකෘතිය (Ecological model) මනාව භාවිතයට ගත හැකිය.

යම් අනාරක්ෂිත ස්ථානයක් ආරක්ෂාකාරී කිරීමට නම් එකී ස්ථානයේ අවධානම් සාධක මොනවාද යන්න පැහැදිලිව හඳුනා ගැනීම එහි පළමු කාර්යයි. එකී කාර්යය උදෙසා මට්ටම් හතරකින් ඒ සඳහා පවත්නා අවධානම් සාධක පාරිසරික ආකෘතියට (Garbarino,1997) අනුව හඳුනා ගත හැකිය.

01 පුද්ගල මට්ටම (Individual Level)

02 සමීප සබඳතා මට්ටම (Relationship Level)

03 ප්‍රජා මට්ටම (Community Level)

04 සමාජ/සංස්කෘතික මට්ටම (Societal Level)

අන්තර්ජාලය භාවිතා කරන ළමයා සයිබර් අවකාශය තුළින් හිංසනයට හෝ අපයෝජනයට ලක්වීමේ දී මෙකී මට්ටම් හතරෙහිම පවත්නා අවධානම්කාරී සාධක බලපෑම් කරනු ඇත. යම් අවධානමක් නිර්මාණයවීමට නම් පුද්ගලයා විසින්ම අවධානම් සාධක ගොඩනගා ගත හැකිය. එසේම තමා වටා සිටින සමීප කණ්ඩායම් වන සමවයස් කණ්ඩායම් පවුලේ තත්තවයන් පාසලේ ස්වභාවය වැනි තත්තවයන් ද

මෙහිදී බලපෑම් කළ හැකියි. ළමයින් අන්තර්ජාලය තුළ අනාරක්ෂිත කිරීමට ප්‍රජාවේ අඩු ලුහුඩුකම් ද බලපාන අතර එකී ප්‍රජාවේ සංස්කෘතික සාධක ද ළමයින් අතුරු අවධානම්වලට ලක් වීමට අවශ්‍ය අවදානම් සාධක මතු කළ හැකියි. එබැවින් එකී මට්ටම් හතරම වෙන වෙනම විමසා බලමු.

04.1. පුද්ගල මට්ටම (Individual Level Influences)

අන්තර්ජාලය පරිහරණය කිරීමේ දී ඒ තුළළමයා අනාරක්ෂිත වීම හා අපයෝජනයන්ට ලක් වීම හෝ අපරාධවලට යොමුවීමට ළමයා තුළින්ම මතු වන ආකල්ප, චර්යා රටා හෝ ක්‍රියාකාරකම් මත අවධානම් සාධක රැසක් හඳුනා ගත හැකියි. එකී අවධානම් සාධක ආරක්ෂක සාධක බවට පරිවර්ථනය කර ගැනීමට නම් ඒවා නිවැරදිව හඳුනා ගත යුතුව තිබේ. එබැවින් එම අවධානම් සාධක එකිනෙක විමසා බලමු .

- වගකීමෙන් භාවිත නොකිරීම
- අන්තර්ජාලය තුළ අධි සක්‍රීය ළමයෙකු වීම
- නිවැරදි දැනුම නොමැතිවීම
- සහකම්පනය නොමැතිවීම
- හිංසාකාරී මානසිකත්වය
- සුරක්ෂිත තාක්ෂණික විධි භාවිත නොකිරීම
- බුද්ධිමත්ව භාවිත නොකිරීම

- ස්වයං පාලනය හා වාරණයක් නොමැතිවීම
- වින්දිතානුයෝජනය/කලින් අපයෝජන අවධානමක සිටීම
- ගැටළු විසඳීමේ කුසලතා මඳ බව
- සදාචාරාත්මක නොවීම
- සයිබර් අපරාධ පිළිගැනීම හෝ අනුමත කිරීම
- මානසික ආතතිය හෝ පෞරුෂ ආබාධ
- නීතිය නොදැනීම හෝ නීතියට සමෝධානය නොවීම

අප ජීවත් වන ඕනෑම මොහොතක් තුළ කුමන හෝ ආකාරයක අවධානමක් පැවතිය හැකිය. ජීවත් වීමම යනු අවධානම්වලට මුහුණදීමකි. එහෙත් ළමයෙකු අන්තර්ජාලයට පිවිසීම එකී අවධානම තවත් වැඩි කරනු ලබනවා. නමුත් එකී අවදානම අවම කිරිමේ ක්‍රම උපායන් දෙමාපියන් ගුරුවරුන් හා වැඩිහිටියන් ලෙස බුද්ධිමත්ව සමෝදානය කරගත යුතුය. අන්තර්ජාලය පරිහරණය කරන්නන් එය වගකීමෙන් භාවිතා නොකිරීම මෙම සියලු ගැටළුවලට බලපාන්නකි. ඕනෑම දෙයක් සිදු කිරිමේ දී වගකීමක් නොමැති නම් එතැන අවභාවිතයක් වන්නට පුළුවන. ඔබ විසින් කරන කියන සියලු දේ සඳහා ඔබ වගකිව යුතුයි. වගකීමෙන් කටයුතු කරන අයෙකුට වෙනත් අයෙකුගේ ජීවිතවලට වගකීමක් ඇත. එබැවින් ඔබ Online සිටින විටත් Offline සිටින විටත් අනිත් අයට ගෞරවයෙන් යුක්තව කාරුණිකව සැලකීම වගකීමක් සහිත පුද්ගලයාගේ ස්වභාවයයි. එහෙත් සාමාන්‍ය ජීවිතයේ දි

බොහෝ දෙනෙකු ගෞරවණීය වුවත්, කාරුණික වුවත් අන්තර්ජාලයේ කටයුතු කිරීමේ දී එකී ගෞරවණීය බව හා කාරුණික බව මදක් අඩු වන ස්වභාවයක් දැකිය හැකියි. යමෙකු අන්තර්ජාලයට ඇතුළත් වු පමණින් ඔහුගේ/ඇයගේ අනන්‍යතාවය එසැණින් වෙනස් වන්නේ නැහැ. එසේම යුතුකම්, වගකීම් හා ස්වභාවයන් ද අමතක කළ නොහැකියි. සිය අනන්‍යතාවය හෙළි නොවන අයුරින් අන්තර්ජාලයේ අන් අයට අකාරුණික ලෙස කටයුතු කරන ගිණුම් බොහොමයක් දකින්නට පුළුවනි. මෙය වීරකමක් හෝ සතුටට කරුණක් නොවන බව සමාජය දැනුවත් කළ යුතුයි. සැබැවින්ම එය පෞරුෂය පිළිබඳ ගැටළුවකි. අන්තර්ජාලය යනු තවත් කෙනෙකුට සැඟවී සිට පහරදෙන ස්ථානයක් නොවේ. මිනිසෙකු ලෙස තවත් මිනිසෙකු දෙස සංවේදීව, කාරුණිකව මනුෂ්‍යයෙකු ලෙස දකින්නට නොහැකි නම් අනෙකාගේ ගැටළුවක්, ප්‍රශ්නයක්, වැරදීමක්, ස්වභාවයක් තවකෙකුගේ සිනහවට හෝ සමච්චලයට හේතුවක් නම් එය සැබවින්ම එකී විහිළුවට ලක් වන්නාගේ ගැටළුවක් නොව, ඒ දෙස බලන අනෙක් පුද්ගලයාගේ දුර්වලතාවකි. ඔබ අන් අයගෙන් බලාපොරොත්තු වන කරුණාව, ගෞරවය, සැලකිල්ල අනිත් අය ද එලෙසම බලාපොරොත්තු වන බැවින් ඔවුනට ද එකී ගෞරවය ලබාදීමට කාරුණික වන ලෙස ළමයින්ව පුහුණු කළ යුතුය.

අකාරුණික බව, අනෙකා ගැන නොසිතීම, ආත්මාර්තකාමී බව නිසා අන් අයගේ තොරතුරුවලට හානි

කිරීමට පෙළඹෙන අවස්ථා පවතී. වෙනත් අයගේ අන්තර්ජාල ගිණුම්වලට හොර රහසේ ඇතුළු වී ඔවුන්ගේ දත්ත මකා දැමීම, දත්ත වෙනස් කිරීම, දත්ත විකෘති කිරීම, තොරතුරුවලට හානි කිරීම, පෞද්ගලිකත්වයට විනාශ කිරීම, ප්‍රතිරූපයට හානි කිරීම, යහපත් අන්තර්ජාල භාවිත කරන්නෙකුගේ ස්වභාවයක් නොවේ. මෙවැනි සිදු වීම් නිසා නිරන්තරයෙන් වර්තමාන තරුණ ප්‍රජාව වෙත එල්ල වන චෝදනාවක් වනුයේ අන්තර්ජාලය අවභාවිත කරමින් හානිකර ලෙස කටයුතු කරන බවයි. එම චෝදනාවේ සාධාරණ බවක් පවත්නා මුත් ඔවුනට නිවැරදි ලෙස අන්තර්ජාලය තුළ හැසිරෙන ආකාරය පිළිබඳව අප විසින් උගන්වා නොමැති නම් හෝ ඒ සඳහා අප විසින් නිවැරදි මඟ පෙන්වීමක් නොමැති නම් හෝ එකී මගපෙන්වීම ලබා දීමට වැඩිහිටි පරපුරට දැනුම නොමැති නම් එකී චෝදනාව සාධාරණ නොවිය හැකිය.

අන්තර්ජාලයේ සැරිසරන විට කාරුණික බව මෙන්ම බුද්ධිමත් බවත් ඉතාම වැදගත්ය. අන්තර්ජාලය තුළදී අන් අයට හානි සිදු නොකිරීම මෙන්ම අනිත් අයගෙන් තමාට සිදු විය හැකි හානිවලින් වැළකී සිටීමද ඉතා වැදගත් වේ. එවැනි අහිතකර අවස්ථාවලින් මිදී කටයුතු කරන්නට නම් අන්තර්ජාල පරිහරණයේ දී බුද්ධිමත් විය යුතුයි. වර්තමාන තරුණ ප්‍රජාවේ අන්තර්ජාල භාවිතය දෙස බලන විට බුද්ධිමත් නොවන බොහෝ ක්‍රියාකාරකම් දකින්නට හැකි යි. අන්තර්ජාලය තුළ යමක් සිදු කිරීමට පෙර ඒ පිළිබඳව

බුද්ධිමත්ව සිතා බලා ක්‍රියාත්මක වීමට ළමයින්ට උගන්වා තිබීම ඉතා වැදගත් වේ. එසේම අන්තර්ජාලයේ දී පුද්ගලයෙකු හෝ යම් තොරතුරක් එකවර විශ්වාස නොකරන ලෙස දැනුම ලබා දීමත් විමසිලිමත්ව කටයුතු කිරීමට පුරුදු කිරීමත් ප්‍රතිචාර දැක්වීමට පෙර ප්‍රශ්න කිරීමටත් තර්ක කිරීමටත් පුහුණුව ලබා දිය යුතුයි. එකී තොරතුර හෝ සම්බන්ධතාවය හරහා තමනට හානියක් සිදු නොවේ නම් හෝ අන් අයට හානියක් සිදු නොවේ නම් හෝ සමාජයට හානියක් සිදු නොවේ නම් පමණක් ක්‍රියාත්මක විය යුතුය. විශේෂයෙන්ම අන්තර්ජාලය තුළින් ඔබ පිළිබඳ උනන්දු වන අය, ආදරය ප්‍රකාශ කරන අය, ඡායා රූප ඉල්ලා සිටින අය, පෞද්ගලික තොරතුරු විසමන අය, පිළිබඳව කිහිප වරක් සිතා බැලීමටත් ඔවුන් විශ්වාස කිරිම අනතුරුදායක බවත් ළමයාට අවබෝධය කර දිය යුතුය. එබැවින් එවැනි විටකදී

උදා- ඔබ මේ තරම් මා ගැන උනන්දු වන්නේ ඇයි?
මාගේ පෞද්ගලික ජීවිතය ගැන විමසන්නේ ඇයි?
එවැනි තොරතුරු දැන ගැනීමට අවශ්‍යවන්නේ ඇයි?
මාගේ ඡායා රූප ඉල්ලා සිටින්නේ ඇයි?
පිළිතුරු ලබා නොදුන් විට කෝප වන්නේ ඇයි?

ආදී ලෙස සිතා බැලීමටත්, ප්‍රශ්න කිරීමටත් උනන්දු කරවන්න. එසේ ක්‍රියා කිරීමට ළමයින් උනන්දු කරනු ලැබුවත් අපගේ මූලික අවවාදය විය යුත්තේ අන්තර්ජාලයේ දී නාඳුනන කිසිම පුද්ගලයෙකු තමාගේ ගිණුමට ඇතුළත් කර

නොගැනීම වඩාත් යෝග්‍ය බවයි. නාඳුනන අයෙකු මිතුරුමට ඇතුළත් කර ගැනීමට අවශ්‍යම නම් ඔහුගේ ගිණුම ඉතා හොඳින් පරීක්ෂාකර බැලීම, එය ව්‍යාජ ගිණුමක්ද යන්න සොයා බැලීම, ඔහුගේ අන්තර්ජාල ප්‍රතිරූපය කෙබඳු ද, ඔහුගේ සබඳතා කෙසේ ද, ඔහු එක්කර ගෙන ඇති යහළුවන් සුදුසු ද, ඔහුගේ අභිරුචීන් කෙසේ ද, ඔහු ඉතිහාසයේ කළ කී දෑ ප්‍රශ්න සහගත ද ආදී පුළුල් විමසා බැලීමකට යාම ඉතා වැදගත් වනු ඇත. මන්ද නාඳුනන ව්‍යාජ ගිණුම් හරහා අන්තර්ජාලයේ දී සිදු විය හැකි අනතුරුවල අවධානම ඉතා ඉහළ වන බැවිනි.

අන්තර්ජාලය යනු නිරන්තරයෙන් තොරතුරු හුවමාරු වන තැනකි. එබැවින් අප හුවමාරු කරනුයේ මොනවාද? කරනුයේ කුමක්ද? එහි ඇති ප්‍රයෝජනය කුමක්ද? වැදගත්කම කුමක්ද? අන් අයට එය බලපානුයේ කෙසේද? යන්න පිළිබඳව යමක් බෙදා හැරීමට හෝ කිරීමට පෙර සිතා බැලිය යුතුය. මන්ද ශ්‍රී ලංකාවේ සමාජ ජාල වෙබ් අඩවි භාවිත කරන්නන් ඒ තුළ හුවමාරු කරන බොහෝ දේවල් දෙස බලන විට ඉතා කනගාටුදායකය. තවෙකෙකුගේ ලිංගිකත්වය හෝ ප්‍රචණ්ඩත්වය මුල් කර ගත් දේවල් හෝ අපහාසයෙන් යුතු තොරතුරු ඉතා වේගයෙන් හුවමාරු වන බවක් පෙනෙන්නට තිබේ. එබැවින් ඔබ හෝ අන් අය අපහසුතාවයට පත් විය හැකි ඡායාරූප වීඩියෝ හෝ ප්‍රකාශන කිසිවක් හුවමාරු කිරීමෙන් වැළකී සිටිය යුතුය. ළමයින් ද ඒ සඳහා උනන්දු කළ යුතු යි. බුද්ධිමත්ව

වගකීමෙන් අන්තර්ජාලය පරිහරණය කරන කිසිවෙකු එවන් දේ අනුමත නොකරනු ඇත.

බුද්ධිමත්ව කල්පනා කරන කිසිවෙකු තම පෞද්ගලික තොරතුරු කිසිවක් පිටස්තර කිසිවෙකුට වැඩදායී අරමුණකින් තොරව ලබා නොදීමට වගබලා ගත යුතුය. විශේෂයෙන්ම ඔබගේ නම, ලිපිනය, දුරකථන අංකය, ඡායා රූප හෝ ඔබට හානි විය හැකි තොරතුරු ඔබ නිතර යන එන තැන් පිළිබඳ, තොරතුරු පුරුද්දක් වශයෙන් නිතර සිදු කරන ක්‍රියා පිළිබඳව කිසිදු විටෙක අන්තර්ජාලය ඔස්සේ කිසිවෙකුට ලබා දීමෙන් වැළකී සිටීම ඔබේ සුරක්ෂිතතාව කෙරෙහි වැදගත් වනු ඇත.

ඉහතින් සඳහන් කළ තොරතුරු හිංසාකාරී පුද්ගලයින් අතට පත්වීම නිසා තර්ජනයට ලක් වූ ළමයින් බොහොමයක් අන්තර්ජාලය හරහා වාර්ථා වේ. එවැනි හිංසා ඉදිරියේ අප කටයුතු කළ යුත්තේ කෙසේද? එවැනි හිංසාකාරී දේ අන්තර්ජාලයට මුදාහරින හිංසකයන්ගේ අරමුණට සහය වන ලෙස අපද ඒවා හුවමාරු කරමින්, අනුමත කරමින්, කටයුතු කිරීම නිවැරදි නොවේ. හිංසාවටපත් වූ පුද්ගලයාගේ මානසිකත්වයෙන් ඒ දෙස බැලීමට නම් එය තමාට සිදු වූවානම් තමා කුමන ත්ත්වයකට පත් විය හැකි ද? සිය පවුලේ අයෙකුට සිදු වූවා නම් කටයුතු කරනුයේ කෙසේද? ඔබගේ සොයුරියගේ නිරුවත් පින්තූරයක් අන්තර්ජාලයේ දුටුවහොත් ඔබ එය හුවමාරු කරන්නේද? යන ප්‍රශ්න ළමයින්ගෙන් අසා සහකම්පනයෙන් යුක්තව ඒ දෙස බලා

කටයුතු කිරීමට ළමා මනස හුරු කළ හැකිය. එසේම එවන් වූ හිංසාවන් පිළිගැනීම හෝ අනුමත කිරීම නොකළ යුතු දෙයකි. හිංසාකාරී චර්යාවන්ට සමාජයේ ව්‍යංගයෙන් හෝ ඉඩකඩක් සපයන්නේ නම් එම ක්‍රියාවන් වර්ධනය වන්නට ඇති අවකාශය එකී සමාජයේ ඉහළ අගයක් ගනු ඇත. එබැවින් අන්තර්ජාලයේ හිංසා සිදු කරන්නන් මෙන්ම එවැනි හිංසාවන්ට Likes හෝ Comments සපයමින් එවන් ක්‍රියා අනුමත කිරීම ද නිශේධනය කළ යුතු යි. එවන් හිංසා සිදු කරන්නන් හෝ ඒවා අනුමත කරන්නන් දෙස බලන විට ඔහුගේ හෝ ඇයගේ පෞරුෂයේ යම් ගැටළුවක් පැවතිය හැකි ය. නැතහොත් එවන් හිංසාවකට ලක් වී අන්තර්ජාලයට වෛර කරන්නෙක් හෝ එවන් හිංසා අත්විඳීම නිසා එය සාමාන්‍යකරණය වූ අයෙකු විය හැකි ය.

නව යෞවන වයසේ පසුවන බොහෝ ළමයින් තුළ ස්වයං පාලනය හෝ ස්වයං වාරණය එතරම් ශක්තිමත් නොවීම මේ සඳහා බලපායි. එම පාලනය ඇති නොවීම මත නව යෞවනයින් රැල්ලට හසුව මෙවන් වැරදිවලට ඇදී යාමට ඇති ඉඩ කඩ වැඩියි. එබැවින් නව යෞවනයාගේ ස්වභාවය හඳුනා ගනිමින් එවන් ළමයින්ට අවශ්‍ය සහයෝගය ලබා දීමත් ඔහුගේ ස්වභාවය පිළිබඳව ළමයාට ස්වයං අධ්‍යයනයක් සිදු කිරීමට ඉඩ කඩ සලසා දීමත් වැඩිහිටියන්ගේ කාර්යයකි.

අන්තර්ජාලය තුළ මතු වන ගැටළුවලදී නව යෞවනයින් හා තරුණයින් විසින් ඒවා විසඳා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග තාර්කික හෝ බුද්ධිමත් නොමැති බවක් පෙන්නුම් කරනවා. එවන් ගැටළුවක දී ප්‍රචණ්ඩත්වය වැපිරීමෙන් හෝ තමාට හානි කර ගැනීමෙන් හෝ එකී හිංසා ඉදිරියේ අසරණව ඊට එකඟවීමෙන් මෙකී ගැටළු විසඳා ගත නොහැකියි. එම ගැටළුව කළමණාකරණය කර ගැනීමට අවශ්‍ය කුසලතාව නව යෞවනයා තුළ ගොඩ නැගීම සිදු කළ යුතු වැදගත් පියවරකි. එකී කාර්යය සඳහා නව ආකල්ප සිතුම් පැතුම් ළමයා තුළ අවධි කළ යුතුයි. යහපත් කල් ක්‍රියාවෙන් යුක්තවීම තමාට එන අභියෝගවලට හොඳ පිළිතුරකි. තම සංස්කෘතිය අභිබවා සදාචාරවත් නොවන අයුරින් හැසිරීමට යාම තුළ ඔහු හෝ ඇය සමූහයෙන් ප්‍රතික්ෂේප වන්නට ඇති ඉඩ කඩ වැඩියි. ඒ බව තේරුම් ගෙන අන්තර්ජාලය නැමති සමූහයේ කටයුතු කිරීමට නවකයින් දැනුවත් කළ යුතු යි. අන්තර්ජාල ගැටළු හමුවේ ප්‍රතිචාර දැක්වීමේ දී ඉහතින් සඳහන් කළ ආකාර තුන ඔබගේ ගැටළුව නිරාකරණය කරනවා වෙනුවට සිදු වනුයේ එම ගැටළුව වර්ධනය වීම හෝ වෙනත් ආකාරයකින් ඔබ කරාම පැමිණීමකි. එබැවින් වඩාත් හොඳම හෝ සුදුසුම ක්‍රමවේදය වනුයේ ගැටළුව නොසලකා හරිමින් ඉතා කඩිනමින් එකී ගැටළුවෙන් ඉවත් වීම යි. පසුව අවශ්‍ය ක්‍රියාමාර්ග වැඩිහිටියන් හා වෘතිකයින් සමඟ සාකච්ඡා කර තෝරා ගැනීම යි.

මදක් සිතන්න. ගුවන්යානයක පියාසර කරන්නේ නම් ඊට අදාළ ආරක්ෂිත උපදෙස් පිළිපැදීම මගියාගේ ආරක්ෂාව තහවුරු කරනු ඇත. එසේම නාවුක ගමනක නිරත වන්නේ නම් ඊට අනුකූල ආරක්ෂිත උපදෙස් පිළිපැදීම ඔබගේ ආරක්ෂාවට වඩාත් යෝග්‍ය වනු ඇත. යතුරු පැදියක ගමන් කරන්නේ නම් ආරක්ෂිත හිස් පළඳනා පැළඳ සිටීම හා මාර්ග නීති පිළිපැදීම පුද්ගල ආරක්ෂාව තහවුරු කරයි. මන්ද අතපසු වීමකින් හෝ අනතුරකට මුහුණ දීමට සිදු වුව හොත් සිදු විය හැකි හානිය අවම කිරීමට එකී ආරක්ෂිත විධි බලපාන බැවිනි. එපරිද්දෙන්ම අන්තර්ජාලයට පිවිසෙන්නේ නම් එය පරිහරණය කිරීමේ ආරක්ෂිත තාක්ෂණික විධි භාවිත කිරීමට හුරුවීම ද එකී භාවිත කරන්නාගේ ආරක්ෂාව තහවුරු කරනු ඇත. ලොකු කුඩා භේදයකින් තොරව පහසුවෙන්ම අනුගමනය කළ හැකි සරල ආරක්ෂිත උපක්‍රම කිහිපයක් පහත දැක්වේ.

අන්තර්ජාලය තුළ කුමන හෝ ගිණුමක් ඔබ නමින් සැකසීමේදි අන් සැමට පෙනෙන ලෙස ඔබේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකථන අංකය, ආදී පෞද්ගලික තොරතුරු මුදාහැරීමෙන් වළකින්න. ඔබට පමණක් පෙනෙන ලෙස එකී දත්ත සකසා තැබීමට පුරුදු වන්න.

අන්තර්ජාල ගිණුමක් සැකසීමේ දී ඉතා වැදගත්ම ආරක්ෂිත උපක්‍රමය වනුයේ ශක්තිමත් මුරපදයක් යෙදීම යි. ශක්තිමත් යන්නෙන් අර්ථවත් වනුයේ වෙනත් අයෙකුට

අනුමාන කළ නොහැකි, සොරකම් කිරීමට අපහසු මුරපදයක්ය යන්නයි. බොහෝ අන්තර්ජාල ගිණුම් හිමියෝ තමාගේ මතක තබා ගැනීමේ පහසුව තකා ඉතා ලෙහෙසි හා පහසු මුර පද යොදා ගනිති. උදාහරණයක් ලෙස 12345 වැනි සරළ ඉලක්කම් සිය උපන් දිනය හෝ සිය නම භාවිත කිරීම පෙන්වා දියහැකිය. මෙවැනි සරළ මුරපද යෙදීමෙන් ඔබ ගැන තොරතුරු සොයන හෝ ඔබට හිංසා කිරීමට බලාපොරොත්තුවෙන් සිටින අයෙකුට ඉතා ලෙහෙසියෙන් හා පහසුවෙන් අනුමාන කර ගිණුම අත්පත්කර ගත හැකි ය. එබැවින් ශක්තිමත් මුරපදයක් සකසා ගන්නේ කෙසේද යන්න ළමයාට කියා දෙන්න. ඔබගේ මතකයට නගා ගත හැකි යම් සිද්ධියක්, ස්ථානයක් හෝ නමක් වුව අර්ථය ලෙස ගෙන ඒ තුළ ඉලක්කම් සංකේත හා සිම්පල් කැපිටල් අකුරු මිශ්‍රණයෙන් යුක්ත වූ මුරපදයක් කිසිවෙකුට එක වර අනුමාන කළ නොහැකි වන ලෙස සකසා ගත හැකියි.

උදා-1992@LRH@cha

මෙම මුරපදයේ අර්ථය වනුයේ "1992 දී ලේඩි රිජ්වේ රෝහලේ දි චා" උපත ලබා ඇති බවයි. මේ ආකාරයට වඩාත් දිගු නොවන, එමෙන්ම වඩාත් කෙටි නොවන සිද්ධියක් මතකයට නගා ගත හැකි වන සේ එහෙත් අන් අයට අනුමාන කළ නොහැකි ආකාරයේ මුරපදයක් යොදා ගැනීම ළමයාගේ ආරක්ෂාව තහවුරු කරනු ඇත.

මුරපදයක් ශක්තිමත් වන්නට නම් සකසා ගත් මුරපදය භාවිත කරන ආකාරය ද ඉතා වැදගත්ය. කොතරම් තාක්ෂණික ලෙස ශක්තිමත්ව මුරපදයක් සකසා ගනු ලැබුවත් එකී මුරපදය කිහිප දෙනෙකු දැන සිටී නම් හෝ එය වෙනත් අය සමඟ හුවමාරු කර භාවිත කරයි නම් හෝ අන් අයට පෙනෙන තැනක ලියා තබයි නම් හෝ ඔබට එහි රහසිගත බව ආරක්ෂා කර ගැනීමට නොහැකි නම් එකී මුරපදයෙන් පලක් නොමැත. මන්ද මුරපදයක් යනු පෞද්ගලික දෙයකි. එය රහසිගතව ගිණුම් හිමියා පමණක් දැන සිටිය යුත්තකි. එබැවින් මුරපදයක් භාවිත කළ යුතු ආකාරය තවදුරටත් සරලව පැහැදිළි කරනවා නම් එය යට ඇඳුමකට සමානකර පැහැදිළි කළ හැකියි.

- අපගේ යට ඇඳුම් අප කිසිදු අවස්ථාවක අන් අය සමඟ හුවමාරු කර භාවිත නොකරන්නා සේම අපගේ මුරපදය ද කිසිදු විටෙක අන් අය සමඟ හුවමාරු කර නොගත යුතුයි.
- හැමෝටම පෙනෙන ලෙස අපගේ යට ඇඳුම් තැන තැන නොදමනවා සේම අපගේ මුරපදය ද අන් අයට පෙනෙන ලෙස තැන තැන නොදැමිය යුයි.

- එසේම එකම යට ඇඳුම අපි කිසිදු විටෙක දිගින් දිගටම භාවිත කිරීම සෞඛ්‍ය ආරක්ෂිත නොවන්නා සේම එකම මුරපදයද දිගින් දිගටම අළුත් නොකර භාවිත කිරීම ඔබේ ගිණුම අනාරක්ෂිත විය හැකි යි.

- යට ඇඳුම් රහසිගතව භාවිත කොරේ. ඒවා හැමෝටම පෙනෙන ලෙස අප භාවිත කරන්නේ නැතිවාක් මෙන්ම මුරපදයද රහසිගතව භාවිත කිරිමට පුරුදු වන්න.

- භාවිත කළ යුතු යට ඇඳුම වඩාත් කොට හෝ වඩාත් දිගු එකක් වීම ඔබ දැඩි අපහසුතාවයට පත් කරනු ඇත. එපරිද්දෙන්ම ඔබ භාවිත කරන මුරපදයද වඩාත් කෙටි හෝ වඩාත් දිගු වීමෙන් ඔබවම අපහසුතාවට පත් විය හැකි බැවින් මධ්‍යම ප්‍රමාණයේ මුරපදයක් භාවිත කිරීමට පුරුදු වන්න.

මෙකී පැහැදිළි කිරිම ළමයින් විෂයෙහි සිදු කිරීමේ දී වඩාත් ප්‍රවේශම් සහගත විය යුතු සේම අනවශ්‍ය අර්ථකථන සැපයීමට ද නොකළ යුතුය.

අන්තර්ජාල ගිණුම් වෙත විවිධ පණිවිඩ ගොනු ලැබිය හැකි යි. එම ගොනු විවෘත කිරීමට පෙර හොඳින් සිතා බැලීම ඉතා වැදගත් වේ. එහිදී සැක සහිත ගොනු පවතී නම් ඒවා විවෘත කිරීම හෝ බාගත කිරීමට යාමෙන් ඔබේ ඉලෙක්ට්‍රෝනික උපකරණයේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකිවා මෙන්ම එවැනි ගොනු හරහා වෛරස්, අසභ්‍ය තොරතුරු මෙන්ම Spamming හෝ Phishing ක්‍රමයට දත්ත සොරා ගන්නා හැකර්ස් ලා (Hackers) ද පැමිණිය හැකිය.

යමෙකු අන්තර්ජාලයට එකතුවන ඉලෙක්ට්‍රෝනික උපකරණයේ සැකැස්ම (Setting) ආරක්ෂාකාරීව සකසා තැබීමද ඉතා වැදගත් වේ. ජංගම ඉලෙක්ට්‍රෝනික උපකරණයක් මගින් අන්තර්ජාලයට එක් වී ඇත් නම් එකී උපකරණයේ ඔබ සිටින ස්ථානය අන් අයට පෙන්නුම් කළ හැකි වන සේ Location ක්‍රියාත්මක කර ඇත් නම් එය ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ය. ඔබ සිටින ස්ථානය ඔබ යන එන ස්ථාන ඔබ ගැන සොයා බලන අයෙකුට ඒ ඔස්සේ දැන ගැනීමට හැකි බැවින් ඉලෙක්ට්‍රෝනික උපකරණයේ සැකසුම් සියල්ල ආරක්ෂාකාරීව සකස් කර ගැනීමට අවශ්‍ය දැනුම ළමයින් වෙත ලබා දිය යුතු ය.

සිය ඉලෙක්ට්‍රෝනික උපකරණයේ පමණක් නොව සිය අන්තර්ජාල ගිණුමේ සැකැස්ම ද (Setting) ආරක්ෂාකාරී ලෙස සකසා ගැනීම ඉතා වැදගත්ය. ශ්‍රී ලංකාවේ බොහෝ අන්තර්ජාල ගිණුම් ආරක්ෂාකාරී ලෙස සකසා ඇති බවක් දකින්නට නැත. විශේෂයෙන්ම සමාජ ජාල ගිණුම් භාවිත කරන ගිණුම් හිමියන්ගේ අවධානය වෙනුවෙන් මෙකී කරුණු ප්‍රකාශ කළ යුතුයි.

- සිය සමාජ ජාල ගිණුමට අනවශ්‍ය දැ වෙනත් අයෙකුට එකතු කිරීමට (Tag) නොහැකි වන සේ සැකසුම් සකසා තැබීම
- වෙනත් ගිණුම් හිමියෙකුට ඔබගේ ගිණුමේ අනවශ්‍ය ලෙස ලිවීමට නොහැකි වන ලෙස සැකසීම
- අකමැති අයට සිය ගිණුම ප්‍රදර්ශනය නොවන ලෙස සැකසීම
- සිය පින්තූර අකමැති අයට හෝ වෙනත් අයට ප්‍රදර්ශනය නොවන ලෙස සැකසීම
- ඔබට හා ඔබගේ විශ්වාසවන්ත යහළුවන්ට පමණක් ප්‍රදර්ශනය වන ලෙස සැකසීම
- නැතහොත් පෞද්ගලික දේවල් ඔබට පමණක් ප්‍රදර්ශනය වන ලෙස ගිණුම සකසා තැබීම.
- තවද සබඳතා පැවැත්වීමට අකමැති කරදරකාරී වෙතැයි අනුමාන කළ හැකි පුද්ගලයින් / ගිණුම් Unfriend කිරීම හෝ Block කිරීම.

- එපමණක් නොව දිගින් දිගටම කරදරකාරි වැරදි හැසිරීම් ඇති ගිණුම් Report කිරීම ආදියයි.

මෙකී සරල මට්ටමේ ආරක්ෂාකාරී උපක්‍රම භාවිත කිරීමටවත් අන්තර්ජාලය භාවිත කරන ළමා හා තරුණ ප්‍රජාව බලගැන්විය යුතු ය. මන්ද යත් වර්තමානයේ ළමා පරපුර මුහුණදී ඇති බොහොමයක් අන්තර්ජාල හිංසා මෙකී මට්ටමෙන් විසඳා ගැනීමට හැකිව තිබියදීත් අනාරක්ෂිත ලෙස අන්තර්ජාලයට නිරාවරණය වීම නිසා ගැටළු උද්ගත වී ඇති බවක් පෙනේ.

අන්තර්ජාල ළමා හිංසනවලට අදාළව සැකසුන වෙනම නීති පද්ධතියක් ශ්‍රී ලංකාවේ නොමැති වුවත් පවත්නා නීතිය උපයෝගී කර ගනිමින් මෙකී හිංසන සඳහා නීතිමය මැදිහත්කරණය සිදු කළ හැකි ය. එබැවින් කුමනාකාරයකින් හෝ අන්තර්ජාලය ඔස්සේ හිංසා කිරීම ශ්‍රී ලංකා නීති පද්ධතිය අනුව දඩුවම් ලැබිය හැකි වරදක් වනු ඇත. එකී නීතිය නොදැන හෝ දැන දැනම නොසලකා හරිමින් නීති විරෝධී ක්‍රියාවන් සිදු කරන්නේ නම් එය පුද්ගල මට්ටමින් අන්තර්ජාලය අවභාවිත කිරීමකි. එසේ හිංසනයට පත් වන පුද්ගලයා ළමයෙකු නම් ඒ සඳහා පවත්නා දඬුවම තවත් ඉහළය. ළමයින්ට අදාළව අසභ්‍ය පළකිරීම් හා ප්‍රකාශන අන්තර්ජාලය ඔස්සේ ප්‍රචාරය කිරීම, අන්තර්ජාලය ඔස්සේ ළමයිනට ලිංගික ඇවිටිලි කිරීම, අන්තර්ජාලය ඔස්සේ ළමයින් පොළඹවා ගැනීමට උත්සාහ කිරීම, ඒ හරහා ලිංගික

අතවර සිදු කිරීම,ළමයින් අපහසුතාවයට පත් කිරීම, අන්තර්ජාලය ඔස්සේ ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම, අන්තර්ජාලය ඔස්සේ හෝ ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියෙකු ලෙස ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම, මෙන්ම අන්තර්ජාලය ඔස්සේ වුවද සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම ආදී වරදක් සිදු වුවහොත් ඒ සඳහා මැදිහත්ව නීතිය ක්‍රියාත්මක කළ හැකිය. එබැවින් එකී නීතිය නොදැන සිටීම හෝ එකී නීතියට අවනත නොවීම පුද්ගල මට්ටමින් ළමයාව අවධානමට පත් කර ගැනීමකි.

අන්තර්ජාලය සුරක්ෂිතව භාවිත කරමින් අන්තර්ජාලය සුරක්ෂිත කිරීමට නම් එය භාවිත කරන්නා සතුව නිවැරදි දැනුමක් තිබිය යුතුයි. එම දැනුම ළමයින් හා ප්‍රජාව අතරට රැගෙන යාම අප සැමගේ යුතුකමක් මෙන්ම වගකීමකි. එබැවින් අන්තර්ජාලය වගකීමෙන් භාවිත කරන්නේ කෙසේද? ඒ තුළ කාරුණිකව, සහකම්පනයෙන් යුක්තව, හිංසාකාරි නොවි බුද්ධිමත්ව කටයුතු කරන්නේ කෙසේද? අන්තර්ජාලයේ දී ස්වයං පාලනය හා වාරණය ගොඩ නගා ගන්නේ කෙසේද? අන්තර්ජාල හිංසාවලින් වැළකී කටයුතු කරන්නේ කෙසේද? ඇතිවන ගැටළුකාරී ත්ත්වයන්ගෙන් මිදී ඒවා විසදා ගන්නේ කෙසේද? සුරක්ෂිත තාක්ෂණික උපක්‍රම කවරේද? ඒවා භාවිත කරන්නේ කෙසේද? රටේ පවත්නා නීතිය උල්ලංඝණය නොවී ඒ තුළ කටයුතු කරන්නේ කෙසේද? ආදී දැනුම් පද්ධතිය අන්තර්ජාලය පරිහරණය කරන ළමයින්, තරුණයින් හා

වැඩිහිටියන් අතට පත්කර දැනුමින් සුපෝෂිත අන්තර්ජාල ප්‍රජාවක් ශ්‍රී ලංකාව තුළ ගොඩ නැගීමෙන් අන්තර්ජාල හිංසනය අවම කර සුරක්ෂිත අන්තර්ජාලයක් ගොඩ නැගීමට පුද්ගල මට්ටමින් දායක විය හැකි යි.

04.2.සමීප සබඳතා මට්ටමේ අවධානම් සාධක පිරික්සීම (Relationship Level)

අන්තර්ජාල හිංසා ඇති වීම කෙරෙහි අවධානම් සාධක මතු කරන දෙවන මට්ටම වනුයේ සමීප සබඳතා මට්ටම යි. විශේෂයෙන්ම ළමයින් සම්බන්ධ අන්තර්ජාල හිංසා සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡාවට ගැනෙන නිසා ඔවුනට අදාළ සමීප සබඳතා සම්බන්ධයෙන් මෙහිදී අවධාරණය කෙරේ. අන්තර්ජාල සුරක්ෂිතතාව ළමයින්ගෙන් ගිලිහී යාම කෙරෙහි ඔවුනට අදාළ සමීප සබඳතා කෙසේ බලපාන්නේද යන්න අන්තර්ජාලය පරිහරණය කරන ළමයින් වටා ඇති සමීප සබඳතා ජාල හතරක් ඔස්සේ මෙහි දි කතා කරනු ඇත.

01 පවුල් මට්ටමේ අවධානම් සාධක (Family Level)

02 සම වයස් මට්ටමේ අවධානම් සාධක(Peer Group Level)

03 පාසල් මට්ටමේ අවධානම් සාධක (School Level)

04 Online මට්ටමේ අවධානම් සාධක (Online Level)

ඕනෑම ළමා හිංසනයක් ගොඩ නැගීම කෙරෙහි පවුල් මට්ටමේ පවත්නා සම්බන්ධතා බලපෑම් කරනු ඇත. එපරිද්දෙන්ම අන්තර්ජාල හිංසාවලට ළමයින් ලක්වීම කෙරෙහි ද පවුල් මට්ටම බලපෑම් කරයි. පවුල් පරිසරය තුළින් ළමයා නොසලකා හැරීමට ලක් වීම නිසා හෝ පවුල් පරිසරය තුළළමයා හුදකලාවීම නිසා එහිදී ඇති වන හිඩැස පුරවා ගැනීමට ළමයි විවිධ උපක්‍රම භාවිත කරති. ඇතැම් ළමයින් රස්තියාදු ගැසීම, ප්‍රේම සබඳතාවලට යොමු වීම, මත්පැන්, මත් ද්‍රව්‍යවලට යොමු වීම, මෙන්ම අන්තර්ජාලය හරහා එකී පීඩනය විවිධාකාරයෙන් මුදා හැරීමට ද වර්තමාන ළමා ප්‍රජාව පුරුදුව සිටී. සිය නිවසින් නොලැබෙන ආදරය, සෙනෙහස, රැකවරණය අන්තර්ජාලයේ සිටින විවිධ පුද්ගලයින් හරහා ලබා ගන්නට ගොස් විවිධ හිංසාවන්ට ලක් වූ ළමයින් කොතෙකුත් ඇත. එසේත් නොමැති නම් නිවසින් ඉගෙනගත් එකී ප්‍රචණ්ඩත්වයන් අන්තර්ජාලය හරහා මුදා හැරීමට ගොස් අන්තර්ජාලය අවභාවිත කරන ස්වභාවයක් ද දැකිය හැකි යි.

අන්තර්ජාලය පිළිබඳව දෙමාපියන් තුළ පවත්නා දැනුම මද කමද අන්තර්ජාල ළමා අපයෝජන හෝ හිංසා ඉහළ යාම කෙරෙහි බලපෑම් කරයි. ශ්‍රී ලංකාවේ මෙකී තත්ත්වය ඉතා බරපතළ ලෙස පවතී. නිලධාරීන් ඇතුළු වැඩිහිටි පරපුර නවීන තාක්ෂණික දැනුම අත්පත්කර ගන්නේ ඉතා සෙමිනි. එහෙත් ළමා හා තරුණ පරපුර නවීන තාක්ෂණික දැනුම අනිකුත් දැනුම් පද්ධතීන්ට වඩා

වේගයෙන් අත්පත්කර ගනී. එකී දැනුමේ පරතරය පෙරලා සමාජය තුළ ගැටළු ඇති කිරීමට සමත් වේ. ළමයින් අන්තර්ජාලය තුළ කුමක් සිදු කරයි ද? ඒ තුළ කෙසේ හැසිරෙයි ද?, අන්තර්ජාලයේ කවරෙකු සමඟ මිත්‍ර සබඳතා පවත්වයි ද?, ඔවුන් අතර පවත්නා මිත්‍ර සබඳතාවල ස්වභාවය කුමක් ද?, ආදී තත්ත්වයන් පිළිබඳව සොයා බැලීමට දෙමාපියන්ට දැනුම නොමැති වීම තුළළමයින් අධීක්ෂණය කිරීම දෙමාපියන්ගෙන් ගිලිහී යයි. එසේම ඒ පිළිබඳව කියා දීමට ද ඔවුන් තුළ පවත්නා දැනුම මදකම මත මෙකී ගැටළුකාරී තත්තවය තව තවත් උග්‍ර විය හැකිය. මෙම අවාසනාවන්ත තත්තවය මත ළමයාද වැඩිහිටියන්ව නොමග යවමින් එකී අවභාවිතාවන් තුළ දිගින් දිගටම නිරතවීමට හැකියාව ලැබේ. එබැවින් මෙකී ගැටළුවට යම් මට්ටමකින් හෝ මැදිහත්වීමට නම් දෙමාපියන් විසින් අන්තර්ජාල පරිසරය පිළිබඳව යම් මට්ටමක හෝ දැනුම වර්ධනය කර ගත යුතුය. දැනුමේ පරතරය මෙන්ම පරම්පරා පරතරය ද මෙකී ගැටළුව උග්‍ර කරනු ඇත. දෙමාපියන් ලෙස අත්පත් කර නොගත් දැනුම් සම්භාරයක් ළමයින් අතට පත්වීමේ දී ඔවුන්ගේ චර්යා රටාවන් දෙමාපියන් අපේක්ෂා කරන මට්ටමින් එළි නොදැක්වීම දෙමාපියන් සිතන පතන ආකාරය හා ළමයින් සිතන පතන ආකාරය අතර දුරස්ථ බවක් වර්ධනය වීම දෙමාපියන්ගේ ළමා කාලයේ වූ අපේක්ෂා හා වර්තමාන ළමයාගේ අපේක්ෂා අතර වෙනසක් හඳුනා ගැනීම ආදී තත්ත්වයන් මත වැඩිහිටියන් අතින් ළමා පරපුර විවේචනයට ලක් වනු දැකිය හැකි යි.

පවුල තුළ පවත්නා දුර්වල ඇති දැඩි කිරීම් මෙන්ම දුර්වල දෙමාපියභාවයන්ද ළමයින් අන්තර්ජාල අවභාවිතාවන්ට හා හිංසාවන්ට ඇද දමනු ලබයි. දෙමාපියභාවයන් පිළිබඳව විමසා බැලීමේ දී එකී දෙමාපියභාවයන් ආකාර හතරක් ගනී. එනම්;

01 අධිකාරී දෙමාපියභාවය

02 නෙසලකා හැරිනසුළු දෙමාපියභාවය

03 නිදහස් දෙමාපියභාවය

04 ප්‍රජාතන්ත්‍රවාදී දෙමාපියභාවය යි

අධිකාරී දෙමාපියභාවය තුළ දී ළමයා දැඩි පීඩනයට ලක් වනු ඇත. ළමයාගේ නිදහස ඉතා සීමා වන අතර දෙමාපියන්ගේ කැමැත්ත මත සියල්ල සිදු වේ. එවන් පවුල් පරිසරයක හැදී වැඩෙන ළමයාට අන්තර්ජාලය යනු සිහිනයක් පමණක් ද විය හැකිය. එවැනි විට අන්තර්ජාලය පිළිබඳ ඇති ඉතා අඩු දැනුම නිසා අනාගතයේ ප්‍රායෝගික ගැටළු රැසකට මැදිවීමට සිදු වන අතරම නිවසට හොර රහසේ අන්තර්ජාලය භාවිතයට පෙළඹිය හැකිය. මගපෙන්වීමක්, අධීක්ෂණයක් නොමැතිව සිදු වන එවන් පරිහරණයක් තුළළමයා අන්තර්ජාල අවභාවිතයට හෝ හිංසාවට ලක් වීමට ඇති ඉඩ වැඩි වන අතරම එවැනි හිංසාවන් සඳහා දෙමාපියන්ට හොර රහසේ විසඳුම් සෙවීමට ගොස් බරපතළ ගැටළු දක්වා එකී ගැටළු වර්ධනය කර ගැනීමට ඇති ඉඩ කඩ ද ඉහළ ය.

ළමයින් පිළිබඳ කිසිදු සොයා බැලීමක් නොමැතිවීම නොසලකා හැරීමේ දෙමාපියභාවයේ ස්වභාවයයි. එවන් පරිසරයක් තුළ වැඩෙන ළමයා අන්තර්ජාලය කිසිදු බාධාවකින් තොරව භාවිත කරනවා විය හැකි යි. එවැනි විටදීත් ළමයා අන්තර්ජාලය තුළ දැඩි අනාරක්ෂිත තත්වයකට ලක් විය හැකි අතර සිදු වන හිංසනයන් ඉදිරියේදී ද දෙමාපියන්ගේ සොයා බැලීම් හෝ මැදිහත් වීම් ඉතා දුර්වල මට්ටමක පැවතිය හැකි යි.

ළමයාගේම කැමැත්තට ඉඩ ලබා දෙමින් ළමයාගෙන් සතුටු වීම නිදහස් දෙමාපියභාවයේ ලක්ෂණයයි. ළමයා ඉල්ලන සියලු දේ ලබා දෙමින් ඔහුට රිසි සේ හැසිරෙන්නට ඉඩ ලබා දෙන මෙකී දෙමාපියභාවය තුළළමයින් අන්තර්ජාල පරිහරණය තුළ ද දැඩි නිදහසක් භුක්ති විඳිය හැකි ය. එකී නිදහසෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ළමයා තුළින් අන්තර්ජාල අවභාවිත කිරීම සිදු වන්නට ඇති ඉඩ කඩ වැඩිය. යම් අවස්ථාවක දී හිංසනයට ලක් වුවද ළමයාගේ තීරණයට ඉඩ දී ඔහු ගන්නා තීරණය දෙස බලා සිටීම හැර මෙකී දෙමාපියන්ගේ බුද්ධිමය මැදිහත්කරණයකට ඇති ඉඩ කඩ ඉතා සීමිතය.

දෙමාපියභාවයන්ගේ ඉතා ප්‍රශස්ථ මට්ටම වනුයේ ප්‍රජාතන්ත්‍රවාදී දෙමාපියභාවයයි. මෙම දෙමව්පියෝ ළමයින්ට අවශ්‍ය නිදහස ලබා දෙන අතරම ඔවුනට අවශ්‍ය මගපෙන්වීම හා අධීක්ෂණය ද නොඅඩුව සිදු කරති. එවැනි

පවුල් පරිසරයක හැදී වැඩෙන ළමයා අන්තර්ජාලයට පිවිසීමට අවශ්‍ය වාතාවරණය ගොඩ නගා දෙන අතරම ඒ පිළිබඳව අධීක්ෂණය හා මඟපෙන්වීම ලබා දීමට ද ඉදිරිපත් වේ. දෙමාපියන්ට එකී දැනුම නොමැති වුවද සුදුසු මැදිහත්කරණයක් මාර්ගයෙන් එකී අධීක්ෂණය හා මඟපෙන්වීම ලබාදීමට කටයුතු කරනු ඇත. එබැවින් අන්තර්ජාල පරිහරණය සම්බන්ධයෙන් ද දෙමාපියන් ලෙස ප්‍රජාතන්ත්‍රවාදීව මැදිහත් වන්නේ නම් ළමයින් කළ යුතු හා නොකළ යුතු දේවල් සම්බන්ධයෙන් මැදිහත්කරණය සක්‍රිය ලෙස ඉටු කරනු ඇත. එවන් පරිසරයක වැඩෙන ළමයෙකු යම් හිංසනයකට ලක් වුවද එකී ගැටළුව සම්බන්ධයෙන් දෙමාපියන්ට පැවසීමට මැළි නොවේ. එහිදී ළමයා මුහුණ දුන් ගැටළුව බුද්ධිමත් ලෙස කළමනාකරණය කර ගැනීමට මෙම දෙමාපියභාවයට හැකියාව පවතී.

නව යෞවන වයසේ පසු වන ළමයින් බොහෝ විට දෙමාපියන්ගේ ආධිපත්‍යයෙන් දුරස්වීමට උත්සාහ දැරීම මනෝවිද්‍යාත්මක ය. ඔවුන් දෙමාපියන්ගේ බුද්ධිය පිළිබඳව මෙම අවධියේ දී එතරම් සැලකිලිමත් බවක් දක්වන්නේ නැත. මෙම කාල වකවානුව යහළුවන් කෙරේ වැඩි විශ්වාසයක් තබන කාල වකවානුවකි. එවන් පරිසරයක් තුළ අන්තර්ජාලයේ කරන කියන සිදු වන දේවල් දෙමාපියන් සමඟ ප්‍රකාශ කරන හෝ දැන ගැනීමට සලස් වන ලෙස දැනුවත් කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැත. ඒ සඳහා දෙමාපියන් ලෙස ළමයින් සමඟ ඉතා හොඳ මිත්‍රශීලී සමීප

සම්බන්ධතාවයක් ගොඩ නගා ගත යුතු ය. දෙමාපියන් එකී සම්බන්ධය ගොඩ නගා ගැනීමට අවශ්‍ය කුසලතාවය ද වර්ධනය කර ගත යුතු ය.

දෙමාපියන්ගේ අන්තර්ජාල භාවිතය අනාරක්ෂිත නම් හෝ යෝග්‍ය නොවේ නම් ළමයාගේ භාවිතය ද සුරක්ෂිත නොවිය හැකියි. ළමයාගේ අන්තර්ජාල භාවිතය අධීක්ෂණය කිරීමට පෙර දෙමාපියන් නිවැරදි දේ අනුගමනය කළ යුතුය. පවුල තුළ ඉලෙක්ට්‍රෝණික උපකරණ භාවිතයේ දී ඒවා අතිශයින් පෞද්ගලික උපකරණ ලෙස වර්ධනය වීමට ඇති ඉඩ කඩ අහුරාලන්න. ඒ සඳහා මූලික පියවර දෙමාපියන් විසින් භාවිතයේ යෙදවිය යුතුය. දෙමාපියන්ගේ දුරකථනය හෝ ඉලෙක්ට්‍රෝණික උපකරණය ද පොදු භාවිතයට ගත හැකි පවුලේ සැමට අවශ්‍ය විට භාවිතයට ගත හැකි භාණ්ඩයක් බවට පත් කරන්න. එකී ආදර්ශය මත පිහිටා දරුවාගේ ඉලෙක්ට්‍රෝණික උපකරණය ද දෙමාපියන්ගේ භාවිතයට ගත හැකි වීම දිරිමත් කරන්න. ඒ මඟින් දුරකථනය ළමයාගේ අතිශය පෞද්ගලික භාණ්ඩයක් වීමට ඇති ඉඩ කඩ අහුරාලන්න උපක්‍රමශීලී වන්න.

වැඩිහිටියන්ගේ දෙමාපියභාවය ළමයාගේ අන්තර්ජාල පරිහරණයේ තීව්‍රතාව හා වාරගණන තීරණය කිරීමටත් අන්තර්ජාල භාවිතයේ ස්වභාවය තීරණය කිරීමටත් මෙන්ම අන්තර්ජාල අධීක්ෂණය හා මඟපෙන්වීම තීරණය කිරීමටත් සිදු වන හිංසා වාර්ථාකරණය තීරණය කිරීමටත් බලපෑම්

කරනු ඇත. එබැවින් අන්තර්ජාල අවභාවිතාවන් හා හිංසා අවම කිරීම කෙරෙහි දෙමාපිය සම්බන්ධතාවය ශක්තිමත් කිරීම ඉතා වැදගත් බව පෙන්වා දිය හැකි යි.

සම වයස් සමීප සබඳතා මට්ටමේ දී ළමයින් අන්තර්ජාලය තුළ අනාරක්ෂිතභාවය ගොඩ නැගීමට තුඩු දෙන අවධානම් සාධක හඳුනා ගැනීමේ දී වැදගත් කරුනු රැසක් මතු කරණු ඇත. ළමයා ඇසුරු කරන හිංසාකාරී මානසිකත්වයක් ඇති යහළුවන්, එසේම අන්තර්ජාල හිංසා සිදු කරන යහළුවන්, මෙන්ම අන්තර්ජාල හිංසා අනුමත කරන යහළුවන් සිටී නම් එකී ආකල්ප හා චර්යාවන් ළමයා තුළට අභ්‍යන්තරීකරණය විය හැකි යි. එකී සමාගම තුළ අන්තර්ජාල හිංසාකාරීන් වීරත්වයෙන් සලකයි නම් හෝ මොඩලයක් ලෙස අනුකරණය කරයි නම් මෙකී බලපෑම තව තවත් ඉහළ යා හැකි ය. නව යොවුන් වියේ පසු වන ළමයින් සම වයස් කාණ්ඩ කෙරෙහි සිය ජීවිතයේ ප්‍රබල තැනක් ලබා දීම ස්වභාවික යි. එබැවින් එකී සමාගමයට අනුගත වීමට හා සමාගමයේ සිය ස්ථානය රැක ගැනීම වෙනුවෙන් එකී සමාගමයේ රුචි අරුචිකම් කෙරෙහි කොන්දේසි විරහිතව එකග වන ස්වභාවයක් ද දැකගත හැකි යි. යහලුවන්ගෙන් කොන් නොවීමට, සමාගමය අතර වීරත්වය හා හැකියාව ප්‍රදර්ශනය කිරීමට, සමාගමයේ සිය ස්ථානය රැකගැනීමට, වර්තමාන ළමා ප්‍රජාව නවීන තාක්ෂණික හැකියාවන් විදහා පෑම ප්‍රධාන අංගයක්ව පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස ද අන්තර්ජාල අවභාවිතය හා හිංසනය සිදු විය හැකි ය.

පාසල් සමීප සබඳතා මට්ටම නිර්මාණය වනුයේ ද පාසල් ගුරුවරුන්ගෙන් හා සමවයස් කාණ්ඩවලිනි. එබැවින් මෙහි දී ගුරුවරයාගේ භූමිකාව ඉතා වැදගත් වන අතර ළමයාට නිවැරදි දැනුම සම්ප්‍රේෂණය කිරීමට ගුරුවරයාට ඇති ශක්‍යතාවය ඉතා ඉහළය.

නමුත් තවමත් නවීන තාක්ෂණික ඥානය අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ගුරුවරයාද සිටිනුයේ පසුගාමී තත්ත්වයකය.

දෙමාපියන් සේම ගුරුවරයා හා ශිෂ්‍යයා අතර පවත්නා සබඳතාවය ද මෙහිදී ඉතා වැදගත් වෙයි. අන්තර්ජාල භාවිතය තහනම් කිරීම හෝ ඒ පිළිබඳ කිසිදු මැදිහත්කරණයකින් තොරව අන්තගාමී ප්‍රවේශයන්ගෙන් මිදී අන්තර්ජාල භාවිතය පිළිබඳ ධනාත්මක ආකල්පයක් පාසල් පද්ධතිය තුළ දැනට පවතීද? තරගකාරී අධ්‍යාපන පරිසරය තුළ මෙකී මගපෙන්වීම සිදු කිරීමට වර්තමාන පාසලට කාලය හා හැකියාව පවතී ද? අවශ්‍ය දැනුම හා කුසලතාවය ගුරුවරුන් ලෙස අත්පත්කර ගෙන තිබේද? අන්තර්ජාලය තුළ සිය ශිෂ්‍යයෙකු හිංසනයට ලක්ව ඇත් නම් එහිදී ගුරුවරයා ලෙස මැදිහත් විය යුත්තේ කෙසේද? යන්න පිළිබඳ නිශ්චිත දැනුමක් ඔවුන් සතුද? මෙකී ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී

සැබවින්ම වර්තමානයේ පවත්නා තත්ත්වය සතුටුදායක නොවේ. එබැවින් අන්තර්ජාල අවභාවිතය හා හිංසා සම්බන්ධයෙන් පාසල් පද්ධතිය තුළද අවධානම් සාධක රැසක් මතු කරනු ඇත.

වැඩිහිටියන් ලෙස අපගේ ළමා හා යෞවන කාලයේ නොතිබූ සමීප සබඳතා මට්ටමක් වර්තමාන ළමා හා යෞවන ප්‍රජාව සතුව තිබේ. එය Online සමීප සබඳතා මට්ටම යි. මෙකී සමීප සබඳතා මට්ටමේ පවත්නා ගැටළුකාරී තත්ත්වයන් නිසාම අපි අද මෙසේ සාකච්ඡා කරමු. මෙහිදී කතා කරනු ලැබූ සියලු කරුණු කාරණා ළමයා අන්තර්ජාලය තුළ අනාරක්ෂිත වීමට බලපානු ලැබුවත් අන්තර්ජාලයේ ස්වභාවයම ළමයින් අනාරක්ෂිත කිරීමට සමත් ය. මන්ද යත් අන්තර්ජාල ගිණුම් ඉතා පෞද්ගලික ය. එකී ගිණුම් හරහා වෙනත් අයෙකුට නොදකින නොපෙනෙන ලෙස ඕනෑම අයෙකුට සැරිසැරිය හැකි ය. ගිණුම් හිමියාගේ අනුමැතියකින් තොරව ගිණුම තුළට ඇතුළුවීමට ඇති ඉඩ කඩ සීමිත ය. අධි පෞද්ගලිකත්වයක් තුළ එය අධීක්ෂණය කිරීමට ද ඇති ඉඩ කඩ සීමා සහිත වේ. එසේම අන්තර්ජාලයට පාලකයෙකු නායකයෙකු හෝ මෙහෙයවන්නෙකු නොමැත. ඉලෙක්ට්‍රෝනික උපකරණය ඉදිරිපිට සිට අන්තර්ජාලයට ඇතුළු වන්නා එහි පාලකයාය; නායකයාය; මෙහෙයවන්නාය. එබැවින් අන්තර්ජාලය භාවිත කරන්නාගේ ආකල්ප, හැදියාව, හික්මීම, පාලනය හා වාරණය මත අවභාවිතය හෝ හිංසනය

රඳා පවතී. ඉන් ගම්‍ය වනුයේ අන්තර්ජාලය සුරක්ෂිත කිරීමට යත්න දරනවාට වඩා භාවිත කරන්නා හෝ ළමයා ශික්ෂණයෙන් යුතු සමාජ අගයන් ගරු කරන මිනිසෙකු බවට පත්කිරීමට උත්සාහ දැරීම වඩාත් යථාර්ථවාදී වන බවකි.

Online සබඳතාවයේ හෝ භාවිතයේ හෝ ප්‍රවේශ වීමට ඇති හැකියාවේ තීව්‍රතාවයත්,ළමයින් කෙතරම් දුරට මෙකී තාක්ෂණය මත යැපෙන්නේද යන්න මතත්,ළමයින් Online සබඳතා සමඟ කෙතරම් විශ්වාසයක් රඳා පවතින්නේද යන්න මතත් Online මට්ටමේ අවධානම් ගොඩ නැගෙනු ඇත. එමෙන්ම ළමයා ගොඩනගා ගෙන ඇති අන්තර්ජාල ප්‍රතිරූපයත්, ඔහු වටා ගොඩ නැගී ඇති Online මිතුරු සමාගමයේ රුචිකත්වයන්, අපේක්ෂා හා සබඳතාවයේ ස්වභාවය මත Online සමීප සබඳතා මට්ටමේ අවධානම වෙනස් වේ. එසේම අන්තර්ජාලය ශ්‍රී ලංකාවේ රජයේ පාලනයෙන් හා ලංකාවේ නීතියේ ආධිපත්‍යයෙන් ගිලිහුණ විදේශීය බහුජාතික සමාගම් විසින් මෙහෙයවනු ලැබේ. එබැවින් එකී සමාගම් මෙහෙය වීම, පාලනය හෝ කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකාවට පවත්නා ශක්තිය ඉතා අල්ප ය.

04.3. ප්‍රජා මට්ටමේ අවධානම් සාධක පිරික්සීම (Community Level)

ප්‍රජාවක් ලෙස ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භය තුළ අන්තර්ජාලය පිළිබඳව පවත්නා කියවීම හෙවත් අන්තර්ජාලය හඳුනාගෙන ඇති ආකාරය ප්‍රශ්න සහගත ය. නවීන තාක්ෂණික මෙවලමක් ලෙස එහි පවත්නා සමාජ ප්‍රගමනයට බලපාන හේතු සාධක ග්‍රහණය කර ගැනීම පසෙක ලා එහි පවත්නා නිශේධනාත්මක සාධක වැඩි වශයෙන් ග්‍රහණය කර ගනිමින් සිටිමු. එය කෙතරම් සමාජගතවී පවතී ද යත් අන්තර්ජාලය භාවිත කරනවා ද? යන ප්‍රශ්නය විමසූ විට "ඔව්" යන පිළිතුර ලබා දීමට බොහෝ දෙනා මැලි බවක් දක්වන තත්තවයක් වර්තමානයේ දකින්නට ඇත. ළමා ප්‍රජාව තුළින් මෙකී ප්‍රශ්නය ඇසූ විට බොහෝ ළමයි නිහඬව සිටීමට උත්සාහ දරති. එයින් ගම්‍ය වනුයේ 'අන්තර්ජාල පරිහරණය නුසුදුසුය' යන මතය ඔවුන්ගේ සිත්වලට කිඳී පවතින බවක් විය හැකිය. එවැනි නිශේධනාත්මක ආකල්පයක් ප්‍රජාව තුළ ස්ථාපනය වී පවත්නා තාක් කල් අන්තර්ජාලය සමාජ ප්‍රගමනයට භාවිත කිරීමට ඇති ඉඩ කඩ සීමා වනු ඇත. ගූගල් (Googal) සමාගම වාර්ෂිකව නිකුත් කරනු ලබන අන්තර්ජාල භාවිතය පිළිබඳ වාර්ථාවෙහි Sex යන වචනය වැඩි වශයෙන් සොයා බලා ඇති බවට ශ්‍රී ලංකාව නම් කිරීම පැති කිහිපයකින් සලකා බැලිය යුතුය. එය නිවැරදි සංගණනයක් නම් ඉන් පෙනී යනුයේ අප සමාජයේ

අන්තර්ජාල ජන විඥානය කුමන දිශානතිකව ගමන් කර ඇද්ද යන්නය. අනිත් පසින් එය සත්‍යයක් හෝ අසත්‍යයක් වුවද ගූගල් සමාගම කදිම ව්‍යාපාරික උපක්‍රමයක් නිර්මාණය කරමින් පවතී. එනම් මෙකී ලේබලය ශ්‍රී ලංකාවට ඇලවීම හරහා තව තවත් මෙවැනි ගවේෂණයන්ට ලාංකීය අන්තර්ජාල පාරිභෝගික ජන විඥානය ගමන් කරවීම ට කදිම උපාය මාර්ගයක් බව ඔවුන් වටහා ගෙන ඇත. එවැනි ජන විඥාණයක් වර්ධනය වන්නට, වර්ධනය වන්නට අලුතින් අන්තර්ජාලයට පිවිසෙන ළමයාද අන්තර්ජාලය භාවිතයට ගනුයේ වැරදි කෝණයෙනි. කෙසේ නමුත් ශ්‍රී ලංකාව තුළ වර්තමානය වන විට පවත්නා අන්තර්ජාල ජන විඥාණය අවධානම් සාධකයක් පවට පත්ව තිබේ. එබැවින් අන්තර්ජාල ආරක්ෂණය පිළිබඳව කටයුතු කරන අප මෙකී ජන විඥානය වෙනස් කිරීමට ද පියවර ගත යුතුය.

අන්තර්ජාලය සුරක්ෂිතව භාවිත කිරීම හා අන්තර්ජාලය තුළින් හිංසා සිදු වන ආකාරය පිළිබඳව ජනතාව වෙත තොරතුරු ගලා යාම ප්‍රමාණවත් නොවේ. එම නිසා ප්‍රජාව තුළ නිවැරදි දැනුම් පද්ධතියක් සමාජගත වී නැත. එය අන්තර්ජාලය සුරක්ෂිත කිරීම උදෙසා අවාසි සහගතය. මෙකී දැනුම් පද්ධතිය ප්‍රජාව අතරට රැගෙන යාම උදෙසා වගකිව යුතු සියලු ආයතන යුහුසුලුව කටයුතු කළ යුතුව තිබේ.

ශ්‍රී ලංකාවේ අන්තර්ජාල සුරක්ෂිතතාවය ගොඩ නැගීමට සම්බන්ධ වන වගකිව යුතු ආයතන කිහිපයක් දක්නට ඇත. මූලිකම ආයතනය වනුයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවයි (TRC). අන්තර්ජාල සේවාවන් සම්බන්ධයෙන් සියලු අධීක්ෂණ හා නියාමන කටයුතු සිදු විය යුත්තේ මෙකී ආයතනය හරහාය. එසේම ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසඳය (Sri Lanka CERT) තොරතුරු ආරක්ෂණය සම්බන්ධයෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරනු ඇත. තොරතුරු හා සංනිවේදන තාක්ෂණික ආයතනය (ICTA) ද මෙහිදී කැපී පෙනෙන මෙහෙයක් ඉටු කරන අතර මෙකී ආයතනයන් ට අමතරව ඩයලොග්, ටෙලිකොම්, මොබිටෙල්, හච්, එටිසෙලාට්, එයාටෙල් වැනි ආයතන ද අන්තර්ජාල සේවා සපයනු ඇත. ඊට අමතරව අන්තර්ජාල අපරාධයකදී නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනවල සහය ද මෙකී කාර්යය සඳහා නොඅඩුව ලැබිය යුතුය. මෙහිදී විශේෂයෙන්ම ශ්‍රී ලංකා පොලීසිය හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) කැපී පෙනේ. නීතිපති දෙපාර්තමේන්තුව මෙන්ම යුක්තිය පසිඳලීම වෙනුවෙන් අධිකරණ පද්ධතියට ද විශාල කාර්ය භාරයක් මේ වෙනුවෙන් ඉටු කළ හැකිව ඇත. තව දුරටත් මේ කාර්යය උදෙසා විශේෂඥ සේවා සපයනු ලබන මොරටුව හා කොළඹ විශ්වවිද්‍යාලවල සහය ද ඉතා වැදගත් වේ. මෙකී ආයතන ඍජු ලෙසම අන්තර්ජාල අපරාධ වැළැක්වීම උදෙසා මැදිහත් විය යුතු වුවත් මේ සඳහා

අධ්‍යාපන දෙපාර්තමේන්තුව,ළමා සංවර්ධන අමාත්‍යාංශය, පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව, අනිකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ද මේ සඳහා සමෝධානය විය යුතුය. මෙම ගැටළුව උදෙසා මෙකී සියලු පාර්ශවයන් එකට එක්ව මේ සඳහා විසඳුම් සෙවීමට අපොහොසත් වුව හොත් එය ප්‍රජා මට්ටමින් අන්තර්ජාල සුරක්ෂිතතාවය ගොඩ නැගීම උදෙසා අවදානම් සාධකයක් බවට පත් වනු ඇත.

ඉහතින් සඳහන් කළ සියලු ආයතන හා නිලධාරීන්ගේ ධාරිතාව මෙකී කාර්යය වෙනුවෙන් සංවර්ධනය කළ යුතුය. එහිදී නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම, තාක්ෂණික ඥානය ඉහළ දැමීම, නිතීය බලාත්මක කිරීම (Law Enforcement), නීතිය ශක්තිමත් කිරීම, විමර්ශන ක්‍රියාවලිය විධිමත් කිරීම (Investigation), අන්තර්ජාල වැරදි අනාවරණය කාර්යක්ෂම කිරීම (Detection) අනවශ්‍ය වෙබ් අඩවි පිරිපහදු කිරීම (Filtering) අදාළ සේවා සපයන ආයතන නියාමනය කිරීම (Monitoring) එකී සේවා සපයන අයාතන ලියාපදිංචිට වාරණ පැනවීම (Liaison) අදාළ ආයතනකඩිනමින් සම්බන්ධීකරණය කිරීම (Coordination) නව නීති සම්පාදනය (Legislation) හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම (Policy Making) ප්‍රජාව තුළට දැනුම රැගෙන යාම (Awareness) ඒ හරහා අපරාධ වාර්ථාකරණයට (Reporting) ජනතාව බලගැන්වීම (Community Empowerment) සමාජය

තුළ අන්තර්ජාල අවභාවිතයන් හා අපරාධ වැළැක්වීම (Prevention) හා එකී කාර්යයන් නිවර්ථනය කිරීම (Deterrence) ආදී විශාල කාර්යයන් රැසක් අන්තර්ජාල සුරක්ෂිතතාව ඇතිකිරීම වෙනුවෙන් ප්‍රශස්ථ මට්ටමකට රැගෙන ආ යුතු ය.

අන්තර්ජාල සුරක්ෂිතතාවය හා සුරක්ෂිත භාවය ගොඩ නැගීම වෙනුවෙන් ප්‍රජා මට්ටමට විශාල කාර්ය භාරයක් හිමි වනු ඇත. මන්ද පුද්ගල මට්ටම, සමීප සබඳතා මට්ටම මෙන්ම සංස්කෘතික මට්ටම යන සියල්ල ආමන්ත්‍රණය කිරීම සිදු කළ යුතු මධ්‍ය ලක්ෂ්‍යය වනුයේ ප්‍රජා මට්ටමයි. මන්ද සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් මෙන්ම ආයතන හා සංවිධාන නියෝජනය වනුයේ මෙකී මට්ටම තුළය.

පුද්ගල මට්ටමත්, සමීප සබඳතා මට්ටමත් ප්‍රජා මට්ටම හා සමාජ සංස්කෘතික මට්ටමත් ස්පර්ශ කිරීම සඳහා ළමයින්ගේ අන්තර්ජාල සුරක්ෂිතතාව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ආයතනික ව්‍යුහය ක්‍රියාත්මක විය යුතු ආකාරය දැක්වෙන යෝජිත දළ සටහනක් පහතින් හඳුන්වා දී ඇත.



මෙහෙයුම් පද්ධතිය-

TRC- Telecommunications Regulatory Commission

ක්‍රියාත්මක පද්ධතිය-

NCPA- National Child Protection Authority,

CID- Criminal Investigation Department & Police,

CERT- Sri lanka Computer Emergency Readiness Team,

ISP- Internet Service Providers,

court, & Forensic Services,

සහයක පද්ධතිය-

NGOs- Non Government Organisation, Health, Education, Child Care Services, Internet service Center, & Others

04.4. සමාජ සංස්කෘතික මට්ටමේ අවධානම් සාධක පිරික්සීම (Social / Cultural Level)

"යම් සමාජයක පවත්නා සංස්කෘතිය එකී සමාජයේ තාක්ෂණය මෙහෙයවන අතර එකී තාක්ෂණය පෙරළා නැවත සංස්කෘතිය මෙහෙයවනු ඇත". එකී මතය ඉතාමත් හොඳින් ගම්‍ය වන ස්ථානයක් ලෙස අන්තර්ජාලය පෙන්වා දිය හැකි ය.

"Veblen" අනුව "යම් සමාජයක වෙනස් වීම එකී සමාජයේ තාක්ෂණය වක්‍රාකාරයෙන් පෙන්නුම් කරනු ලබන බව" සඳහන් කරයි. එනම් සංස්කෘතිය වෙනස් කිරීමේ ප්‍රබල කාර්යයක් තාක්ෂණය විසින් සිදු කරන බවකි. නමුත් ශ්‍රී ලාංකීය සමාජය තුළ අන්තර්ජාල සුරක්ෂිතතාව බිඳ වැටීම කෙරේ පවත්නා සංස්කෘතික අවධානම් සාධක රැසක් හඳුනා ගත හැකි ය. පශ්චාත් යුධ පරිසරයක් පවත්නා ශ්‍රී ලාංකීය සමාජයේ ප්‍රචණ්ඩත්වය අනුමත කරන ස්වභාවයක් දැක ගත හැකි ය. එවැනි පරිසරයක් තුළ ශ්‍රී ලංකාවේ අන්තර්ජාල හිංසා හා අවභාවිතාවන් වර්ධනය වීමට ඇති ඉඩ කඩ බහුලය. මන්ද මිනිසා තුළ පවත්නා ප්‍රචණ්ඩත්වය එළි

දැක්වීමට ඔවුන් බොහෝ විට තෝරා ගන්නේ තමාට අවම හානියක් සහිත මාධ්‍යයන් ය. තමාගේ ගොදුර වෙත වඩාත් ලෙහෙසියෙන් හා පහසුවෙන් රහසිගතව තමාට අවම හානියක් ගෙන දෙන මාධයක් ලෙෂ අන්තර්ජාලයට ඇති හැකියාව නිසා බොහෝ ප්‍රචණ්ඩකාරීන් මෙකී මාධ්‍යය තෝරා ගන්නා බවක් පෙන්නුම් කරයි.

වේගවත් සමාජ හා සංස්කෘතික වෙනස්වීම්වලට ලක් වන සමාජයන් හී ද ප්‍රචණ්ඩත්වය ඉහළ යන අතර ශ්‍රී ලාංකීය සමාජය ද මෑත භාගයේ වේගවත් සමාජ වෙනසකට ලක්වෙමින් පවතී. එයද මෙකී කාර්යය උදෙසා උපස්ථම්භනයක් ලබා දෙනු ඇත. ඉහළ අන්තර්ජාල භාවිතයක් සහිත සමාජයන් තුළ ද අන්තර්ජාල හිංසා වැඩි වශයෙන් වාර්ථා වෙන අතර ශ්‍රී ලංකාවේ අන්තර්ජාල හිංසා වැඩි වශයෙන් වාර්ථා වනුයේ බස්නාහිර පළාතෙනි. මෙහි පරිගණක සාක්ෂරතාව 2015 වසරේ 38.3% වන අතර අන්තර්ජාල පහසුකම් සැපයීමද අනිකුත් පළාත්වලට සාපේක්ෂව ඉහළ අගයක් ගනී.

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය තුළ පවත්නා ලිංගික කුතුහලය හා ලිංගික අධ්‍යාපනය පිළිබඳ අඩු දැනුම ද අන්තර්ජාලය තුළ ලිංගික හිංසා හා ලිංගික අවභාවිතාවන්ට යොමු වීමට ඇති ඉඩ කඩ වැඩි කළ හැකිය. ලාංකීය සමාජ

ජාල වෙබ් අඩවිවල හැසිරීම දෙස බලන විට ලිංගික ප්‍රචණ්ඩත්වයට ඇති ඉල්ලුම මැනවින් හඳුනාගත හැකිය.

අන්තර්ජාලය ප්‍රචලිත වීමත් සමඟම ශ්‍රී ලාංකීය සංස්කෘතිය ලෝකයට විවෘත වුවා සේම ලෝක සංස්කෘතීන් ද ලාංකීය සමාජයට විවෘත වී තිබේ. එබැවින් ඇති වන සංස්කෘතික විසරණයත් සමඟ සංස්කෘතික ගැටුම වර්ධනය වන ස්වභාවයක් දක්නට ලැබේ. එකී පරිසරය තුළ අන්තර්ජාල හිංසා හා අවභාවිතාවන් ඉහළ යාමට ඇති ඉඩ කඩ තුළින් පෙන්නුම් කරනුයේ ශ්‍රී ලාංකීය සංස්කෘතිය මෙකී ගැටළුවට අවධානම් සාධක මතු කරන බවයි.



පස්වන පරිච්ඡේදය

ළමයින්ට එරෙහි සයිබර් අපරාධ කෙරේ යොදාගත හැකි ශ්‍රී ලංකාවේ නීතිමය වපසරිය හා විමර්ශන ක්‍රියාවලිය

ඕනෑම සමාජයක් පාලනය වීම කෙරෙහි එම සමජයේ පවත්නා පුරුෂාර්ථ හා ධර්මතා ඉතා වැදගත් කාර්යය භාරයක් ඉටු කරයි. යම් කාර්යයක් කෙරෙහි අප තුළ පවත්නා ගෞරවය හා වටිනාකම් මත එය ක්‍රියාවට නැගීමේ දී ගොඩනැගුණු ධර්මතා මගින් අපගේ චර්යාව ක්‍රියාත්මක වේ. ඒ අනුව සමාජයක් සතුව ගොඩනැගුණු ගණචර්යා, ජන චර්යා හා නීතිය මගින් සමජය පාලනය වනු ඇත. මෙම ධර්මතා බිඳ වැටුණු කල සමාජ පාලනය ද බිඳ වැටෙන බැවින් එකී සමාජය තුළ මිනී මැරුම්, සොරකම්, ස්ත්‍රී දූෂණ,ළමා අපයෝජන මෙන්ම වර්තමානයේ බහුලව

ක්‍රියාත්මක වන සයිබර් අපරාධ හෙවත් අන්තර්ජාල අපරාධ ද ක්‍රියාවට නැගේ. අන්තර්ජාලය ද සමාජයකි. විශේෂයෙන්ම සමාජ ජාල වෙබ් අඩවි තුළ බොහෝ පිරිසක් ඒකරාශී වන අතර ඒ තුළ සමූහයක් එක්ව කටයුතු කරන ස්වභාවයක් දැකගත හැකියි. එබැවින් අන්තර්ජාලය තුළ ගනුදෙනු කිරීමේ දී ද පුරුෂාර්ථ හා ධර්මතා එකී ගනුදෙනු පාලනයකින් යුතුව ක්‍රියාත්මක වීමට විශාල කාර්යය භාරයක් ඉටු කරන මුත් අන්තර්ජාලයටම සුවිශේෂී වූ පුරුෂාර්ථ හා ධර්මතා ශක්තිමත්ව නිර්මාණය වී නොතිබීම හා පවත්නා ධර්මතා නිවැරදිව ක්‍රියාත්මක නොවීම අන්තර්ජාල අපරාධ නිර්මාණයේදී ප්‍රබලව බලපෑම් කරනු ඇත.

අන්තර්ජාලය පරිහරණය කිරීමේ දී එය තමාටත් අන් අයටත් සමාජයටත් කරදරයක්, හිරිහැරයක්, හිංසනයක් නොවී ඒ තුළ කාරුණිකව ගෞරයයෙන් යුතුව පුරුෂාර්ථ මත පිහිටා කටයුතු කිරීම තුළින් ධර්මතා මතුකර ගත හැකිය. ඔබට හානි විය හැකි කිසිදු පිංතූරයක්, වීඩියෝවක් හෝ ප්‍රකාශයක් අන්තර්ජාලයට ඇතුළත් නොකිරීමටත් අන් අයට හානි විය හැකි පිංතූරයක්, වීඩියෝවක් හෝ ප්‍රකාශයක් ඇතුළත් කිරීමට, හුමවමාරු කිරීම ඉල්ලා සිටීම, බලපෑම් කිරීම හෝ අන් අයට කරදරකාරී ලෙස හැසිරීම නොකර සිටීමටත්, සමාජයට හානි විය හැකි පිංතූර වීඩියෝ ප්‍රකාශ ඇතුළත් කිරීම හෝ හුවමාරු කිරීම නොකර සීටීමටත් ඔන්ලයින් (Online) හැසිරීමේ දී ඔබ වගබලා ගන්නේ නම් අන්තර්ජාලය හරහා අපරාධ, අපචාර, අපයෝජන සිදු වීම අවම කර ගත හැකි ය.

සමාජයක ධර්මතා බිඳවැටුණු තැන සිදුවිය හැකි හානිය අවම කිරීම සඳහා නීතිය ඉවහල් වන අතර නීතිය බොහෝ විට ගණචර්යා හා ජන චර්යා මත පිහිටා නිර්මාණය වේ. එහෙත් නීතිය වරද කුමක්ද? ගතයුතු පියවර කුමක්ද? ඒ සඳහා දඬුවම කුමක්ද? යන්න නිරවුල්ව හා සංෂිප්තව ව්‍යවස්ථාගත කර ඇති බලය ලත් ලේඛනයකි. එපරිද්දෙන්ම අන්තර්ජාලය තුළ කටයුතු කිරීමේ දී ඔබ සතු ධර්මතා බිඳවැටී තවත් අයෙකුට හානියක් සිදු වූ තැන සමාජය බිඳ වැටීම අවම කිරීම උදෙසා සැකසුණු නීති මාලාවක් ද ශ්‍රී ලංකා නීති පද්ධතිය විග්‍රහකර බැලීමේ දී හඳුනා ගත හැකිය. නමුත් සයිබර් අපරාධ පිළිබඳ පනතක් හෝ ඒ සඳහා වෙන් වූ පැහැදිළි නීති පද්ධතියක් ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ මේ වන විට හඳුනා ගැනීමට අපහසුය. නමුත් දණ්ඩ නීති සංග්‍රහය තුළ හා වෙනත් පනත් හා අණ පනත් තුළ පවත්නා වගන්ති මුල්කර ගනිමින් මෙකී විමර්ශන හා නීතිමය ක්‍රියාවලිය මේ වන විටත් ක්‍රියාත්මකව පවතී. එබැවින් ශ්‍රී ලංකාවේ සයිබර් අපරාධ සම්බන්ධ නීතිමය රාමුව ශක්තිමත්ව නොමැති මුත් සිදු වන හානිය දෙස බලා සුසුම් හෙළනවාට වඩා නව නීතිමය ප්‍රතිපාදන සැකසෙන තෙක් පවත්නා නීතිය උපයෝගී කර ගනිමින් මෙම අපරාධ මැඩලීමට නීතිය ක්‍රියාත්මක කරන ආයතන සුක්ෂමව කටයුතු කළ යුතුයි. එමෙන්ම ලාංකීය පුරවැසියෙකු ලෙස එවන් අපරාධවලට කිසිවෙකු යොමු නොකිරීමටත් මෙන්ම අන්තර්ජාලය ඔස්සේ යම් අපරාධයක් සිදු වන බව දැන ගැනීමේ දී ඒ පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන ආයතන දැනුවත් කිරිමත් වගකිව

යුතු පුරවැසියන් සතු යුතුකමකි. එකී දැනුවත් බව ලබා ගැනීම සඳහා පවත්නා නීතිමය වපසරිය පිළිබඳව හා විමර්ශන ක්‍රියාවලිය පිළිබඳව යම් වැටහීමක් තිබීම ඉතා වැදගත් විය හැකියි.

ශ්‍රී ලංකාවේ මූලික නීතිය ලෙස 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ළමයින් විෂයෙහි විශේෂ වරප්‍රසාද රැසක් අත් කර දී ඇත. එම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවේ 04 වන උප ව්‍යවස්ථාව මගින්; "කාන්තාවන්ගේ,ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනු නීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේය." යනුවෙන් ළමයින් ගේ ප්‍රගතිය විෂයෙහි සුවිශේෂී ප්‍රතිපාදන සපයා දී ඇත.

එබැවින් අන්තර්ජාලයෙන් සිදු විය හැකි ළමයින්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් භාවිතා කළ හැකි ජාත්‍යන්තර හා දේශීය නීතිමය ආරක්ෂක මෙවලම් කිහිපයක් පිළිබඳව මූලිකව විමසා බලමු.

05.1. ජාත්‍යන්තර නීති හා මූලාශ්‍ර

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය හා අතුරු කෙටුම්පත්
- යුරෝපා සංගමයේ සයිබර් අපරාධ ප්‍රඥප්තිය

05.1.1. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය (Child Rights Convention)

ළමයාගේ ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය හා සහභාගීත්වය යන අයිතීන් හතර මුල් කර ගනිමින් සැකසුණ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය තුළ අන්තර්ජාලයට සම්බන්ධ වූ ළමයාගේ අයිතිවාසිකම් පවතීද යන්න විමසා බලමු.

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 13 වන ව්‍යවස්ථාව තුළළමයාට නිදහස් ලෙස අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය පිළිබඳව අවධාරණය කරයි. මෙකී අයිතිවාසිකම ගැඹුරින් අධ්‍යයනය කර බැලීමේ දී එකී ව්‍යවස්ථාවේ සඳහන් සියලුම ආකාරයේ තොරතුරු හා අදහස් ගවේෂණය කිරීම, ලබා ගැනීම සහ ඕනෑම මාධ්‍යක් ඔස්සේ ප්‍රකාශයට පත් කිරීමට අයිතියක් ඇති බව අවධාරණය වේ. අන්තර්ජාලය ද වර්තමානයේ පවත්නා ප්‍රබල මාධ්‍යයක් වන බැවින් ඒ ඔස්සේ තොරතුරු හා අදහස් ගවේෂණය කිරීමට, ලබා ගැනීමට හෝ ප්‍රකාශයට පත් කිරීමට ළමයිනට අයිතියක් ඇති බව හඳුනා ගත හැකිය. එවන් වූ අයිතියක් ඇති මුත් එකී අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇතැම් සීමා කිරීම් පවත්නා බවද එකී ව්‍යවස්ථාව සඳහන් කරයි. එනම්;

- නීතියෙන් යම් විධිවිධාන සලසා ඇත්තා වූද
- වෙනත් තැනැත්තෙකුගේ අයිතීන්ට සහ කීර්තියට ගරු කිරීම පිනිස හෝ

- ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය හෝ සදාචාර ධර්ම හෝ සුරැකීම පිණිස හෝ අවශ්‍ය වූද

සීමා කිරීම්වලට යටත්ව ළමයාට අන්තර්ජාල මාධ්‍යය වුවද භාවිතයට ගත හැකිය. එහෙත් අන්තර්ජාල මාධ්‍යය වුව ද අවභාවිත කරමින් හෝ ඒ හරහා හිංසාකාරී ක්‍රියාවක් සිදු කිරීමට කිසිදු අයිතියක් නොමැති බව ළමයින්ට මෙන්ම වැඩිහිටියන්ටද දැනුම ලබා දිය යුතුයි.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 17 වන ව්‍යවස්ථාව විමසීමේ දී "ජාතික හා ජාත්‍යන්තර සම්භවයන්ගෙන් ලැබෙන්නා වූ ළමයාගේ සමාජීය, ආධ්‍යාත්මික, සදාචාරාත්මක මෙන්ම කායික හා මානසික සෞඛ්‍යය නංවාලීමේ අරමුණින් යුත් තොරතුරුවලට ප්‍රවේශවීමේ අයිතියක් ඇති බව" සඳහන් කරයි.

එකී ව්‍යවස්ථාවේ (ඉ) උප ව්‍යවස්ථාව තුළ වැඩිදුරටත් අර්ථ විග්‍රහ කරමින් පෙන්වා දෙනුයේ "13 හා 18 වන ව්‍යවස්ථාවල විධිවිධාන සිත්හී දරාගෙන ඔහුගේ හෝ ඇයගේ යහපතට හානි කරවන්නා වූ තොරතුරුවලින් සහ පුවත්වලින් ළමයා ආරක්ෂා කර ගැනීම සඳහා නිසි මාර්ගෝපදේශ වර්ධනය කර ගැනීමට උනන්දු කිරීම පාර්ශ්ව රාජ්‍යයන් විසින් සිදු කළ යුතු බවයි. "

ඒ අනුව අන්තර්ජාලය තුළින් සිදු වන සියලු ආකාරයේ ළමා අපයෝජන හා අපචාර මැඩලීම වෙනුවෙන් පාර්ශ්ව රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම මේ පනත අනුව යුහුසුලුව සිදු කළ යුතුය.

ප්‍රඥප්තිය එළිදැක්වීමෙන් අනතුරුව දශක කිහිපයක් ඉක්ම ගිය කල ළමයින් යොදා ගනිමින් සකසනු ලැබූ අසභ්‍ය නිර්මාණ අන්තර්ජාලය තුළින් හා වෙනත් සම්බන්ධිත තාක්ෂණයන් හරහා ලබා ගැනීමට හා බෙදා හැරීමට ඇති හැකියාව වැඩි වීම සලකා බලා මෙන්ම ළමයින්ගේ කාමුක චිත්‍රපට හා ප්‍රකාශන හෙළා දැකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මේලන වැඩමුළු හා ප්‍රඥප්ති පිළිබඳව ද අවධානය යොමු කරමින් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට 2002 වසරේ දී අතුරු කෙටුම් පතක් ගෙන එනු ලැබීය. එනම් "ළමා වෙළදාම ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම වැලැක්වීම" සම්බන්ධයෙන් වූ අතුරු කෙටුම් පතයි. එකී කෙටුම් පතට අනුව එහි පළමු ව්‍යවස්ථාව තුළින් ළමයින් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම තහනම් කළ යුතු බව අවධාරණය කරනු ලබයි.

එකී පනතේ දෙවන ව්‍යවස්ථාවේ (ඇ) උප ව්‍යවස්ථාව තුළළමයින් කාමුක චිත්‍රපට හා ප්‍රකාශන සඳහා යොදවා ගැනීම යන්නෙන් අදහස් කරනුයේ "කුමන ආකාරයක හෝ සැබෑ හෝ අනුකෘත වශයෙන් හෝ ලිංගික ක්‍රියා නිරූපනය කෙරෙන නිර්මාණ හා ප්‍රකාශන සඳහා ළමයින් හෝ ළමයින්

ගේ නග්නත්වය හෝ යොදවා ගැනීම හෝ ලිංගික ක්‍රියා මුල්කරගත් කාර්යයන් සඳහා ළමයින්ගේ ලිංගික අවයවයන් භාවිත කිරීම යි.” ඒ අනුව අන්තර්ජාලය තුළ පවත්නා ළමයින් යොදවා ගත් යම් යම් නිර්මාණවල සභ්‍ය අසභ්‍යතාවය සලකා බැලීමට එකී නිර්වචනය මගපෙන්වීමේ මූලධර්මයක් (guiding Principle) ලෙස වැදගත් වනු ඇත.

එකී ප්‍රඥප්තියේ 03 වන ව්‍යවස්ථාවේ පළමු වන උප ව්‍යවස්ථාවේ (ඈ) ඡේදය මගින් “දෙවන ව්‍යවස්ථාවේ නිර්වචනය කර ඇති ළමයින් සම්බන්ධ කර ගත් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන නිෂ්පාදනය කිරීම, බොදා හැරීම, විසුරුවා හැරීම, ආනයනය, අපනයනය, භාරදීම, විකිණීම හෝ සන්තකයේ තබා ගැනීම යන කාර්යයන්හී නිරත වීම” තම රටේ නීතිය මගින් වරදක් ලෙස නිර්වචනය කිරීමට කටයුතු කළ යුතු බව සඳහන් කරයි.

එවැනි වැරදි සඳහා වැරදිකරුවෙකු වන පුද්ගලයෙකු සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කළ යුතු ආකාරයත් විදේශීය වරදකරුවෙකු සම්බන්ධයෙන් මැදිහත්කරණය කළ යුතු ආකාරයත් එකී ප්‍රඥප්තියේ 04 සහ 05 වන ව්‍යවස්ථා මගින් ආවරණය කෙරේ.

මෙකී කරුණු අනුව ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය තුළ හා එහි අතුරු කෙටුම්පත් තුළ අන්තර්ජාලය හා ඒ ආශ්‍රිත අපරාධවලින් ළමයින් ආරක්ෂා කර ගැනීමටත් අන්තර්ජාල අවභාවිතයන්ගෙන් ළමයින් සුරක්ෂිත කර ගනිමින් එකී

මාධ්‍යය ළමයාගේ ප්‍රගමනය උදෙසා භාවිතයට ගත හැකි ආකාරය පිළිබඳවත් අවශ්‍ය මඟපෙන්වීමක් මේ තුළින් ලබා ගත හැකිය.

05.1.2. සයිබර් අපරාධ ප්‍රඥප්තිය (Convention on Cyber Crime)

යුරෝපා සංගමය විසින් ප්‍රකාශයට පත්කර ඇති සයිබර් අපරාධ පිළිබඳ වූ ප්‍රඥප්තිය හෙවත් Budapest ප්‍රඥප්තියට 2015 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජය විසින් ද අත්සන් තබනු ලැබීය. ඒ අනුව අන්තර්ජාලය හරහා සිදු වන අපරාධ වළක්වා ගැනීම උදෙසා ගතයුතු ක්‍රියාමාර්ග රැසක් එකී ප්‍රඥප්තිය තුළ අන්තර්ගතව ඇත. මෙම ප්‍රඥප්තියේ 09 වන ව්‍යවස්ථාව තුළළමා අසභ්‍ය නිර්මාණ සම්බන්ධ වැරදි පිළිබඳව අන්තර්ගතව තිබේ. පරිගණක පද්ධතියක් මගින් ළමා කාමුක දර්ශන නිෂ්පාදනය, නැරඹීම,ළඟ තබා ගැනීම, බෙදාහැරීම, අන් අයට ලබා දීම, ලබා ගැනීම යන සියල්ලම වැරදි ලෙස ව්‍යවස්ථාගත කර ඇති අතර ඒ හරහා ලිංගික හැසිරීම්වල නිරත වීම, යෙදවීම මෙන්ම ඒ ආකාරයේ වූ යථාර්ථවාදී රූප ද වැරදි ලෙස මෙකී පනත මගින් පෙන්වා දී ඇති බවට සාරාංශ කර ඉදිරිපත් කළ හැකිය.

මෙම පනත මගින් ද ළමයා යනු අවුරුදු 18 අඩු අයෙකු අදහස් කරන අතර අවම වශයෙන් අවුරුදු 16 ට නොඅඩු විය යුතුය. එබැවින් මෙකී ප්‍රඥප්තියද ශ්‍රී ලංකාවේ

ළමයින්ට එරෙහි සයිබර් අපරාධ මැඩලීමේ දී ජාත්‍යන්තර ආරක්ෂක මෙවලමක් ලෙස භාවිතයට ගත හැකියි.

05.2. දේශීය නීති, පනත්, චක්‍රලේඛ හා මූලාශ්‍ර

- අසභ්‍ය ප්‍රකාශන පනත හා (1983 අංක 22 දරන සංශෝධන පනත)
- දණ්ඩ නීති සංග්‍රහය
    - 286 (අ)-ළමයින්ට අදාළව සිදු කරනු ලබන අසභ්‍ය පළකිරීම් හා ප්‍රකාශන
    - 286(ආ)-ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම පරිගණකය මගින් සේවා සපයන තැනැත්තෙකුගේ කාර්යයක් බව
    - 288(අ)(1)-ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියෙකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම
    - 288(ආ)(1)-සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම
    - 345 -ලිංගික අතවර
    - 360(ආ)-ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම
    - 360(ඉ)-ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම

- 365 (ඇ)-ඇතැම් වැරදිවලට අදාළව කරනු ලබන පළකිරීම්

- ➢ 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොණික ගනු දෙනු පනත
- ➢ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත
- ➢ පාසල් පිරිවෙන් හා අනිකුත් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීම පිළිබඳ 2017 අංක 21 දරණ අධ්‍යාපන චක්‍රලේඛය
- ➢ 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත (මෙය සයිබර් ළමා අපරාධ සඳහා නොව පරිගණක අපරාධ සම්බන්ධයෙන් වැදගත් විය හැකි බැවින් ඉතා කෙටි විස්තරයක් ඇතුළත් කර ඇත.)
- ➢ 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත

05.2.1. අසභ්‍ය ප්‍රකාශන පනත (Obscene Pablication Act)

මෙකී පනත හුදෙක් ළමා අපයෝජන සම්බන්ධයෙන්ම ක්‍රියාත්මක නොවුනත් අන්තර්ජලයෙන් සිදු විය හැකි යම් අපරාධ කිහිපයක් සම්බන්ධයෙන් භාවිතයට ගත හැකිය. විශේෂයෙන්ම අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රකාශන වැළැක්වීම සම්බන්ධයෙන් සුවිශේෂී ප්‍රතිපාදන කිහිපයක්ම මෙමගින් සලසා ඇත. ඒ අනුව එකී පනතේ (1983 අංක 22 දරන සංශෝධන පනත) දෙවන වගන්තිය තුළ අසභ්‍ය

ප්‍රකාශන සම්බන්ධ වැරදි කිහිපයක් එහි උප වගන්ති (අ), (ආ), (ඇ), (ඈ), යන වගන්ති ඔස්සේ විස්තර කරයි.

ඒ අනුව යම් අසභ්‍ය ප්‍රකාශනයක් වෙළදාම් කිරීම, බෙදාහැරීම, මහජන ප්‍රදර්ශනයට තැබීම, එසේම අසභ්‍ය ලියවිලි, චිත්‍ර, මුද්‍රිත ඡායා රූප, සිතුවම්, මුද්‍රිත ද්‍රව්‍ය, පින්තූර, විශාල දැන්වීම්, ලාංඡන, ඡායාරූප, සිනමා පට, රූපවාහිනී කැසට් පට, හෝ වෙනත් යම් අසභ්‍ය දේ සෑදීම, නිෂ්පාදනය හෝ තමා සන්තකයෙහි තබා ගැනීම ආනයනය කිරීම, ගෙනයාම, අපනයනය කිරීම, අපනයනය කිරීමට සැලැස්වීම, සංරක්ෂණය කිරීම, ඒ හා සම්බන්ධ ව්‍යාපාරයක් කිරීම, ඒ සඳහා සහය වීම, ඒ හා සම්බන්ධයෙන් කවර ආකාරයෙන් හෝ කටයුතු කිරීම, ඒවා බෙදා හැරීම, අතමාරුවට දීම, අනුබල දීම, ප්‍රචාරය කිරීම, එසේම ඒවා ලබාගත හැක්කේ කවරෙකුගෙන්ද යන්න ප්‍රචාරය කිරීම ආදී යම් ක්‍රියාවක් නීතිය ඉදිරියේ වරදක් වන බවට මෙම පනත මගින් පැහැදිළිව දක්වා ඇත.

මෙකී පනතට විරුද්ධ වරදක් සඳහා පළමු වරදට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකින් හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ එකී දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකින් ම දඬුවම් කළ හැකි බව ට නියෝග කරයි.

එසේම එකී පුද්ගලයා පළමු වරදට වරදකරු කිරීමෙන් පසු කරන ලද තදනන්තර වරදක් සඳහා මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමෙන් සහ ඊට අතිරේකව රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි බවට පැහැදිලි කරයි.

05.2.2. අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රකාශයක් යනු කුමක්ද

අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත පරිශීලනය කිරීමේ දී හමු වන මූලික වචනයක් වනුයේ "අසභ්‍ය" යන්නයි. ඒ සඳහා භාවිත වන තවත් වචනයක් වනුයේ අශ්ලීල යන්නයි. අන්තර්ජාලය හරහා සිදු වන අපරාධ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී අසභ්‍ය තොරතුරු යන්න නිතර හමුවන වදනකි. එහෙත් "අසභ්‍ය" යන්නට නිවැරදි නිර්වචනයක් හෝ සභ්‍ය හා අසභ්‍ය නොවන දෙය වෙන්කර හඳුනා ගැනීමට සමත් මිනුම් දණ්ඩක් සොයා ගැනීම අසීරුය. මෙකී සංකල්පය රටින් රටට සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් විය හැකි අතර ලංකාවේ සභ්‍ය වූ යමක් වෙනත් රටකදී අසභ්‍ය වන්නට හැකි අතර වෙනත් රටක සභ්‍ය වූ යමක් ලංකාවේ අසභ්‍ය විය හැකිය. එබැවින් නිශ්චිත මතයක් හෝ නිර්වචනයක් නොවන තත්තවයක් කෙරෙහි නීතියක් කෙසේ බලපැවැත්විය හැකිද යන්න ගැටළුවකි. එබැවින් අසභ්‍ය හෝ අස්ලීල යන්නට නීතිය ඉදිරියේ කුමන නිර්වචනයක් සපයන්නේ දැයි මූලිකව විමසා බැලිය යුතුය.

පිළිගත් ශබ්ධ කෝෂ කිහිපයක "අසභ්‍ය" යන්න නිර්වචනය වී ඇති ආකාරය පහත දැක්වේ.

> **ඔක්ස්ෆර්ඩ් ශබ්ධ කෝෂය-** විනීතත්වයට පටහැනි රාගික හෝ දුරාචාරී අදහස් පළකරන හෝ යෝජනා කරන අවිනීත, පහත්, අධම, යන අදහස ලබා දෙයි.
>
> **වෙබ්ස්ටර්ගේ නව විද්‍යාත්මක ශබ්ධ කෝෂය-** ජුගුප්සාජනක හැඟීම් දනවන සුළු සදාචාරයට පටහැනි, අධික රාගය හෝ පහත් හැඟීම් ඇවිස්සීම අරමුණු කර ගත් යමක් අසභ්‍ය වේ.
>
> අසභ්‍ය යන්නට සමාන වචන වූ අශ්ලීල හෝ නග්න යන්න මෙහිදී තවත් ආකාර දෙකකින් පැහැදිලි කරයි.
>
> රාගික හැඟීම් ඇවිස්සීම අරමුණු කරගත් චිත්‍ර හෝ ලේඛන මගින් හෝ ලිංගික හැසිරීම් නිරූපනය කිරීම.
>
> ලිංගික රාගික හැඟීම් ඇවිස්සීම අරමුණු කරගත් හා ලිංගික හැසිරීම් නිරූපනය කරන වීඩියෝ හෝ ඡායාරූප වැනි ද්‍රව්‍ය.

මෙම ශබ්ධකෝෂවල කෙසේ නිර්වචනය වී තිබුණද වැදගත් වනුයේ අධිකරණය "අසභ්‍ය" යන්න නිර්වචනය කර ඇති ආකාරයයි. නීතියේ "අසභ්‍ය" යන්න පිළිබඳව නිර්වචනයක් සපයා නැතත් අධිකරණ පද්ධතිය තුළ

අසභ්‍යයත්වය පිළිබඳ වූ නඩු තීන්දු කිහිපයක් පිළිබඳව සලකා බැලීමෙන් මෙකී තත්තවයට නිර්වචනයක් සපයා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ නඩු තීන්දු කෙරෙහි විදේශීය නඩු තීන්දුවල ආභාශයද ලබාගෙන ඇත. ඒ අනුව අසභ්‍යත්වය යන්න පිළිබඳව විදේශීය නඩු තීන්දු කෙරෙහි මූලිකව අවධානය යොමු කරමු. එවැනි සලකා බැලූ නඩු තීන්දුවක් ලෙස කෝක්බර්න් අගවිනිසුරු තුමා විසින් මෙහෙය වූ රැජිණට එරෙහි හික්ලින් නඩුව වැදගත් වේ.

> "මා හිතන විදිහට අසභ්‍යත්වය පිළිබඳ උරගල මෙයයි. අසභ්‍ය යැයි චෝදනා නගා ඇති යමක් ඒවා දුරාචාරී බලපෑමට විවෘත වුවත් ඒවා අතට පත්වන්නා වූ පුද්ගලයින් ගේ මනස දූෂ්‍යකර පිරිහෙළීමේ ප්‍රවණතාවයක් පවතී නම් එය අසභ්‍ය විය හැකිය." වූ බ්‍රිතාන්‍ය නඩු තීන්දුව

ශ්‍රී ලංකාවේ නඩු තීන්දු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දි

> "යම් ලිපියක ඇතුළත් වන කරුණු එම ලිපිය අතට පත් වන්නා වූ පුද්ගලයින්ගේ මනස දූෂ්‍ය කිරීමේ මෙන්ම පරිහානියට ඇද හෙළීමේ ප්‍රවණතාවයක් ඇත්නම් එය අසභ්‍ය වන බව" (උප පොලිස් පරීක්ෂක තංගල්ල එරෙහි ධර්මබන්දු- 33NLR14)

බෙහෙත් ද්‍රව්‍ය ප්‍රචාරය කිරීම උදෙසා ආයුර්වේද වෛද්‍යවරයෙකු විසින් ලියා තිබූ "නිරෝගී පුද්ගලයින්ට ලිංගික උත්තේජනයක්ද රෝගී පුද්ගලයින් උදෙසා ප්‍රතිකාරයක්ද" යන ග්‍රන්ථයට එරෙහිව පනවා තිබූ නඩුවක් සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය එය අතට පත් වන අයගේ මනස දූෂ්‍ය කිරීමට සමත් යැයි පවසා තහනම් කරන ලදී. (පෙරේරා එරෙහිව අගලවත්ත- 39NLR22)

උක්ත නඩු තීන්දුවේ දී අගවිනිසුරු ආබ්‍රහම් ගේ මතය වුයේ එය ලියා ඇත්තේ බෙහෙත් ද්‍රව්‍ය ප්‍රචාරය කිරීම සඳහා වුවත් චූදිතගේ චේතනාව මෙහිදී අදාළ නොවන බවයි. එහිදී වැදගත් වනුයේ අරමුණ හෝ පරමාර්ථය නොව එය කියවීමෙන් සිත දූෂ්‍ය විය හැකි පුද්ගලයින්ගේ අතට එකී ප්‍රකාශය පත්වන්නේද යන්න මත යන්නයි. ඒ අනුව එකී ප්‍රකාශය අසභ්‍ය ප්‍රකාශයක් යැයි සලකා තහනම් කරන ලදී.

දෙමළ භාෂාවෙන් ලියා තිබු "රහස් විද්‍යා" යන ග්‍රන්ථය මාතෘකා පහළොවක් යටතේ පැහැදිළි කර තිබුණි. එම මාතෘකා නම්

01- උත්පත්තියේ රහස
02- පුරුෂ ලිංගේන්ද්‍රිය
03- ස්ත්‍රී ලිංගේන්ද්‍රිය
04- මාස්ශුද්ධිය
05- ගැබ් ගැනීම

06- කළලයේ වර්ධනය

07- ලිංගික සංසර්ගයේ රස විඳීම

08- ලිංගික සංසර්ගයේ යෙදෙන ක්‍රම

09- ලිංගික සංසර්ගයට ඇති සීමා

10- ස්වයං වින්දනය

11- රාගික සිතුවිලි

12- මෝචනය

13- ලිංගික සංසර්ගයේ යෙදීමේ හැකියාව

14- ශුක්‍රාණු පෝෂණය

15- සමාජ රෝග

මෙම පොතට විරුද්ධව ගොනු කර තිබූ නඩුවට අදාළව එය මුළුමනින්ම කියවා බලා එහි අඩංගු කරුණු දුරාචාර බලපෑම්වලට විවෘත වූ මනසක් ඇති පුද්ගලයින්ගේ සිත් දූෂ්‍ය කිරීම හා පිරිහෙළීම පැහැදිළි ලෙසම අරමුණු කර ඇතැයි යන්න මත චූදිත වරදකරු කර තිබුණි. (ජෝෂප් එරෙහි වේලුපිල්ලේ-08NLR67)

"රති සැපත" මැයෙන් ලියා තිබූ පොතක කතෘ ප්‍රකාශක හා මුද්‍රණකරුට එරෙහිව ගොනු කර තිබූ නඩුවකට අනුව ඒ පිළිබඳව සිංහල විචාරකයින් දෙදෙනෙකුගේ මත විමසීමකින් පසුව තීන්දුවක් ලබා දී තිබුණි.

එකල සිංහල භාෂාව පිළිබඳ සම්භාවනීය පඬිවරයෙකු වූ ඩබ්. එෆ්. ගුණවර්ධන මුදලිතුමාගේ මතය වුයේ;

> "එය සම්භාවනීය ගුණයෙන් යුතු පොතකි. එය ඉහළ මට්ටමේ කලා කෘතියකි. අදහස් ප්‍රකාශ කිරීම ඉතා මනහරය. රමණීය බසින් ලියා ඇත. ඉහළ විඳීමේ ශක්තියක් ඇති පුද්ගලයින් සඳහා වූ කෘතියකි. සාමාන්‍ය ජනතාවට එය කියවා තේරුම් ගත නොහැකිය. එය කියවා තේරුම් ගත හැකි ඉහළ සංස්කෘතික මට්ටමක් ඇති පුද්ගලයින්ගේ සදාචාරාත්මක හැඟීම් මෙම පොත නිසා දූෂ්‍ය වන්නේ නැත. එමෙන්ම නූගත් අයට මෙය කියවා තේරුම් ගත නොහැකි බැවින් ඔවුන්ගේ සදාචාරාත්මක සිතුවිලිවලට ද බලපෑම් නොවේ. එබැවින් මෙම පොත අසභ්‍යයැයි මම කල්පනා නොකරමි" යන්නයි.

සිංහල ශබ්දකෝෂයේ ප්‍රධාන කතෘ තරුණ බෞද්ධ සමිතියේ සභාපති බෞද්ධ පාසල් පිළිබඳ කළමනාකාර ව්‍යවස්ථා මණ්ඩල සභික ඩී. බී. ජයතිලක මහතාගේ මතභේදයට තුඩු දුන් පිටු පිළිබඳ මතය වුයේ;

> "මෙම පිටුවල නියත වශයෙන් අසභ්‍යයැයි කිව හැකි කිසිවක් නැත. නමුත් සදාචාරාත්මක දෘෂ්ඨිකෝණයෙන් බලන විට මෙම ප්‍රකාශනයේ පොදු ප්‍රවණතාවය හිතකර නොවේ. පොත ලියා ඇත්තේ සාමාන්‍ය භාෂාවෙන් නොවේ. එහෙත් එය වැදගැම්මකට නැති පොතකි. එය නිර්දේශ කළ නොහැක. මෙම පොතේ ඉලක්කය ලිංගික

> සම්බන්ධතාවයේ කායික පැත්ත කෙරෙහි අවධානය යොමු කිරීමකි. මොහු පළපුරුදු ලේඛකයෙකු බව පෙන්වයි. භාෂාව පමණක් ගත් විට එය අසභ්‍ය නොවේ. පොතේ පිටකවරයද අසභ්‍ය නොවේ. එහෙත් මම එය මගේ නිවසේ එල්ලා නොතබමි. අට පාස් පිරිමි ළමයෙකුට මෙය කියවා තේරුම් ගත හැකිය. එබැවින් එවැනි ළමයෙකුට මෙය හිතකර නොවේ. එසේම මෙම පොත මාගේ පාසල්වල භාවිත කිරීමට මම නිර්දේශ නොකරමි. මන්ද එය අධ්‍යාපනික හෝ සදාචාරාත්මක වටිනාකමක් ඇති පොතක් නොවන බැවිනි. එය හිතකර පොතක් නොවේ. ”

මහේස්ත්‍රාත්තුමා විත්තිකරු නිදහස් කළේය. පසුව පොලිස් පරීක්ෂකවරයා එකී නඩු තීන්දුවට එරෙහිව අභියාචනය කළේය. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය නැවත නඩු විභාගයේ දී

> “මෙම පොත අඩු මිළට පොදුවේ විකිණීමට තබා ඇත. එහි පිටකවරය එහි අභ්‍යන්තරයේ ඇති දේ පිළිබඳව ඉඟි කරයි. එය පුළුල් පාඨකයින් පිරිසකට කියවා බලා තේරුම් ගත හැකි බවට සාක්ෂි ඇත. එසේම එය අතට පත්විය හැකි පුද්ගලයින් බොහෝ දෙනෙකු කෙරෙහි අහිතකර බලපෑමක් කිරීමට ඉඩ ඇති පොතක් බවට සැකයක් නොමැති බව ප්‍රකාශ කරමින් රටේ පිළිගත් මතධාරීන් දෙදෙනෙකු අසභ්‍ය පොතක් නොවේයැයි මත ඉදිරිපත් කර තිබියදීත්

කියවන පුද්ගලයින් කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කළ හැකි පොතක් බවට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ලයාල් ග්‍රාන්ට් විනිසුරු තුමා තීන්දු කළේය. එසේම අසභ්‍යත්වය ඇත්තේ එහි යොදා ඇති කිසියම් වදන්වල යැයි පෙන්වීම අවශ්‍ය නොවේ. එම කෘතිය මගින් විස්තර කර ඇති දර්ශන සහ ඉන් නිරූපණය කරන කාමාශක්ත දර්ශන පිළිබඳ විස්තර සැබැවින්ම අසභ්‍ය නම් එය ප්‍රමාණවත් වනු ඇත"(ද බෘයින් එරෙහි ධර්මබන්දු-32NLR88).

උක්ත නඩු තීන්දු පිළිබඳව සලකා බැලීමේ දී මෙන්ම ශ්‍රී ලංකාවේ අධිකරණය ක්‍රියාකර ඇති ආකාරය සලකා බැලීමේ දී යම් ප්‍රකාශනයක් අසභ්‍යවේද එසේ නොවේද යන්න පිළිබඳව තීරණය කිරීමේ දී යොදා ගත හැකි නිර්ණායකයන් තුනක් පිළිබඳව පැහැදිළිව හඳුනාගත හැකිය. එනම්;

01. ප්‍රකාශනයේ දුරාචාරී බලපෑමට විවෘත මනස් ඇති පුද්ගලයින් සිටිනවාද?
02. එකී ප්‍රකාශනය එම පුද්ගලයින්ගේ අතට පත් වීමේ ඉඩ කඩක් පවතීද?
03. ප්‍රකාශනයේ අඩංගු ඡායාරූප, පින්තූර, කතන්දර හා ලිපි හෝ එහි කිසියම් කොටසක් එය අතට පත්වන පුද්ගලයින්ගේ සිත් සතන් දූෂ්‍ය කොට පහත හෙළිය හැකි ප්‍රවණතාවක් පවතීද?

යන්නයි. මෙකී ප්‍රශ්න තුනට ලැබෙන පිළිතුර "ඔව්" නම් එය අසභ්‍ය ප්‍රකාශනයක් යැයි අධිකරණය තීන්දු කරනු ඇත.

අසභ්‍ය හෝ අශ්ලීලතාවය පිළිබඳ මූලික පැහැදිළි කිරීමට පසුව අන්තර්ජාල ළමා අපයෝජනවල දී දැනට ලංකාවේ පවත්නා නීතිය යොදාගත හැකි වගන්ති අනුව එක් එක් නීතිමය වගන්ති පිළිබඳව විමසා බලමු. හුදෙක් මෙම නීතිමය වගන්ති අන්තර්ජාල ළමා අපයෝජන හෝ අපරාධ ඉලක්කකර ගනිමින්ම සකසා නොමැති වුවත් මෙකී වගන්ති ඒ ඒ අවස්ථාවලදී ඉතා සූක්ෂමව විමසා බලා නීතිය පසිඳලීමේ දී භාවිතයට ගත හැකිය. එබැවින් දණ්ඩ නීති සංග්‍රහයේ පවතින නෛතික ප්‍රතිපාදන කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරමු.

05.2.3. දණ්ඩ නීති සංග්‍රහයට අදාළ වැරදි

(286- අ) - ළමයින්ට අදාළව සිදු කරන පළකිරීම් හා ප්‍රදර්ශන

ශ්‍රී ලංකාවේ අන්තර්ජාල ළමා අපයෝජන වැළැක්වීම සම්බන්ධයෙන් දැනට පවත්නා සුවිශේෂී නීති ප්‍රතිපාදනයක් ලෙස මෙය හැඳින්විය හැකිය. 286 (ආ) වගන්තිය තවදුරටත් මේ සඳහා උපකාරි වන අතර ළමයින්ට එරෙහි සයිබර් අපරාධ මැඩලීම සම්බන්ධයෙන් මෙම වගන්තිය සෘජුව භාවිතයට ගත හැකිය.

286 (අ) (1)-(අ) යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක පෙනී සිටීමට හෝ රඟපෑමට හෝ යම් අසභ්‍ය හෝ අශ්ලීල ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබීමට, එහි නිරූපණයක් කිරීමට හෝ පෙනී සිටීමට, යම් ළමයෙකු කුළියට ගන්නා හෝ සේවයේ නියුක්ත කරන, එහි ලා උපකාර කරන, ඒ සඳහා කැමති කරවා ගන්නා, යොදවන, පොළඹවන හෝ බල කරන හෝ එවැනි යම් ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් විකුණන හෝ බෙදාහරින නැතහොත් අන්‍යාකාරයකින් **පළ කරන** හෝ තම සන්තකයෙහි තබා ගන්නා කවර හෝ තැනැත්තෙකු හෝ

(1)(ආ)- ළමයෙකුගේ දෙමාපියන්ගෙන් කෙනෙකු, හෝ භාරකරුවෙකු හෝ ඒ ළමයාගේ භාරකාරීත්වය දරනතැනැත්තෙකුව සිටිමින්, යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක සේවයේ නියුක්ත කිරීමට හෝ එවැන්නකට සහභාගීවීමට හෝ (අ) ඡේදයෙහි සඳහන් අන්දමේ යම් ඡායාරූපයක හෝ චිත්‍රපටියක රූගත කරනු ලැබීමට, නිරූපණය කිරීමට හෝ පෙනී සිටිමට ඒ ළමයාට සලස්වන හෝ ඉඩ දෙන කවර හෝ තැනැත්තෙකු හෝ

1) (ඇ)(i)ළමයෙකුගේ යම් අශ්ලීල ඡායාරූපයක් ගන්නා හෝ ගැනීමට උපකාර කරන කවර හෝ තැනැත්තෙකු; හෝ

(ii) එවැනි යම් ඡායාරූපයක් **බෙදාහරින** හෝ පෙන්වන හෝ එවැනි යම් ඡායාරූපයක් සහිත යම් **පලකිරීමක් බෙදාහරින** හෝ පෙන්වන කවර හෝ තැනැත්තෙකු; හෝ

(iii) එවැනි යම් ඡායාරූපයක් හෝ **පළ කිරීමක් බෙදාහරිම** සඳහා හෝ පෙන්වීම සඳහා තම සන්තකයෙහි තබාගෙන සිටින කවර හෝ තැනැත්තෙකු; හෝ

(iv) එවැනි යම් ඡායාරූපයක් **පළ කරන** හෝ පළ කිරීමට සලස්වන හෝ යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන්නා හෝ ප්‍රචාරක දැන්වීමෙහි නම් කර ඇති තැනැත්තා එවැනි යම් ඡායාරූපයක් හෝ **පළ කිරීමක් බෙදාහරින** නැතහොත් පෙන්වන තැනැත්තකු හෝ එසේ කිරිමට අදහස් කරන තැනැත්තකු ය යන පණිවුඩය දීමට හැකි වන ආකාරයෙන් යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන හෝ පළ කිරීමට සලස්වන කවර හෝ තැනැත්තෙකු. ළමයින්ට අදාළව සිදුකරන අසභ්‍ය පළ කිරීම් හා ප්‍රදර්ශනය යන වරද සිදු කරයි. ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයකට නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතුය. තවදත් තැනැත්තාට දඩයකින්ද දඬුවම් කරනු ලැබිය හැකි ය.

2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)පනත

286 ආ- ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම පරිගණක මඟින් සේවා සපයන තැනැත්තෙකුගේ කාර්යය බව

පරිගණක මගින් සේවා සපයනු ලබන තැනැත්තෙකු ලෙස ඉන්ටර්නෙට් කැෆේ, පරිගණක පාඨමාලා සහිත ස්ථාන වැනි පරිශ්‍රයන් මෙහිදී හඳුන්වා දිය හැකිය. මෙවැනි ස්ථානයකදි පරිගණකය භාවිත කරමින් ළමයෙකු යම් ලිංගික අපයෝජනයකට කවරෙකු විසින් හෝ ලක් කිරීමට නොහැකි වන ලෙස අදාළ සියලු පියවර එකී ආයතනයේ භාරකරු විසින් අරගත යුතුය. එසේ රැගෙන තිබියදීත් යම් අයෙකු ඔහුට අයත් පරිශ්‍රය තුළළමයෙකු ලිංගික කටයුත්තක් සඳහා පරිගණකය ඇසුරු කර ගනිමින් යොදා ගනු ලබන බවට එහි හිමිකරුට සැළවුව හොත් වහාම ළඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමන්ව දැනුවත් කිරීම සිදු කළ යුතු බවට මෙකී වගන්තිය මගින් පෙන්වා දී ඇත.

(ආ)-(1) පරිගණක මගින් සේවා සපයන තැනැත්තෙකු විසින් ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා එම පරිගණක පහසුකම භාවිත නොකරන බවට සහතික වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගත යුතු ය.

(ආ)-(2)ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා (1) වන උපවගන්තියේ සඳහන් යම් පරිගණක පහසුකමක් භාවිත කරනු ලබන බවට තමා දන්නා (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තෙකු විසින් ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරියා වෙත එම ක්‍රියාවට අදාළව එම කරුණු පිළිබඳව වහාම දැනුම් දී එම ක්‍රියාව සම්බන්ධයෙන් සහ උද්දේශිත වරදකරුගේ අනන්‍යතාවය ද සම්බන්ධයෙන් තමා සතු තොරතුරු එම නිලධාරියා වෙත හෙළිකරනු ලැබිය යුතු ය.

(ආ)-(3) (1) වන හෝ (2) වන උපවගන්තිවල විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරුවන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම යටත් විය යුතුය.

1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත (345)- ලිංගික අතවර කිරීම

අන්තර්ජාල වැරදි සම්බන්ධයෙන් පවත්නා නීතිය ශක්තිමත් නොවුවත් අන්තර්ජාලය මගින් සිදු වන බොහෝ වැරදිවලදී මෙකී වගන්තිය අනුව කටයුතු කිරීමට හැකිය. මන්ද ස්ත්‍රී දූෂණයක් නොවන මෙන්ම බරපතළ ලිංගික අපයෝජනයක් නොවන අනිකුත් සියලුම ලිංගික වැරදි මෙම

වගන්තිය යටතට ඇතුළත් කළ හැකි බැවින් අන්තර්ජාලය හරහා සිදු වන ලිංගික හිංසා බොහොමයක් මේ යටතේ විභාග කළ හැකිය. ඒ ආකාරයට ළමයෙකුට යම් වචනයකින්, ක්‍රියාවකින් හෝ ඉගියකින් සිදු කරනු ලබන ලිංගික හිංසනයකදී ලිංගික අතවර කිරීම යන වරද යටතේ ක්‍රියාත්මක විය හැකිය.

> අඩත්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන් යම් තැනැත්තෙකුට ලිංගික අතවර කරන හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් යම් තැනැත්තෙකුට ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් සිදු කරන කවර හෝ තැනැත්තෙකු ලිංගික අතවර කිරීමේ වරද සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින්ම හෝ ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය;
>
> තවද එකී හානිය ලත් තැනැත්තාට එකී හානිය වෙනුවෙන් මුදලක වන්දියක් ද ගෙවන ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකිය.

2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)පනත

360 (ඉ)- ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිට්ලි කිරීම

අන්තර්ජාලය භාවිත කරමින් බහුල ලෙස සිදු වන ළමා අපයෝජනයක් වනුයේ ළමයින් ලිංගික කටයුතුවලට පොළඹවා ගැනීමට උත්සාහ දැරීමයි. මේ සඳහා විවිධාකාර

උත්සාහයන් අන්තර්ජාලය ඔස්සේ ළමා අපයෝජකයින් විසින් සිදු කරනු ලබයි. එකී අවධානම නිසාම මෙම නීතිය තුළ සුවිශේෂී ප්‍රතිපාදනයක් අන්තර්ගත කර ඇති අතර අවුරුදු 18 අඩු තැනැත්තෙකු හෝ අවුරුදු 18 අඩු තැනැත්තෙකු යැයි විශ්වාස කරමින් යමෙකු ලිංගික ඇවිටිලි කිරීම් සිදු කරයි නම් එයද වරදක් බවට අවධාරණය කිරීම අන්තර්ජාල විමර්ශන ක්‍රියාවලියේ දී ද ඉතා වැදගත් ප්‍රවේශයක් උදාකරනු ඇත.

360(ඉ)-(1) - ළමයෙකු ලිංගික අපයෝජනය කිරීමේ කාර්යය සඳහා

(අ)- වයස අවුරුදු 18 අඩු තැනැත්තෙක්; හෝ

(ආ)- වයස අවුරුදු 18 අඩු තැනැත්තෙකු බවට විශ්වාස කරනු ලබන යම් තැනැත්තෙක්,

ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිට **කවර හෝ ආකාරයකින් පොළඹවා ගැනීමට ඇවටිලිකරන** කවර හෝ තැනැත්තකු ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීමේ වරද සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට නැතහොත් එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

360(ආ)- ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම

මෙම වගන්තිය යටතේ ළමයෙකු යම් අසභ්‍ය හෝ අශ්ලීල දර්ශනයක සහභාගී කර ගැනීමට යම් පරිශ්‍රයක රැඳී සිටීමට සැලැස්වීමත් එවැනි කාර්යයක් සඳහා ළමයෙකු කුට්ටනය කිරීමත් එසේම එවැනි කාර්යයක් සඳහා ළමයෙකුගේ සේවාදායකයෙකු වීමත් එවැනි දෙයකට ළමයෙකු පෙළඹවීමත් එවැනි යම් කාර්යයක් සඳහා ළමයකු කුට්ටනය කිරීමට තර්ජනය කිරීමත් හෝ සාහසිකත්වය පෑමත් පිළිබඳව අවධානය යොමු කරමු.

360 (ආ) (ඇ)-මුද්‍රණ මාර්ගයෙන් හෝ **වෙනත් සන්නිවේදන මාධ්‍යයකින්** හෝ වාචිකව කරනු ලබන ප්‍රචාරක දැන්වීම් මඟින් හෝ වෙනත් සමාන මාර්ගයකින් ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයෙකුගේ සේවාදායකයෙකු වීමට, යම් තැනැත්තෙකු පොළඹවන;

කවර හෝ තැනැත්තකු "ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරද" සිදු කරනු ලබන අතර ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොඅඩු වු ද අවු විස්සක් නොඉක්මවන්නා වු ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරිමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතුය.තවද දඩයකින් ද ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකිය.

1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

365(ඇ)- ඇතැම් වැරදිවලට අදාළව කරනු ලබන පළ කිරීම්

මෙම වගන්තිය මගින් යම් ළමයෙකු ස්ත්‍රී දූෂණයකට හෝ ලිංගික අතවරයකට හෝ කුට්ටනයට ලක් වී හෝ ළමයෙකුගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමකට හෝ ව්‍යභිචාරයකට හෝ අස්වාභාවික වරදකට හෝ බරපතළ ලිංගික අපයෝජනයකට හෝ තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියාවකට හෝ ලක්ව සිටී නම් එවන් වැරදි කුමන හෝ මාධ්‍යයක් ඔස්සේ ළමයාගේ අනන්‍යතාවය හෙළි වන ආකාරයකට පළ කිරීම තහනම් කරයි. අන්තර්ජාලය තුළ මෙවැනි හිංසනයන්ට ලක් වූ ළමයිගේ තොරතුරු පලකරනු ලබන අවස්ථා දැක ගත හැකිව ඇත. ඒ ඔස්සේ තවදුරටත් ළමයින් හිංසනයට ලක් වන අවස්ථා ඇත. එවැනි අවස්ථාවක දී මෙම වගන්තිය භාවිතයට ගත හැකිය.

(1)- 345 වන වගන්තිය හෝ 360(අ) වගන්තිය හෝ 360(ආ) වගන්තිය හෝ 363 වගන්තිය හෝ 364(අ) වගන්තිය හෝ 365 වන වගන්තිය හෝ 365(අ) වගන්තිය හෝ 365(ආ) වගන්තිය හෝ යටතේ යම් තැනැත්තෙකුට එරෙහිව වරදක් සිදු කර ඇතැයි කියනු ලබන්නේ ද නැතහොත් වරදක් සිදු කර ඇති බව සොයා දැනගෙන ඇත්තේ ද (මෙහි මින් මතු ගොදුරු වූ තැනැත්තා යනුවෙන් මේ වගන්තියේ සඳහන් කරනු ලබන) ඒ තැනැත්තාගේ නම හෝ ඒ තැනැත්තාගේ අනන්‍යතාවය හෝ එළිදරව් වන යම් කාරණයක් මුද්‍රණය කරන නැතහොත් පළ කරන කවර හෝ තැනැත්තෙකුට අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධණාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකෙන්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතුය.

(3) (1)-වන උප වගන්තියේ සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් යම් අදිකරණයක පැවැත්වෙන යම් නඩු කටයුත්තකට අදිළ යම් කරුණක් ඒ අධිකරණයේ පූර්ව අනුමැතිය නොමැතිව මුද්‍රණය කරන හෝ පළ කරන කවර හෝ තැනැත්තෙකුට අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්දනාගාරගත කිරිමකින් හෝ දඩයකින් හෝ ඒ බන්දනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකෙන්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතුය.

5.2.4 සයිබර් ළමා ලිංගික අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන විශ්ලේෂණය.

ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති ළමයින්ට එරෙහි සයිබර් අපරාධවලින් 81% ක් ලිංගිකත්වය මුල්කර ගත් සයිබර් අපරාධ වන හෙයින් ඒ සඳහා වන නීතිය පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත්ය. දණ්ඩ නීති සංග්‍රහය පරිශීලනය කිරීමේ දී ළමයින්ට එරෙහි ලිංගික අපරාධ 13 ක් හඳුනා ගත හැකිය. එකී වැරදි දහතුනට අමතරව ලිංගික වැරදිවලට අදාළ කරුණු පළ කරීම වැළැක්වීම සම්බන්ධයෙන් වූ වගන්තියත් ඇතුළුව ඒ හා සම්බන්ධ වැරදි දාහතරක් හඳුනාගත හැකිය. එකී වැරදි දාහතර තුළින් ළමයින්ට එරෙහි සයිබර් ලිංගික අපරාධ මැඩලීම උදෙසා භාවිතයට ගත හැකි වගන්ති මොනවාද යන්න විමසා බලමු.

කායික, මානසික, ලිංගික හා නොසලකා හැරීම යන ළමා අපයෝජන වර්ග හතර අතරින් අන්තර්ජාලය හරහා බොහෝ දුරට සිදු වනුයේ ලිංගික හා මානසික අපයෝජනයන්ය. ඒ අතරින් ලිංගික අපයෝජන සිදු වන ආකාර දෙකකි. එනම් ස්පර්ශයක් සහිත ලිංගික අපයෝජන හා ස්පර්ශයක් රහිත ලිංගික අපයෝජනයි. ස්පර්ශයක් සහිත ලිංගික අපයෝජන අන්තර්ජාලය හරහා සිදු වීමට ඇති අවකාශය සීමා වන අතර ස්පර්ශයක් රහිත ලිංගික අපයෝජන සිදු වීමේ ශක්‍යතාවය ඉතා ඉහළය. ඒ අනුව ස්ත්‍රී දූෂණය (363), ව්‍යාභිචාරය (364අ), බරපතල ලිංගික අපයෝජනය (365ආ) හා අස්වාභාවික වැර දි (365) යන වැරදි හතර ස්පර්ශයක් සහිතව සිදු විය යුතු බැවින් එකී වැරදි හතර ළමයින්ට එරෙහි සයිබර් ලිංගික වැරදි සම්බන්ධයෙන් භාවිතයට ගත නොහැකි බව පෙනී යයි. ඒවා භෞතිකව සිදු වන වැරදි තුළ දී පමණක් භාවිතයට ගත හැකිය.

ස්පර්ශයක් රහිතව සිදු වන ලිංගික අපයෝජන සම්බන්ධයෙන් භාවිතයට ගත හැකි වැරදි ලෙස ළමයින්ට අදාළව සිදු කරනු ලබන අසභ්‍ය පළ කිරීම් හා ප්‍රදර්ශන (286අ), ලිංගික අතවර (345), ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියෙකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම (288අ), කුට්ටනය (360අ), ලිංගික ඇවිට්ලි කිරීම (360ඉ),ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම (360ආ), තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා (365අ),

ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම (365ඇ) යන වැරදි අට හඳුනාගත හැකියි.

මීට අමතරව හඳුනාගත් ලිංගික වැරදි දාහතරෙන් තවත් වැරදි දෙකක් ස්පර්ශයක් සහිතව හෝ ස්පර්ශයක් රහිතව සිදු වන ඕනෑම ලිංගික වරදක දී ළමා අපයෝජනය සඳහා පරිශ්‍රයක් භාවිතා කරන බවට දැනුම් දීමට ඇති කාර්ය භාරය (286ඇ) හෝ ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම පරිගණකයක් මගින් සේවා සපයන තැනැත්තකුගේ කාර්යය බව (286ආ) යන්නද වැරදක් බවට නිර්වචනය කර තිබේ. .

ස්පර්ශයක් රහිත ලිංගික අපයෝජන සඳහා භාවිත කළ හැකි උක්ත වගන්ති අට සයිබර් ලිංගික අපරාධ සම්බන්ධයෙන් භාවිතයට ගත හැකි වුවත් එම වැරදි නීතියේ නිර්වචණය කරලීමේ ගැටළුකාරී තත්තවයන් කිහිපයක් ද දැක ගත හැකිය.

සයිබර් අපරාධක් සිදු විය හැක්කේ යම් මාධ්‍යක්/ජාලයක් හරහාය. එවැනි සංනිවේදන මාධ්‍යක් හරහා ළමයෙකුගේ අසභ්‍ය හෝ අශ්ලීල යමක් විකාශනයක්, පළ කිරීමක්, බෙදාහැරීමක්, පළ කිරීමක් බෙදා හැරීමක්, මෙන්ම ඒ හරහා ඇවිටිලි කිරීමක් පෙළඹවීමක් හෝ කුමන ආකාරයක හෝ අසභ්‍ය සංනිවේදනයක් සිදු කිරීම වරදක් බවට මෙම ස්පර්ශයක් රහිත වැරදි අට තුළ අන්තර්ගතව පවතීද යන්න විමසා බැලිය යුතුය. එසේත් නොමැති නම් මෙකී වැරදි අට

තුළ කුමන හෝ මාධ්‍යක්/ජාලයක් හරහා එකී වරද සිදු කිරීම වරදක් බවට පිළිගෙන පවතීද යන්න විමසා බැලිය යුතුය.

ඒකී කොන්දේසිවලට අනුව විමසා බැලීමේ දී 286(අ), 360(ඉ), 360 (ආ) (ඇ), හා 365 (ඇ) යන වැරදි හතර තුළ පමණක් උක්ත විශේෂිකරන වචන යොදා ඇත. එබැවින් සයිබර් ළමා ලිංගික අපරාධවල දී සෘජු ලෙසම භාවිතයට ගත හැකි වගන්ති හතරක් ලෙස මෙම වැරදි හතර හඳුනා ගත හැකිය. (මෙම ළමයින්ට එරෙහි සයිබර් ලිංගික වැරදි වෙන්කර ගැනීමට අදාළ ගැලීම් සටහන 02 මගින් පෙන්වා ඇත)

නමුත් ළමයින්ට එරෙහි සයිබර් අපරාධ සිදු වීම් දෙස බලන විට අන්තර්ජාලය හරහා ලිංගික අතවරවීම් (345), කුට්ටනය වීම් (360අ), කුට්ටානියෙකු ලෙස ක්‍රියාකිරීමට ළමයින් කුලියට ගැනීම් (288අ), තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා සඳහා කුට්ටනය කිරීමට තැත් කිරීම් (365අ) වැනි වැරදිවලට ඇතුලත් විය හැකි ගණයේ අපරාධ ද වාර්තා වේ. එහෙත් එකී වගන්ති හතර තුළ ජාලයක් ඔස්සේ සිදු විය හැකි බවක් හෝ සංනිවේදන මාධ්‍යක් භාවිතයෙන් මෙකී තත්තවයක් සිදු විය හැකි බවට වූ ප්‍රතිපාදනයක් අන්තර්ගත කර නැත. එවැනි තත්තවයක දී මෙම වගන්ති සයිබර් අපරාධ වැළැක්වීමට භාවිතයට ගත නොහැකිද?

මේ සඳහා පහත සඳහන් තාර්කික පදනම මත පිහිටා උක්ත ප්‍රශ්නය සඳහා පිළිතුරක් සපයා ගත හැකියි. සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය යන වරද පිහියෙන් ඇණ හෝ පොල්ලෙන් පහර දී

හෝ වෙනත් ක්‍රමවේදයක් හරහා සිදු කළ හැකි බව අප දනිමු. කුමන ක්‍රමවේදයක් ඔස්සේ සිදු වුවද සිදු වී ඇත්තේ මනුෂ්‍ය ඝාතනයක් නම් අපි ඒ සඳහා සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය යන නීති ප්‍රතිපාදනය භාවිතයට ගනු ඇත. එසේම 345 හෙවත් ලිංගික අතවර යන වරද වචනයක් මගින් හෝ ඉගියක් මගින් හෝ ලිපියක් මගින් හෝ මාධ්‍යක් මගින් හෝ සිදු වන්නේ එකී තැනැත්තාට සාපරාධී බලහත්කාරය පෑමක් නම් එය ලිංගික අතවරයක්ය යන වරද සම්පූර්ණ කරනු ඇත. එවැවින් වරද සිදු කරන ආකාරය කුමක් වුවත් එකී ක්‍රියාවෙන් සිදු වන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ විග්‍රහකර ඇති වරදක් නම් එකී වගන්තිය යටතේ එම වරදකරුවන් නීතිය හමුවට ගෙන ඒමට හැකියාව පවතී. එබැවින් අන්තර්ජාලයේ සිදු වූ ක්‍රියාව සාක්ෂි වශයෙන් ගෙන අදාළ වරද ඔප්පුකර ගැනීමට කටයුතු කිරීමෙන් උක්ත සඳහන් ස්පර්ශයක් රහිත ලිංගික වැරදි අටම ළමයින්ට එරෙහි සයිබර් ලිංගික අපරාධ මැඩලීම සඳහා භාවිත කළ හැකි බවට මෙම තර්කය පාදක කර ගත හැකියි.



දණ්ඩ නීති සංග්‍රහයේ සයිබර් ළමා ලිංගික නීති හඳුනා ගැනීම

ගැලීම් සටහන - 02

05.2.5. 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රෝණික ගනු දෙනු පනත

නවීන තාක්ෂණික සන්නිවේදන උපක්‍රම හරහා සිදු වන අපරාධවල දී එකී දත්ත සාක්ෂි වශයෙන් සපයා ගැණීමේ දී ශ්‍රී ලංකා සාක්ෂි ආඥා පනත තුළ ප්‍රමාණවත් මගපෙන්වීමක් නොමැති වුවද මෙකී පනතේ V වන පරිච්ඡේදයේ 21 වන වගන්තිය තුළින් සාක්ෂි පිළිබඳ රීති සඳහන් කරයි.

මෙකී පනත අධ්‍යයනය කිරීමේ දී යම් යම් සීමාවලට යටත්ව ඉලෙක්ට්‍රෝණික උපකරණයක් මගින් සිදු කරනු ලැබූ පණිවුඩයක්, ලේඛනයක්, වාර්ථාවක්, සන්නිවේදන තොරතුරක් සාක්ෂි වශයෙන් යොදා ගත හැකි බව සඳහන් වේ. එහෙත් මෙකී පනත ඉලෙක්ට්‍රොනික වාණිජ කටයුතු සම්බන්ධයෙන් පමණක් භාවිත කළ හකි පනතක් ලෙස අධිකරණය තුළ මේ වන විට අභියෝගයට ලක් වී ඇත.

05.2.6.ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත

උක්ත පනතට අනුව විදුලි සංදේශ සම්බන්ධයෙන් වූ කාර්යයන් නියාමනය කරමින් එකී කාර්යය විධිමත් කරමින් ජනතාවගේ සුභසිද්ධිය ගොඩ නැගීම හා ඒ පිළිබඳ වූ තිරසාර සංවර්ධනයක් ගොඩ නැගීම සඳහා වූ ක්‍රියාවලියක් මෙකී පනත හරහා ක්‍රියාත්මක කරයි. ඒ අනුව විදුලි සංදේශ ආශ්‍රිත වූ යම් ක්‍රියාවලියක දී පැමිණිලි කිරීමේ හැකියාවද පවත්නා

අතර එකී පනතේ 58 හා 59 වන වගන්ති මෙහිදී වඩා වැදගත් වනු ඇත.

වගන්ති අංක 58- යම් අශිෂ්ට, අසභ්‍ය, කැරලිකාර, අශ්ලීල, තර්ජනාත්මක හෝ අතිශයින් අප්‍රසන්න ස්වභාවයක පණිවුඩයක් ඉදිරිපත් කරන සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයක් හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් වන්නේය.

වගන්ති අංක 59- කිසියම් තැනැත්තෙකුට පීඩාවක් හෝ හිරිහැරයක් සිදු කිරීම පිණිස සාධාරණ හේතුවක් නොමැතිව නිරන්තරයෙන් දුරකථන ඇමතුම් කරන සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට සහ ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුව හොත් මාස තුනකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ යටත් වන්නේය.

05.2.7. 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත (Computer Crimes Act)

විශේෂයෙන්ම මෙම පනත පරිගණක වැඩසටහන් හා තොරතුරුවලට අදාළ වැරදි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන පනතකි. එසේම පරිගණක ආචනය දත්ත හෝ සංනිවේදන පහසුකම ඇතුළු පරිගණක පහසුකම හෝ සේවය

සම්බන්ධයෙන් රජයට හෝ යම් තැනැත්තෙකුට පාඩුවක් හෝ අලාභයක් සිදු වූ අවස්ථාවලදී තවදුරටත් ප්‍රයෝජනයට ගැනේ. එබැවින් මෙම පනත හරහා ළමයෙකුට විරුද්ධව සිදු කරනු ලබන අන්තර්ජාල අපයෝජන තත්තවයන් ඉලක්ක නොවන අතර මෙකී පනත මගින් ආවරණය කෙරෙන අපරාධ පහත පරිදි වේ.

03. පරිගණකයකට නීත්‍යානුකූල නොවන ප්‍රවේශයක් ඇතිකර ගැනීම සඳහා යම් ක්‍රියාවක් සිදු කිරීම වරදක් බව

04. වරදක් සිදු කිරීම සඳහා නීත්‍යානුකූල නොවන ප්‍රවේශයක් ඇතිකර ගැනීම සඳහා යම් ක්‍රියාවක් සිදු කිරීම වරදක් බව

05. අධිකාරී බලය නොමැතිව පරිගණකයකට කර්තව්‍යක් ඉටු කිරීමට සැලැස්වීම වරදක් බව

06. ජාතික ආරක්ෂාව ආදියට එරෙහිව සිදු කරනු ලබන වැරදි

07. නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ලබාගත් දත්ත ආදිය සමග කටයුතු කිරීම වරදක් බව

08. නීති විරෝධී ලෙස දත්ත අත්කර ගැනීම වරදක් බව

09. වරදක් සිදු කිරීම සඳහා නීති විරෝධී උපක්‍රම සැපයීම වරදක් බව

10.සේවයට ප්‍රවේශවීමට නීත්‍යානුකූල බලයක් නොමැතිව තොරතුරු අනාවරණය කිරිම වරදක් බව

11. වැරදි සිදු කිරීමට තැත් කිරීම වරදක් බව

12. වරදක් සිදු කිරීමට අනුබල දීම වරදක් බව

13. වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරරීම වරදක් බව

ළමයින්ට එරෙහි අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීමේ දී මෙකී පනත භාවිත කිරීමේ දුර්වලතා පැවතියත් ඒ සම්බන්ධව අත්අඩංගුවට ගැනීමේ, සොදිසි කිරීමේ, තොරතුරු තහනමට ගැනීමේ හා විමර්ශන ක්‍රියාවලියේ දී ඉතා වැදගත් වනු ඇත.

5.2.8 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත

මෙම පනත "අපරාධ නඩු කටයුතුවල දී ශ්‍රව්‍ය දෘශ්‍ය රෙකෝඩන සහ පරිගණක මගින් ලබා ගන්නා ප්‍රකාශවල ඇතුලත් තොරතුරු සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිනිස වූ පනතකි."

මෙම පනතේ දෙවන වගන්තියේ මෙසේ සඳහන් කරයි.

"සාක්ෂි ආඥා පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද මෙහි විධිවිධාන සලස්වා ඇති යම් කරුණක් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ කරනු ලැබිය යුතුය."

තවදුරටත් මෙම පනත සයිබර් අපරාධ සම්බන්ධයෙන් නඩු කටයුතුවල දී සාක්ෂි අදාළ කරගැනීම පිළිබඳව විමසා බැලීමේ දී මෙහි II වන කොටසෙහි පරිගණක සාක්ෂි සම්බන්ධයෙන් අර්ථකතන රැසක් ඉදිරිපත් කරයි. 5-1 සිට 5-4 දක්වා ඒ පිළිබඳව පැහැදිළි කරනු ලබන අතර 5-4 උප වගන්තිය දෙස විශේෂ අවධානය යොමු කරමු.

"යම් ප්‍රකාශයක් තනි පරිගණකයක් මගින් හෝ පරිගණක කිහිපයක් මගින් හෝ පරිගණක ඒකාබද්ධ කිරීමකින් හෝ යම් ක්‍රමයකින් අනුපිළිවෙලට ක්‍රියාත්මක වන විවිධ පරිගණක මගින් හෝ උත්පාදනය කරන ලද්දක් නම් ඒ ප්‍රකාශයේ ඇතුලත් තොරතුරු පරිගණකයක් මගින් උත්පාදනය කරන ලද තොරතුරු ලෙස පිළිගනු ලැබිය යුතු අතර ඒ ප්‍රකාශය උත්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලැබූ සියලුම පරිගණක මගින් තනි පරිගණකයක් සංස්ථාපනය කෙරුනු පරිද්දෙන් මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. තවද මේ පනතේ පරිගණකයක් සම්බන්ධයෙන් වූ යම් සඳහනක් ඒ අනුව තේරුම් ගත යුතුය."

උක්ත ප්‍රකාශයේ "පරිගණක කිහිපයක් මගින් හෝ පරිගණක ඒකාබද්ධ කිරීමකින් හෝ යම් ක්‍රමයකින් අනුපිළිවෙලට ක්‍රියාත්මක වන විවිධ පරිගණක මගින් හෝ උත්පාදනය කරන ලද්දක් නම්" යන්නෙන් පරිගණක පද්ධතියක් / ජාලයක් අර්ථකතනය කරයි. පරිගණක පද්ධති ජාලයන් ඒක් වූ විට අන්තර්ජාලය නිර්මාණය වන හෙයින් එවැනි

ජාලයකින් උත්පාදනය කරනු ලබන සාක්ෂි, නීතිය ඉදිරියේ වලංගු වනු ඇත. එහෙත් සයිබර් අපරාධ සම්බන්ධයෙන් කුමන හෝ සාක්ෂියක් යම් හෙයකින් ශ්‍රී ලංකාවේ නීතියට ආවේක්ෂකර ගැනීමට අපොහොසත් වුව හොත් එවැනි අවස්ථාවක දී සාක්ෂි ආඥා පනතේ 100 වන වගන්තිය අනුව ක්‍රියාකිරීමට කිසිදු භාධාවක් නොවනු ඇත. එනම්

"මේ ආඥා පනත මගින් හෝ මේ දිවයිනෙන් වලංගු අන් කිසි නීතියක් මගින් විධිවිධාන නොයොදා සාක්ෂි පිළිබඳ ප්‍රස්නයක් නීති කෘත්‍යක දී මතු වන ඕනෑම විටෙක එබදු ප්‍රශ්නයක් තත් කාලයෙහි බලපවත්නා සාක්ෂි පිළිබඳ ඉංග්‍රීසි නීතිය අනුව නිශ්චය කළ යුතුය."

05.2.9. චක්‍රලේඛ (Circulars)

පාසල් පිරිවෙන් හා අනිකුත් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම පිළිබඳ චක්‍රලේඛය

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2017/06/21 වන දින නිකුත්කර ඇති 21/2017 දරන චක්‍රලේඛය මගින් පාසල්, පිරිවෙන් හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අනිකුත් අධ්‍යාපන ආයතන තුළ අන්තර්ජාල සේවා පරිහරණය කිරීමේ දී මෙකී චක්‍රලේඛය ට අනුව කටයුතු කළ යුතු වේ. ඒ අනුව මෙකී චක්‍රලේඛය මගින් පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීම පිළිබඳ මාර්ගෝපදේශයක් ඉදිරිපත් වන අතර එහි

කෙටි කාලීන මධ්‍ය කාලීන හා දිගු කාලීන අරමුණු රැසක් අපේක්ෂා කරයි.

එසේම එකී චක්‍රලේඛයේ 1.1 මගින් පාසල් අන්තර්ජාල භාවිත ප්‍රතිපත්ති හඳුන්වා දෙන අතර එහි 1.2 මගින් විද්‍යුත් තැපැල් භාවිතා කළ යුත්තේ කුමන කොන්දේසි මතද යන්නත් 1.3 මගින් අන්තර්ජාලය තුළින් සංවාද (Chat) කළ යුත්තේ කුමන කොන්දේසි මත ද යන්නත් එහි 1.4 මගින් වෙබ් අඩවි බාවිත කළ යුත්තේ කෙසේද යන්නත් අංක 1.5 මගින් පෞද්ගලික සංනිවේදන උපාංග භාවිත කළ යුත්තේ කෙසේද යන්නත් ඇතුළත්ව එකී කොන්දේසි බිඳ ටැටීමේ දී ගත යුතු විනය ක්‍රියාමාර්ග කුමක්ද යන්න පිළිබඳවත් අන්තර්ගතව ඇත. මෙම චක්‍රලේඛය පාසල් පද්ධතිය තුළදී ළමයින්ට එරෙහි සයිබර් අපරාධ වැළැක්වීමටත් අවභාවිතය අවම කිරීමටත් ඉතා වැදගත් ආරක්ෂිත මෙවලමක් ලෙස භාවිත කළ හැකිය.

මෙකී සියලු නීති මුලාශ්‍ර සලකා බැලූ විට පෙනී යනුයේ ශ්‍රී ලංකාවේ සයිබර් ළමා අපරාධ මැඩලීම සඳහා නීති පවත්නා මුත් එකී නීති එක හෙලාම සෘජු ලෙසම නීතිමය මැදිහත්කරණය සැලසීමට සමත් නොවන බවයි. එබැවින් මෙකී නීතියට සංශෝධන ලෙස පැහැදිළි කිරීම්, අර්ථකතනය කිරීම්, ආදේශ කිරීම්, සංශෝධනය කිරීම්, නව වගන්ති එකතු කිරීම් හෝ වෙනම සයිබර් අපරාධ සඳහා පනතක් නිර්මාණය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

05.3. ළමයින්ට එරෙහි සයිබර් අපරාධ විමර්ශන ක්‍රියාවලිය

සයිබර් අපරාධ පිළිබඳ සමාජ විද්‍යාත්මක හෝ අපරාධ විද්‍යාත්මක දෘෂ්ටි කෝණ ඔස්සේ බැලීමේ දී හිංසාකාරී සයිබර් අපරාධ හා හිංසාකාරී නොවන සයිබර් අපරාධ ලෙස හඳුනාගනු ලැබුවත් විමර්ශන ක්‍රියාවලියේ පහසුව උදෙසා පරිගණකයක් ඉලක්ක කර ගත් සයිබර් අපරාධ හා පරිගණකය ආශ්‍රිත සයිබර් අපරාධ ලෙස හඳුනා ගනිමු.

මෙම ආකාර දෙකේ වෙනස වනුයේ සයිබර් අපරාධවලදී ඇතැම් විට අපරාධයේ ඉලක්කය පරිගණකයක් හෝ පරිගණක ජාලයක් විය හැකි අතර තවත් විටක අපරාධයක් සිදු කිරීමට පරිගණකයක් හෝ ජාලයක් යොදා ගත හැකිය යන්නයි.

උදාහරණයක් ලෙස ගත හොත් යම් පරිගණක ජාලයක් යොදා ගනිමින් වෙනත් කෙනෙකුගේ ගිණුමක් සොරා ගැනීම හෝ ගිණුමට හානි කිරීමක් පරිගණකයක් ඉලක්ක කර ගත් සයිබර් අපරාධයක් ලෙස හැඳින්විය හැකිය. යම් පරිගණක පද්ධතියක් යොදා ගනිමින් යම් කෙනෙකුගේ

ප්‍රතිරූපයට හානි කිරීමක් හෝ ලිංගික ඇවිට්ලි කිරීමක් වැනි ක්‍රියා සිදු වන්නේ නම් ඒවා පරිගණකය ආශ්‍රිත අපරාධයන් ලෙස පෙන්වා දිය හැකියි. බොහෝ විට ළමයින් සම්බන්ධයෙන් වූ සයිබර් අපරාධ බොහොමයක් වාර්ථා වනුයේ පරිගණක ආශ්‍රිත සයිබර් අපරාධ වශයෙනි.

සයිබර් විමර්ශන ක්‍රියාවලිය සාමාන්‍ය සිද්ධි කළමණාකරණයේ සිට අපරාධ විමර්ශන ක්‍රියාවලිය හරහා අතිශය තාක්ෂණික වූ ව්‍යෝහාරික (Forensic) පරිගණක විමර්ශන ක්‍රියාවලියක දක්වා විහිද යයි. එහෙත් මෙහිදී අවධානය යොමු කරනුයේ අන්තර්ජාල අපරාධයක් සම්බන්ධයෙන් වූ සාමාන්‍ය සිද්ධි කළමණාකරණය හා අපරාධ විමර්ශන ක්‍රියාවලියක දී නිලධාරියෙකු විසින් සලකා බැලිය යුතු කරුණු කිහිපයක් පිළිබඳවය. මන්ද එහි තාක්ෂණික පරිචය තාක්ෂණික විශේෂඥතාවයකින් යුතු බලධාරීන් විසින් සිදු කළ යුතු වූවක් වන බැවිනි. එකී විශේෂඥ මතය තහවුරු කිරීමට සමත් අනිකුත් සාක්ෂි එකතු කර ගැනීමට යාමේ දී විමර්ශන නිලධාරීන් විසින් පිළිපැදිය යුතු හර පද්ධතීන් පිළිබඳව වැඩි දුරටත් අවධානය යොමු කරමු.

සයිබර් අපරාධ විමර්ශන ක්‍රියාවලියේ දී අපරාධ විමර්ශනයකට පෙර එය සාමාන්‍ය සිද්ධි කළමණාකරණය හරහා ප්‍රතිචාර දැක්විය හැකිය. අන්තර්ජාල ගැටළුවක් සඳහා

ප්‍රතිචාර දැක්වීමට යාමේ දී පියවර හතරක් භාවිත කරයි. එනම්;

01 සිද්ධිය හඳුනා ගැනීම

02 වර්ගීකරණය

03 ප්‍රමුඛතා තීරණය

04 ප්‍රතිචාර දැක්වීම

සිද්ධිය හඳුනා ගැනීම

සයිබර් අපරාධ සිද්ධියක් ඕනෑම ප්‍රවේශයක් ඔස්සේ අන්තර්ජාල සිද්ධි කළමණාකරණ ඕනෑම මධ්‍යස්ථානයකට වාර්තා විය හැකිය. පාසල් පරිගණක ඒකකයේ සිට රාජ්‍ය නොවන සිද්ධි කළමණාකරණ ඒකකයේ පටන් නීතිය ක්‍රියාත්මක කරන ආයතන දක්වා ඕනෑම ස්ථානයකට දුරකථන, අන්තර්ජාල, ලිඛිත හෝ වාචික යන ඕනෑම මාධ්‍යයකින් වාර්තා වේ. එසේ ලැබෙන ඕනෑම පැමිණිල්ලක් අන්තර්ජාල ගැටළුවක්ද යන්න මූලිකව හඳුනා ගත යුතුය. එසේම එය නිවැරදිව සටහන් කර ගැනීම ඉතා වැදගත් වේ.

- සිද්ධිය වාර්තා කරනු ලබන පුද්ගලයාගේ නම හා අනන්‍යතාවය
- වාර්තා කරනු ලබන දිනය හා වේලාව
- සිද්ධිය කුමක්ද
- එකී සිද්ධිය හඳුනා ගැනීමට සමත් අනෙකුත් සාක්ෂි සියල්ල

පිළිබඳ හඳුනා ගැනීමක් වැදගත් වේ.

වර්ගීකරණය

සිද්ධියක් වාර්තා වූ සැනින් එය හඳුනා ගැනීමෙන් පසු එකී සිද්ධිය වර්ගීකරණය කර ගත යුතුය. මෙකී පැමිණිල්ල කුමන වර්ගයේ සයිබර් පැමිණිල්ලක්ද මෙම සිද්ධිය ඇතුලත තවත් සිද්ධීන් පවතීද යන්න ගැඹුරින් අධ්‍යයනය කර අනුවර්ගීකරණය සිදු කිරීම තවදුරටත් වැදගත් වනු ඇත.

ප්‍රමුඛතාගත කිරීම

උක්ත වර්ගීකරණය හා අනුවර්ගීකරණය මත පිහිටා මෙම සිද්ධියට කෙතරම් ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුද යන්න තීරණය කර ගත හැකිය. මෙකී සිද්ධියෙන් ළමයාට හෝ සමාජයට සිදු වන බලපෑම කෙතරම් ද යන්න පිළිබඳ අවධානම් තක්සේරුවක් කර ඉතා ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුත්තක් නම් ඒ සඳහා කඩිනමින් මැදිහත් කරණය කළ යුතුයි.

ප්‍රතිචාර දැක්වීම

අවධානම් තක්සේරුවෙන් පසු ක්ෂණිකව පියවර ගත යුත්තක්ද නොයේසේ නම් ප්‍රතිචාර දැක්විය යුතු ස්වභාවය අනුව මැදිහත්කරණය ලබා දිය යුතුය. ඇතැම් විට එකී සිද්ධියට සාමාන්‍ය සිද්ධි කළමණාකරණයකින් සහයෝගය ලබා දිය හැකි නම් ඒ සඳහා සහය විය යුතුය. මෙහිදී Block කිරීම Unfreind කිරීම Report කිරීම Diactivet වැනි සරල

මැදිහත් කිරීමේ සිට අපරාධ විමර්ශනයක් ඔස්සේ වෝහාරික විමර්ශනයන් දක්වාද ගමන් කළ හැකිය.

නිසි බලයලත් නිලධාරීන් විසින් සයිබර් අපරාධයක් පිළිබඳ අපරාධ විමර්ශනය (Criminal Investigation) සිදු කිරීමට නම් මුල් තොරතුරක් හෝ පැමිණිල්ලකින් ලැබිය යුතුය (අ.න.වි.ස 109-2). එසේත් නොමැති නම් ආවේක්ෂණයක් හරහා තොරතුරක් සොයාගත හැකිය. එවැනි පැමිණිල්ලක් හෝ තොරතුරක් ලද සැනින් එකී විමර්ශනය නීත්‍යානුකූලවත් අපක්ෂපාතීවත් කඩිනමින් පූර්ණ ලෙසත් ඉහළ වෘත්තීමය භාවයකින් සිදු කළ යුතුය. කිසිදු අවස්ථාවක ළමයා ද්වීතීක වින්දිත භාවයට පත් කිරීමට හෝ තවදුරටත් අපයෝජනය වෙමින් පැවතීමට ඉඩ කඩ කඩිනමින් අසුරාලිය යුතුය. එසේ ලබා ගත් තොරතුරක් ඔස්සේ විමර්ශනයක් පැවැත්වීමේ දී ඒ සඳහා අරමුණක් හා ඉලක්කයක් පැවැතිය යුතු අතර එකී ඉලක්කය වෙත ළඟාවීමට සමත් පොදු ආදර්ශයක් පිළිබඳව සලකා බලමු.

01. මුලිකවම වරදක් සිදු වී ඇද්ද නැද්ද යන්න සලකා බැලීම
02. එකී වරද සම්බන්දයෙන් වූ පවත්නා සියලුම තොරතුරු, ද්‍රව්‍ය හා බුද්ධිමය සාක්ෂි එකතු කර ගැනීම.
03. ඒ හා බැඳුණ නීතිමය තත්ත්වයන් පිළිබඳව සලකා බැලීම
04. සර්ව සාධාරණ විමර්ශනයක් සිදු කිරීමට අදාළ සියලු හේතු කාරණා පිළිබඳව දැඩි ලෙස සලකා බැලීම
05. පුළුල් විමර්ශනයක් සිදු කිරීම

06. වරදකරුවන් හඳුනා ගැනීම හා අත්අඩංගුවට ගැනීම
07. සියලු සාක්ෂි අධිකාරී බලය ලත් ආයතනයක් වෙත ඉදිරිපත් කිරීම

මෙම පියවරයන් සියල්ල ක්‍රියාත්මක කිරීමට යාමේ දී විමර්ශන නිලධාරියෙකු විසින් විමර්ශනයේ ABC මූලධර්මය[27] මත පිහිටා කටයුතු කිරීම ප්‍රතිඵලදායකය. එනම්;

A- පූර්ව නිගමනවලින් බැහැරවීම
B- විශ්වාස නොකිරීම
C- සෑම කරුණක්ම පරික්ෂාකර බලා අභියෝගයට ලක් කිරීමයි.

අන්තර්ජාල ගැටළුවක් විසඳා ගැනීමටයාමේදී එකී ගැටළුව (CyberInvestigation Staircase Model)CISM[28]ආකෘතියට අනුව විසඳා ගැනීමට උත්සාහ දැරීම විමර්ශන ක්‍රියාවලිය වඩාත් ක්‍රමවත් කරනු ඇත.

---

[27].Akhgar Babak, Staniforth Andrew & Bosco Francesca,Cyber Crime and Cyber Terrorism Investigator's Handbook,2014,chapter 4,pp,33.

[28].Akhgar Babak, Staniforth Andrew & Bosco Francesca,Cyber Crime and Cyber Terrorism Investigator's Handbook,2014,chapter 4,pp,34.



(CISM- Cyber Investigators Staircase Model)

රූප සටහන් - 04

විමර්ශනය සඳහා පැමිණිල්ලක් හෝ තොරතුරක් ලද සැණින් විමර්ශකයා විසින් ඒ සඳහා අරමුණක් නිර්වචනය කර ගත යුතු අතර එකී අරමුණට අනුව හැකිතාක් තොරතුරු එක් රැස් කර ගත යුතුය. එම තොරතුරුවල නිරවද්‍යතාවය හා වලංගුභාවය පරික්ෂාකර බැලීම යුහුසුළුව සිදු කළ යුතුයි. මන්ද අන්තර්ජාල අපරාධයකදී සාක්ෂි වසන් කිරීමට හෝ විනාශ කිරීමට ඉතා වේගයෙන් හැකියාව ලැබෙන බැවින් ඊට පෙර ක්‍රියාත්මක විය යුතුය. තොරතුරු රැස් කිරීමේදී 5 x Wh + H ක්‍රමවේදය[29] භාවිතයට ගත හැකිය. එනම් Who, What,

[29].Akhgar Babak, Staniforth Andrew & Bosco Francesca,Cyber Crime and Cyber Terrorism Investigator's Handbook,2014,chapter 4,pp,35.

When, Where, Why, How යන ප්‍රශ්නවලට හැකිතාක් තොරතුරු සපයා ගැනීමයි.

01 වින්දිතයා කවුද? (Who is the victim)

02 සිදු වුයේ කුමක්ද? (What Happened)

03 සිදු වුයේ කවදාද? (When did it happen)

04 සිදු වුයේ කොහේදීද? (Where did it happen)

05 එය සිදු වුයේ ඇයි? (Why did it happen)

06 එය සිදු වුයේ කොහොමද?(How did it happen)

යන ප්‍රශ්න සඳහා සාධාරණ නිරවද්‍ය තොරතුරු ලබා ගැනීම සිදු කළ යුතුවේ.

වින්දිතයා හෝ වින්දිතයින් කවුරුන්ද යන්න නිවැරදිව හඳුනා ගැනීම අපගේ විෂය පතයට අනුව ඉතාමත් වැදගත්ය. මන්ද අන්තර්ජාල ළමා අපරාධ සම්බන්ධ විමර්ශන කටයුත්තක් වන බැවින් මුලිකවම එකී වින්දිතයා අවුරුදු 18 අඩු අයෙක්ද යන්න තීරණය කර ගත යුතුය. ඒ අනුව වින්දිතයාගේ හෝ වින්දිතයින්ගේ නම, ලිපිනය, ස්ත්‍රී පුරුෂ බව ආදී පෞද්ගලික තොරතුරු හැකි තාක් එක් රැස් කර ගත යුතුය.

සිදු වුයේ කුමක්ද යන්න අනතුරුව හඳුනා ගත යුතුයි. එහිදී ඒ පිළිබඳ හැකිතාක් තොරතුරු සොයා බලමින් අපරාධයේ ඉලක්කය පරිගණකයක්ද එසේත් නොමැති නම්

.

පරිගණකය යොදා ගෙන සිදු කළ අපරාධයක්ද යන්න හඳුනා ගැනීමටත් හිංසාකාරී සයිබර් අපරාධයක්ද හිංසාකාරී නොවන සයිබර් අපරාධයක් ද යන්න හඳුනා ගැනීමටත් අවශ්‍ය තොරතුරු එකතු කර ගත යුතුය. ඒ තුළ පවතිනුයේ ලිංගිකත්වය පදනම් කර ගත් සයිබර් අපරාධයක් ද? නැද්ද? යන්න තහවුරු කර ගැනීමට උත්සාහ දැරිය යුතුය. Cyber Bullying , Cyberstalking, sexting , Child Abuse Image වැනි තත්ත්වයක් ඒ අනුව හඳුනාගත හැකිද? නොඑසේ නම් දත්ත සොරාගැනීමක්, දත්ත වෙනස් කිරීමක්, අනවසරයෙන් ඇතුළු වීමක්, අන්තර්ජාල සූදුවක් වැනි හිංසාකාරී නොවන යමක් පවතීද යන්න තහවුරු කර ගත යුතුය. ඒ ආකාරයෙන් හඳුනාගත් සයිබර් අපරාධය ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ උල්ලංඝනය වී පවතිනුයේ කුමන වගන්තිද යන්න විමසා බලමින් අපරාධ සංඝටකය හඳුනා ගැනීමට උත්සුක විය යුතුය.

එකී අපරාධය සිදු වූයේ කවදාද යන්න පිළිබඳව සොයා බැලීමේ දී වින්දිතයා එකී අපරාධයට මුහුණ දෙනු ලැබූ දිනය මෙන්ම සැබවින්ම දැන ගැනීමට ලැබුණ ආකාරයත් ඉතා වැදගත් වේ. මන්ද ඇතැම් හිංසකයින් අපරාධ සිදු කරමින් එය අදාළ පුද්ගලයාට සන්නිවේදනය කිරීමට විවිධ උපක්‍රම භාවිත කරන බැවිනි. අන්තර්ජාලය භාවිත කරමින්ම එකී අපරාධය සිදු වුයේ කවදාද, කුමන වෙලාවටද යන්න පිළිබඳ තොරතුරු හඳුනා ගත හැකිය.

අපරාධය සිදු වුයේ කොහිදීද යන්නට තොරතුරු සොයා බැලීමේ දී දේශීය, විදේශීය බව මෙන්ම කුමන ජාලයක් හරහා සිදු වී ඇද්ද යන්න හඳුනාගත යුතුය. එය සමාජ ජාල වෙබ් අඩවියක්ද නොඑසේ නම් වෙනත් කුමනාකාරයේ ජාලයක්ද යන්නත් මෙන්ම එකී ජාලය නිවැරදිව කුමක්ද යන්නත් හඳුනා ගත යුතුය. Facebook, Instagram, whatsapp, viber, twitter හෝ වෙන යම් ජාලයක්ද යන්න නිවැරදිව හඳුනා ගත යුතුය. එසේම කුමන සෙවීම් යන්ත්‍රයක් උපයෝගී කර ගෙන ඇද්ද, කුමන කලාපයකින් ප්‍රහාරය දියත්කර ඇද්ද, එහි IP ලිපිනය (Internet Protocol Address) එක කුමක්ද ආදී කරුණු අනාවරණය කර ගැනීම කෙරෙහි තාක්ෂණික සහයෝගය හැකිතාක් ලබා ගැනීම වැදගත් වේ. සිදු වී ඇති අපරාධය තවදුරටත් දර්ශනය වේ නම් කඩිනමින් එහි URL ලිපිනය (Link) ඇතුළු අපරාධයක් වූ ස්ථානය හා ඊට සම්බන්ධ සියලු තොරතුරු සාක්ෂි සහිතව හඳුනා ගැනීම කළ යුතුයි. එකී අපරාධය දෙස හොඳින් විමසා බලා සිද්ධිය අන්තර්ජාලය තුළින්ම සිදු වූවක්ද යන්න තහවුරු කර ගත යුතුයි. මන්ද යත් විමර්ශන නිලධාරීන් සතු දැනුම ප්‍රමාණවත් නොවීම නිසා අන්තර්ජාලය ආශ්‍රිතව සිදු වන සයිබර් අපරාධ හා භෞතිකව සිදු වන අපරාධ වෙන්කොට හඳුනා ගැනීමට අපොහොසත් විය හැක. එහි ප්‍රතිඵලයක් ලෙස අන්තර්ජාලය යන නම භාවිත වූ පමණින් එකී සිද්ධිය සයිබර් අපරාධ ගණයට ඇතුළත් කර කටයුතු කිරීම නිසා ළමයාට ලබා දිය හැකි

අවම සහනය හෝ ලබා දීමට ඇතැම් නිලධාරීහු මැලි කමක් දක්වති. එබැවින් සිදු වී ඇති අපරාධය දෙස හොඳින් අධ්‍යයනය කර එකී අපරාධය Online මට්ටමේ දී සිදු වූවක්ද Offline මට්ටමේ දී සිදු වූ වක්ද යන්න හඳුනා ගැනීමට කටයුතු කිරීම ඉතා වැදගත්ය.

අපරාධය සිදු වූයේ ඇයි ද යන්න ඉතා පුළුල් කතිකාවතක් වන අතර අපරාධ මැඩලීම උදෙසා ස්ථිරසාර විසඳුමක් කරා ළඟාවීමේ දී වැදගත් සාධක රැසක් මේ තුළින් මතු කරයි. නමුත් අපරාධයේ අරමුණ කුමක්ද යන්න විමසා බලමින් හිතාමතාම යමක් අහිමි කිරීමට හෝ අත්පත්කර ගැනීමට එකී අපරාධකරුට අවශ්‍යතාවයක් තිබුණේ ද යන්න අවබෝධකර ගැනීමට මෙම පැනයට පිළිතුරු සෙවීම වැදගත්ය.

එය සිදු වූයේ කෙසේද යන්න විමසා බැලීම මත විමර්ශනයේ වැදගත්ම සාක්ෂි රැසක් මතු කරන අතර ඒ තුළ පුළුල් තාක්ෂණික ක්‍රියාවලියක්ද සැඟවී පැවතිය හැකිය. එබැවින් වින්දිතයා මෙන්ම අපරාධකරු හෙළිකරන තොරතුරු මෙන්ම පරිගණක විශේෂඥයින්ගේ විද්‍යාත්මක මතයද ඉතා වැදගත්ය. විමර්ශන ක්‍රියාවලියේ දී අත්‍යවශ්‍ය මෙන්ම බැරෑරුම් අනාවරණ රැසක් මේ තුළ ගැබ්ව ඇති බැවින් අංකිත වෝහාරික සාක්ෂි (Digital Forensic) සාක්ෂි වෙත අධිකරණය හරහා යොමු කිරීමට ද සිදු වනු ඇත.

විමර්ශන නිවැරදිව සිදු නොවන විට අපරාධ මැඩලීම ප්‍රමාණවත් මට්ටමකින් සිදු නොවනු ඇත. විමර්ශන

නිවැරදිව සිදු වීමට නම් ඒ පිළිබඳ පුහුණුව ලත් නිලධාරීන් මෙන්ම ජනතාවට ඉතා පහසුවෙන් ප්‍රවේශවීමට හැකි ප්‍රාදේශීය සයිබර් පොලිස් ඒකකද පිහිටුවීමද අවශ්‍ය වේ. සයිබර් විමර්ශකයින් සෑම විටම සිය ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ මෙන්ම තාක්ෂණික විශේෂඥයින්ගේ උපදෙස් නිරන්තරයෙන් ලබා ගනිමින් කටයුතු කළ යුතු අතර එකී විමර්ශනයේ දත්ත නිරන්තරයෙන් සුපරීක්ෂණය, විශ්ලේෂණය, ප්‍රතිචාර දැක්වීම හා ඇගයීම යන ක්‍රියාවලිය ඔස්සේ ගමන් කිරීමට උත්සාහ ගත යුතුය.

අන්තර්ජාලය තුළළමා අපයෝජන සිදු කරන අපරාධකරුවන් නීතියේ රැහැනට හසුකර ගැනීම උදෙසා ක්‍රියාත්මක විය හැකි ආකාර දෙකක් තවදුරටත් පෙන්වා දිය හැකියි.

01- ළමයෙකු පිටු පස යාමෙන්

02 අපරාධ කරුවෙකු පිටුපස යාමෙන්

අන්තර්ජාලයෙන් හිංසාවට ලක් වන ළමයෙකු සම්බන්ධයෙන් නිරන්තර තොරතුරු ගවේෂණය කරමින් හෝ ළමයෙකු අපයෝජනයට ලක් කරන අපරාධකරුවෙකු පිටුපස නිරන්තර තොරතුරු ගවේශනය කිරිමෙන් අන්තර්ජාල අපරාධකරුවන් නීතියේ රැහැනට හසුකර ගත හැකිය.

ඒ අනුව නිතිය ක්‍රියාත්මක කරන නිලධාරියා වෙතට ලැබෙන මුල් තොරතුර මත පදනම්ව විමර්ශනය ආරම්භ කිරීමේදී ඒ පිළිබඳ මූලික පිරික්සීමකින් පසු මතු පිට අපරාධ තොරතුරු පැවතීම හෝ නොවීම හෝ ප්‍රමාණවත්

නොවීම මත එකී විමර්ශනය සිදු වන ආකාරය තීරණය වනු ඇත. එවැනි අන්තර්ජාල විමර්ශන ක්‍රියාවලියක් සිදු වන ආකාරය පහත සඳහන් ගැලීම් සටහන අධ්‍යයනය කිරීමෙන් අවබෝධ කර ගත හැකිය.



NCPA, CYBER CRIME INVESTIGATION UNIT
Prepared by – Champika k Ayagama

රූප සටහන් - 05

මුල් තොරතුර අනුව එහි මතුපිට අපරාධ තොරතුරු පවතී නම් අපරාධ විමර්ශනය ආරම්භ කළ හැකිය. එහි පමතුපිට අපරාධ තොරතුරු නොපවතී නම් අදාළ සැකකාර ගිණුම සමග රහසිගත විමර්ශනයක් (Undercover Investigation) හරාහා අපාරධ තොරතුරු සොයා බැලිය යුතුය. අපරාධ තොරතුරු අනාවරණයත් සමගම ගිණුමේ අනන්‍යතාව හඳුනා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. සමහර ගිණුම්වල අනන්‍යතාව අනාවරණය කර ගැනීම පහසු වුවත් බොහෝ අපරාධකාරී අන්තර්ජල ගිණුම්වල අනන්‍යතාව තහවුරු කර ගැනීම පහසු කටයුත්තක් නෙවේ. ඒ අනුව එකී අපරාධකාරී ගිණුම් හිමියාගේ නම, ගම, වයස, පදිංචිය, ඔහුගේ ඡායාරූප, දුරකථන අංක මෙන්ම IP ලිපිනයන් භාවිතා කරනු ලබන ඉලෙක්ට්‍රොනික උපකරණයේ IMEI අංකය ඔහු සම්බන්ධ වී සිටින සම්ප්‍රේෂණ කුළුණු වාර්ථා වැනි තාක්ෂණික තොරතුරුද මෙම විමර්ශනය සඳහා සොයා ගැනීමට උත්සාහ කළ යුතුය. එහිදී විමර්ශන නිලධාරියාට තනිවම මෙකී තොරතුරු සොයා ගැනීමට හැකියාවක් නොමැති බැවින් අනිකුත් සහයක ආයතනයන් හී සහයෝගය පැතීම ඉතා වැදගත් වනු ඇත. ශ්‍රී ලංකාව තුළ මෙවැනි විමර්ශන කටයුත්තක දි සහය ලබා ගත හැකි ආයතන කිහිපයක් තිබේ.

01. සියලුම දුරකථන සමාගම්

02. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRC)

03. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT)

04. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

අපරාධයේ අනන්‍යතාව තහවුරු නොවේ නම් නැවත එකී ගිණුම සමග වෙනත් ආකාරයකින් සම්බන්ධ වී රහස් විමර්ශනයක් (Undercover Investigation) සිදු කිරීමට සිදු වනු ඇත. අනන්‍යතාව තහවුරු කර ගැනීමට හැකියාව ලැබුණේ නම් ඔබ එම විමර්ශනය තුළ පැවති අපරාධ සංඝටක හඳුනා ගැනීම සිදු කළ යුතුය. සමහර විට අපරාධ සංඝටක එකවර හඳුනා ගැනීමට නොහැකි වන අවස්ථාවන් ඇති අතර එවැනි අවස්ථාවකදී නැවත ගිණුම සමග සම්බන්ධ වී විමර්ශනය කර බැලිය හැකිය. එසේත් නොමැති නම් විමර්ශනය අවසන් කළ හැකිය. කෙසේ වුවත් අපරාධ සංඝටක හඳුනා ගැනීමට හැකි වුයේ නම් එකී සංඝටක මත පිහිටා තොරතුරු වාර්ථා කිරීම හෝ චෝදනා ගොණු කිරීම සිදු කළ හැකි අතර ඒ මත සැකකරු අත්අඩංගුවට ගැනීම හා ඔහු භාරයේ ඇති අපරාධ සහයක උපාංග භාරයට ගැනීම හා නඩු භාණ්ඩ ලේඛනගත කිරීම (PR) සිදු කළ යුතුය. එසේම සැකකරු නීතිය පසිඳලීම සඳහා අධිකරණයට ඉදිරිපත් කිරීම හා අධිකරණය මගින් විශේෂඥ සාක්ෂි කැඳවීම සිදු විය යුතුය. එකී විශේෂඥ සාක්ෂි ඉතා වැදගත් වන අතර මේ සම්බන්ධයෙන් විශේෂඥ සාක්ෂි සපයන ආයතන ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන පීඨය, මොරටුව

විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය, යන ආයතන සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරයි. ඊට අමතරව අවශ්‍ය නම් විදේශීය ආයතනවල සහයද අධිකරණය මගින් කැඳ විය හැකිය.

උදා - Facebook ආයතනයෙන් අනන්‍යතාවය ඉල්ලා උසාවි නියෝගයක් යොමු කිරීම.

අන්තර්ජාල ගිණුමක මතුපිට තොරතුරු නොපැවතීම මත එය අපරාධකාරි ගිණුමක් නොවේයැයි එක හෙළාම බැහැර කළ නොහැක. එවැනි විට දී රහස් විමර්ශනයකට (Undercover Investigation) යොමු විය හැකියි. නමුත් එවැනි අවස්ථාවකදී එකී අපරාධකාරී ගිණුම සමඟ නිවැරදිව සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම ඉතා වැදගත් කාරණයකි. අපරාධය තහවුරු කර ගැනීම සඳහා විවිධ උපක්‍රම අදාළ අපරාධයේ ස්වභාවයට අනුව විමර්ශන නිලධාරියා විසින් තෝරා ගත යුතු අතර කුමන උපක්‍රමයක් තෝරා ගනු ලැබුව ද එම සියලු උපක්‍රම ශ්‍රී ලංකාවේ නීතිය අතික්‍රමණය නොකළ යුතුය. ඒ සඳහා අන්තර්ජාල විමර්ශනයක දී විමර්ශන නිලධාරියා විසින් පිළිපැදිය යුතු මූලික ආචාරධර්ම කිහිපයක් අවධානයට යොමු කරමි.(11 රීති)

- අපරාධයට පෙළඹවීමක් නොකිරීම
- බලපෑම් නොකිරීම
- අපරාධ සහයකයෙකු නොවීම

- පූර්ව විනිශ්චයක් නොකිරීම
- අපරාධකාරී චර්යා අනුමත නොකිරීම
- තොරතුරු සටහන් අඛණ්ඩව පවත්වා ගෙන යාම
- සෑමවිටම අරමුණු සහගතව තොරතුරු පිරික්සීම
- පවත්නා නීතියට පටහැනි වරදක් සිදු වේදැයි සොයා බැලීම
- පරස්පර විරෝධී තොරතුරු ලබා නොදීම
- පිළිතුරු දීමට අපහසු අවස්ථා මඟ හැරීම
- තොරතුරුවල රහස්‍යභාවය සුරැකීම

මෙකී ආචාර ධර්ම මත පිහිටා කටයුතු කිරීම සයිබර් අපරාධ විමර්ශන නිලධාරියාගේ ආරක්ෂාවට මූලිකවම වැදගත් වනු ඇත. මන්ද යත් අන්තර්ජාල අපරාධ විමර්ශන නිලධාරීන් මෙවැනි විමර්ශන තුළ සිර වීමට ඇති ඉඩ කඩ බහුල වන බැවිනි. ක්‍රමානුකූලව තොරතුරු රැස් කිරීමෙන් අනතුරුව හා අපරාධය සහ අපරාධකරු හඳුනා ගැනීමෙන් අනතුරුව එකී අපරාධකරු එළියට ගැනීම සඳහා අවශ්‍ය නම් උපාය දූතයෙකු හෝ යොදා ගත හැකිය.

අන්තර්ජාල විමර්ශන ක්‍රියාවලියේ දී සෑම විමර්ශන පියවරක්ම ULR ලිපිනය ප්‍රදර්ශනය වන සේ තිර දර්ශන (Screen Shots) ලබා ගෙන සුරක්ෂිතව තබා ගැනීමට ප්‍රමාද නොකළ යුතුය. එසේ නොමැති නම් ඒ සඳහා පවත්නා මෘදුකාංග මගින් ස්වයංක්‍රීයව එකී දත්ත ගබඩා කර ගනීමේ පහසු කම් සකසා ගත යුතුය.

අපරාධකරු අත් අඩංගුවට ගැනීමෙන් අනතුරුව ඔහු සතු ඉලෙක්ට්‍රෝනික උපකරණ පොලිස් භාරයට ගැනීමේ දී ඉතා සැලකිලිමත් විය යුතු අතර භාරයට ගත් එකී උපකරණ තුළට ඇතුළු වීමට යාම සිදු නොකළ යුතුය. එසේ ඇතුළු වන්නේ නම් 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතෙහි 21 වන වගන්තියේ 2 වන උප වගන්තියට අනුව පොලිස්පති තුමාගේ විශේෂ අවසරයෙන් යුතු බලය පැවරූ ඒ පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති නිලධාරියෙකු හැරෙන්නට එම උපකරණය තුළට ඇතුළු නොවිය යුතුය. එසේම එකී උපකරණයට හෝ දත්තවලට හානියක් නොවන ලෙස අදාළ උපකරණ භාරයට ගැනීමට විමර්ශන නිධාරියා දක්ෂ විය යුතුය.

5.3.1. ශ්‍රී ලංකාවේ සයිබර් අපරාධ විමර්ශනය සඳහා වූ අභියෝග

ශ්‍රී ලංකාවේ සයිබර් අපරාධ පිළිබඳව විමර්ශන නිලධාරීන් සතු දැනුම ප්‍රමාණවත් නොවීම; විමර්ශන නිලධාරීන් සතු තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නොවීම; අන්තර්ජාල විමර්ශන කටයුතු බොහෝ පොලිස් ස්ථාන මගින් භාර නොගැනීම හා විමර්ශන ක්‍රියාවලිය ප්‍රාදේශීය පොලිස් ස්ථාන දක්වා විහිදී නොයෑම; පවත්නා නීතිය නිවැරදිව හඳුනාගෙන/නිර්වචනයකර ගෙන නොමැතිවීම; නීතිය පිළිබඳ පැහැදිළිතාවයක් නොමැති වීම; ශ්‍රී ලංකාවේ දියුණු

සුරක්ෂිත අන්තර්ජාල සේවාවක් නොමැති වීම; ගැඹුරු හා අඳුරු අන්තර්ජාලයේ (Deep web and Dark web) සිදු වන අපරාධ හඳුනා ගැනීමේ අසීරුතාවය; එකම IP Address එකකින් ග්‍රාහකයින් බොහෝ පිරිසකට ප්‍රවේශය ලබා දීම; දුරකථන සංවාද හා තොරතුරු රඳවා තබා ගනු ලබන කාලය සීමා වීම; සයිබර් දුරකථන සංවාද/සංසරණ තොරතුරුවල ගබඩාකරණය ලංකාවේ අන්තර්ජාල සේවා සපයන ආයතන තුළ සිදු නොවීම; සයිබර් විමර්ශන දේශීය සයිබර් මූලාශ්‍ර තුළින් ලබන තොරතුරු මත පමණක් ඔප්පු කර ගත නොහැකි වීම; විදේශීය සාක්ෂි ගෙන්වා ගැනීමට ඇති අසීරුතාවය; අපරාධකාරී පුද්ගලයින් ව්‍යාජ ගිණුම් හා ව්‍යාජ මාර්ග ඔස්සේ අපරාධ සිදු කිරීම; සයිබර් අපරාධ කරුවන් ඍජුව හඳුනා ගැනීමට නොහැකි වීම; විමර්ශන සිදු කිරීම සඳහා අපරාධ නඩු විදාන සංග්‍රහයෙන් හෝ කාර්යපටිපාටික නීතියෙන් විමර්ශන නිලධාරීන් සඳහා ලබා දී ඇති පහසුකම් ප්‍රමාණවත් නොවීම; විමර්ශන කටයුතු සඳහා තාක්ෂණික මෘදුකාංගවල හිගය; Report කිරීමෙන් පමණක් හානිය පූර්ණ ලෙස ඉවත් කර ගැනීමට නොහැකි වීම; Report කිරීමට ක්ෂණික ප්‍රතිචාර නොදැක්වීම සහ අන්තර්ජාලයට මුදාහළ පසු ඒවා Report කරනු ලැබුවද භාගතකර ලබා ගත් එකී අපරාධ නැවත නැවත අන්තර්ජාලයට මුදා හැරීම වැනි තත්තවයන් සයිබර් අපරාධ විමර්ශනයේ දී ජය ගත යුතු අභියෝගන් වේ.

තවද අන්තර්ජාලයේ සිදු වන සයිබර් අපරාධ ළමයින් රහසක් සේ තබා ගැනීම; එකී සිද්ධීන් නීතිය ඉදිරියට රැගෙන ඒමට මැලි කමක් දැක්වීම; පැමිණිලි කළ යුත්තේ කාට ද යන්න නොදැන සිටීම; ඉතා විශාල හානියක් සිදු වූවිට හෝ සිදු වීමට ආසන්නවිට පමණක් පැමිණිලි කිරීමට යොමු වීම; Report කර අනතුර ඉවත්කර ගැනීමෙන් පමණක් සෑහිමකට පත් වීම; පැමිණිලිකරු වින්දිතයා හෝ අපරාධකරු නොදැන සිටීම; වාර්තා කිරීමේ දි ලැබෙන තොරතුරු ප්‍රමාණවත් නොවීම; සයිබර් ලිංගික අපරාධ වාර්තා කරණයේ දී ලබා දිය යුතු තොරතුරු මොනවාද යන්න පැමිණිලිකරුවන් නොදැන සිටීම; සිදුවීම අපරාධයක්ද යන්න නොදැන සිටීම; මෙකී අපරාධ ඇතැම් ළමයින්ට හෝ වැඩිහිටියන්ට සාමාන්‍ය දෙයක් බවට පත් වීම; රහසිගතව වාර්තා කරණයට පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ පැමිණිලි සඳහා ලැබෙන සහන ප්‍රමාණවත් නොවීම යන දුර්වලතා සයිබර් ළමා අපරාධ වාර්තාකරණය අඩපන කරමින් විමර්ශනයට බාදා පමුණුවනු ඇත.

විනිසුරුවරුන් සතු දැනුම හා තාක්ෂණික හැකියාවේ හා තාක්ෂණික අත්දැකීම්වල ඇති ප්‍රමාණවත් මද බව; අධිකරණ නියෝගවලට විදේශීය ආයතන ප්‍රතිචාර නොදැක්වීම; නීතිඥවරුන් සතු අඩු දැනුම හා සයිබර් අපරාධ නඩු මෙහෙයවීමේ දුර්වලතා; අධිකරණය දක්වා යාමට බොහෝ වින්දිතයින්ගේ පාර්ශවයන් අකමැති වීම; විශේෂඥ සාක්ෂි සපයන ආයතන එකී වාර්තා ප්‍රමාද කිරීම; විමර්ශන වාර්තා

නිවැරදිව අධිකරණයට වාර්තා නොවීම සහ පොදුවේ ශ්‍රී ලංකාවේ නඩු කටයුතු සඳහා බලපාන අනිකුත් දුර්වලතා ද සයිබර් අපරාධ විභාග කිරීම සම්බන්ධයෙන් අධිකරණය තුළ දී මතු වන අභියෝග ද ජය ගත යුතු වේ.

05.4. ශ්‍රී ලංකාවේ ළමයින්ට එරෙහි සයිබර් අපරාධවලට අදාළව නීතිය ක්‍රියාත්මක කරන ආයතන හා තාක්ෂණික සහයක ආයතනයන් හී කාර්ය භාරය

අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ නීතිය ක්‍රියාත්මක කරන ආයතන පිළිබඳව දැනුවත් වීම ඉතා වැදගත් වේ. එසේම නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා විශේෂඥ තාක්ෂණික සහය ලබා දෙමින් විමර්ශන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහය වන ආයතන කිහිපයක් ද මෙහි දී හඳුනා ගැනීම වැදගත්ය. එය විමර්ශන නිලධාරීන්ගේ විමර්ශන කටයුතු සඳහාත් ප්‍රජාවගේ අන්තර්ජාල ගැටළුවලට මැදිහත්කරණය කෙසේ ලබා ගන්නේද? ඒ ඒ ආයතනයන්ගෙන් ලබා ගත හැකි සහය කුමක්ද? යන්න පිළිබඳව හඳුනා ගැනීම සඳහාත් මහත් උපකාරයක් විය හැකිය.

05.4.1. නීතිය ක්‍රියාත්මක කරන ආයතන

ශ්‍රී ලංකාවේ අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතන දෙකක් ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැකිය.

01. ශ්‍රී ලංකා පොලීසිය

02. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

ශ්‍රී ලංකා පොලීසිය

ඕනෑම ගණයේ අපරාධයක් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානතම ආයතනය වනුයේ ශ්‍රී ලංකා පොලීසියයි. නමුත් අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය පොලිස් ස්ථානවල පවත්නා පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා අන්තර්ජාල අපරාධ

සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීම ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ විමර්ශන ඒකකයක් වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) පරිගණක අපරාධ විමර්ශන අංශය මගින් මේ වන විට සිදු වෙමින් පවතී. ජනාධිපති පොලිස්පති හා ආරක්ෂක ලේකම් මගින් යොමු කරන පැමිණිලි විමර්ශනය සඳහා පමණක් මෙම දෙපාර්තමේන්තුව ස්ථානගත වුවත් මෙකී අපරාධ සම්බන්ධයෙන් අනිකුත් පොලිස් ස්ථානවලට ඇති අඩු පහසුකම් හා විශේෂඥ දැනුම ප්‍රමාණවත් නොවීම මත මෙකී දෙපාර්තමේන්තුව ඒ වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරයි.

නමුත් අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් දිවයිනේ ඕනෑම පොලිස් ස්ථානයකට පැමිණිල්ලක් යොමු කළ හැකි අතර එකී පොලිස් ස්ථානය මගින් ඔවුන් සතු ධාරිතාවය සලකාබලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අදාළ පැමිණිල්ල යොමු කරමින් සහය වන අවස්ථාද ඇත.

නමුත් ඉදිරියේ දි මෙකී හැකියාවන් අනිකුත් පොලිස් ස්ථානවලටද ලබාදීමේ කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක විය යුතුය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

1998 අංක 50 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටු වනු ලැබූ මෙම ආයතනය කායික, මානසික, ලිංගික හෝ නොසලකා හැරීම යන සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම එහි මුඛ්‍ය පරමාර්ථයයි. ඒ සඳහා ආණ්ඩුවට උපදෙස් ලබා දීම, ප්‍රතිපත්ති සම්පාදනය, නඩු කටයුතු හා විමර්ශන නියාමනය, දැනුවත් කිරිම, සම්බන්ධීකරණය හා විමර්ශනය යන කාර්යයන් රැසක් සිදු කරමින් ප්‍රබල සේවාවන් රැසක් ඉටු කරනු ඇත. එකී පනතේ දාහතර වන වගන්තියට අනුව

> "ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම"(14-ඉ)

යන වගන්තිය ප්‍රකාරව මෙම ආයතනයට ළමා අපයෝජන වැළැක්වීම සම්බන්ධයෙන් හා ළමා අපයෝජනවලට ගොදුරු වූවන් ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග තේරීමට නිදහස ලබා දී ඇත.

> "ළමා අපයෝජන පිළිබඳ මහජන පැමිණිලි භාර ගැනීම හා අවශ්‍ය අවස්තාවල දී ඒවා නිසි බලධාරීන් වෙත යොමු කිරීම"(14-ඔ)

මෙම වගන්තිය ප්‍රකාරව ළමයින්ට අදාළ හිංසන සම්බන්ධයෙන් පැමිණිලි භාර ගැනීමට ද නීතිමය බලය ලබා දී ඇත. මේ සඳහා මෙකී පනතේ 33 වන වගන්තිය මගින් එකී බලය තවදුරටත් තීවුර කරමින්;

> "යම් පරිශ්‍රයක ළමා අපචාර කටයුතු සිදු කෙරෙන බව විශ්වාස කිරීමට අධිකාරියට හේතු ඇති අවස්ථාවක එම පරිශ්‍රයට සෝදිස්සි වරෙන්තුවක් නොමැතිව ඇතුළු වී පරික්ෂා කරන ලෙස අධිකාරියේ යම් නිලධාරියෙකුට බලය දිය හැකිය. ඔහු 'බලය ලත් නිලධාරියා' යනුවෙන් හදුන්වයි" (33 වගන්තිය)

විමර්ශන නිලධාරියෙකු යම් පරිශ්‍රයකට ඇතුලු වීමට නම් සාමාන්‍ය නීතිය වනුයේ ඒ සඳහා සෝදිසි වරෙන්තුවක් ලබා ගනිමින් ඒ සඳහා යොමු වීමයි. එහෙත් ළමා අපයෝජනයක් සිදු වන යම් පරිශ්‍රයකට ඇතුලු වී එය පරික්ෂා කරන ලෙස අධිකාරියේ නිලධාරියෙකුට බලය

පැවරීමට මෙකී වගන්තිය අනුව හැකියාව ලැබෙන අතර එසේ බලය පවරනු ලැබූ තැනැත්තා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව සාම නිලධාරියෙකු බවට පත් වනු ඇත. මෙම වගන්තිය ළමා අපයෝජන මැඩලීම සම්බන්ධයෙන් අධිකාරියට සුවිශේෂී බලයක් පවරනු ඇත.

එහි 34 වන වගන්තිය මගින් පරීක්ෂා කිරීමේ හා සොදිසි කිරීමේ බලය ලබා දෙන අතර 35 වන වගන්තිය මගින් භාණ්ඩ තහනමට ගැනීමේ බලයද ලබා දෙනු ඇත. ළමා අපයෝජන වැළැක්වීම සඳහා මෙවැනි බල තල රැසකින් යුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ අංශ ගණනාවක් ක්‍රියාත්මක වන අතර ඒ අතර විමර්ශන හා අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය, නීතිය බලාත්මක කිරීමේ අංශය, නීති අංශය, මනෝ සමාජීය අංශය හා මුලු දිවයිනම ආවරණය වන සේ විමර්ශන කටයුතු සිදු කළ හැකි විශේෂ පොලිස් විමර්ශන ඒකකය, පැමිණිලි භාරගැනීමේ 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය මෙන්ම වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකයක් ද ස්ථාපිතව ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 39 වන වගන්තිය අනුව ක්‍රියාත්මක විය යුතු ළමා අපයෝජන මොනවාද යන්න විස්තර කරන අතර එහි දී දණ්ඩ නීති සංග්‍රහයේ 286(අ) වගන්තිය හෙවත් ළමයින්ට අදාළව සිදු කරනු ලබන අසභ්‍ය පළකිරීම් හා ප්‍රදර්ශන වෙනුවෙන්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මැදිහත් විය යුතුව ඇත.

එකී අපයෝජනය වැළැක්වීම වෙනුවෙන් මෙම ආයතනය තුළ ස්ථාපිතව ඇති විමර්ශන හා අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය, විශේෂ පොලිස් විමර්ශන ඒකකය ද සමග සමාන්තරව කටයුතු කරමින් අන්තර්ජාලය තුළ සිදු වන ළමා අපයෝජන මැඩලීමට අවශ්‍ය තාක්ෂණික මැදිහත්කරණය මෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු ද සිදු කෙරේ.

මෙකී බලතල ක්‍රියාවේ යොදවමින් ළමා අපයෝජන අවම කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමේ දී යම් ළමා අපයෝජනයකට අදාළ තොරතුරක් යම් ආයතනයක් සතුව පවතී නම් එය අධිකාරිය විසින් ඉල්ලා සිටි විට දී එකී සියලු තොරතුරු අධිකාරියට ලබා දීමට එම ආයතන බැඳී සිටින බව අධිකාරී පනතේ 24 වන වගන්තිය අනුව අවධාරණය කර ඇත. ඒ අනුව අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් යම් තොරතුරක් එකී සේවාවන් සපයන කුමන ආයතනයක් සතුව හෝ පවතී නම් එම තොරතුර ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඉල්ලා සිටි විට දී ලබා දීමට එම අයතනය බැඳී සිටී.

මෙම පනතේ විධිවිධාන අනුව ළමා අපයෝජන අවම කිරීම සඳහා උචිත පියවරක් ලෙස නිර්නාමික පැමිණිලි භාර ගනිමින් ඒවා විමර්ශනය කිරිම මෙන්ම ආවේක්ෂණයන් හරහා අනාවරණය කර ගත් ළමා අපයෝජන සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අධිකාරියට ඇති සුමට බව නිසා අන්තර්ජාල ආවේක්ෂණයෙන් සොයා ගත් ළමා

අපයෝජකයින් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට ද හැකි වීම ශ්‍රී ලංකාවේ ළමයින් ආරක්ෂා කිරීම වෙනුවෙන් ඉතා වැදගත් වනු ඇත.

05.4.2. අන්තර්ජාල අපරාධ මැඩලීම සඳහා වන තාක්ෂණික සහයක ආයතන

මෙම ආයතන සඳහා වෙන් වෙන් වූ ස්වාධීන රාජකාරී ස්වභාවයක් පැවතියත් ඔවුන් සතු විශේෂඥතාව සැලකිල්ලට ගනිමින් මෙම ආයතන හරහා අන්තර්ජාල අපරාධ මැඩලීමේ විමර්ශන කාර්යයේ දී සුවිශේෂී වූ කාර්ය භාරයන් රැසක් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ පවත්නා එවන් අයතන කිහිපයකි.

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT)

පරිගණක ජාලකරණය ව්‍යාප්තව වර්තමාන ලෝකය පුරා තොරතුරු තාක්ෂණය වේගයෙන් දියුණු වත්ම ඒ හරහා විවිධාකාර අකටයුතුකම් ද වේගයෙන් සිදු වන්නට පටන් ගෙන ඇත.

එබැවින් තොරතුරු ආරක්ෂණය සම්බන්ධයෙන් ද ලෝකයේ වැඩි අවධානය යොමුව ඇති අතර එකී කාර්යය සඳහා ලෝකයේ බොහෝ රටවල පරිගණක හදිසි ප්‍රතිචාර සංසද (Computer Emergency Readiness Team) නමින් තොරතුරු ආරක්ෂණය වෙනුවෙන් තාක්ෂණික ආයතනයක් පිහිටුවා ඇත. ශ්‍රී ලංකාවේ තොරතුරු ආරක්ෂණය වෙනුවෙන් පිහිටුවා ඇති අයතනය වනුයේ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයයි (Sri Lanka CERT). මෙහි මූලික අරමුණ වනුයේ තොරතුරු ආරක්ෂණය වුවත් අන්තර්ජාලය තුළ ඇති වී තිබෙන ගැටළුකාරී තත්ත්වයන්ට අවශ්‍ය තාක්ෂණික මැදිහත්කරණය ලබාදීමද මෙමගින් සිදු කරනු ඇත. මෙම ආයතනය මගින් ලබා ගත හැකි සේවාවන් ලෙස ප්‍රතිචාරාත්මක සේවා, දැනුවත් කිරීමේ සේවා හා උපදේශන සේවා ලෙස වර්ග කළ හැකිය. අන්තර්ජාලය හරහා ඇතිවී තිබෙන යම් තාක්ෂණික ගැටළුවක් නිරාකරණය කරගැනීම වෙනුවෙන් මෙකී ආයතනය වෙත පැමිණිලි කළ හැකි වුවත් ඒ සඳහා නීතිමය මැදිහත්කරණයක් අවශ්‍ය වේ නම් ශ්‍රී ලංකා පොලීසියට හෝ ළමයෙකු නම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණිලි කළ හැකිය. නමුත් ඔබ අපහසුතාවයට පත් වන අන්තර්ජාල ගිණුම් ඉවත්කර ගැනීම හෝ ඒ සඳහා තාක්ෂණික උපදෙස් ලබා ගැනීම සඳහා හෝ මෙම ආයතනය සතු සබ්‍යතාවය ඉතා ඉහළය. මෙම ආයතනය කොළඹ 07, බෞද්ධාලෝක මාවත, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යනතර සම්මන්ත්‍රණ ශාලාවේ කාමර අංක 4-

112 යන ස්ථානයේ පිහිටා ඇත. යම් පැමිණිල්ලක් E-Mail මගින් ඉදිරිපත් කිරිමට අවශ්‍ය නම් report@cert.gov.lkහෝ cert@cert.gov.lkයන විද්‍යුත් ලිපිනය මගින් යොමු කළ හැකි අතර 0112691692/0112 695749/0112 679888 යන දුරකථන අංක යටතේ ද සම්බන්ධ කර ගත හැකිය.

කොළඹ විශ්වවිද්‍යලය හා මොරටුව විශ්වවිද්‍යාලය

දැනට ලංකාවේ විද්‍යුත් ඉංජිනේරු ශිල්පය හෝ මෘදුකාංග තාක්ෂණ ශිල්පය පිළිබඳව විශ්වවිද්‍යාල මට්ටමේ විශේෂඥයින් ලෙස අධිකරණය පිළිගෙන ඇති විශේෂඥ සේවා ආයතන දෙක වනුයේ මේවාය. කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක ඒකකයත් මොරටුව විශ්ව විද්‍යාලයේ පරිගණක ඒකකයත් සඳහා මෙකී විශේෂඥ සාක්ෂි සැපයීමට අවසර ලබා දී ඇත. ඒ අනුව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති මෙම විශ්වවිද්‍යාලවල විශේෂඥතාවය සයිබර් අපරාධ හා පරිගණක අපරාධවලදී ශ්‍රී ලංකාවේ උසාවි පද්ධතිය විසින් නිතැතින්ම සලකා බලනු ලැබේ.

මෙම ආයතන දෙකට අමතරව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවත් එමෙන්ම ගෙවීම් උපක්‍රම පිළිබඳ වංචා පනත යටතේ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයත් අධිකරණයට මෙවැනි කරුණු සම්බන්ධයෙන් විශේෂඥ සාක්ෂි සපයනු ඇත.

පැමිණිලි ඉදිරිපත් කිරිම හා තොරතුරු වාර්ථා කිරීම

සයිබර් අපරාධ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල මට්ටමේ ආයතන වෙත සාමාන්‍ය ජනතාව ලෙස පැමිණිලි හෝ තොරතුරු ඉදිරිපත් කර සහන සලසා ගැනීමට හැකියාව නැත. මන්ද එකී අයාතන මගින් සිදු වනුයේ අධිකරණ නියෝගයක් මත අධිකරණය සඳහා විශේෂඥ සේවය සැලසීමයි.

මෙහි කලින් සඳහන් කළ ආකාරයටම ප්‍රජාවක් ලෙස ඔබට තාක්ෂණික කාරණයකදී අවශ්‍ය සහය හෝ උපදෙස් ලබා ගැනීමට ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය හරහා හැකියාව ලැබෙන අතර නීතිමය මැදිහත්වීමක් අවශ්‍ය නම් ශ්‍රී ලංකා පොලීසිය හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් අවුරුදු 18 ට අඩු ළමයෙකු සම්බන්ධ කාරණයක් නම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියත් සම්බන්ධ කර ගත හැකිය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට තොරතුරු හෝ පැමිණිලි ලබා දීමේ දී 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය භාවිතයට ගත හැකි අතර එසේත් නොමැතිනම් ලිපියක්, විද්‍යුත් පණිවිඩයක්, නිර්ණාමික ලිපියක් හෝ පැමිණ පැමිණිල්ලක් සටහන් කිරීමෙන් තොරතුරු ලබා දිය හැකියි. එසේ තොරතුරු වාර්ථා කිරීමේ දී පැමිණිලිකරුවන් ලෙස අනුගමනය කළ යුතු මූලික කරුණු කිහිපයක් පවතී.

- ✓ ඔබට අන්තර්ජාලය ඔස්සේ සිදු වී ඇති හානිය පැහැදිළිව සඳහන් කළ යුතුය
- ✓ හානිය සිදු වී ඇති ගිණුමේ නම නිවැරදිව අකුරු සමග සඳහන් කළ යුතුය
- ✓ හානිය සිදු කර ඇති ගිණුම දන්නේ නම් එකී ගිණුමේ පවත්නා නම නිවැරදිව සඳහන් කරන්න
- ✓ එකී ගිණුම් වල ULR ලිපිනය සහිත link එක ලැබීමට සලස්වන්න
- ✓ එකී ගිණුම් හඳුනා ගැනීමට හැකි තොරතුරු කිහිපයක්ම ලබා දෙන්න
- ✓ ඔබ නීතිමය පියවරකට යොමු වන්නේ නම් අදාළ අපරාධකාරී අවස්ථාවකදී එකී ගිණුම්වල තිර දර්පන (Screen Shot) ලබා ගන්න. ඒවා අවශ්‍ය අවස්ථාවලදී බලධාරීන්ට ඉදිරිපත් කළ යුතුය.
- ✓ හැකි විගස තොරතුරු වාර්ථා කරන්න. පළමුව විය යුත්තේ සිදු වන හිංසාවෙන් ඉතා කඩිනමින් ඉවත් වීමයි. ඒ සඳහා Logout, Unfriend, Block, Report, යන විකල්ප භාවිතා කරන්න.

ඒ අනුව තොරතුරු වාර්ථා කිරීමේ දී සුදුසුම ආයතනය තෝරා ගැනීමට වග බලා ගත යුතුය.

- තාක්ෂණික සහය පමණක් අවශ්‍ය නම් ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය අමතන්න

- ඕනෑම අයෙකු සම්බන්ධ අන්තර්ජාල අපරාධ පිළිබඳ පැමිණිල්ලක් සඳහා නීතිමය මැදිහත්කරණයක් අවැසි නම් ශ්‍රී ලංකා පොලීසිය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහය ලබා ගන්න
- විශේෂයෙන්ම ළමයෙකු සම්බන්ධ අන්තර්ජාල හිංසනයක් සඳහා නීතිමය සහය අවශ්‍ය නම් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අමතන්න

05.4.3. අනිකුත් ආයතන හා පුද්ගල වගකීම්

අන්තර්ජාලය හරහා සිදු වන ළමා අපයෝජන අවම කිරමින් සුරක්ෂිත අන්තර්ජාලයක් නිර්මාණය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට පමණක් තිනිවම කටයුතු සිදු කළ නොහැකිය. මන්ද නීතිය ක්‍රියාත්මක කිරීම මගින් පමණක් සමාජය නිවැරදි නොවන බැවිනි. ඒ සඳහා සියලුම පාර්ශ්වයන්ගේ සාධනීය මැදිහත්කරණය ඉතා වැදගත් වනු ඇත. අන්තර්ජාලය ළමයින්ට සුරක්ෂිත ස්ථානයක් වන්නට නම් අනිකුත් පුද්ගල හා ආයතනික පද්ධති සියල්ල එකම අරමුණකට අනුව කටයුතු කළ යුතු අතර ඔවුන්ගේ යුතුකම් හා වගකීම් නොපිරිහෙළා ඉටු විය යුතුය. එවැනි ආයතන කිහිපයක් පිළිබඳව තවදුරටත් අවධානය යොමු කරමු.

ශ්‍රී ලංකාවේ අන්තර්ජාල භාවිතය ප්‍රවර්ධනය, නියාමනය, අධීක්ෂණය, සම්බන්ධීකරණය හා ලියාපදිංචිය ආදී සියලු කටයුතු සඳහා පෙරමුණ ගත යුතු ආයතනය ලෙස

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRC) පෙන්වා දිය හැකිය. එබැවින් එම ආයතනය විසින් ඔවුන්ගේ සියලු කටයුතුවල දී ළමයාගේ උපරිම යහපත වෙනුවෙන් සලකා බලා අවශ්‍ය තීන්දු තිරණවලට යොමු වීමට පවත්නා සබ්‍යතාව ඉතා ඉහළ වන බැවින් ළමා හිතකාමී අන්තර්ජාල පරිසරයක් නිර්මාණය කිරිමට එම ආයතනයේ අධීක්ෂණය යටතේ ඇති සියලු ආයතන මෙහෙය වීම වැදගත් වනු ඇත.

අන්තර්ජාල පහසුකම් සපයන Dialog, Mobitel, Airtel, Huch, Etisalat, Lankabel, SLT, වැනි පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන් හී සේවාවන් ළමා හිතකාමී අයුරින් සකසුරුවම් කිරීම ද ඔවුන් විෂයෙහි ඇති වගකීමකි.

ළමයින් සඳහාම සේවා සපයන අධ්‍යාපන දෙපාර්තමේන්තුව,ළමා සංවර්ධන අමාත්‍යාංශය, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව ඇතුළු සියලු රජයේ හා පෞද්ගලික ආයතනයන් ද මෙකී කාර්යය සඳහා සමෝධානය විය යුතු අතර අන්තර්ජාලය අවභාවිත කිරීම හා අන්තර්ජාල ළමා අපයෝජන වැළැක්වීම සම්බන්ධයෙන් දැනුම, ආකල්ප හා ක්‍රමවේද යාවත්කාලීන කළ යුතුය. ඒ සඳහා සිය ප්‍රතිපත්ති හා වැඩසටහන්වලදී ප්‍රමාණවත් ඉඩක් ලබා දිය යුතුය.

නීතිය බලාත්මක කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය තුළ ද අන්තර්ජාල අවභාවිතය හා ළමා හිංසනය පිළිබඳ දැනුම යාවත්කාලීන විය යුතු අතර

නව නීති සම්පාදනය හා පවත්නා නීති බලාත්මක කිරීම සඳහා යුහුසුලුව මැදිහත් විය යුතුය. එවැනි හිංසනයන් සම්බන්ධයෙන් යුක්තිය පසිඳලන බව පෙනෙන්නට සැලැස්විය යුතුය.

ප්‍රජාවක් ලෙස සමාජය සතුවද ඉතා විශාල වගකීමක් පවත්නා අතර දෙමාපියන්, ගුරුවරුන්, සමාජ ක්‍රියාකාරීන් ඇතුළු සමස්ත සමාජයම අන්තර්ජාලයෙන් ළමයාට සිදු විය හැකි හානිය අවම කිරීම උදෙසා නිරන්තර අවධානයෙන් හා අවබෝධයෙන් කටයුතු කළ යුතුය. එසේම අන්තර්ජාලය පිළිබඳ අවබෝධය යාවත්කාලීන කර ගත යුතුය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජය ලෙස මෙකී අරමුණ උදෙසා අවශ්‍ය පහසුකම් සැලසීම හා මගපෙන්වීම නිරන්තරයෙන් ලබා දෙමින් දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් නව ප්‍රතිපත්ති හා පවත්නා ප්‍රතිපත්ති සංශෝධන සමාජ ගත කළ යුතුය.

හයවන පරිච්ඡේදය

ළමයින් හා යෞවනයින් අන්තර්ජාලයට ඇබ්බැහි වීම වැළැක්වීම,පසුවිපරම, අධීක්ෂණය හා මැදිහත්කරණය

06.1. ළමයාගේ අන්තර්ජාල රුචිකත්වය හඳුනා ගැනීම

අන්තර්ජාලය භාවිත කිරීමට බොහෝ දරුවන් රුචිකත්වයක් දැක්වීම සමාන්‍ය දෙයකි. මෙම රුචිකත්වයේ ස්වභාවය දරුවාගේ සංවර්ධනයට මෙන්ම පසුගාමීත්වයටද බලපෑම් කළ හැකි බැවින් ඒ පිළිබඳව යම් අවබෝධයක් තිබීම දෙමාපියන්, වැඩිහිටියන් හා සමාජයක් ලෙස ඉතා වැදගත් වේ. සාමාන්‍යයෙන් දරුවන් අන්තර්ජාලය පරිහරණය කිරීමේ රුචිකත්වය[30] ආකාර තුනකින් දැකගත හැකිය.

[30]ගම්මන්පිල ප්‍රදීප්,පරිගණකය හා ඔබගේ ළමයා,2013,ඩයිනමින් ඇසෝෂියේට්,හැඳල,වත්තල,පි.15.

01 අධික රුචිකත්වය

02 සාමාන්‍ය රුචිකත්වය

03 මන්දගාමී රුචිකත්වය

උක්ත රුචිකත්වයන් අතරින් අන්තර්ජාලය සඳහා අධික රුචිකත්වයක් දක්වන දරුවා තුළ අන්තර්ජාල භාවිතයේ කුමන හෝ ගැටළුවක් දැක ගත හැකිය. සමහර විට එම දරුවා අන්තර්ජාලය නිවැරදිව භාවිත නොකරනවා වන්නට පුළුවන. එසේත් නැතහොත් කුමන හෝ තත්තවයකට දරුවා ඇබ්බැහි වී සිටිනවා වන්නට පුළුවන. එබැවින් දරුවා අන්තර්ජාලයට අධික ලෙස රුචිකත්වයක් දක්වන්නේ නම් දෙමාපියන් ලෙස දරුවාගේ අන්තර්ජාල භාවිතය පිළිබදව වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබේ.

අන්තර්ජාලය පිළිබඳව ඇලීමක් ගැලීමක් නොමැතිව ඒ පිළිබඳව කිසිදු උනන්දුවක් නොදැක්වීම ද දෙමාපියන් ලෙස අවධානය යොමු කළ යුතු තත්ත්වයකි. මන්ද එය දරුවන්ගේ අධ්‍යාපන තත්වයකදී මෙන්ම අනාගත වෘත්තීය නිපුණත්වයේ දී ද ගැටළු මතු කළ හැකි බැවිනි. මෙවැනි දරුවන් ඉතා සීමිත වුවත් කලාතුරකින් මෙවැනි දරුවන් දක්නට ලැබේ. මේ සඳහා බලපානු ලබන සාධක පිළිබඳ සොයා බැලීමේ දී අවබෝධ වනුයේ දරුවන්ට අන්තර්ජාලය හෝ පරිගණකය පිළිබඳව මූලික දැනුමක් නොමැති වීම, ඒ සඳහා අධික බියක් ආරෝපණය කර තිබීම, දරුවා අධික

කාර්ය බහුලවීම හෝ දරුවා කුමන හෝ අසනීප තත්ත්වයකින් හෝ ආබාධිත තත්තවයකින් පසුවවීම වන්නට පුළුවන. එබැවින් එවන් දරුවන් පිළිබඳව ද දෙමාපියන් හා වැඩිහිටියන් ලෙස අවධානය යොමු කළ යුතුය.

දරුවන් අන්තර්ජාලයට ලැදි වීම බොහෝ වැඩිහිටියන් අසුභදායී තත්ත්වයක් ලෙස සැලකුවත් පාසල් වයසේ දරුවෙකු සාමාන්‍ය රුචිකත්වයක් අන්තර්ජාලයට දැක්වීම දරුවාගේ සංවර්ධන කාර්යයට සුභදායි ලෙස බලපානු ලබන බව පෙන්වා දීමට කැමැත්තෙමි. ක්‍රමනුකූල කාල සටහනකට අනුව දෙමාපිය අධීක්ෂණය යටතේ අන්තර්ජාලය සාමාන්‍ය ලෙස භාවිත කරන ළමයා පිළිබඳව බිය විය යුතු නැති අතර අවශ්‍ය වනුයේ සාමාන්‍ය අධීක්ෂණයක් පමණි.

06.2. ළමයින් අන්තර්ජාලයට ඇබ්බැහි වීම

දරුවෙකු අන්තර්ජාලයට ඇබ්බැහි වී පවතී ද යන්න පිළිබඳව මූලික නිගමනයක් දරුවාගේ අන්තර්ජාල රුචිකත්වය දෙස බලා අවබෝධ කර ගත හැකිය. එසේ වුවත් අන්තර්ජාලයට දරුවන් ඇබ්බැහි වීම පිළිබඳව පුළුල් පරාසයක විහිදුණු දැනුමක් වැඩිහිටියන් තුළ පැවතීම දරුවාගේ අන්තර්ජාල භාවිතයට ධනාත්මකව මැදිහත්වීම වඩාත් සක්‍රීය කරනු ඇත.



යම් ක්‍රියාවක් හෝ භාවිතයක් තමාගේ පාලනයෙන් තොරව ස්ව කැමැත්තෙන්ම සිදු කරයි නම් ඒ තුළ ඇබ්බැහිවීමක් දක්නට ලැබේ. එවන් වූ ඇබ්බැහිවීම් රාශියක් දක්නට ලැබෙනමුත් ඉතා මෑත කාලයේ මිනිස් ප්‍රජාව තුළ මතු වූ නවතම ඇබ්බැහිවීමක් ලෙස අන්තර්ජාලයට ඇබ්බැහිවීම පෙන්වා දිය හැකි ය. මෙම ඇබ්බැහිවීම පිලිබඳව මානසික රෝග පිළිබඳ DSM5 වර්ගීකරණයට අනුව නවතම චර්යාමය අක්‍රමතාවක් ලෙස Internet Gaming Disorder යන්න යෝජිත මට්ටමේ පවතී.

ඇතැම් ක්‍රියාවන් සඳහා අප දක්වන්නා වූ කැමැත්ත නිසාම ඒ සඳහා ඇබ්බැහිවී ඇති බවක් අපට මුල් අවධියේ දී තේරුම් නොයන්නට පුළුවනි. නමුත් කාලයත් සමග එම ක්‍රියාව නිසා අපගේ මානසිකත්වය, චර්යා රටාව, ශරීරය අපට අවශ්‍ය ලෙස හසුරුවා ගත නොහැකිව අප වේදනාවට පත්ව ඇබ්බැහිවීමේ ඉහළ මට්ටමකට රැගෙන යනු ඇත. ඒ අයුරින්ම අන්තර්ජාලයට ද අප ඇබ්බැහිවීම සිදු විය හැකි ය.

06.3. අන්තර්ජාලයට ඇබ්බැහි වූ අයෙකු හඳුනා ගැනීම

අන්තර්ජාල අධි භාවිතය ඇබ්බැහි වීමේ අක්‍රමතාවයෙන් වෙන් කර හදුනා ගත යුතු ය. එනම් පුද්ගලයෙකුගේ

අන්තර්ජාල භාවිතය කළමණාකරණය කර ගැනීම ඔහුගේ පාලනයෙන් ගිලිහී ගොස් පවතී ද යන්නයි. අන්තර්ජාලය අධිකව භාවිතා කරන්නන් සියලු දෙනාම අන්තර්ජාල ඇබ්බැහි වීමේ අක්‍රමතාවයෙන් පෙලෙන්නන් නොවිය හැකි ය. එබැවින් ඒ පිළිබඳව විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ අධ්‍යයනය කළ යුතුය. ලොකයේ මානසික රෝග නිර්ණය පිළිබඳ පිළිගත් වර්ගීකරණය වනුයේ DSM5 වර්ගීකරණය යි. එකී වර්ගීකරණයට අනුව අන්තර්ජාල භාවිත ආශ්‍රිත ගොඩනැගිය හැකි අක්‍රමතාවයක් ලෙස Internet Gemming Disorder හෙවත් අන්තර්ජාල ක්‍රිඩා ආශ්‍රිත අක්‍රමතාවය මේවන විට පතිකාර ලැබිය යුතු අක්‍රමතාවයක් ලෙස හදුනා ගෙන ඇත. එකී හදුනා ගැනීමට අනුව එවන් ඇබ්බැහියක් සහිත පුද්ගලයෙකු තුළින් මතුවිය හැකි ලක්ෂණ නවයක් මේ වන විට පෙන්වා දේ. එකී ලක්ෂණ නම්;

1. අන්තර්ජාලයේ ක්‍රීඩාවල වැඩි කාලයක් නිරත වීම.
2. එම ක්‍රීඩාවලින් ඉවත්වීමේ දී භෞතිකව නොපෙන්වන රෝග ලක්ෂණ මතුවීම.
3. අන්තර්ජාල ක්‍රීඩාවල වැඩි කාලයක් රැඳී සිටීමේ අවශ්‍යතාව වැඩි කිරීමට සිතීම.
4. එම ක්‍රීඩාවල නිරතවීම පාලනය කළ යුතු යැයි සිතා අසාර්ථක උත්සාහවල නිරත වීම.
5. කලින් පුරුදු වී සිටි විනෝදාංශවලට තිබූ කැමැත්ත නැතිව යාම.

6. අධික අන්තර්ජාල ක්‍රීඩා භාවිතය අඛණ්ඩව කර ගෙන යාම නිසා දැනුම සම්බන්ධ මනෝ සාමාජීය ගැටළු පැන නැගීම.
7. අන්තර්ජාල ක්‍රීඩා නිසා පවුලේ සාමාජිකයන්ගේ හා අන් අයගේත් විශ්වාසය බිඳ වැටීම.
8. පුද්ගලයාගේ සෘණාත්මක මනෝභාවයන්ගෙන් මිදීම උදෙසා අන්තර්ජාල ක්‍රීඩාවලට යොමුවීම.
9. මෙම තත්තවයන් නිසා සමීප සම්බන්ධතා හා රැකියා හෝ අධ්‍යාපන අවස්ථා අහිමිවීම.

යන කරුණුයි. එකී රෝග නිර්ණයට අනුව මාස දොළහක වැනි කාලයක් තුළ ඉහතින් සඳහන් කළ ලක්ෂණයන් කිහිපයකින් යම් පුද්ගලයෙකු හෝ ළමයෙකු පීඩාවිඳී නම් එකී පුද්ගලයා/ළමයා අන්තර්ජාල ක්‍රීඩා සඳහා ඇබ්බැහි වීමේ අක්‍රමතාවයෙන් පෙළෙනු ඇතැයි නිර්ණය කෙරේ. අන්තර්ජාල අධිභාවිතය හරහා අන්තර්ජාලයට ඇබ්බැහි විය හැකි තවත් ආකාර ගණනාවක් මේ වන විට හඳුනාගෙන ඇතත් ඒවා අක්‍රමතා (Disorder) ලෙස නොසලකයි. ඒ අතර

Net Compulsions

Cyber sex Addiction

Cyber Relationship Addiction

General Computer Addiction

Compulsive Web Surfing

යන ආකාර පෙන්වා දිය හැකිය. මෙම ආකාරයන් කිහිපය මත අන්තර්ජාලය තුළ ඇබ්බැහිවීම් ගොඩ නැගිය හැකි නමුත් තවමත් DSM 5 මානසික රෝග වර්ගීකරණය තුළ යෝජිතව පවතිනුයේ අන්තර්ජාල ක්‍රීඩා සම්බන්ධ අක්‍රමතාවය (Internet Gaming Disorder) යන්න පිළිබඳව පමණි.

නිරන්තරයෙන් අන්තර්ජාලය තුළ සූදුවට, ක්‍රීඩාවන්ට, භාණ්ඩ පරික්ෂාවන්ට හා භාණ්ඩ වෙළඳාමට යොමුව එය නිතර නිතර භාවිතයට ගැනීම මෙන්ම අරමුණකින් තොරව නැවත නැවත එය පරික්ෂා කිරිම Net Compulsions හෙවත් ජාල අනිවාර්ය පරික්ෂා කිරීමේ තත්ත්වය වර්ධනය විය හැකිය.

අන්තර්ජාලය හරහා පාලනයකින් තොරව අසභ්‍ය චැට් රූම්වල සැරිසරමින් අසභ්‍ය ක්‍රියාකාරකම්වල නිරත වීම හා අසභ්‍ය දෑ සොයා බැලීම සිය ජීවිතයේ අනිවාර්ය අංගයක් බවට පත් වීම Cyber sex Addiction හෙවත් අන්තර්ජාල ලිංගික ආශ්වාදයන් සඳහා ඇබ්බැහි වීම ලෙස හැඳින් වේ.

සිය සමාජීය ජීවිතය හෝ පවුල් ජීවිතය තුළ මිනිසුන් ගනුදෙනු කරන සැබෑ ස්වරූපය ඉක්මවා අන්තර්ජාලය හරහා සමාජ ජාල වෙබ් අඩවි තුළින් හා චැට් රූම් තුළින් සීමාව ඉක්මවා සමාජ සබඳතා පැවැත්වීමට ඇබ්බැහි වීම Cyber Relationship Addiction හෙවත් අන්තර්ජාල සමාජ සබඳතා කෙරේ ඇබ්බැහිවීම නම් වේ.

General Computer Addiction හෙවත් සාමාන්‍ය පරිගණක ක්‍රියාකාරකම් සඳහා ඇබ්බැහිවීම සෘජුවම අන්තර්ජාල ක්‍රියාකාරකම් නොවුනත් එකලස් කිරීම, සැකසීම හා පරිහරණය ආදී පරිගණකය ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළ නිරන්තරයෙන් නැවත නැවත සීමාවකින් තොරව ක්‍රියාත්මක වීම මේ යටතට ගැනේ.

එසේම යම් නිශ්චිත ජාලයක් හෝ තෝරාගත් යම් එක් දත්ත පද්ධතියක් පිළිබඳව නිතර නිතර පරීක්ෂා කිරීමේ මානසිකත්වයෙන් පෙළෙමින් සිය ජීවිතයේ කාලය හා ශ්‍රමය අපතේ හරිමින් නිශ්ඵල ක්‍රියාවක නිරත වීම සිදුවන්නේ නම් එය Compulsive Web Surfing ලෙස හඳුන්වනු ලබයි.

මේ ආකාරයට කවරෙකු හෝ අන්ර්ජාලය හෝ පරිගණකය ආශ්‍රිතව නිතර නිතර සීමාවකින් තොරව හෝ අරමුණකින් තොරව ජීවිතයේ අනිවාර්ය අංගයක් බවට පත්කර ගනිමින් අන්තර්ජාලය හෝ පරිගණකය පරීක්ෂා කිරීම්වල, ක්‍රියාකාරකම්වල හෝ සබඳතාවල නිරත වෙමින්, මානසිකව පෙළෙමින් සිටී නම් ඔහු හෝ ඇය පිළිබඳව වඩාත් උනන්දු විය යුතුය. මන්ද යත් ඔහු අන්තර්ජාලයට හෝ පරිගණකයට ඇබ්බැහි වී ඇති ඉන් මිදීමට සහය අවශ්‍ය වූ අයෙකු විය හැකි බැවිනි.

06.4. අන්තර්ජාලයට ඇබ්බැහි විය හැක්කේ කවරෙකු ද?

අන්තර්ජාල ඇබ්බැහිවීම්වලට ළමයෙකු යෞවනයෙකු හෝ පුද්ගලයෙකු නතු වනුයේ ඇයි ද යන්න විමසා බලමු. බොහෝ විට තනිකම පාලුව මකා දමා ගැනීම සඳහා අන්තර්ජාලයට යොමු වන ළමයා හෝ වැඩිහිටියා දිගින් දිගටම ඒ තුළින් සහනයක් ලැබීමට හුරුවීම මත අවසානයේ දී ඔහු ඇබ්බැහිවීමක් දක්වා රැගෙන යනු ඇත.

මානසික අවපීඩනය, අධික කාන්සා තත්ත්වයන් හෝ වෙනත් මානසික අක්‍රමතාවයන් සහිත පුද්ගලයෙකු අන්තර්ජාලයට ඇතුළත් වන්නේ නම් ඔහු හෝ ඇය අන්තර්ජාලයට ඇබ්බැහිවීමට ඇති ඉඩ කඩ ඉහළ ය. උදාහරණයක් ලෙස දෙමාපිය ආදරය, සෙනෙහස, රැකවරණය අහිමි දරුවෙකු එකී අහිමිවීමේ කාන්සාවෙන් පෙළෙයි නම් එම තත්ත්වයෙන් මිදීම උදෙසා අන්තර්ජාලයට පිවිසෙන්නේ නම් ඔහු ද අන්තර්ජාලයට ඇබ්බැහිවීමට පවත්නා ඉඩ කඩ වැඩිය.

තවද කෞමාරකාමය (Pedophilia) හෙවත් ළමයින් ලිංගික කටයුතු සඳහා යොදා ගැනීමේ ආශාව සහිත පුද්ගලයින් හෝ පරපීඩා හෝ ස්වපීඩා කමුකත්වය හෝ විවිධ ලිංගික අක්‍රමතා සහිත පුද්ගලයින් අන්තර්ජාලයට පිවිසෙන්නේ නම් එවැනි පුද්ගලයින් අන්තර්ජාලය තුළ ඇබ්බැහිවීම්වලට ලක්වීමට ඇති ඉඩ කඩ බහුල බව පෙන්වා දිය හැකිය. මන්ද යත් සැබෑ ජීවිතයේ දී තෘප්තකර ගත

නොහැකි වූ ලිංගික හැඟීම් අන්තර්ජාලය හරහා සංතෘප්ත කර ගැනීමට යත්න දැරීමේ අතුරු ඵලයක් ලෙස ඇබ්බැහිවීම සිදු විය හැකිය. එබැවින් මානසික පීඩනයෙන් යුතු අය අන්තර්ජාලයට පිවිසීමත් මානසික පීඩනයෙන් මිදීමට අන්තර්ජාලයට පිවිසීමත් යන දෙයාකාරයම අන්තර්ජාල ඇබ්බැහිවීම් සඳහා අත වනයි.

සමාජ භීතිකාව වැනි සමාජ අක්‍රමතා හා කාන්සා තත්ත්වයන් සහිත ළමයින් හෝ යෞවනයින් ට මුහුණටම මුහුණ සිදු කරනු ලබන ගනුදෙනු තුළින් ඇති වන අපහසුතාවයන් මගහැරීමේ ක්‍රමයක් ලෙස අන්තර්ජාලය සංනිවේදන මාධ්‍යයක් සේ යොදාගැනීමට යාමේ ප්‍රතිඵලයක් ලෙස ද අන්තර්ජාලයට ඇබ්බැහිවීමට ඉඩ ඇත.

ඇතැම් පුද්ගලයින් තුළ පවත්නා තොරතුරු පිපාසය හේතුකොටගෙන අන්තර්ජාලයට නිතර නිතර සම්බන්ධවන බැවින් හා ඉතා ක්ෂණිකව හා පහසුවෙන් එම තොරතුරු ලබා ගැනීමේ හැකියාව අන්තර්ජාලය සතුවන බැවින් නිරන්තරයෙන්ම අන්තර්ජාලය භාවිත කිරීමට පෙළඹෙන අතරම ඒ මත යැපෙන්නෙකු බවට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ද අන්තර්ජාල ඇබ්බැහි වූවන් බිහි විය හැකි ය.

සජීවී ජීවිතය තුළ සිදු කිරීමට අකමැති හෝ වෙහෙසකර හෝ ගැටළුකාරි තත්ත්වයක් පවත්නා ඇතැම් ක්‍රියාවන් සමහර පුද්ගලයින් අන්තර්ජාලය හරහා සිදු කිරීමට දරණ උත්සාහයන්වල දී ද ඔවුන් අන්තර්ජාලයට

ඇබ්බැහිවීමට ඉඩ ඇත. උදාහරණයක් ලෙස සූදු ක්‍රීඩා කිරීමට අදහසක් ඇති තැනැත්තෙකු එය සමාජයේ පිළිගත් ක්‍රියාවක් නොවන නිසා අන්තර්ජාලය ඔස්සේ සිය අභිප්‍රායයන් ඉටු කර ගැනීමට උත්සාහ දැරීමේ ප්‍රතිඵලයක් ලෙස අන්තර්ජාලයට ඇබ්බැහි වූවන් නිර්මාණය විය හැකි ය.

මානසික අවපීඩනය, කාන්සාව, සමාජ භීතිකාව, චර්යා අක්‍රමතා, පෞරුෂ අක්‍රමතා, තනිකම, පාලුව වැනි මානසික තත්තවයන් සහිත පුද්ගලයින් අන්තර්ජාලය පරිහරණය කිරීමට යාමේ දී ඒ සඳහා ඇබ්බැහිවීමට පවත්නා හැකියාව වැඩි බව ඉහත කරුණු අනුව පැහැදිළි වන බැවින් එවන් තත්ත්වයන් යටතේ සිටින අයෙකු අන්තර්ජාල පරිහරණයේ දි ප්‍රවේසම් විය යුතු ය. එවැනි තත්ත්වයක දී පිළිපැදිය යුතු හා ඇබ්බැහිවීම වළකාලීම උදෙසා ගත යුතු ක්‍රියාකාරකම් කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරමු.

06.5. අන්තර්ජාල ඇබ්බැහිවීම නවතාලීමට ගත හැකි ක්‍රියාමාර්ග

මානසික අවපීඩනයක් හෝ කාන්සා තත්තවයක් හෝ වෙන යම් මානසික ගැටළුවක් පවතී නම් අන්තර්ජාලය භාවිතයට පෙර හා පසු භාවනාවක හෝ සරළ සංයම අභ්‍යාසයකට යොමු වීම ඉතා වැදගත් වනු ඇත. එහෙත් ඇතැම් මානසික තත්ත්වයන්වලදී භාවනාව සුදුසු නොවිය හැකි බැවින් මනෝ වෛද්‍යවරයෙකුගේ හෝ

මනෝවිද්‍යාඥයෙකුගේ මග පෙන්වීම මත මෙවන් අභ්‍යාසවල නිරත වීම ඉතා යෝග්‍ය වේ.

අන්තර්ජාලය තුළ කටයුතු කිරීමේ දී අනාරක්ෂිත වන අවස්ථාවක දී හෝ යම් අන්තර්ජාල ක්‍රියාවලියක් භාවිත කරන්නාගේ පාලනයෙන් මිදී යන ස්වභාවයක් තේරුම් ගිය අවස්ථාවක දි තවකෙකුගේ උදවු උපකාර අවශ්‍යය. එහිදී හොඳම යහළුවන්, පවුලේ සාමාජිකයින්, සමාජ සේවකයින්, ප්‍රජා කණ්ඩායම්, උපදේශකයින්, මනෝ චිකිත්සකයින් හෝ වෛද්‍යවරුන් මෙන්ම නීතිය බලාත්මක කිරීමේ ආයතනයන් හී සහය ලබා ගැනීමට වඩාත් සුදුසුය. එය අනාරක්ෂිත තත්ත්වයන්ගෙන් මිදී යථා තත්ත්වයට පත් වීමට මහත් උපකාරී වනු ඇත.

මානසික ඉල්ලීම්වලට ඉඩ ලබා දීම වළකාලමින් සැලසුම් සහගතව කටයුතු කිරීමට නම් කාල සටහනකට අනුව වැඩ කිරීමට පුරුදු වීම ඉතා ප්‍රතිඵල දායකය. ඒ අනුව තමාගේ ජීවිතයේ එදිනෙදා කටයුතුවලදී අන්තර්ජාල පරිහරණය සඳහා ද ප්‍රමාණවත් සාධාරණ කාලයක් වෙන් කර තැබීම මෙහි දී වැදගත් විය හැක. ඒ තුළින් අනවශ්‍ය ලෙස අන්තර්ජාලය තුළ සැරිසැරීම නවතාලිය හැකි අතර එසේ කාලය වෙන් කරනු ලැබූ මුත් එකී කාලය ඉක්මවා කිසිදු හේතුවක් මත තවදුරටත් අන්තර්ජාලයේ රැඳීමට ඉඩ ලබා නොදිය යුතු ය. අන්තර්ජාලය පරිහරණය සඳහා නිශ්චිත කාලයක් වෙන්කර ගැනීම හෝ වෙන්කර දීම අන්තර්ජාල ඇබ්බැහිය නවතාලීම උදෙසා කදිම උපාය මාර්ගයකි.

වර්තමානයේ අන්තර්ජාලයේ සමාජ ජාල වෙබ් අඩවි භාවිතයට ළමයින් හා තරුණයින් යොමු වීම සුලභ තත්ත්වයකි. එය ඉතා ආකර්ශනීය වන බැවින් ඒ සඳහා ඇබ්බැහිවීමට ඇති ඇදගැනීමේ හා තල්ලු කිරීමේ සාධක බහුල වුවත් අධීක්ෂණයෙන් යුක්තව අන්තර්ජාලය පරිහරණයට මෙන්ම සමාජ ජාල වෙබ් අඩවි භාවිතයට ද සාධාරණ කාලයක් වෙන් කරදීම ළමයාගේ කුතුහලය සමනය කිරීම සඳහා හොඳ උපක්‍රමයකි. එහෙත් එය ඉතා සීමිත කාලයක් බවට පත්කර ගන්නේ නම් මැනවි.

අන්තර්ජාලය පරිහරණය කරන්නන් එය නිශ්චිත අරමුණකින් යුතුව පරිහරණය කිරිමට පුරුදු විය යුතුය. වර්තමාන තරුණ හා ළමා ප්‍රජාව නිකරුණේ අන්තර්ජාලය තුළ සැරිසරන අතර ඒ වෙනුවට අධ්‍යාපනික හෝ පර්යේෂණාත්මක කටයුතු සඳහා අවශ්‍ය දැනුම ගවේෂණය වෙනුවෙන් අරමුණුගත වීමට ඔවුන් පෙළඹවිය යුතුය.

කාලය සීමා කිරීමේ දී විනෝද ජනක කටයුතු හා අන්තර්ජාල ක්‍රීඩා සඳහා වෙන්කරන කාලය ද සීමා සහිත බවට පත් කරීම වැදගත්ය. මන්ද බොහෝ ළමයින් හා යෞවනයින් අන්තර්ජාලයේ දිගු වේලාවක් මෙවැනි කාර්යන් හි නිරත වීම ඔවුන්ගේ කායික, මානසික මෙන්ම සමාජීය ජීවිතයට ද අහිතකර ලෙස බලපානු ඇත.

දෙමාපියන් හා වැඩිහිටියන් ලෙස දරුවාගේ අන්තර්ජාල භාවිතය නියාමනය හා අධීක්ෂණය කිරීම තුළින්

එකී භාවිතයන් සැලසුම් හා නිවැරදි කිරීම ඔවුනගේ වගකීමකි. ඒ නිසා දරුවාගේ අන්තර්ජාල භාවිතය පිළිබඳව දොස් නැගීම හෝ බැණවැදීම පසෙකලා වැඩිහිටියන්ගේ යුතුකම නොපිරිහෙළා ඉටු කිරීමට උපක්‍රමශීලීව බුද්ධිමත්ව කටයුතු කළ යුතුයි. එහිදී පොලිස් නිලධාරියෙකු සේ නිතර නිතර කඩා පනිමින්, තර්ජනය කරමින්, බලපෑම් කරමින් සිදු කරන අධිකාරිමය මැදිහත් වීම වෙනුවට මිත්‍රශීලී සහය වන්නෙකු බවට පත් වීම වැදගත්ය.

වැඩිහිටියන්ගේ මැදිහත්කරණය තුළ දරුවාගේ අන්තර්ජාල භාවිතය නිවැරදි කිරීමට අපොහොසත් වුයේ නම් උපදේශකයෙකුගේ හෝ මනෝ චිකිත්සකයෙකුගේ හෝ මනෝ වෛද්‍ය වරයෙකුගේ හෝ ඒ පිළිබඳ වෘත්තීය නිපුණත්වයක් ඇති අයෙකුගේ සහය පතිය යුතුයි.

අන්තර්ජාල භාවිතය මගහැර ප්‍රායෝගික ජීවිතයේ සිදු වන වෙනත් සමාජීය ක්‍රියාකාරකම්වලට දරුවන් යොමු කිරීමට උත්සාහ ගැනීම ඉතා වැදගත් ය. ඒ සඳහා අවශ්‍ය ඉඩකඩ හා කාලය ළමයින්ට ලබා දීමට අවශ්‍ය මැදිහත්කරණය සිදු කරන්න. උදාහරණයක් ලෙස ක්‍රිකට්, වොලිබෝල්, චෙස් වැනි ක්‍රීඩා කටයුතුවලට මෙන්ම ළමා සමාජ, යෞවන සමාජ හා විෂය බාහිර කටයුතු වෙනුවෙන් ළමයින් යොමු කර විය හැකිය. නමුත් එකී අවස්ථාවන් පවා වැඩිහිටියාන්ගේ අධීක්ෂණය මත ක්‍රියාත්මක විය යුතුය.

තවදුරටත් අන්තර්ජාල භාවිතයේ දී සැලකිලිමත් විය යුතු අවස්ථා කිහිපයකි. විශේෂයෙන්ම නොරුස්සන, කළහකාරී, කේන්ති සහිත, මානසික පීඩනයෙන් යුතු අවස්ථාවලදී අන්තර්ජාලය භාවිත කිරීමට යාමෙන් වැළකීම සුදුසුය. මන්ද එවැනි මානසික තත්ත්වයන් තුළ අන්තර්ජාල සබඳතා ව්‍යාකූල කිරීමට මෙන්ම වැරදි ඇබ්බැහිවීම්වලට ලක් වීමට ඇති ඉඩකඩ ඉහළ දමනු ලබයි.

මෙම සියලු පියවරයන් මෙන්ම අධික ලෙස අන්තර්ජාලය භාවිත කිරීම නිසා සිදු විය හැකි හානිදායක තත්ත්වයන් පිළිබඳව දරුවන් සමග සාකච්ඡා කිරීමද ඇබ්බැහිවීම වැළැක්වීමේ දැනුවත් භාවය වර්ධනය කරනු ඇත. නමුත් එම සාකච්ඡාවන් හමුවේ වුවද දරුවා බියවැද්දීම, කොන්කිරීම, මානසික පීඩනයට ලක් කිරීම, පහත්කොට සැලකීම පසෙකලා ධනාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාව මෙහෙය වන්න.

06.6. ළමයාගේ අන්තර්ජාල භාවිතය අධීක්ෂණය, නියාමනය හා පසු විපරම් කිරීම

තම ළමයින් පිළිබඳව නිරන්තරයෙන් සොයා බැලීම දෙමාපියන් සතු වගකීමකි. එහිදී දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය, අධ්‍යාපන තත්ත්වය, පෝෂණය, ආරක්ෂාව, ඇකවරණය මෙන්ම සමාජ භාවිතයන්,ළමයා යන එන තැන්, ඇසුරු කරන්නන්, සිදු කරන ක්‍රියාකාරකම් ආදි ළමයාගේ සමස්ත හැසිරීම දෙස අවධානය යොමු කළ යුතුය. ඉහතින්

සඳහන් කළ දෘෂ්‍යමාන වූ තත්ත්වයන් කෙරෙහි අවධානය හා සොයා බැලීම සිදු කළ යුතු ආකාරය පිළිබඳව බොහෝ දෙමාපියන් සතුව වැටහීමක් ඇති අතර ඒ පිළිබඳ පරිචයක් කුඩා කළ සිට ම වර්තමාන වැඩිහිටි පරපුර තුළ ගොඩ නැගී ඇත.

ළමයෙකු සඳහා බයිසිකලයක් පැදීමට පුහුණු කරනු ලබන අවස්ථාවක් පිළිබඳව මොහොතක් සිතන්න. දරුවා ඉන් බිම ඇද වැටුන හොත් හානියක් වන බව ඔබ දනී. එහෙත් සියලු ආරක්ෂිත ක්‍රම සලසමින් හා බයිසිකලය පාලනය කරමින්, වේගය සීමා කරමින්, තිරිංග ක්‍රියාත්මක කරන ආකාරය හොඳින් දැනුවත් කරමින් ඔබ දරුවාට එකී කාර්යය හානියක් නොවන ලෙස සාර්ථක කර ගැනීමට මග පෙන්වනු ඇත. එසේ වන්නේ පුහුණුකරන්නා ඒ පිළිබඳව ලබා ඇති පෙර අත්දැකීම් හා පාරම්පරික ඥානය මතිනි. එහෙත් අන්තර්ජාලය සුරක්ෂිතව පරිහරණය හා එහි අනතුරුදායී සීමාවන් පිළිබඳව තම දරුවන්ට කියා දීමට වර්තමානයේ බොහෝ දෙමාපියන්ට ඒ පිළිබඳ පරිචය හා අත්දැකීම් නොමැත. මන්ද වර්තමාන වැඩිහිටියා හා ළමයා යන දෙදෙනාම එක විට මෙකී තාක්ෂණයට නිරාවරණය වීම නිසාවෙනි.

තත්ත්වය එසේ වුවත් වර්තමාන ළමා ප්‍රජාව ලෙස මුහුණ දෙන නවතම අභියෝගයක් වූ අන්තර්ජාලය ආශ්‍රිත ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට බොහෝ දෙමාපියන්ට හා වැඩිහිටියන්ට පවත්නා දැනුම හා ආකල්ප ප්‍රමාණවත්

නොවේ. එකී රික්තය තවතවත් අන්තර්ජාල ගැටළුව උග්‍ර තත්තවයක් දක්වා වර්ධනය කිරීමට ඉඩ කඩ විවර කරයි. එබැවින් දෙමාපියන් හා වැඩිහිටියන් නොදන්නා නොහඳුනන ඉසව්වක සිදු වන දේ පිළිබඳව අසීමිත බියට පත්වන වැඩිහිටියන් තම දරුවන්ට එකී ඉසව්ව අවධානම්කාරි කලාපයක් බවට පත් කරමින් සම්පුර්ණයෙන් තහනම් කිරීම හෝ නොදැනුවත්භාවය මත අසීමිත ලෙස එකී කලාපයට නිරාවරණය කිරීම වැනි අන්තගාමී ප්‍රතිචාරයන් දැක් විය හැකිය.

ඕනෑම සංස්කෘතියක නවීන තාක්ෂණය පිළිබඳ දැනුම වැඩිහිටි පරපුර පරදා ළමා පරපුර අතට පත්වීම සාමාන්‍යයි. එසේ වුවත් ළමා පරපුරට තරම් වූ අන්තර්ජාලය පිළිබඳ දැනුමක් දෙමාපියන් හා වැඩිහිටියන්ට නැතැයි සිතමින් ළමයින් අනාරක්ෂිත තත්තවයට පත්වන්නට ඉඩ හැර බලා සිටිය නොහැක. එබැවින් දෙමාපියන්, වැඩිහිටියන් ලෙස අන්තර්ජාලය සම්බන්ධ අභියෝගයට මැදිහත් විය හැකි ආකාරය පිළිබඳවත් පවත්නා දැනුම මත ඉතා සරල ක්‍රියාකාරකම් හරහා ළමයා අධීක්ෂණය හා පසුවිපරම් සිදු කිරීමටත් අවශ්‍ය මගපෙන්වීම මේ යටතේ සාකච්ඡා කරනු ඇත.

ළමයින්ගේ අන්තර්ජාල භාවිතය අධීක්ෂණය කළ යුත්තේ ඇයි ද යන්න පිළිබඳව ඔබට මේ වන විටත් පිළිතුරක් ඇත. එහෙත් නිශ්චිතවම පවත්නා අනතුර කුමක්දැයි නොදැන සිටිනවා වන්නට පුළුවන. එබැවින් අනතුර

කුමක්දැයි නොදැන ආරක්ෂිත ක්‍රම තීරණය කර ගැනීමට නොහැකි වන්නා සේ අන්තර්ජාල භාවිතයේ දී දරුවන් මුහුණ දෙන ගැටළුකාරී තත්ත්වයන් දෙමාපියන් ලෙස මූලිකව හඳුනා ගත යුතුය.

අන්තර්ජාලය ඔස්සේ කාමුක පණිවුඩ ලබා දීම, ලිංගික ඇවිටිලි කිරීම, ලිංගික කටයුතුවලට ළමයින් යොදා ගැනීම හෝ ඒ සඳහා ගොදුරු සොයන පුද්ගලයින්ගේ ගොදුරක් බවට පත් වීම විවිධාකාර හිංසාවන්ට අන්තර්ජාලය ඔස්සේ ළමයින් ලක් වීම සිදු විය හැකි ය. එමෙන්ම මත් ද්‍රව්‍ය ජාවාරම්වලට ළමයින් යොදා ගැනීම, කූට ව්‍යාපාරවලට අසුකර ගැනීම, විවිධ රැවටිලිවලට ලක් කිරීම, පෞද්ගලික තොරතුරු කොල්ලකෑම වැනි අනතුරුදායී තත්ත්වයන් පවත්නා අතර මේ පිළිබඳව පුළුල් වශයෙන් ඉහත තුන්වන පරිච්ඡේදයේ දී සාකච්ඡා කර ඇත.

මෙවැනි තත්ත්වයන්ගෙන් ළමයින් ආරක්ෂාකර ගනිමින් නවීන තාක්ෂණික ලෝකය තුළ ඉදිරියට යන්නට ළමයින් මෙහෙයවීම දෙමාපියන්, ගුරුවරුන් මෙන්ම වැඩිහිටියන්ගේ වගකීමක් වේ. එකී වගකීම නොපිරිහෙළා ඉටු කරන්නට නම් මෙවැනි පරිසරයක් තුළ කෙසේ කටයුතු කළ යුතුද යන්න සඳහා දැනුම හා කුසලතා අත්පත් කර ගත යුතුව ඇත.

ලාංකීය සමාජ සංදර්භය තුළ දෙමාපියන් දරුවන්ව අධීක්ෂණය කරනමුත් ඒ සඳහා මැදිහත්වීමේ ක්‍රමවේදයේ

පවත්නා අඩු ලුහුඬුකම් නිසා එකී ගැටළුව නිරාකරණය වෙනවා වෙනුවට ළමයින් හා දෙමාපියන් අතර ගැටුම් නිර්මාණය වීමක් හෝ වර්ධනය වීමක් බොහෝ විට දැක ගත හැකි යි. එබැවින් ඔබේ මැදිහත්කරණය එවන් තත්ත්වයකට පරිවර්ථනය නොවී ළමයා සහ දෙමාපියන් අතර තවතවත් සුහදත්වය වර්ධනය වෙමින් ගැටුම් කළමනාකරණය කරන්නේ නම් මැනවි. ඒ අනුව ළමයින්ගේ අන්තර්ජාල භාවිතය අධීක්ෂණය කිරීමේ දී තාක්ෂණික ක්‍රමවේද හා භෞතික සරල ක්‍රමවේද යන දෙයාකාරයම භාවිතයට ගත හැකි යි.

ළමයින්ගේ අන්තර්ජාල භාවිතය පිළිබඳව අධීක්ෂණය කිරිම සඳහා ඉතා ලෙහෙසියෙන් හා පහසුවෙන් ළමයාගේ සිත් නොබිඳෙන ලෙස සුක්ෂමව නිවසේදීම භාවිතයට ගත හැකි තාක්ෂණික ක්‍රම කිහිපයක් ඇත.

01 අන්තර්ජාල දත්ත පරිහරණයේ ඉතිහාසය පිරික්සීම (Internet Browsing History)

02 Router Activity History පිරික්සීම

03 පරිගණකයේ මෑතදී භාවිත කළ ගොනු පරික්ෂාව

04 විශේෂිත වූ මෘදුකාංග හරහා අධීක්ෂණය

අන්තර්ජාල දත්ත පරිහරණය කර ඇති ඉතිහාසය පරීක්ෂා කර බැලීම දෙමාපියන් ලෙස ඉතා පහසුවෙන් කළ හැකිය. ඔබගේ දරුවා අන්තර්ජාලය තුළ භාවිත කර ඇති

වෙබ් අඩවි මොනවාද යන්න Internet Browsing History තුළ නිරායාසයෙන්ම සටහන් වනු ඇත. එම ඉතිහාසය පරීක්ෂා කර බැලීමෙන් ඔබගේ දරුවාගේ අන්තර්ජාල රුචි අරුචිකම් මොනවාද,ළමයා නරඹා ඇති වෙබ් අඩවි මොනවාද යන්න පිළිබඳව ඔබට යම් වැටහීමක් ඉතා පහසුවෙන් ලබා ගත හැකියි. මේ සඳහා අවශ්‍ය වනුයේ ඉතා සුළු දැනුමක් පමණි. එකී තොරතුරු එකිනෙක පරීක්ෂා කර බැලීම හරහා ළමයාගේ අන්තර්ජාල භාවිතයේ ස්වභාවය පිළිබඳ යම් නිගමනයකට එළඹිය හැකිය. අන්තර්ජාලයට අමතරව ළමයා පරිහරණය කරනු ලබන පරිගණකය ආශ්‍රයෙන්ද ළමයාගේ රුචි අරුචිකම් හා පරිගණකය භාවිත කරනුයේ කුමන කාරණයක් සඳහා ද යන්න හඳුනා ගැනීමට හැකි ය. එකී අධීක්ෂණය සඳහා පරිගණකයේ Recent Open File යන විකල්පය භාවිතයෙන් පරිගණකය මෑතදී භාවිත කර ඇත්තේ කුමන කටයුතුවලට ද යන්න පෙන්වා දෙයි. ඒ තුළළමයා භාවිතා කළVideos, Photos, file මොනවාද යන්න පෙන්නුම් කරයි. නමුත් මතක තබා ගත යුතු එක් දෙයක් නම් පරිගණකයේ මෙන්ම අන්තර්ජාලයේ ද එකී ඉතිහාසය මකා දැමිය හැකි බවයි. එබැවින් ඔබේ ළමයාගේ පරිගණකයේ Recent Open Files නොමැති වීම හෝ අඩු වීම ඔබේ සැලකිලිමත් භාවය අඩු වීමට හේතුවක් නොවිය යුතුය. මෙම අධීක්ෂණය සඳහා පරිගණක පිළිබඳ පුළුල් දැනුමක් අවශ්‍ය නොවේ. නමුත් එකී දැනුම හෝ නොමැති නම් පරිගණකය හා අන්තර්ජාලය පිළිබඳ දැනුවත්භාවයක් ඇති විශ්වාසවන්ත

වැඩිහිටියෙකු ලවා අධීක්ෂණය සිදු කරවා ගත හැකිය. නමුත් විශේෂයෙන් මතක තබා ගත යුතු දේ නම් ළමයාට මේ පිළිබඳ දැනෙන ලෙස හෝ සිත් රිදෙන ලෙස අධීක්ෂණයට යාම නොකළ යුතු ය. මන්ද එය ළමයා හා ඔබ අතර පවත්නා සුහදතාවය බිඳ වැටීමට හේතුවක් විය හැකි අතරම පවත්නා ගැටුම් තවදුරටත් උග්‍ර තත්තවයට පත් විය හැකිය. ඒ ඉදිරියේ දී ඔබට කිසිදු හෝඩුවාවක් ඉතිරි නොකරම සූක්ෂම ලෙස අන්තර්ජාල අවභාවිතාවේ යෙදීමට ළමයා ක්‍රියාත්මක විය හැකි බැවිනි.

අන්තර්ජාලයේ හෝ පරිගණකයේ ළමයින් සිදු කරන ක්‍රියා මොනවාද යන්න පිළිබඳව සොයා බැලීමෙන් පමණක් අන්තර්ජාල අධීක්ෂණය හා සුරක්ෂිතතාව ගොඩ නැගෙන්නේ නැත. මන්ද අන්තර්ජාලය තුළ පහසුවෙන් හා ලෙහෙසියෙන් ළඟාවිය හැකි අනතුරුදායී වෙබ් අඩවි පවතී නම් එම ඉසව් වෙත යොමුවීමට නොහැකි වන ලෙස පරිගණකය හෝ දුරකථනය සකසා ගැනීමට ද හැකි විය යුතු යි. ඒ සඳහා භාවිතයට ගත හැකි විවිධ මෘදුකාංග දැන් වෙළඳ පොළේ ඇත. එම මෘදුකාංග Parental Control Software ලෙස හඳුන්ව යි.

ඔබගේ නිවසේ හෝ ගෙවත්තේ දරුවන්ට අනතුරුදායී ස්ථානයක් පවතී නම් ඔබ ඒ පිළිබඳව සැලකිලිමත් වේ. එයින් දරුවා ආරක්ෂා කරගැනීමට විවිධ උපක්‍රම භාවිතා කරනු ලබන බව අපි දනිමු. ඔබගේ නිවස ආසන්නයේ ගැඹුරු ළිඳක් පවතී යැයි සිතන්න. එහිදී ඔබගේ

දරුවාට එකී ඉසව්වට යාම තහනම් කරනවා සේම එහි අනතුරුදායී බව දරුවාට වටහාදීමට කටයුතු කරයි. එපමණකින් සෑහීමකට පත් නොවන ඔබ එම ළිඳ වටා දරුවාට ළඟාවීමට නොහැකි වන සේ බැම්මක් හෝ වැටක් බැඳ දරුවාට මග අසුරාලීම සිදු කරයි. ඒ පරිද්දෙන්ම අන්තර්ජාලය සම්බන්ධයෙන් පවත්නා අනතුරුදායී තත්ත්වය හමුවේ ඔබට ද කටයුතු කළ හැකියි. මුලින්ම අනතුර හඳුනාගෙන ඒ පිළිබඳව දරුවා දැනුවත්කර තැබීම ප්‍රථම පියවර යි. ඉන් පසුව එකී අනතුරුදායී ඉසව්වලට යාමට නොහැකි වන සේ මග අහුරාලීමට ද ඔබට හැකි ය. ඒ සඳහා ඔබගේ දරුවා අන්තර්ජාලයට යොමු වන ඉලෙක්ට්‍රෝනික උපකරණයේ සැකසුම් (setting) අනවශ්‍ය වෙබ් අඩවිවලට ළඟාවිය නොහැකි වන සේ සකසා තැබිය හැකිය. ඒ සඳහා භාවිතයට ගත හැකි සුවිශේෂී මෘදුකාංග බොහොමයක් නොමිළේ බාගතකර ගත හැකි ය. එකී මෘදුකාංග හරහා අනවශ්‍ය වෙබ් අඩවි අවහිරකර (Block) දැමිය හැකිවා සේම දරුවා අන්තර්ජාලයේ නරඹන ලද, පරිහරණය කරන ලද, ලියන ලද, කථා කරන ලද සියල්ල දරුවාටද නොදැනෙන සේ වෙනම තැනක ගබඩා කිරීමටත් (Save) අවශ්‍ය නම් දෙමාපියන්ගේ විද්‍යුත් ලිපිනයට (E-Mail) ගෙන්වා ගැනීමටත් හැකි ය. එවැනි මෘදුකාංගවලට උදාහරණ ලෙස K9 web Protection, Kaspersy, Safe Kids, SafeDNS, Mobicip, Clean Router, OpenDNS Home VIP, Circle with Disney, Symantec Norton Family Premier,

Contentwatch Net Nanny7, වැනි Parental Control Apps ගණනාවක් අන්තර්ජාලයට ඇතුළත් වූ විට මුදල් ගෙවා හෝ නොමිළේ ද බාගත හැකිය.

තාක්ෂණික නොවන ආකාරයේ ඉතා සරල ක්‍රමවේද රැසක් ද මෙහිදි දෙමාපියන් ලෙස ඔබට ක්‍රියාත්මක කළ හැකි යි. එහිදි නිවසේ අන්තර්ජාල පරිසරය ළමා හිතකාමී බවට පත් කිරීම ඉතා වැදගත් වේ. නිවසේ පරිගණකය කාමරවල, අහුමුලුවල, අඳුරු ස්ථානවල ස්ථානගත කිරීම ළමයා ට අනතුරුවලට අතවැනීම කි. මන්ද සැඟවී රිසිසේ පරිගණකය හා අන්තර්ජාලය භාවිත කිරීමට ඒ තුළින් හැකි වන නිසා ළමයා අතින් අන්තර්ජාලය අවභාවිත කිරීමට ඇති හැකියාව ඉහළ යනු ඇත. එබැවින් නිවසේ පරිගණකය බොහෝ දෙනා ගැවසෙන සාලය වැනි ස්ථානයක තබා තිබීමෙන් ඔබගේ අධීක්ෂණයට නිරන්තර ලක් වන නිසා ළමයාට අනවශ්‍ය කාර්යයන් හී නිරතවීමට ඇති ඉඩ කඩ අවහිර වේ.

ඔබගේ ළමයාට කුමන හේතුවක් මත හෝ මේ වන විට දුරකථනයක් ලබා දී ඇත් නම් නිවසේ දුරකථන පිළිබඳ පෞද්ගලිකත්වය වර්ධනය වීමට ඉඩ නොහරින්න. ඔබගේ දුරකථනයෙන් එය ආරම්භ කරන්නට පුළුවන. සියලු දෙනාටම එකී දුරකථනයට ප්‍රවේශය ලබා දෙමින් ඒ ඔස්සේ ළමයාගේ දුරකථනය ද ඔබගේ භාවිතයට ඉඩ සළසා ගන්නට උපක්‍රමශීලී විය යුතුයි. කිසි විටෙක දුරකථන හෝ පරිගණක

පිළිබඳ අතිශය පෞද්ගලිකත්වයක් නිවස තුළ ගොඩනැගීමට සමත් වාතාවරණයන් මගහරින්න.

ළමයින්ට පරිගණක ලබා දීමේ දී ඉතා සැලකිලිමත් විය යුතුයි. මන්ද පාසල් වයසේ පසු වන ළමයින්ට ටැබ්ලට්ස් හෝ ලැප්ටොප් පරිගණක රැගෙන දීම නිර්දේශ කළ නොහැක. ඔවුන් සඳහා සුදුසු වනුයේ ඩෙස්ක්ටොප් පරිගණකය යි. උසස් අධ්‍යාපනය ලැබීමේ දී ලැප්ටොප් පරිගණකයක් ලබා දීම ගැටළු සහගත නොවේ. නමුත් වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ වඩාත් කතාබහට ලක් වන සුහුරු පංතිකාමර (Smart Class Room) සංකල්පය ශ්‍රී ලංකාව තුළද අත්හදා බැලීමට නිර්දේශ වී ඇත. එකී ටැබ්ලට් පරිගණකය අන්තර්ජාල සම්බන්ධතාවයක් ගොඩ නැගීමට නොහැකි සුවිශේෂීව සකසන ලද අධ්‍යාපන මෙවලමක් පමණක් විය යුතුය. ඔබේ නිවසේ ළමයින් අන්තර්ජාලය භාවිත කරන්නේ නම් දැනට පවත්නා වඩාත් සුදුසුම අන්තර්ජාල සම්බන්ධතාවය වනුයේ ඩොංගල් මගින් අන්තර්ජාල සම්බන්ධතාවය ලබා ගැනීම යි. මන්ද එය ළමයාට හිමි නිශ්චිත කාලයෙන් පසු දෙමාපිය භාරයට ගත හැකි බැවිනි.

06.7. අන්තර්ජාල භාවිතයට ආචාර ධර්ම

ආචාර ධර්ම පද්ධතියක් යනු වැළැක්වීමේ මෙවලමකි. එය නිසි ප්‍රමිතියකින් යුතුව අන්තර්ජාලය පරිහරණය කිරීමත් ආරක්ෂාව සලසා ගැනීමත් මානව හිමිකම් කඩවීම අවම

කරලීමත් තමන් සතු වගකීම් නොපිරිහෙළා ඉටු කිරීමත් පුද්ගල ගෞරවය සුරක්ෂිත කිරීමත් සඳහා වන එකගතා ලැයිස්තුවකි (UN).[31]

අන්තර්ජාලය තුළ සිදු වන බොහොමයක් අවභාවිතයන් හා අපරාධවලට මූලිකම හේතුව වනුයේ ඒ සඳහා පිළිගත් ආචාර ධර්ම පද්ධතියක් නොමැති වීම හා පවත්නා ධර්මතා හෝ නොපිළිපැදීම යන කාරණයන්ය. එබැවින් අන්තර්ජාලය තුළළමුන්ගේ ආරක්ෂාව තහවුරු කරීම විෂයෙහි ළමයින් විසින් පිළිපැදිය යුතු හා ප්‍රජාව විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම මාලාවක අවශ්‍යතාව මතුව තිබේ.

එවන් වූ ආචාර ධර්ම පද්ධතියක් සකසා ගැනීම උදෙසා භාවිතයට ගත හැකි මෙන්ම ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කර ගත හැකි පොදු කරුණු කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරමු.

අන්තර්ජාල භාවිත කරන්නන් විෂයෙහි ආචාර ධර්ම;

- පෞද්ගලික තොරතුරු හෙවත් නම, ලිපිනය, පෞද්ගලික දුරකථන අංක, පාසලේ නම ආදී තොරතුරු අන් අයට

---

31 .

පෙනෙන අයුරින් අන්තර්ජාල තුළ ප්‍රසිද්ධියට පත් නොකිරීම.

- නිතර පුරුද්ධක් ලෙස යන එන ස්ථාන හෝ දැනට රැඳී සිටින ස්ථාන ප්‍රසිද්ධියට පත් නොකිරීම.
- ඡායා රූප අනාරක්ෂිත ලෙස අන්තර්ජාලයට මුදා හැරීමෙන් මෙන්ම අනාරක්ෂිත ඡායා රූප අන්තර්ජාලයට මුදා හැරීමෙන් වැළකී සිටීම.
- තමාගේ ප්‍රතිරූපයට හානි සිදු විය හැකි හෝ අන් අයගේ ප්‍රතිරූපයට හානි සිදු විය හැකි යමක් හුවමාරු (Share) නොකිරීම.
- Online හැසිරෙන විට ද කාරුණික වීම හා කිසිදු අයෙකුට හිංසා නොකිරීම.
- නාඳුනන පුද්ගලයින් ගිණුමට එක්කර ගැනීමෙන් වළකී සිටීම.
- අන්තර්ජාලයේ සිදු කරනුයේ මොනවාදැයි දෙමාපියන්ටත් දැන ගැනිමට සැළැස්වීම.
- යහපත් විශ්වාසවන්ත අයෙකු ලෙස ඔබගේ අන්තර්ජාල ප්‍රතිරූපය ගොඩනගා ගැනීම හා එය පවත්වාගෙන යාම.
- තවත් අයෙකු අන්තර්ජාලය තුළ හිංසනයට ලක් වන්නේ නම් කළ යුත්තේ කුමක්ද යන්න ඔහුට ද උපදෙස් ලබා දීම හා උදවු කිරීම.
- අන්තර්ජාලයේ ඇති සියල්ලම විචාරයකින් තොරව පිළිගැනීමෙන් වැළකී සිටීම හා බුද්ධිමත්ව කටයුතු කිරීම.

- අන්තර්ජාල ගිණුමේ මුරපදය (Password) අනුමාන කළ නොහැකි සේ ශක්තිමත්ව සකසා ගැනීම; එය අන් අය සමග හුවමාරුකර ගැනීමෙන් වැළකීම, පෞද්ගලිකව තබා ගැනීම.
- සබඳතා පවත්වන්නට අකමැති කරදරකාරි සියලු දෙනාම Unfriend කිරීම හෝ Bock කිරීම.
- හිංසාකාරී කරදරකාරී වැරදි හැසිරීම් ඇති ගිණුම් Report කිරීම.
- සැක සහිත ගොනු (File) හා වැඩසටහන් බාගත කිරීමෙන් (Download) වැළැකීම.
- සිටින ස්ථානය (Location) හෝ යන එන ස්ථාන පිළිබඳව ප්‍රසිද්ධියටපත් නොවන සේ ඉලෙක්ට්‍රෝනික උපකරනයේ සැකසුම් (Setting) සකසා තැබීම.
- අන්තර්ජාලය ඔස්සේ හඳුනාගත් කිසිවෙකු සැබෑ ජීවිතයේ දී මුණගැසීමට යාමෙන් වැළකීම.
- අන්තර්ජාලය ඔස්සේ යම් හිංසනයකට හෝ අපහසුතාවයකට පත් වන්නේ නම් දෙමාපියන්ට, ගුරුවරුන්ට හෝ වගකිවයුතු වැඩිහිටියෙකුට හෝ ආයතනයකට දැනුම් දීම.
- අන්තර්ජාලයේ කරදරකාරී, හිංසාකාරී, වැරදි හැසිරීම් ඇති අයගේ යෝජනා හෝ ඉල්ලීම්වලට එකඟ නොවීම.
- හිංසා කළ අයගෙන් පළිගැනීමට හෝ එකට එක කිරීමට අන්තර්ජාලය භාවිතයට ගැනීමෙන් වැළකීම.

- අන්තර්ජාල අපරාධයක් හෝ අවභාවිතයක් ඉදිරියේ මානසික බිඳවැටීමට ලක් නොවන ලෙස කටයුතු කිරීම.
- කරදරකාරී හා හිංසාකාරී පුද්ගලයන්, අවස්ථාවන් හා ගිණුම් මගහැරීම; නොසලකා හැරීම; නැතහොත් විශ්වාසවන්ත අයෙකුට දැනුම් දීම.
- අන්තර්ජාලය තුළ තමාටත් අන් අයටත් සමාජයටත් හානි නොවන භාවිතයකට හුරු වීම.

අන්තර්ජාල සේවා සපයන්නන් විෂයෙහි ආචාර ධර්ම

- ළමයාගේ ආරක්ෂාව සෑමවිටම තහවුරු කිරීම.
- ඇතැම් ජාලවලට පිවිසීමට හැකි වයස් සීමාවන් පැනවීම
- අන්තර්ජාල සේවාවන් හා සේවා සපයන ස්ථාන ළමා හිතකාමී ලෙස සකසුරුවම් කිරීම.
- සේවා ලබා ගන්නන් නිවැරදිව ලියාපදිංචියකට ලක් කිරීම.
- අනාරක්ෂිත අන්තර්ජාල වෙබ් කලාපවලට ඇතුළු වීමට නොහැකි වන ලෙස ආරක්ෂිත මෙවලම් සැකසීම.
- අනතුරුදායී අවවාද ප්‍රදර්ශනය කිරීම.
- ළමයින් විෂයෙහි පිළිපැදිය යුතු නීති රීති පැහැදිළිව ලබා දීම; ප්‍රදර්ශනය කිරීම; එකඟතා ලබා ගැනීම.
- පවත්නා නීති හා එකඟතා කඩවීම නිසා සිදු විය හැකි ප්‍රතිවිපාක පිළිබඳව දැනුවත් කර තැබීම; ඒ පිළිබඳව ප්‍රදර්ශනය කර තැබීම,

- ළමයින් විෂයෙහි යම් නීතියක් කඩ වන බව දැන ගැනීමට ලැබුණු සැණින් ළඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිව දැනුවත් කිරීම.

මැදිහත්කරනය සිදු කරන්නන් විෂයෙහි

- ළමයාගේ රහස්‍යභාවය සුරැකීම.
- ළමයාගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු සැකසීම.
- ළමයාට ගරු කිරීම
- ළමයාව පිළිගැනීම.
- ළමයා පවසන දේට සක්‍රීයව සවන් දීම.
- ළමයා පවසන දේවල්වල සටහන් තබා ගැනීම.
- වෙනසක් කමක් නොකිරීම.
- ඔබට කළ හැකි හා කළ නොහැකි දේ පැහැදිළිව පැවසීම.
- සහය ලබා ගත හැකි වෙනත් ස්ථාන පිළිබඳව දැනුවත් කිරීම.
- ළමයාගේ පෞද්ගලිකත්වය සුරක්ෂිත කිරීම

06.8. අන්තර්ජාල භාවිතයට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමේ මාර්ග සිතියම

මෙම පොත පරිශීලනය කළ ඔබ විසින් ලබා ගත් දැනුම ළමා ආරක්ෂාව උදෙසා ප්‍රායෝගික තලයකට රැගෙන යාමට සඳහා ඔබගේ පාසලේ, ඔබගේ ආයතනයේ, ඔබගේ ග්‍රාමයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දිස්ත්‍රික්කයේ හෝ ජාතික මට්ටමින් අන්තර්ජාල භාවිතය තුළ සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට සහය වීම උදෙසා මෙකී මාර්ග සිතියම ඔබට මහගු පිටිවහලක විය හැකිය.



රූප සටහන්-06

01. අන්තර්ජාලය පිළිබඳ වූ ගැටළුව හඳුනා ගැනීම

ඔබගේ නිවස, පාසල, ආයතනය, ග්‍රාමය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දිස්ත්‍රික්කය හෝ පළාත තුළ ව්‍යාපෘතියක් සූදානම් කිරීමේ දී ගැටළුව නිර්වචනය කර ගැනීම වැදගත්ය. ඒ සඳහා අන්තර්ජාල අපරාධයක් හෝ අවභාවිතයක් යනු කුමක්ද? යන්න නිර්වචනය කර ගනිමින් ඔබගේ ඉලක්ක කණ්ඩායමට එකී අපරාධ හෝ අවභාවිතයන් කෙසේ බලපෑම් කරන්නේද යන්න මූලිකවම හඳුනා ගත යුතුය.

02. අන්තර්ජාලය නිසා අනතුරු අවධානමක සිටින ළමුන් හඳුනා ගැනීම

අන්තර්ජාලය භාවිත කරන ළමයින්, අන්තර්ජාලය භාවිත නොකරන ළමයින්, ඇබ්බැහි වූ ළමයින් අන්තර්ජාලයෙන් හිංසනයට ලක් වූ ළමයින්, අන්තර්ජාල අවභාවිත කරන ළමයින් හෝ අපරාධකාරී ළමයින් ලෙස හඳුනා ගැනීමට හැකිය. එකී ළමයින්ගේ වයස් ස්වභාවයන් ස්ත්‍රී පුරුෂ බව අනුව එකී හඳුනා ගැනීමට ඇතුළත් කළ යුතුය.

03. අන්තර්ජාලය පිළිබඳ ආරක්ෂක මෙවලම් නිර්වචනය කර ගැනීම

ආරක්ෂක මෙවලමක් යනු එකී විෂය සඳහා ඇති ප්‍රඥප්ති, පනත්, නීතිරීති හා චක්‍රලේඛ ආචාර ධර්ම, ආයතන හා සහයක පද්ධතීන්ය. අන්තර්ජාල සුරක්ෂිතභාවය

වෙනුවෙන් දැනට ලංකාවේ පවත්නා ආරක්ෂක මෙවලම් ලෙස පහත ලියකියවිලි හඳුනා ගත හැකිය.

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය
- බුඩාපෙස්ට් (Budapest) ප්‍රඥප්තිය හෙවත් යුරෝපා සංගමයේ සයිබර් අපරාධ පනත
- දණ්ඩ නීති සංග්‍රහය හා හඳුනාගත් වැරදි
- අසභ්‍ය ප්‍රකාශන පනත
- ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත
- පරිගණක අපරාධ පනත
- ඉලෙක්ට්‍රොනික ගනු දෙනු පනත
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත
- අන්තර්ජාල භාවිතය පිළිබඳ පාසල් හා පිරිවෙන් චක්‍රලේඛය

වාර්ථා කළ යුතු ආයතන හඳුනා ගැනීම

- ශ්‍රී ලංකා පොලීසිය / අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
- අධිකරණය
- කොළඹ විශ්වවිද්‍යාලය,

- මොරටුව විශ්වවිද්‍යාලය
- රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

සහයක ආයතන

- අධ්‍යාපන අමාත්‍යාංශය
- ළමා සංවර්ධන අමාත්‍යාංශය
- පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව
- ජනමාධ්‍ය අමාත්‍යාංශය
- රාජ්‍ය නොවන සංවිධාන

04. අන්තර්ජාල අපරාධ හා අවභාවිතයන් වැළැක්වීමේ කණ්ඩායම් නිර්මාණය කිරීම

සුරක්ෂිත අන්තර්ජාල පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා ක්‍රියාත්මක වීමේ දී මූලික වශයෙන් ම ප්‍රබල වැළැක්වීමේ කණ්ඩායමක් නිර්මාණය කර ගත යුතුය. එකී කටයුත්තේ දී මුලින්ම ඒ සඳහා නායකත්වය ලබා දෙන අයෙකු හඳුනා ගනිමින් විවිධ අංශවලින් සැදුම්ලත් වැළැක්වීමේ කණ්ඩායමක් තෝරා ගත යුතුය. එකී තෝරාගත් සියලු සාමාජිකයින් විෂයෙහි අන්තර්ජාලය පදනම් කරගනිමින් ළමා අපරාධ සිදු වන ආකාරයේ සිට පුළුල් දැනුමක් ලබා දීම ඉතා වැදගත් වේ. එකී වැළැක්වීමේ කණ්ඩායමේ එක් එක් පාර්ශ්වයේ වගකීම් හා කාර්ය භාරය අර්ථ කථනය කර ගත යුතුයි. වැඩසටහනෙහි ප්‍රතිපාදන වෙන්කරන්නේ කවරෙකු ද යන්න තීරණයකර ගනිමින්

අවශ්‍ය අය වැය වෙන් කිරීම සිදු කළ යුතුය. මෙකී ව්‍යාපෘතිය උදෙසා බාහිර ආයතනයන් හී සහය අවශ්‍ය වන්නේනම් ඒවා හඳුනාගෙන එකී පාර්ශ්වයන් වෙතින් ලබා ගැනීමට බලාපොරොත්තු වන සහය නිර්වචනය කර ගත යුතුය. එසේම වැඩසටහන අධීක්ෂණය සිදු කිරීම හා නියාමනය පිළිබඳව ද අවධානය යොමු කර සියල්ල ලේඛනගත කරමින් සමස්ත ක්‍රියාවලිය හඳුනා ගැනීම සිදු කළ යුතුයි.

05. අවධානම් තක්සේරුව සම්පූර්ණ කිරිම

මෙකී විෂය සම්බන්ධයෙන් වූ අවධානම යනු ළමයෙකුට හෝ යෞවනයෙකුට කායිකව, මානසිකව හෝ ලිංගිකව අන්තර්ජාලය ඔස්සේ යම් අපයෝජනයක් සිදු වීමට ඇති ඉඩකඩයි. එකී අවධානම් මොනවාද යන්න හා ඒවා තක්සේරුකරණයට ලක්කර ගැනීම මෙහිදී සිදු වනු ඇත. ඒ අනුව ඔබගේ පරිශ්‍රය තුළළමයින්ට හෝ යෞවනයින්ට බලපාන සුවිශේෂී අවධානම් සාධක මොනවාද; එකී අවධානම් සාධක සඳහා පවත්නා ආරක්ෂක පදිධතීන් මොනවාද; ඒ වෙනුවෙන් සකසා ගත යුතු ආරක්ෂක පද්ධති මොනවාද යනාදිය මෙහිදී විමසා බලයි. ඒ අනුව ඒවා නිර්වචනය කර ගනිමින් එකී අවධානම් සාධක ආරක්ෂක සාධක බවට පත්කර ගැනීමට කටයුතු කිරිම කළ යුතුය.

06. සුරක්ෂිත අන්තර්ජාල භාවිතයක් ගොඩනැගීම උදෙසා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම

හඳුනාගත් අවධානම් සාධක ආරක්ෂක සාධක බවට පත් කර ගැනීම උදෙසා එය කළමනාකරණය කර ගැනීමට අවශ්‍යය. ඒ සඳහා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සංවර්ධනය කර ගත යුතුය. ඒවා ක්‍රියාත්මක කළ යුතුය. අධීක්ෂණය කළ යුතුය. නියාමනය කළ යුතුය. එහිදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නන්, ප්‍රතිලාභීන්, හවුල්කරුවන්, ප්‍රජාව හා තාක්ෂණය භාවිත කරන්නන් විෂයෙහි එකිනෙකට වෙනස් වූ සුවිශේෂී ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සකසා ගත යුතු වේ. විශේෂයෙන්ම ළමා ආරක්ෂක ප්‍රතිපත්ති, පුහුණු කිරීමේ ප්‍රතිපත්ති, අධීක්ෂණ ප්‍රතිපත්ති, හෙළිදරවු කිරීමේ ප්‍රතිපත්ති, මැදිහත්කරන ප්‍රතිපත්ති, තාක්ෂණික විද්‍යා ප්‍රතිපත්ති, දෙමාපියන් විෂයෙහි වූ ප්‍රතිපත්ති මෙන්ම ඊට අදාළ ආචාර ධර්ම මාලාව සැකසීම සිදු විය යුතුය. එකී සෑම ප්‍රතිපත්තියක්ම ලිඛිතව පැවතිය යුතු අතර එකී ප්‍රතිපත්ති සෑම විටම භාවිතයට ගත යුතුය.

උදා- පාසල තුළ අන්තර්ජාලය භාවිත කරන ආකාරය, යම් ලෙසකින් ළමයෙකු අන්තර්ජාලය හරහා හිංසනයට ලක් වුව හොත් වාර්ථා කරන ආකාරය, එකී හිංසනයෙන් ළමයා ආරක්ෂාකරන ආකාරය, එවැනි ළමයෙකුට පාසල තුළින් උපකාර කරන ආකාරය, වරදකරුවන් සම්බන්ධයෙන් මැදිහත් වන ආකාරය, වරදකරු පාසල් පද්ධතියේ අයෙකු නම්

ක්‍රියාත්මක වන ආකාරය ආදී අංශ කෙරෙහි අවධානය යොමු කරමින් එකී ප්‍රතිපත්ති නිර්මාණය විය යුතුය.

07. ළමයින් / යෞවනයින් හා වැඩිහිටියන් කෙරේ අධ්‍යාපනය ලබා දීම

නිලධාරීන්,ළමයින්, දෙමාපියන්, වැඩිහිටියන් මෙන්ම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන සියලු පාර්ශ්වයන් උදෙසා අධ්‍යාපනය ලබා දිය යුතුය. එහි දී ඒ ඒ කාණ්ඩයට සුවිශේෂි වූ කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය. නිලධාරීන් හා කාර්ය මණ්ඩලය සඳහා ව්‍යාපෘතිය පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් ලබා දිය යුතු අතර එහි ක්‍රියාවලිය, වගකීම, විෂය කරුණු, වැළැක්වීමේ ක්‍රම, නීතිය, ප්‍රඥප්ති, පනත්, අවධානම් සාධක, ආරක්ෂක සාධක, ආචාර ධර්ම, මැදිහත්කරණය, හෙළිදරවුවකදී කටයුතු කිරීම, ආදී සමස්තය ආමන්ත්‍රණය කිරීම ඉතා වැදගත්ය. ළමයින් සතු අයිතිවාසිකම්,ළමා අපයෝජන, අන්තර්ජාලය හරහා සිදු විය හැකි හිංසා, අපරාධ, අවභාවිතයන්, ඒවායින් ආරක්ෂාවීමේ ක්‍රම, ආචාර ධර්ම, හෙළිදරවු කිරීම වැනි කරුණු ආකර්ෂණීය අයුරින් කියා දිය යුතුය. දෙමාපියන් හා වැඩිහිටියන් විෂයෙහි ද මෙකී කරුණු අදාළ විය යුතු වුවත් එහි දී ඔවුනගේ වගකීම් හා යුතුකම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය. දෙමාපියන් ලෙස අන්තර්ජාල අවධානම් සාධක කළමනාකරණය කිරීම අන්තර්ජාල භාවිතය, අධීක්ෂණය, නියාමනය නිවසේ, පාසලේ, ආයතනයේ අන්තර්ජාල භාවිතය සම්බන්ධ ළමා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම,

ආචාර ධර්ම සඳහා වටිනාකමක් ලබා දීම වැනි කරුණු කෙරේ අවධානය යොමු කළ යුතුය.

08. හෙළි දරවු කිරීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

මේ පිළිබඳව ළමයින් හා ප්‍රජාව දැනුවත් කිරීමත් සමග වාර්ථාකරණය ඉහළ යා හැකිය. එසේ යම් අපරාධයක් හෝ අවභාවිතයක් පිළිබඳව හෙළිදරවු කිරීමේ දී නිවැරදිව ඊට ප්‍රතිචාර දැක්විය යුතුය. එකී ප්‍රතිචාරයන් සුදුසු කල්හී සුදුසු ආකාරයෙන් අප්‍රමාධව කළ යුතුය. එහිදී රහස්‍යභාවය ආරක්ෂා කරමින්, ද්විතීක වින්දිත බවට පත් නොවන ලෙස ළමයාගේ උපරිම යහපත වෙනුවෙන් ප්‍රතිචාර දැක්විය යුතුයි.

09. අභියෝගවලට මුහුණ දීම

මෙවනි ව්‍යාපෘතියක් සිදු කිරීමේ දී විවිධාකාරයේ අභියෝග පැමිණිය හැකිය. ඒ අතර සමාජීය බාධක, සංවිධානමය බාධක, තාක්ෂණික සීමාකම්, පෞද්ගලික බාධක, මූල්‍යමය බාධක,ළමයින් විෂයෙහි අභියෝග වැනි සාධක රැසක් බලපෑම් කළ හැකිය. එකී බධක කල්තියා හඳුනාගැනීමට හැකි විය යුතු අතර ඒ සඳහා ශක්තිමත්ව මුහුණ දිය යුතුය.

10. සුරක්ෂිත පරිසරය පවත්වාගෙන යාම

ඉතා කැපවීමෙන් උනන්දුවෙන් ගොඩනගා ගත් සුරක්ෂිත බව දිගටම පවත්වා ගෙන යා යුතුය. එසේ

පවත්වාගෙන යාමට නම් එකී ක්‍රියාවලිය තුළ මතු වූ අභියෝග ප්‍රශ්න ගැටළු සුපරීක්ෂණය, විශ්ලේෂණය, ප්‍රතිචාර දැක්වීම, ඇගයීම සිදු කළ යුතුය. ඒ සඳහා ඔබට SARA[32] ප්‍රවේශය භාවිත කළ හැකියි.



රූප සටහන් - 07

[32] .Akhgar Babak, Staniforth Andrew & Bosco Francesca,Cyber Crime and Cyber Terrorism Investigator’s Handbook,2014,chapter 4,pp,36.

06.9. අන්තර්ජාල අවභාවිතය අභියෝගාත්මක චර්යාවක් ලෙස වර්ධනය විය හැකිද?

අන්තර්ජාල අවභාවිත කිරීම ළමයින් තුළ සිය චර්යාවේ අක්‍රමතාවක් ලෙස මතු වෙමින් පැවතීම ද වර්තමානයේ හඳුනා ගත හැකියි. එකී චර්යාවන් ළමයින්ගේ සංවර්ධනයට, පැවැත්මට හා ආරක්ෂාවට ගැටළු රැසක් මතු කළ හැකිය. එබැවින් අන්තර්ජාල අවභාවිතය අභියෝගාත්මක චර්යාවක් ලෙස වර්ධනය වනුයේ කෙසේද යන්න විමසා බැලීම කාලෝචිතය. අභියෝගාත්මක චර්යාවක් යනු

"පුද්ගලයෙකුට හෝ ඔහු හෝ ඇය වටා සිටින ප්‍රජාවගේ ආරක්ෂාවට හෝ පුද්ගල ජීවිතයේ ගුණාත්මකභාවයට තර්ජනයක් වන, හැසිරීමේ තීව්‍රතාවය, වාර ගණන සහ කාල පරාසය අනුව සාමාන්‍ය නොවන, සංස්කෘතික වශයෙන් සාමාන්‍ය ප්‍රජාවගේ ව්‍යුහය තුළ ප්‍රතික්ෂේපිත යම් චර්යාවන් ය."

(Royal Collage of Psychiatrist - British Psychiatric Society - 2006)

මෙම නිර්වචනය අනුව අන්තර්ජාල භාවිතයේ අභියෝගාත්මක බව පැතිකඩ කිහිපයක් ඔස්සේ අවධානයට යොමු කළ හැකිය. එනම්;

- අන්තර්ජාල අවභාවිතය ළමයාගේ හෝ ඔහු හෝ ඇය වටා සිටින අයගේ ආරක්ෂාවට තර්ජනයක් ඇති වීම
- ළමයාගේ පුද්ගලික ජීවිතයේ ගුණාත්මකභාවයට තර්ජනයක් මතු වීම
- ළමයා අන්තර්ජාලය තුළ හැසිරීමේ තීව්‍රතාවය, භාවිතයේ වාර ගණන, භාවිතා කිරීමේ කාල පරාශය සාමාන්‍ය නොවීම
- අන්තර්ජාල අවභාවිතය තුළින් සංස්කෘතික වශයෙන් ප්‍රතික්ෂේපිත චර්යාවන් මතු වීම.

යන පැතිකඩ කිහිපය පිළිබඳව වෙන් වෙන්ව අවධානය යොමු කර බලමු.

අන්තර්ජාල අවභාවිතය පුද්ගලයාගේ හෝ ඔහු හෝ ඇය වටා සිටින අයගේ ආරක්ෂාවට තර්ජනයක් ඇති කරනුයේ කෙසේද යන්න විමසා බැලීමේ දී අන්තර්ජාලය භාවිත කරමින් සිදු කරනු ලබන හිංසාකාරී සයිබර් අපරාධ හෙවත් grooming, sextin, bullying, Cyberstaking, Child abuse Image, මෙන්ම Cyber terrorism යන හිංසාවන් හී දිගින් දිගටම නිරත වීම නිසා ඇති වන අනාරක්ෂිතභාවයන් මෙහිදී පෙන්වා දිය හැකිය. වැඩිහිටියන් මෙසේ හැසිරෙමින් ළමා ප්‍රජාව අනාරක්ෂිත කළ හැකි සේම ළමයින්ද මෙකී ක්‍රියාවල නිරත වීම හරහා ඔහු මෙන්ම ඔහු වටා සිටින අනෙකාත් අනාරක්ෂිත කළ හැකිය. ඒ අනුව මෙවැනි අනාරක්ෂිත චර්යාවන් තුළ දිගින් දිගටම ළමයෙකු නිරත

වන්නේ නම් එය අන්තර්ජාලය භාවිතය තුළ මතු වූ අභියෝගාත්මක චර්යාවක් ලෙස හඳුනා ගත හැකියි.

අන්තර්ජාලය තුළ අනාරක්ෂිතව කටයුතු කරමින් හෝ අනවශ්‍යය ක්‍රියාවල නිරත වෙමින් කාලය නාස්ති කරමින් හෝ නිස්ඵල ක්‍රියාවල නිරත වෙමින් හෝ සිය ප්‍රතිරූපයට හානි සිදු කර ගනිමින් ළමයාගේ පෞද්ගලික ජීවිතයේ ගුණාත්මකභාවයට තර්ජනයක් මතු කර ගනිමින් අන්තර්ජාලය තුළ ක්‍රියාත්මක වීම ද දිගින් දිගටම සිදු වන්නේ නම් එය ද ළමයා තුළ අන්තර්ජාලය සම්බන්ධයෙන් අභියෝගාත්මක චර්යාවක් ගොඩනැගීමට ඉඩ කඩ නිර්මාණය වනු ඇත.

අන්තර්ජාලය තුළළමයාගේ හැසිරීමේ තීව්‍රතාව භාවිතාකරන වාර ගණන හෝ භාවිතයේ කාල පරාසය සාමාන්‍ය නොවන විට ළමයාගේ අනෙකුත් අධ්‍යාපන කටයුතුවලට බාධා පැමිණීම, සාමාන්‍ය ජීවිතයේ කටයුතු අවුල් සහගතවීම, අසාමාන්‍ය චර්යා වර්ධනයවීම මෙන්ම අන්තර්ජාලයට ඇබ්බැහි වීම වැනි කරුණු මත ද අන්තර්ජාල අවභාවිතාවක් නිර්මාණය වන අතර එයද අභියෝගාත්මක චර්යාවක් බවට පත් විය හැකියි.

සිය සංස්කෘතියට නොගැලපෙන චර්යාවන් එළි දක්වමින් අන්තර්ජාලය තුළ නොහික්මුණු අයුරින් කටයුතු කිරීම තුළ තමාට හා අන් අයට මෙන්ම සිය සංස්කෘතියට ද සිදු වන බලපෑම සුළු පටු නොවනු ඇත. එකී සංස්කෘතික

විරෝධී ඇතැම් චර්යාවන් නීතියට අනුව වරදක් හෝ අපරාධයක් ලෙස නිර්වචනය නොවුවත් සමාජ බැමි ලිහී ගොස් ඒ හරහා පසු කාලීනව අපරාධකාරී චර්යාවන් මතු වීමට ඉඩ කඩ සැකසිය හැකිය. එවන් සදාචාර විරෝධී චර්යාවන් තුළ අන්තර්ජාලය ඔස්සේ දිගින් දිගටම නිරත වීම අභියෝගාත්මක චර්යාවක් ලෙස මතු විය හැකි අතර එය සමාජ පාලනය බිඳ වැටීමට ඉවහල් විය හැක. ඒ අනුව

- අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන අපරාධ/හිංසාවන්
- අන්තර්ජාලය තුළින් සිය හැදියාව ශික්ෂණය හා ප්‍රතිරූපය බිඳ වැටෙන ක්‍රියා
- පාලනයකින් තොරව අන්තර්ජාලය අධිභාවිතය හා ඇබ්බැහිය
- අන්තර්ජාලය හරහා සිදු වන සංස්කෘතික හෝ සදාචාර විරෝධී චර්යා

යන අවභාවිතයන් හඳුනා ගත හැකි අතර ඒවා අභියෝගාත්මක චර්යා ලෙස ළමයා තුළ මතු විය හැකි බව මේ අනුව පැහැදිළි වේ.

එවන් අභියෝගාත්මක චර්යාවන් කළමනාකරණය කිරීම සඳහා මැදිහත්කරණය ළමයින්ගේ සංවර්ධනය වෙනුවෙන් නිතැතින්ම සිදු විය යුත්තකි. ඒ අනුව අන්තර්ජාල අවභාවිතය නිසා ඇති වන අභියෝගාත්මක චර්යාවන් කළමනාකරණය කිරීමට විද්‍යාත්මක ක්‍රමවේදයන් අවශ්‍ය වේ.

06.10. සයිබර් අපරාධකරුවන්, වින්දිතයින් හා අවභාවිතකරන්නන් සඳහා මනෝවිද්‍යාත්මක උපදේශනය

"උපදේශනය යනු උපදෙස් දීමක් නොවේ"

"මනුෂ්‍යයා වනාහී යහපත්ය. විශ්වාස කටයුතුය. තාර්කික බවින් යුක්තය. ඔහු වෙනස් වීමට මුහුණදීමට හැකියාව ඇත්තෙකි. තවද කිසියම් ඉලක්කයක් දෙසට ඔහු ගමන් කරයි. එය ආත්ම සාක්ෂාත්කරණයයි. එයට සහජ නැඹුරුතාවයක් ඔහු තුළ ඇත. පුද්ගලයා සම්පත් ගොඩකි. විවිධ ශක්තීන් ඔහු සතුය. තීරණ ගැණීමේ හැකියාව ඔහු සතුය. එම යථාර්ථය අවබෝධ කරලීම තුළින් පුද්ගලයාගේ ජීවන ගමන් මග ධනාත්මක දිසාවකට යොමුකරවීමට සහය දැක්වීම උපදේශනයෙන් සිදු වේ" (කාල් රොජර්ස්)[33]

ඒ අනුව සිය සේවාලාභියා පිළිගනිමින්, විශ්වාසනීය සබඳතාවයක් ගොඩනගා ගනිමින්, ඔහු හෝ ඇය ගේ ගැටළු හඳුනා ගනිමින්, එය තක්සේරුකරණයට ලක් කරමින්,

විශ්ලේෂණය කරමින්, ඉලක්ක සකසාලමින්, සුදුසු මැදිහත්කරණය සිදු කර නැවත නැවත පසුවිපරම් සිදු කරමින්

---

[33]. පෙරේරා ඥානදාස,උපදේශන මනෝ විද්‍යාව,2016,සහස්‍ර ප්‍රකාශකයෝ

සිදු වන විද්‍යාත්මක ක්‍රමවේදයක් ලෙස උපදේශනය හඳුනාගත හැකිය.

අන්තර්ජාලය නිවැරදිව භාවිත කිරීම, අන්තර්ජාලය තුළ මතු විය හැකි තාක්ෂණික අභියෝග ජය ගැනීම, අන්තර්ජාල ආචාර ධර්ම බිඳවැටීම, අන්තර්ජාලය ඔස්සේ යහපත් සන්නිවේදන ක්‍රමවේද පවත්වා ගැනීම, යහපත් සබඳතා ගොඩනගා ගැනීම, අන්තර්ජාලය ඔස්සේ යම් හිංසාකාරී තත්ත්වයකට ලක්ව මානසිකව බිද වැටීම, සයිබර් අපරාධ සඳහා යොමු වීම, අන්තර්ජාල ක්‍රියාකාරකම් සඳහා ඇබ්බැහි වීම,ළමයා වටා ඇති අන්තර්ජාල අවධානම් සාධක තක්සේරුකර ගැනීම, ඇතුළුව අන්තර්ජාලය ඔස්සේ ඇති විය හැකි මානසික ව්‍යාකූලතාවයන්ගෙන් අත්මිදීම උදෙසා මනෝ විද්‍යාත්මක මැදිහත්කරණයක් අවශ්‍ය විය හැකිය. දැනට ලෝකයේ මෙකී කාරණය සම්බන්ධයෙන් වෙනම විෂය ක්ෂේත්‍රයක් වර්ධනය වී නොමැති අතර Cyber Counselling ලෙස අන්තර්ජාලය හරහා උපදෙස් ලබා දීමක් පමණක් හඳුනාගත හැක. නමුත් මෙම ක්ෂත්‍රයේ පවත්නා සුවිශේෂත්වය සැලකිල්ලට ගනිමින් අන්තර්ජාලය ආශ්‍රිත නව විද්‍යාත්මක උපදේශනයක් ගොඩනැගීමේ අවශ්‍යතාවයක් පවතී.

අන්තර්ජාලය කල්පිතයක් වුවත් භෞතිකව පුද්ගලයාට බලපෑම් කිරීමට ඇති හැකියාව අති මහත්ය. කෙනෙකු යමෙකුට මුහුණට මුහුණ ලා අපහාස කළ හැකිය. ලොව පවත්නා හානිකරම වචනයෙන් බැන වැදිය හැකිය. එහෙත්

එම සිදු වීම ඒ වටා සිටින සුළු පිරිසකට පමණක් ඇසෙනු ඇත. නමුත් අන්තර්ජාලය ඔස්සේ එවන්නක් සිදු වීම මුළු ලෝකයක් ඉදිරියේ සිදු වන්නක් වේ. එබැවින් ආත්මයට සිදු විය හැකි හානිය ඉතා බරපතල විය හැකි සේම එම සිදු වීම නැවත නැවත ලෝකය ඉදිරියේ ප්‍රදර්ශනය විය හැක. එබැවින් අන්තර්ජාලය හරහා වන අපරාධ නිසා බොහෝ පුද්ගලයින් දැඩි මානසික බිඳ වැටීම්වලට ලක් විය හැකිය. පහතින් දක්වනුයේ අන්තර්ජාල අපරාධවලට වැඩි වශයෙන්ම පුද්ගලයින් දක්වා ඇති චිත්තවේගික ප්‍රතිචාරයන් දහයයි. (Top 10 emotional reactions to cyber crimes)[34]



ප්‍රස්ථාර අංක- 07

[34].http://www.symantec.com/content/en/us/home_homeoffice/media/pdf/cybercrime_report/Norton_USA-Human%20Impact-A4-2.pdf)

අන්තර්ජාලය ඔස්සේ යම් හිංසනයකට හෝ අවභාවිතයකට ලක් වූ ළමයින් විෂයෙහිද ඉහත ප්‍රතිචාර සාධාරණය. එබැවින් ළමයින් සතු අත්දැකීම් මද බව නිසා හෝ වෙනත් අයෙකුට එකී ගැටළුව ප්‍රකාශ කිරීමට නොහැකි නිසා හෝ එවැනි ගැටළුවකට මුහුණ දීමට ශක්තිය, කුසලතාවය නොමැති නිසා හෝ තනිව විසඳා ගැනීමට නොහැකිව අර්බුදකාරී තත්ත්වයකට ලක් වීම නිසා බොහෝ ළමයි තනිව පීඩා විඳිමින් සිය සංවර්ධනයට බාධා ඇති කර ගනිති. ළමයා අන්තර්ජාලය ඔස්සේ මෙවැනි අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දුන් අවස්ථාවලදී බොහෝ දෙමාපියන් හා වැඩිහිටියන් අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙත එතරම් සුභදායක නැත. ළමයාට බැණ වැදීම, දඬුවම් ලබා දීම, ඉලෙක්ට්‍රෝනික උපකරණය තමන් භාරයට ගැනීම විනාශ කිරීම හෝ ප්‍රවේශය තහනම් කිරීම හෝ ප්‍රවේශය නවතා දැමීම මගින් සිදු වූ විනාශය අවම කිරීමට හැකියාවක් නොමැත. ඒ සඳහා ප්‍රතිකාරාත්මක මැදිහත්කරණයක් අවශ්‍ය වේ.

ප්‍රතිකාරාත්මක මැදිහත්කරණයක දී ළමයාට අන්තර්ජාලය වටා ඇති අවදානම් සාධක හඳුනා ගනිමින් එම සාධක තක්සේරුකරණයට ලක් කරමින් එකී සාධක ආරක්ෂිත සාධක බවට පත් කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයන් අනුගමනය කළ යුතුය. එසේම අන්තර්ජාල ක්‍රියාවලියක් හරහා ළමයාගේ සංජානනය විකෘති තත්ත්වයකට ලක් වී ඇත්නම් එය යථා තත්ත්වයට පත්

කරලීමටත් අන්තර්ජාලය හරහා සිදු වන අපගාමී පෙළඹවීම් අවම කරලීමටත් අන්තර්ජාල ක්‍රියාවලියක් නිසා හානි වූ ළමයාගේ ස්වයං අභිමානය හෝ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීමටත් ඒ හරහා වූ කෝපය, බිය, ලැජ්ජාව, හීනමානය, වරදකාරී බව පාලනය කිරීමටත් අන්තර්ජාලය වගකීමෙන් භාවිත කිරීමටත් අන්තර්ජාලය හරහා යහපත් සබඳතා ගොඩනගා ගැනීමටත් අන්තර්ජාලය හෝ පරිගණකය භාවිතයේ දී ඇති වන මානසික ආතතීන් කළමනාකරණය කර ගැනීමටත් විද්‍යාත්මක මැදිහත්කරණයක් ලබා දීමේ අවශ්‍යතාවය තිබේ.

මෙකී සුවිශේෂී මැදිහත්කරණයක් සිදු කිරීමට නම් අන්තර්ජාලය ඔස්සේ හිංසනයක් හෝ අවභාවිතයක් වන බවට තොරතුරු මතුපිටට පැමිණිය යුතුය. එහෙත් බොහෝ ළමයින් අන්තර්ජාලය ඔස්සේ සිදු වන අපයෝජන, හිංසා හෝ ඇබ්බැහිවීම් හෙළි කිරීමේ ප්‍රවණතාවය ඉතා අඩුය. ඒ සඳහා බොහෝ විට බලපාන්නේ

- නිවසට හොර රහසේ අන්තර්ජාලයට පිවිසීම
- නැවත අන්තර්ජාලයට පිවිසීම තහනම් කරයි යන බිය
- අන්තර්ජාල හිංසනයෙන් අත් විඳි බිය
- කාටවත් නොකියන ලෙස තර්ජනය කර තිබීම
- එකී හිංසනය සුළුකොට තැකීම
- අන්තර්ජාලය ඔස්සේ සිදු වන හිංසා සාමාන්‍යකරණය කර ගැනීම

- එකී හිංසනය සඳහා තනිවම විසඳුම් සෙවීම
- එකී හිංසනය අමතක කර දැමීමට වෑයම් කිරීම
- හිංසාකාරී පුද්ගලයාට ළමයා තවමත් ආදරය කිරීම
- තමා තුළ ඇති වරදකාරී හැඟීම
- අන්තර්ජාල හිංසා වාර්ථා කළ යුත්තේ කාටදැයි නොදැන සිටීම
- තාක්ෂණික සහය ලබා ගත යුත්තේ කාගෙන්දැයි නොදැන සිටීම
- තවත් කරදරයකට වැටීමට සිදු වෙතැයි යන බිය
- ලැජ්ජාවට හෝ අපහසුතාවට හෝ නින්දාවට පත් වීමට සිදු වෙතැයි යන බිය
- එහි ඇති භයානක කම හෝ වරදකාරී බව නොදැන සිටීම
- තමා නිසා පවුල තුළ ගැටළුකාරී තත්ත්වයක් මතුවෙතැයි යන බිය
- හිංසාකාරී පුද්ගලයාගෙන් තවමත් අනිසි ප්‍රතිලාභ බලාපොරොත්තුව

යනාදී කරුණුය.

ළමයාට සිදු වන හිංසා හෙළි නොකරනු ලැබුවත් ඔබගේ නිසි අධීක්ෂණය හෝ නිරීක්ෂණය මත ළමයා අන්තර්ජාලය තුළින් යම් හිංසනයකට හෝ අවභාවිතයකට ලක් වී ඇති බව හඳුනාගැනීමට උත්සාහ දැරීමේ දී භාවිතයට ගත හැකි ඉඟි කිහිපයක් කෙරේ අවධානය යොමු කරමු.

- නිරන්තරයෙන් ළමයා අන්තර්ජාලය තුළ වැඩි කාලයක් ගත කිරීම
- එක් වරම අන්තර්ජාලය ප්‍රතික්ෂේප කිරීම
- අන්තර්ජාලයට යොමු වීමට අධික බියක් හෝ චකිතයක් දැක්වීම
- නුසුදුසු හැසිරීම් පෙන්නුම් කිරීම
- ආත්ම අභිමානය බිඳ වැටී තිබීම
- සමාජ ජාල වෙබ් අඩවි තුළ තබන සටහන්
- අවාචික හෙළිදරවු කිරීම්
- තුන්වන පාර්ශ්වයක් මගින් හෙළිදරවු කිරීම්

ආදී තත්ත්වයන් පිළිබඳ විමසිල්ලෙන් පසු වීමෙන් ළමයාගේ ගැටළුකාරී මානසික තත්ත්වයන් අවබෝධකර ගත හැකිය.

ළමයා විසින් ස්ව කැමැත්තෙන්ම හෙළිදරවු කිරීමක දී හෝ තුන් වන පාර්ශ්වයක් මගින් හෙළිදරවු කිරීමක දී හෝ ඔබ විසින්ම අවබෝධකර ගැනීමක දී හෝ එකී හෙළිදරවුවට ප්‍රතිචාර දැක්වීම ඉතා ප්‍රවේසමෙන් සිදු කළ යුතුය. එහි දී;

- ළමයාගේ තත්ත්වය පිළිගන්න
- ළමයාට එකී හෙළිදරවුව සිදු කිරීමට ආධාර හා සහය ලබා දෙන්න
- ළමයා සනසන්න
- ඔහු/ඇය සුරක්ෂිත ස්ථානයකට රැගෙන යන්න
- ළමයා ප්‍රකාශ කරනු ලබන දෙයට ප්‍රවේසමෙන් සවන් දෙන්න

- ළමයා සිටින අවදානම් තත්ත්වය පිළිබඳව තක්සේරුවක් සිදු කරන්න
- ළමයාට බල නොකරන්න/තර්ජනය නොකරන්න
- ඔබගේ විශ්වාසය තහවුරු කරන්න
- ළමයා පවසන දේවල් සටහන් තබා ගැනීමට අමතක නොකරන්න
- අවශ්‍ය නම් ළමයාගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙමින් ළමයාගේ කැමැත්ත මත බලධාරින් හෝ විශේෂඥයින්ගේ සහය සඳහා යොමු කරවන්න
- ළමයාගේ ආරක්ෂාව වෙනුවෙන් ගත හැකි සියලු විකල්ප භාවිත කරන්න
- තවදුරටත් හිංසනයට පත් නොවීමට හෝ ද්විතීක වින්දිත භාවයට පත් නොවීමට වගබලා ගන්න

ඔබ හොඳ උපකාර කරන්නෙකු ලෙස ළමයා සමග කටයුතු කළ යුතුයි. ඒ සඳහා හොඳ පුහුණුවක් ලබා තිබීම ඉතා වැදගත්ය. විශේෂයෙන්ම පාසල් පද්ධතිය තුළ දී මේ සඳහා ගුරු භූමිකාව මනාව පුරුදු පුහුණු කළ යුතුයි. එකී අනාවරණයෙන් පසු ගැටළුවේ ස්වභාවය හා තත්ත්වය මත පදනම්ව ඒ සඳහා ප්‍රතිකාරාත්මක මැදිහත්කරණයක් සඳහා යොමු කළ යුතුයි.

06.11. මනෝ විද්‍යා උපදේශන ප්‍රවේශයන් ඔස්සේ අන්තර්ජාල ගැටළු අවබෝධකර ගැනීම හා මැදිහත්කරණය

01- මනෝ විශ්ලේෂණවාදී ප්‍රවේශය (Psycho Analytic Approach)



රූප සටහන් - 08

සිද්ධි අධ්‍යයනය-

සිතිජ වයස අවුරුදු 25 ක තරුණයෙකි. ලිංගික අප්‍රාණිකත්වය පිළිබඳව වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වූ මොහු සිය ජීවිතය එපා වී සිටි අතර එම තත්ත්වය මත

පරාරෝපණයට ලක්ව එකී ගැටළුව හැරයාම සඳහා මත්ද්‍රව්‍ය, දුම් වැටි සඳහා ද ඇබ්බැහි වී සිටියේය. විශාදයට ලක්ව සිටි සිතිජ සිය දිවි නසා ගැනීමට ඇති අවධානම සලකා බලා වෛද්‍යවරයා විසින් ඔහු මනෝ උපදේශනය සඳහා යොමු කරන ලදී.

උක්ත ගැටළුව සිතිජ තුළ නිර්මාණය වූයේ කෙසේද යන්න මනෝ විශ්ලේෂණවාදී න්‍යාය පදනම් කර ගනිමින් සොයා බැලීමට උපදේශකයා සමත් විය. ලිංගිකත්වය ඕනෑම පුද්ගලයෙකු සතු ජීව විද්‍යාත්මක ආශයකි. එකී අවශ්‍යතාවය යොවුන් වියට පා තැබූ සිතිජ තුළද මතු විය. ඒ සඳහා යහපත් මගපෙන්වන්නෙකු නොමැති වූ සිතිජ කුඩා කළ සිට අන්තර්ජාලය ඔස්සේ අසභ්‍ය වීඩියෝ නැරඹීමට පුරුදුව සිටි අතර එයින් ලැබූ අත්දැකීම් ප්‍රායෝගික ජීවිතයේ අත්හදා බැලීමට කිහිප විටක් උත්සාහ කළද ඒ සෑම අවස්ථාවකදීම ඔහු අසමත් වී ඇත. එයින් ආතතියට පත්ව ඉච්ඡාභංගත්වයට පත් වූ සිතිජ තුළ "මට එය කළ නොහැකියි" යන සෘණාත්මක විශ්වාසය මනසෙහි (ඉඩ් තුළ) අම්හිරි අත්දැකීමක් ලෙස අභ්‍යන්තරීකරණය වන්නට ඇත. එකී හැඟීම දිගින් දිගටම මනස තුළ ස්ථාපනය වන්නට පටන් ගැනීමත් සමග එකී පීඩනයෙන් අත් මිදීම උදෙසා සංරක්ෂණ ප්‍රයෝගයක් (Defence mechanism) ලෙස එම තත්ත්වය මගහැරයාම සඳහා මත් ද්‍රව්‍ය හා දුම් වැටි සඳහා යොමු වී ඇත. එකී තත්ත්වයන් සියල්ලම මත සිතිජ ලිංගික බෙලහීනතාවයෙන් යුතු අයෙකු බවට පත්වන්නට ඇතැයි

සිතිජගේ මනෝවිශ්ලේෂණවාදි මනෝවිද්‍යා උපදේශකයා රෝග නිධානය අනාවරණය කරගන්නට විය.



මනෝ විශ්ලේෂණවාදී උපදේශන ක්‍රියාවලිය

රූප සටහන් - 09

එකී මූලය සොයා ගැනීමත් සමගම සිතිජගේ මනෝ විද්‍යා උපදේශකයා විසින් යටි සිත තුළ සැඟව තිබූ අභිහිරි මතකය එළියට රැගෙන, එය සිතිජගේ තාර්කික මනස හෙවත් Ego තුළට යොමු කර ගැටළුව පිළිබඳව තාර්කිකව සිතා බලා අතාර්කික බව අවබෝධ කරගන්නට ඉඩ කඩ සලසාලනු ලැබීය. ඒ අනුව උපදේශනය හා වෛද්‍ය ප්‍රතිකාර දිගින් දිගටම ලබා ගැනීමට සිතිජ පොළඹවනු ලැබීය.

02- චර්යා හැඩගැස්වීමේ ප්‍රවේශය (Behaviour Modification Approach)

චර්යාවාදීන් ලෙස මිනිසාගේ මනස යන සංකල්පය බැහැර කළ අතර ඒ වෙනුවට චර්යාව යන්න ඉදිරිපත් කරන ලදී. එබැවින් මනස සැකසීම වෙනුවට චර්යාවන් හැඩගැස්ස වීම සිදු කළයුතු බව අවධාරණය කරයි. ඒ සඳහා උත්තේජ ප්‍රතිචාර න්‍යායත් උපස්ථම්භන න්‍යායත් චර්යා වාදීන් විසින් පෙන්වා දෙනු ඇත.

උත්තේජය ⟶ ප්‍රතිචාරය = චර්යාව

Stimulation ⟶ Response = Behaviour

S ⟶ R = Bond

රූප සටහන් - 10

පුද්ගලයාගේ සෑම ක්‍රියාවක්ම උත්තේජයට දක්වන්නා වූ ප්‍රතිචාරයක් බව චර්යාවාදීන්ගේ අදහසයි. මෙකී න්‍යායට අනුව විමසා බලන්නේ නම් අන්තර්ජාලය ඔස්සේ සිදු වන සෑම චර්යාවක්ම උත්තේජයකට දක්වන්නා වූ ප්‍රතිචාරයක් විය යුතුය. පුද්ගලයා තුළ දුස්සමාහිත චර්යාවන් (Maladaptive Behaviour) හෙවත් වැරදි ඉගෙනීමක් මත නුසුදුසු චර්යාවන් නිර්මාණය වන බව පෙන්වා දෙන මොවුන් ඒවා තුළින් පුද්ගලයා තුළ ගැටළුකාරී චර්යාවන්ද නිර්මාණය විය හැකි බව පෙන්වා දෙයි.



රූප සටහන් - 11



රූප සටහන් - 12



රූප සටහන් - 13

මේ ආකාරයට අනිකුත් අපරාධකාරී, ගැටළුකාරී නුසුදුසු චර්යාවන් මෙන්ම අන්තර්ජාලයට ඇබ්බැහි වීම, අන්තර්ජාල හිංසා සිදු කිරීම, අන්තර්ජාල අපරාධ මෙන්ම අවභාවිතයන්ද ගොඩ නැගිය හැකිය.

මේ අයුරින් නිර්මාණය වන නුසුදුසු චර්යාවන් සුදුසු චර්යාවක් බවට පත් කිරීමට ද හැකියාව පවත්නා බව චර්යාවාදීන්ගේ අදහසයි.



රූප සටහන් - 14



රූප සටහන් - 15

චර්යාවන් හැඩගැස්සවීමේ දී මෙකී න්‍යායවාදීන් තවදුරටත් අදහස් දක්වන අතර උපස්ථම්භනය ලබා දීම හරහා ද චර්යා වෙනස් කළ හැකි බව පෙන්වා දෙයි. යහපත්



රූප සටහන් - 16

චර්යාවන් ගොඩ නැන්වීමට හෝ පවත්නා චර්යාවන් ශක්තිමත් කිරීමට ධන උපස්ථම්භන ද, නුසුදුසු චර්යාවන් ඉවත් කිරීමට හෝ දුර්වල චර්යාවන් සකස් කිරීමට සෘණ උපස්ථම්බන ද භාවිත කළ හැකිය. මොවුන්ගේ මතයට අනුව දුස්සමාහිත චර්යාවන් නිර්මාණය වනුයේ කාංසාමය (Anxiety) ප්‍රතිචාරයක ප්‍රතිඵලයක් ලෙසය.

කාංසාමය උත්තේජයකට හටගනු ලබන කාංසාමය ප්‍රතිචාරය තුළින් මතු වන දුස්සමාහිත චර්යාව ඉවත් කිරීමට නම් ඒ සඳහා තරගකාරි ප්‍රතිචාරයක් රැගෙන ආ යුතුය.

ළමයෙකු අන්තර්ජාලය ඔස්සේ විහිළුවට ලක් වීම නිසා (bullying) අන්තර්ජාලය භාවිතා කිරීමට බිය වීම හරහා ළමයා අන්තර්ජාලයට යොමු වීම ප්‍රතික්ෂේප කිරීමක් සිදු වූවා යැයි සිතන්න. එවැනි අවස්ථාවක දී ඒ සඳහා ප්‍රබල එදිරි ප්‍රතිචාරයක් ලබා දීම මගින් ළමයා සුදුසු පරිදි අන්තර්ජාලය පරිහරණය කරන තත්ත්වයක් දක්වා රැගෙන ආ හැකිය. එහි දී ළමයා සුදුසු පරිදි අන්තර්ජාල පරිහරණයට නැවත රැගෙන ඒමට නම් ළමයාගේ මනස හා සිරුර ඉහිල්

කරමින් (Relaxation) එවැනි විහිළුවට ලක්වීම්වලට මුහුණදීමට සමත් කුසලතාවයන් ළමයා තුළ නිර්මාණය කරමින් (Assertive Training) නැවත කාංසාවට ලක් නොවී සිටීමට සමත් කුසලතාවයක් නිර්මාණය කළ යුතුය.

03. ප්‍රජානන චර්යා ප්‍රවේශය/හේතුවාදී ප්‍රවේශය (Cognitive Behavior Approach/Rational Approach)



රූප සටහන් - 17

මොවුන් සඳහන් කරනුයේ උත්තේජය හා ප්‍රතිචාරය අතර තුන්වන සාධකයක් පවත්නා බවයි. එය ප්‍රජානනය (Cognitive) නම් වේ. උත්තේජ ප්‍රතිචාර න්‍යායට අනුව එකම උත්තේජයකට ලැබෙන ප්‍රතිචාරය එකක් විය යුතුයි. නමුත් සාමාන්‍ය ලෝකයේ දී එය එසේ වන්නේ නැත. මන්ද යත් ප්‍රජානනය යන සාධකය නිසා උත්තේජයකට එක් ප්‍රතිචාරයක් නොව ප්‍රතිචාර රැසක් ලැබිය හැකිය. අන්තර්ජාලය ඔස්සේ නාඳුනන ගිණුම් හිමියෙකු විසින් ළමුන් හතර දෙනෙකුගේ මුහුණු යොදා සකසනු ලැබූ අසභ්‍ය

පිංතූර හතරක් එම ළමයින් හතර දෙනාගේ ගිණුම් හතරට එකම තත්ත්වයන් යටතේ යොමු කළ හොත් ඔවුන් සියලු දෙනාම එකම ප්‍රතිචාරය නොදක් වනු ඇත. එය එසේ වුයේ ප්‍රජානනය විසින් ප්‍රතිචාර වෙනස් කළ හැකි බැවිනි.

අන්තර්ජාලය ඔස්සේ ළමයින් මුහුණ දෙන ප්‍රධානතම ගැටළුව වනුයේ ලිංගිකත්වය මුල් කර ගත් හිංසනයන්ට ගොදුරු වීමයි. ළමයින්ගේ නිරුවත් පින්තූර හෝ අසභ්‍ය ලෙස සකසනු ලැබූ පින්තූර හෝ වීඩියෝ අන්තර්ජාලයට මුදා හරිමින් ළමයින්ට හිංසා කිරීම හා ප්‍රතිරූපයට හානි සිදු කිරීම බහුලව දක්නට ලැබේ. එවැනි අවස්ථාවල දී ළමයා තුළ ලැජ්ජාව, බිය, අවමානය, කුතුහලය, වරදකාරී බව වැනි චිත්තවේගයන් හරහා සිය ආත්ම සම්මානනය හෙවත් තමා පිළිබඳ වටිනාකමට දැඩි ප්‍රහාරයක් එල්ල වනු ඇත. එය පදනම් කර ගනිමින් ළමයා තුළ සෘණාත්මක විශ්වාස රැසක් මතු විය හැකියි.

- මම හරිම නරක ළමයෙක්
- මම හරිම කාලකන්නි ළමයෙක්
- මා නිසා අපේ මුළු පවුලටම ලැජ්ජා වෙන්න සිදු වුණා
- මට දැන් ලෝකෙට මුහුණ දෙන්න බෑ
- මම නරක කෙනෙක් කියලා හැමෝම හිතාවි
- දැන් මට ඉඳල වැඩක් නෑ
- මගේ මුළු ආත්මයම ඉවරයි

අදී ලෙස සෘණාත්මක පුරෝකථන රැසක් ළමයා තුළ මතු වන්නට පුළුවනි.



ෆනෙල් ආකෘතිය (1998)

රූප සටහන් - 18

එකී හැගීම් දිගින් දිගටම ළමයා තුළ වර්ධනය වන්නට ඉඩ හැරීම තුළ ඔහු හෝ ඇය කාංසා තත්ත්වයට (Anxiety) හෝ දුස්සමාහිත චර්යාවන් (Maladaptive Behaviour) ගොඩ නැගීමට ඉඩ සැලසේ. එවැනි චර්යාවක් ළමයා තුළ දිගින් දිගටම පැවතීම තුළ එම චර්යාව ස්ථිර චර්යාවක් හෝ චින්තනයක් බවට ලක්වීම නිසා නිතර නිතර ළමයා තමාව විවේචනයට ලක් කර ගත හැකිය. එයින් විශාදයට

(Depression) ලක් විය හැකි ළමයා නැවත නැවත මෙකී චක්‍රයට ඇද ගනු ලැබීමෙන් ගැටළුව වඩවඩාත් ප්‍රබල විය හැකිය. ඉහත සඳහන් ෆනෙල් (1998) ආකෘතිය අනුව එය අවබෝධ කර ගත හැකියි.



රූප සටහන් - 19

(ගැටළුවේ නඩත්තු චක්‍රය-Maintaining Circle)

උක්ත ගැටළුව දෙස නැවතත් විමසා බැලීමේ දී අන්තර්ජාලයට නිරුවත් පින්තූර එක් කර තිබීම හේතුවෙන් ළමයාගේ සිතුවිලි ව්‍යාකුල බවට පත් වී දැඩි දුකක්, කාංණස්සල්ලක්, වරදකරි බවක්, අපේක්ෂා භංගත්වයක්, ගොඩ නගෙමින් "මං ඔහුගෙන් පළිගන්නවා; ඔහු මරණවා; මම මැරෙනවා" ආදී සිතුවිලි දිගින් දිගටම පැවතීම නිසා ඔහු ගේ හෝ ඇයගේ ශාරීරික ප්‍රතික්‍රියා පවා අඩ පන විය හැකිය. ශරීරයේ සමබරතාවය ගිලිහී යාම, පේශී තද වීම, වෙව්ලීම,

ආහාර අරුචිය වැනි තත්ත්වයන් මතු විය හැකියි. එහි අවසාන ප්‍රතිඵලය වනුයේ සිය දෛයිනික ජීවිතයේ සාමාන්‍ය චර්යාවන්ට පවා බාධා ඇතිවීමයි.

- ළමයාගේ එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් බිඳ වැටීම
- අභියෝගවලට මුහුණ දීමට නොහැකි වීම
- සිය දිවි නසා ගැනීමට තැත් කිරීම
- පළිගැණීම්වල නිරත වීම
- සමාජයෙන් මුළු ගැන් වීම
- පාසල හැර යාම හෝ පාසල් අධ්‍යාපනය බිඳ වැටීම
- සමාජ සබඳතා අවම කිරීම
- අන්තර්ජාලය හෝ පෙර කැමති දේවල් ප්‍රතික්ෂේප කිරීම
- විනෝදාත්මක කටයුතුවලින් ඈත් වීම
- තමා පිළිබඳ අඩු සැලකිල්ල ආදී චර්යාත්මක ලක්ෂණ මතු කළ හැකිය.

ඒ අනුව සිතුවිලි, චිත්තවේග, ශාරීරික ප්‍රතික්‍රියා මෙන්ම චර්යා අතර සමබරතාවය ගිලිහී යාම සිදු විය හැකි අතර ඒවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා උපදේශකයා විසින් මැදිහත්කරණය සිදු කළ යුතුය.

රූප සටහන් -20

උක්ත ගැටළුව තවත් තීව්‍ර කරමින් "මගේ නමින් අසභ්‍ය ගිණුමක් සකස් කරලා එකේ පිංතූරත් දාල තියනවා" යනුවෙන් ළමයින් නිතර මැසිවිලි නගනු අසන්නට ලැබේ.

එවැනි සිදුවීමක් (Active Event) ඇති වූ සැණින් බොහෝ ළමයින් කලබලයට පත්ව වැරදි විශ්වාසයන් (Beliefs) ඇති කර ගැනීමක් සිදු වේ. "මට සමාජයට මුහුණ දෙන්න බැහැ; හැමෝම මං ගැන වැරදියට හිතාවි" ආදී සෘණාත්මක විශ්වාස රැසක් ගොඩ නැගීම සාමාන්‍යයෙන් සිදු වේ. එකී විශ්වාසයන්ට අනුව සිය හැඟීම් වෙනස් කර ගැණීම (Consequence) නිසා ළමයා මෙතෙක් තිබූ යහපත් හැඟීම් වෙනස් කරමින් සෘණාත්මක හැඟීම් ගොඩ නගා ගැනීම තුළින් ගැටළුකාරී තත්ත්වයකට පත් විය හැකියි. ABC න්‍යාය අනුව එසේ ගොඩ නැගුණු අක්‍රමතාවය DEF මගින් බිඳ දමන ආකාරය ද ඇල්බර්ට් එලිස් පැහැදිලි කර ඇත.

උක්ත ගැටළුව නිර්මාණය වීම දෙස සුපරික්ෂාකාරීව බැලූ විට එම ගැටළුව මතු වීමට හේතු වුයේ ළමයා එම සිදුවීම දෙස බැලූ ආකාරයයි. බාහිර පරිසරයෙන් පැමිණි අනපේක්ෂිත සිදුවීමක් නිසා එකී ගැටළුව ළමයාට නිවැරදිව තේරුම් ගැනීමට හා අවබෝධකර ගැනීමට නොහැකි වීම හෙවත් ළමයාගේ ප්‍රජානනයේ පැවති විකෘතිතාවයක් නිසා ළමයාගේ හැසිරීම විකෘති වී ඇත. ඒ අනුව එකී ගැටළුවට මුල් වූ අහේතුක සිතුවිලි නිවැරදිව පරීක්ෂාකර බලා (Debeting) එකී අහේතුක සිතුවිලි ඉවත් කරගැනීමට ළමයාට සහය දිය යුතුය. එම සිදුවීම පිළිබඳව ළමයා පීඩනයට පත් නොවන ලෙස,ළමයා යටපත් කිරීමේ අරමුණින් තොරව,ළමයා ගොඩ නැගීමේ අරමුණින් යුතුව ඒ දෙස තාර්කිකව බැලීමට ළමයා පෙළඹවීමේදී ළමයා තුළ වූ

- තාක්ෂණික වශයෙන් වූ වැරදි ආකල්ප
- සමාජ මතය පිළිබඳ වැරදි ආකල්ප
- හිංසකයා පිළිබඳ වූ වැරදි ආකල්ප
- සිය ප්‍රතිරූපය පිළිබඳ වැරදි ආකල්ප
- නීතිය හෝ මැදිහත්කරුවන් පිළිබඳ වූ වැරදි ආකල්ප
- දෙමාපියන් හෝ සහයෝගී කණ්ඩායම් පිළිබඳ වැරදි ආකල්ප
- හානිය තක්සේරුකරණය පිළිබඳ වූ වැරදි ආකල්ප

ආදිය පිළිබඳ ආවධානය යොමු කරමින් එදිරි සංවාදය (Confrontation) සිදු කළ යුතුය.

"ඔබේ නම යොදා ගෙන අන්තර්ජාල ගිණුමක් සකසා ඇති බව සැබෑය. එහෙත් ඔබගේ නම පවත්නා අය සිටිනුයේ ඔබ පමණක් නොවේ. තවත් බොහෝ පිරිසක් ඔබේ නමින් සිටිනු ඇත". ආදී වශයෙන් තේරුම්කර දී නම පමණක් යොදා ගෙන ගිණුමක් සකසා තිබූ පමණින් කලබල විය යුතු නැති බව අවබෝධ කර දිය යුතුය.

"ඔබගේ පිංතූර අදාළ ගිණුමේ ඇති බව දකින්න ලැබුණා. ඕනෑම අයෙකුට අන්තර්ජාල ගිණුම්වලින් පිංතූර සොරා ගෙන වැරදි විදිහට භාවිතා කරන්න ඉඩ ඇති බැවින් අනිත් අය ඔබ ගැන එක විටම වැරදියට සිතන්නේ නෑ. එය ඔබගේ තරහකරුවෙකු විසින් සිදු කළ ක්‍රියාවක් විය හැකියි" ආදී වශයෙන් පවසා දී වැරදි මත තහවුරු වන්නට ඉඩ නොදී සංසුන්ව කටයුතු කළ යුතු බවත් අවබෝධකර දිය හැකියි.

"බලන්න ඔබගේ පිංතූර තවමත් නරඹා ඇත්තේ ඉතා සුළු පිරිසකි. (පිංතූර නරඹා ඇති ප්‍රමාණය (Views) ගිණුම තුළ දක්නට ඇත) දසදෙනෙක් ඔබේ පිංතූරය දුටු පමණින් ජීවිතයෙන් පළා යාමට උත්සාහ දැරීම ප්‍රායෝගික නැති බවත් සමාජයට මුහුණ දෙන්නට බැරි කමක් උදා නොවන බවත් අපි මෙය Report කර කඩිනමින් ඉවත් කර ගමු" යැයි යෝජනා කරමින් ළමයා සිද්ධිය දෙස බලන ආකාරය වෙනස් කිරීමට උත්සාහ ගත යුතුයි. මන්ද ඇතැම් ළමයින් තම අසභ්‍ය පිංතූර අන්තර්ජාලයට එක් කර ඇතැයි සියල්ල අහිමි වූ අයෙකු සේ කලබලයට පත්ව සිටිනු අප දැක ඇත. නමුත්

එකී ගිණුම හෝ පිංතූර හෝ වීඩියෝ පරීක්ෂා කර බැලීමේ දී එය නරඹා ඇත්තේ පස් දෙනෙකු නැතිනම් දසදෙනෙකු වැනි කුඩා පිරිසක් බව පැහැදිළියි. එවැනි විටදී එහි යථාර්ථය ළමයාට පැහැදිළි කර දෙමින් කලබල නොවී, වැරදි තීරණ නොගෙන මෙකී අවධානමෙන් මිදීමට අවශ්‍ය ශක්තිය හා ක්‍රමවේද දෙස අවධානය යොමු කරන ලෙස ළමයා ශක්තිමත් කිරීම ඉතා වැදගත්ය.

තාක්ෂණික වශයෙන් ගැටළුව නිරාකරණය කිරීමට ළමයාට ඇති නොදැනුවත්භාවයට මැදිහත්කරණය ලබා දෙමින් කඩිනමින් තාක්ෂණික ආරක්ෂිත ක්‍රම (Safety Tips) ක්‍රියාත්මක කරවන්න සහය වන්න. ඇතැම් අවස්ථාවල දී ළමයින් අන්තර්ජාල අපරාධකරු හඹා යමින් ඔහු සමග තවදුරටත් සම්බන්ධතාවය පවත්වමින් හෝ ප්‍රචණ්ඩත්වය විදහා පාමින් හෝ තර්ජනයට යටපත් වෙමින් හෝ ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් හෝ සිය ගැටළුව රහසිගතව විසඳා ගැනීමට උත්සාහ දරමින් අනාරක්ෂිතව කටයුතු කරන බවක් දක්නට ලැබේ. එවැනි අනාරක්ෂිත, අවධානම් සහගත වැරදි මතවලින් ළමයා ඉවත්කර තැබීමට අවශ්‍ය එදිරිසංවාදය සිදු විය යුතුය.

හිංසනයකට ලක් වන ළමයින් තුළ ඇති වන වරදකාරී හැඟීම නිසා ඔහු /ඇය රහසිගතව පීඩා විඳිනවා විය හැකියි. එබැවින් මෙය ළමයාගේ හෝ අන්තර්ජාලයේ ඇති ගැටළුවක් නොවන බවත් පුද්ගලයින්ගේ ක්‍රියා කලාපයේ

ගැටළුවක් නිසා හට ගත් තත්ත්වයක් බවත් නොහික්මුණ මිනිසුන්ගේ නොහික්මුණ ක්‍රියාවන්ට ඔබ වැරදිකරුවෙක් නොවන බවත් අවබෝධ කර දෙමින් ළමයාගේ පීඩනය සමනය කිරිමට මැදිහත් විය යුතුයි.

බොහෝ ළමයින් අන්තර්ජාලයෙන් සිදු වන හිංසාවන් නිවසින් වසන් කිරීමට උත්සාහ දැරීම බහුලව දක්නට ලැබේ. එය වැරදි ක්‍රියාවක් බවත් ඒ නිසා සිදු විය හැකි හානිය වඩාත් උග්‍ර විය හැකි බවත් මෙවැනි අවස්ථාවල දී දෙමාපියන්, වැඩිහිටියන් තමා ළගින් සිටීම ඉතා වැදගත් බවත් ළමයාගේ පවුල් පරිසරය අධ්‍යනය කර බලමින් එදිරි සංවාදයේ යෙදෙන්න.

නීතියේ සහය හා විශේෂඥයින්ගේ සහය පැතීමට ද ළමයි මැලිකමක් දක්වති. එය අනිසි බියක් බවත් ළමයාට අවශ්‍ය සහයෝගී කණ්ඩායම් වෙත ළගා වීමට අවශය ශක්තිය ලබා දිය යුතුයි. ඇතැම් විට ළමයා තමාට සහයට සිටින ආයතන හෝ පුද්ගලයින් පිළිබඳව නොදන්නවා විය හැකියි. එසේත් නොමැතිනම් මානසිකත්වය මත කළ යුත්තේ කුමක්දැයි තීරණය කිරීමට තරම් වූ ශක්තිය ගිලිහී ගොස් තිබෙන්නට පුළුවන. එවැනි අවස්ථාවලදී ළමයා කළ යුත්තේ කුමක් ද යන්න පිළිබද සහයෝගී සංවාදයකට එළඹෙන්න.

හිංසනයට පත් වූ ළමයා සිය හිංසනයේ තක්සේරුව නිවැරදිව වටහා නොගැනීම මත අනවශ්‍ය අවධානමකට ලක්ව සිටිය හැකියි. ඇතැම් විට ගැටළුවේ බරපතළ බව

අඩුවෙන් හෝ පවත්නා තත්ත්වයටත් වඩා බරපතළ බව තක්සේරු කිරිම හානිකරයි. එබැවින් වැරදි ආකල්පවලින් ඉවත්ව නිවැරදි තක්සේරුවක් ගොඩ නගා ගෙන සුරක්ෂිත බව ගොඩ නගා ගැනීමට එදිරි සංවාදයේ යෙදෙමින් ළමයාට සහය විය යුතුය.

මේ ආකාරයට එදිරි සංවාදයෙන් පසු ළමයා තුළ නිවැරදි ආකල්ප ගොඩනගමින් ළමයා ශක්තිමත් කිරීමට නම් ඔබ හොඳින් සන්නද්ධ වී සිටිය යුතුය. එසේම දක්ෂ විය යුතුය. ඒ හරහා ළමයා තුළ නව දර්ශනයක් (Effective Philospshy) ගොඩ නැගිය යුතුය. ඒ තුළින් අළුතින් සිතන්නට හැකියාව ලැබෙන සේවාලාභියා තුළ නව අදහස් සමුදායක් (New set of Feelings) ගොඩ නගා ගනීම හරහා ගැටළුව නිරාකරණය කර ගනු ඇත. මෙහි (ABCDEF) න්‍යායට අනුව අන්තර්ජාල ගැටළුවක දී හිංසනයට පත් වූ ළමයෙකු සම්බන්ධයෙන් ඉහත කාරණා පිළිබඳව සැලකිලිමත් වෙමින් මැදිහත්කරණයකට යොමු විය හැකිය. එහිදි ළමයාගේ ප්‍රජානනය වෙනස් කළ හැකි සංයම අභ්‍යාස, පරිකල්පනයන්, භාෂා වෙනස් කිරීම්, ස්වයං කථන අභියෝග ශිල්ප, අභියෝගාත්මක ක්‍රියා "Counter Writing & Thaught stopping (සිතුවිලි නැවත්වීමට) වැනි ක්‍රම ශිල්ප රැසක්ද ගැටළුවේ ස්වභාවය අනුව භාවිතයට ගත හැකිය.

04- සංජානනික හා ප්‍රපංචමය ප්‍රවේශය (Perceptual Phenomenological Approch)

පුද්ගලයා දෙස ධනාත්මක දෘෂ්ටිකෝණයෙන් බැලු ප්‍රවේශයක් ලෙස මෙම ප්‍රවේශය සෑම පුද්ගලයෙකුම වටිනා වස්තුවක් බවත්, සෑම පුද්ගලයෙකුගේම ආත්ම බර සමාන බවත්, සෑම පුද්ගලෙයෙකුටම තමාගේ මතයක් දැරීමට අයිතියක් ඇති බවත්, තමාගේ ඉරණමට තමා වගකිව යුතු බවත්, සෑම පුද්ගලෙයෙකුම රහසිගත විෂයබද්ධ පෞද්ගලික ලෝකයක ජීවත් වන බවත්, සෑම පුද්ගලෙයෙකුටම නිශ්චිත ගමන් මගක් හා ඉලක්කයක් ඇති බවත්, පුද්ගලයා සෑම අංශයකින්ම ඉදිරියට යාමට හෙවත් ආත්ම සාක්ෂාත්කරණයට උත්සාහ දරන බවත් පෙන්වා දී ඇත.



රූප සටහන් - 21

ආත්ම සංකල්පය, සමස්ත පුද්ගලයා හා ප්‍රපංචමය ක්ෂේත්‍රය යන කරුණු තුනෙහි සමබරතාව ගිලිහී ගිය විට ප්‍රශ්න ගැටළු නිර්මාණය වන බව මෙකී න්‍යායවාදීහු පෙන්වා දෙති. යම් ගැටළුවකට ලක් වූ පුද්ගලයෙකු සම්බන්ධයෙන් උපදේශනය ලබා දීම යනු මෙකී සම්බන්ධතා තුන ශක්තිමත් කිරීමකි. එනම් උපදේශනයේ දී පුද්ගලයා සමබර වන අතර ආත්ම අවබෝධය ඉහළ යා යුතුය.

"අන්තර්ජාලයට ගියොත් බලාගන්න පුලුවන්. මෙහාට දෙනවා ඔය ෆෝන් එක. කපනවා ගෙදර Internetළමයින්ට වෙලා තියන දේ පේන්නේ නැද්ද? ස්කෝලේ ගිහිල්ලා ඉවරවෙනකම් Internet පාවිච්චි කිරීම සම්පූර්ණයෙන් තහනම්. ආයිත් මොනම හේතුවකටවත් Internet ගියොත් මං නරක මිනිහා කියන්න එපා" මේ ආකාරයට අන්තර්ජාලය පිළිබඳ දැඩි භීතියකින් කටයුතු කරන දෙමාපියන් විසින් ළමයින් අන්තර්ජාලයෙන් දුරස්කර තැබීමට කටයුතු කරන ස්වභාවයක් ද දක්නට හැකිය. සැබැවින්ම එය තාර්කික නැත. එවැනි දෙමාපියන්ටත් උපදේශනය අවශ්‍යය වේ.

අන්තර්ජාලය යකෙක්, රාක්ෂයෙක් ලෙස ළමයින් බිලිගැනීමට සිටින මෙවලමක්ය යන විශ්වාසය මත පිහිටා වැඩිහිටියන් ගනු ලබන තීරණ ළමා සංවර්ධනයට යම් පසුගාමී බලපෑමක් එල්ල කළ හැකිය. ඕනෑම මෙවලමක හොඳ මෙන්ම නරකද පවතී. එබැවින් නරක දෙස පමණක්

හෝ හොඳ දෙස පමනක් බලා තීරණ ගැනීම එතරම් සුබදායක නොවේ. ලෝකය හොඳ, නරක, සැප, දුක, යහපත, අයහපත සියල්ලගෙන් සැකසී ඇත. ළමයා ද එකී ලෝකය තුළ හැදී වැඩිය යුතුයි. එබැවින් ළමයාට හොඳ නරක, යහපත අයහපත කුමක්ද යන්න නිවැරදිව වෙන්කර හඳුනා ගැනීමට කියා දීම වෙනුවට යථාර්ථයෙන් ඈත් කර සිහින ලෝකවල දරුවන් නිර්මාණය කිරිම ප්‍රායෝගික නොවේ. හොඳ දේ මෙන්ම යම් විටෙක ළමයාට හානිකර දේ සඳහාද මුහුණදීමට සිදු වුව හොත් එවැනි විට ශක්තිමත්ව නැගී සිටීමේ කුසලතාවයන්ද ළමයා තුළ ගොඩ නැගිය යුතුය.

අන්තර්ජාලය හරහා එක් අයෙකු හෝ කුඩා කණ්ඩායමක් විසින් හිංසාකාරී දෑ සිදු කළ පමණින් සමස්ත අන්තර්ජාලයම ප්‍රතික්ෂේප කිරීම තාර්කික නොවේ. එසේම ළමයා අතින් අන්තර්ජාලයේ දී සිදු වූ එක් වැරැද්දක් මත සමස්ත ජීවිතයම වරදකාරී නොවේ. එකී ළමයා විසින් අතීතයේ දී කෙතරම් යහපත් සුබවාදී ක්‍රියාවන්වල නිරත වී ඇද්ද? එක් මොහොතක සිදු වූ වරදක් මත සමස්ත ජීවිතයටම වෛර කිරීම හෝ දඬුවම් කිරීම කෙතරම් සාධාරණද? අතීතයේ සිදු වූ වැරද්දක් මත කණගාටුවීම පලක් නොවන බැවින් හා අතීතය වෙනස් කළ නොහැකි වුවත් වර්තමානය වෙනස් කළ හැකි බැවින් සියල්ල අහිමි වන ආකාරයේ දඬුවම් ළමයින්ට දිය යුතු නැත. ඇතැම් දෙමාපියෝ අන්තර්ජාලය ඉතා අයහපත් බව පවසමින් එයට දොස් නගමින් ළමයාට ළඟා කරගත නොහැකි අසීරු ඉලක්ක

යෝජනා කරති. එබැවින් අන්තර්ජාලය වෙනස් කිරීමට වඩා අන්තර්ජාලය දෙස බලන ආකාරය හා ඵලදායීව භාවිත කරන ආකාරය වටහා දීම වඩාත් ප්‍රායෝගිකය.

මිනිසාගේ ප්‍රසස්ථම ඉලක්කය වනුයේ ආත්ම සාක්ෂාත් කරණයයි. ඒ සඳහා අවස්ථා තුනක් බලපාන බව මෙකී න්‍යායවාදීහු පෙන්වා දෙති. එනම්;

- අවංක බව
- නිර්මාණාත්මක බව
- සන්සුන් බව

යන්නයි. අපගේ බොහෝ ගැටළුවලට බලපානුයේ අවංක බව ගිලිහීයාමයි. තමා තමාටම අවංක නොමැති වීමත් අන් අයට අවංක නොමැති වීමත් මෙහි දී විමසා බලන්න. එසේම සමාජ/පුද්ගල පුරුදුවලට හෝ විමසා බැලීමකින් තොරව සිදු කරන ක්‍රියාවන් අභිබවා ගොස් නිර්මාණශීලී ලෙස ප්‍රතිචාර දැක්වීම මත ද ගැටළුකාරී අවස්ථාවලින් අත්මිදිය හැකියි. එසේම අවංක බව, නිර්මාණශීලීත්වය, මෙන්ම සන්සුන් බවද ඉතා වැදගත්ය. මෙකී කාරණා තුනම අන්තර්ජාල පරිහරණයේ දී ද භාවිතයට ගැනෙන්නේ නම් හිංසාවලට ලක් වීමෙන් වැළකීමටමෙන්ම අවභාවිතයන්ගෙන් සුරක්ෂිත වීමට ද හැකියාව පවතී. මානව සම්බන්ධතා සඳහා ද උක්ත සාධක තුන බෙහෙවින් බලපෑම් කරන අතර පුද්ගල ජීවිතයට මානව සබඳතා ද දැඩිව බලපෑම් කරයි. මන්ද පුද්ගලයින් මානව සබඳතා පවත්වන ස්වභාවය අනුව පුද්ගල ජීවිතයේ බොහෝ

ප්‍රශ්න ගැටළු නිර්මාණය වන බැවිනි. අන්තර්ජාලය හෝ සමාජ ජාල මාධ්‍යය යනු වර්තමාන සමාජීය සත්වයා මානව සබඳතා පවත්වනු ලබන ප්‍රබල මෙවලමකි. එකී ජාලය හරහා පවත්වන්නා වූ සබඳතාවලට ද අවංක බව, නිර්මාණශිලී බව හා සන්සුන් බව ප්‍රබලව බලපෑම් කරනු ඇත. අන්තර්ජාල ගැටළු බොහොමයක සැඟව ඇත්තේ අවංක බව, නිර්මාණශීලී බව හා සන්සුන් බව ගිලිහීයාම පිළිබඳ ප්‍රශ්නයකි.

ළමයෙකු අන්තර්ජාල හෝ පරිගණක ක්‍රියාවලට ඇබ්බැහි වී ඇතැයි සිතන්න. එවැනි ගැටළුකාරී තත්ත්වයක් පැවතියත් එයට ඇබ්බැහි වූවෝ එය ගැටළුවක් ලෙස සිතීමට මැලිකමක් දක්වති. එබැවින් මෙවැනි ගැටළුකාරී ළමයෙකුට සහය ලබා දීමේ දී සංජානනික ප්‍රපංච න්‍යායවාදින්ට අනුව කරුණු තුනක් පිළිබඳ අවධානය යොමු කෙරේ.

01.පවත්නා ගැටළුව පවත්නා ආකාරයෙන්ම පිළිගැනීමට හා එකී ගැටළුව පුද්ගලයාගේ ජීවිතයට බලපාන ආකාරය හේතු සහිතව පිළිගැනීමට සැලැස්වීම මුලිකවම සිදු කිරීම.

02.එකී ගැටළුව විසඳා ගැනීමට මාර්ගයක් ඇති බව ළමයාට අවබෝධකර දීම.

බොහෝ ළමයින් අන්තර්ජාලය ඔස්සේ සිදු වන හිංසාකාරී තත්ත්වයන් වල දී කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව පවත්නා වැටහීම ප්‍රමාණවත් නොවනු ඇත. එබැවින්

එකී ගැටළුව විසඳා ගැනීමට මාර්ග ඇති බව ළමයාට අවබෝධකර දිය යුතුය.

03.ගැටළුව විසඳා ගැනීමට ළමයා තුළ පවත්නා සම්පත් හෙවත් ළමයාගේ කුසලතා හඳුනා ගැනීමට සලස්වා එය ඔහු වෙතම සංනිවේදනය කිරීම.

මෙකී කරුණු ඔස්සේ අන්තර්ජාලය පදනම් කරගත් ගැටළුවකට මුහුණ දුන් ළමයෙකු සඳහා ප්‍රතිකාරාත්මක මැදිහත්කරණයකට යොමු විය හැකි පියවරයන් අවබෝධකර ගමු.

ගැටළුව - දිනපතා අන්තර්ජාල ක්‍රීඩාවකට (උදා- COC – Clash Of Clans) ඇබ්බැහි වූ නව යෞවනයෙකු සඳහා උපදේශනය කිරීම.

01.දිනකට කෙතරම් කාලයක් ක්‍රීඩා සඳහා අන්තර්ජාලය භාවිත කරන්නේදැයි ළමයා තුළින් දැන ගැනීම. ඒ අනුව;

(එකී පැය ගණන දින 07 කින් ගුණ කිරීමට දෙන්න)
(එකී පැය ගණන දින 30 කින් ගුණ කිරීමට දෙන්න)
(එකී පැය ගණන දින 365 කින් ගුණ කිරීමට දෙන්න)
අවබෝධ වන්නට ඉඩ හරින්න

02-ඒ සඳහා දිනකට වැය වන Dataප්‍රමාණය හා වැය වන මුදල ගණනය කිරීමට අනුබල දෙන්න.

(එකී මුදල් ප්‍රමාණය දින 07 කින් ගුණ කිරීමට දෙන්න)
(එකී මුදල් ප්‍රමාණය දින 30 කින් ගුණ කිරීමට දෙන්න)
(එකී මුදල් ප්‍රමාණය දින 365 කින් ගුණ කිරීමට දෙන්න)
අවබෝධ වන්නට ඉඩ හරින්න.

03-ළමයාගේ අනිකුත් අවශ්‍යතා හා ඉලක්ක පිළිබඳව හඳුනා ගැනීමට උනන්දු කරවන්න.

(ළමයාගේ අනාගත, අධ්‍යාපන, සමාජීය, වෘත්තීයමය ඉලක්ක හා පවුලේ බලාපොරොත්තු වැනි අවශ්‍යතා)

04-එකී ඉලක්ක, අපේක්ෂා ජය ගැනීමත් අන්තර්ජාල ක්‍රීඩාවල නිරතවීමත් අතර ඇති සබඳතාවය පිළිබඳව අවබෝධකර ගැනීමට අවස්ථාව සලසන්න.

05-අන්තර්ජාලය තුළ දිගින් දිගටම ක්‍රීඩා කටයුතුවල නිරත වීම නිසා ඇති වන වාසි හා අවාසි පිළිබඳව සොයා බැලීමට අවස්ථාව ලබා දෙන්න.

06-අන්තර්ජාල ක්‍රීඩාවල යෙදෙන කාලය අවම කිරීම මගින් අනිකුත් අවස්ථා සපුරා ගැනීමට ළමයාට ඇති ඉඩකඩ පෙන්වා දෙන්න.

07-ළමයා වටා ඇති අනෙකුත් අවශ්‍යතා, බලාපොරොත්තු හා ඉලක්කවල වටිනාකම පැහැදිළි කර දෙන්න.

08-ළමයා දිනකට අන්තර්ජාලය තුළ ක්‍රීඩා කරන පැය ගණන හා වාර ගණන සටහන් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

09-එකී අවබෝධයෙන් පසු ළමයාගේ එකඟතාවය මත දිනකට අන්තර්ජාලය තුළ ක්‍රීඩා කටයුතුවල නිරත වන වාර ගණන හා කාලය ක්‍රමයෙන් අඩු කිරීමට අවශ්‍ය සැලසුම් සකස්කර එය ක්‍රියාත්මක කරවන්න.

05- සාංදෘෂ්ටිකවාදි ප්‍රවේශය (Existential Approach

පුද්ගලයා සැදි ඇත්තේ මාන තුනකිනි. ජීව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක හා අධ්‍යාත්මික මානයන්ගෙන් සැදුම්ලත් මිනිසා තුළ නිතැතින්ම හිඩැසක් නිර්මාණය වී ඇත. එකී හිඩැස අධ්‍යාත්මික මානයෙන් පිරවිය යුතුය යන්න මෙකී න්‍යායවාදීන්ගේ අදහසයි. ඒ අනුව උපදේශනයේ දී අවධානය යොමු විය යුත්තේ අධ්‍යාත්මික මානය ගොඩ නැගීම උදෙසාය. මක්නිසාද යත් බොහෝ අය

- කරන්නේ කුමක්දැයි නොදැන
- කරන්නට උවමනා කුමක්දැයි නොදැන
- ජීවත් වීමේ අර්ථය කුමක්දැයි නොදැන දුක්විඳින බවත් ගැටළු ඇතිකර ගන්නා බවත් පැහැදිළි කරයි.



රූප සටහන් -22

අනාගතය පිළිබඳ දැක්මක්, ඉලක්කයක්, පරමාර්ථයක්, බලාපොරොත්තුවක්, සැලැස්මක් නොමැති වීම තුළ සිය ජීවිතයට වටිනාකමක් නොදැනීමේ හේතුවෙන් ළමයි අසංවිධානාත්මකව ජීවිතයට මුහුණදෙති. එවන් ළමයින් අතින් අවභාවිතාවන් මෙන්ම හිංසාකාරීත්වයන් ද සිදු විය හැකිය. නමුත් දෙමාපියන් හා වැඩිහිටියන් ළමයින්ට ඉලක්ක අරමුණු සකසා දිය යුතුය. එවන් අරමුණක්, ඉලක්කයක් පවත්නා කිසිදු ළමයෙකු අන්තර්ජාලය අවභාවිතයේ යෙදෙමින් හිංසාකාරි කටයුතුවල නිරත නොවනු ඇත. එබැවින් අන්තර්ජාලය තුළ හිංසා සිදු කරන, එය අවභාවිත කරන ළමයින් හා පුද්ගලයින්ට තමන් කරන්නේ කුමක්ද, කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳ වැටහීමක් නොමැති බව

පැහැදිළිය. එබැවින් අන්තර්ජාලයට පිවිසෙන ළමයාට තම ජීවිත ඉලක්කයට සරිලන ලෙස අන්තර්ජාලය පරිහරණය කිරීමට පුරුදු පුහුණු කළ යුතුය. අන්තර්ජාල පරිහරණයේ ආචාර ධර්ම ගොඩ නැගීම හා ඒ අනුව කටයුතු කිරිම මෙකී ප්‍රවේශය හරහා ක්‍රියාවට නැගිය හැකියි.

අන්තර්ජාලය තුළ යම් හෙයකින් ගැටළුවක් මතු වුව හොත් එසේ සිදුවුයේ ඇයිද යන්න තේරුම් ගැනීමට ළමයාට උදවු කළ යුතුය. එසේම ගැටළුවට මුහුණ දුන් ළමයාට පරිසරයට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ශක්තිය ලබාදිය යුතුය. අන්තර්ජාල හිංසාවලදී ළමයින්ට ඇති වන ප්‍රධාන ගැටළුවක් වනුයේ සමාජයට මුහුණදීමට නොහැකි වීමයි. ඒ සඳහා ළමයා ශක්තිමත් කිරීමේ දී ආගමික ප්‍රවේශය ඉතා වැදගත් වනු ඇත.

අන්තර්ජාල හිංසාවල දී එකී හිංසාවන්ගෙන් පලායාම සඳහා විවිධ ක්‍රමවේද ළමයා භාවිත කරයි. ඇතැම් විට වරද අනුන් මත පැටවීමේ සංරක්ෂණ ප්‍රයෝග භාවිතය හෝ සිය ජීවිතයෙන් පලායාම වැනි තාර්කික නොවන ක්‍රියාවන් සඳහා යොමු වේ. එබැවින් එකී හිංසනයේ හෝ ගැටළුවේ සැබෑ තත්ත්වය පිළිගැනීමටත් එම තත්ත්වයට මුහුණදීමට තමාගේ දායකත්වය අවබෝධකර ගැනීමටත් ළමයාට සහය දිය යුතුය.

"යාදිසං වපතේ බීජං
තාදිසං ලපතේ ඵලං

ඔබ වපුරනුයේ යම් දෙයක්ද ඊට අනුව පලදාව නෙලා ගත යුතුය. ඔබ තල වැපුරුවේ නම් නෙලා ගත යුත්තේ තලම වන අතර අබ වැපුරුවේ නම් නෙලාගත යුතතේ අබම විය යුතුය. එනම් ඔබ කරනු ලබන ක්‍රියාව අනුව ඔබට ප්‍රතිඵල ලැබෙනු ඇත. එපරිද්දෙන්ම ඔබ අන්තර්ජාලය වැරදියට භාවිත කළේ නම් ඔබට ලැබෙනුයේ වැරදි ප්‍රතිඵලම වන අතර ඔබ නිවැරදිව භාවිත කලේ නම් ඔබට ලැබෙනුයේ යහපත් ප්‍රතිඵලම විය යුතුය.

"උදකංහි නයන්ති නෙත්තිකා
උසුකාරෝ නමයන්ති තේජනං
දාරුං නමයන්ති තච්ඡකා
අත්තානං දමයන්ති පණ්ඩිතා"

(ධම්ම පදය - පණ්ඩිත වග්ගය)

ගොවියෝ තමන් කැමති තැනට දිය ගෙන යයි. හී වඩුවෝ තමන්ට ඇවසි ලෙස හී දඬු නවයි. තාක්ෂණවේදීන් තමන් කැමති ලෙසට දැව දඬු දිගහරියි. පණ්ඩිතයෝ තමන් දමනය කර ගනිති. එපරිද්දෙන්ම, ඔබ අන්තර්ජාල තාක්ෂණයේ ඉහළ බුද්ධිමය තලයකට පැමිණ දස්කම් කළ හැකි පුද්ගලයෙකු විය හැකියි. එහෙත් මෙකී තාක්ෂණය නිවැරදිව සමාජ ප්‍රගමනයට භාවිත කිරීමට නම් ඔබ ඔබව දමනය කර ගත යුතුය. සන්සුන් විය යුතුය. අධ්‍යාත්මික විය යුතුය.

ආශ්‍රිථ ග්‍රන්ථ නාමාවලිය

- ඉලංගකෝන් කාන්චන, 2016, ආරක්ෂාකාරී ලෙස අන්තර්ජාලය භාවිතයට උපදෙස්,එස්.ගොඩගේ සහ සහෝදරයෝ.
- ඉලංගකෝන් කාන්චන, 2015, දරුවාට ආරක්ෂාකාරී පරිගණකයක්,එස්.ගොඩගේ සහ සහෝදරයෝ.
- කෝදාගොඩ යසන්ත, 2017,ළමා අපයෝජන සිදුවීමක් පිළිබඳව අපරාධ පරීක්ෂණයක් පැවැත්වීමේ දී පොලිස් නිලධාරීන් විසින් පිළිපැදිය යුතු මූලධර්ම සහ ගත යුතු පියවර, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.
- ගම්මන්පිල ප්‍රදීප්, 2013 පරිගණකය හා ඔබගේ ළමයා,ඩයිනමින් ඇසෝෂියේට්,හැඳල,වත්තල,
- පුහුණු අත්පොත (Educsirt) (2017)ඵලදායී හා ආරක්ෂාකාරී ඩිජිටල් තාක්ෂණයේ භාවිතය තුළින් සුරක්ෂිත පාසල් අධ්‍යාපනයක්, අධ්‍යාපන අමාත්‍යාංශය.
- පෙරේරා ඥානදාස,2016,උපදේශන මනෝ විද්‍යාව,සහස්‍ර ප්‍රකාශකයෝ
- ෆෙයාර්හොල්ම් ජුඩි, සහ සිං ගුරුවින්දර්, 2008,අපි සුරැකෙමු,ප්‍රධාන පුහුණුකරුවන්ගේ අත්පොත,කැනේඩියානු රතුකුරුස සමාජය,.
- ෆෙයාර්හොල්ම් ජුඩි, සහ සිං ගුරුවින්දර්, වික්‍රමසිංහ වෛද්‍ය සිංහ, 2010,ළමුන්ට හා යෞවනයින්ට සුරක්ෂිත පරිසර නිර්මාණය කිරීම සඳහා පියවර දහයක් , කැනේඩියානු රතුකුරුස සමාජය

- මාරසිංහ චාරිකා,2012, කාන්තා සහ ගැහැණු දරුවා ආරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා නීති නාමාවලිය. ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
- රත්නපාල,නන්දසේන,(2003), අපරාධ විද්‍යාවේ මූලධර්ම 1,ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්,ගනේමුල්ල.

පනත්

- 1927 අංක 04 දරන අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
- 19 වන අධිකාරිය ,දණ්ඩනීති සංග්‍රහය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 1989 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ,
- 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 1979 අංක 15 දරන සාක්ෂි ආඥා පනත, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රෝණික ගනු දෙනු පනත රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත,රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

- 21/2017 දරන පාසල් පිරිවෙන් හා අනිකුත් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම, අධ්‍යාපන අමාත්‍යාංශය

සඟරා

- උපදේශනා, සිව්වන කලාපය, 2014 ඔක්තොම්බර්, සමාජ සේවා දෙපාර්තමේන්තුව
- උපදේශනා, පස්වන කලාපය, 2015 ඔක්තොම්බර්, සමාජ සේවා දෙපාර්තමේන්තුව

Engish Bibliograpy

- A study on Sri Lanka’s digital landscape: Potential risks to children and young people who are online (20117), Published by Unicef
- Akhgar Babak, Staniforth Andrew & Bosco Francesca, Cyber Crime and Cyber Terrorism Investigator’s Handbook,2014,chapter 4,pp,33.
- American psychological Association, (2013) Diagnostic and Statistical Manual of Mental Disorders (fifth Edition), American psychological Association, 1000, Wilson, Boulevard Arlington, VA 222093901.
- Behzat Yucedal, Victimization in Cyberspace: An Application Of Routine Activity and Lifestyle Exposure theories, 2010, pp,28-31

- Brette, Olivier.(2003) Thorstein Veblen's Theory of Institutional Change: Beyond Technological Determinism' European Journal of the History of Economic Thought, Vol 10(3)455-477.
- Cyber Crime: A Conceptual and Theoretical Framework, Chapter 1,
- Jaishankar, k (2007)Establishing a Theory of Cyber Crime,pg7-9 International Journal of Cyber Criminology Vol 1 Issue 2
- jameson, Fredric(1991) postmodernism, Or the Cultural Logic of Late Capitalism, pg IV, Duke University Rress.
- Ritzer, George (2008).The McDonal dization of Society, pp.351-384,pine Forge Press, Los Angeles.
- Weber, Max(1991),The Nature of Social Action in Runciman, W.G. Weber: Selections in Translation,p7,Cambridge University Press, UK
- Council of Europe,2001, Convention on Cyber Crimes,

Internet Source

- Cybercrime Legislation in Sri Lanka, Jayantha Fernando, Attorney-at-Law, LLM – Telecom & IT Law (Lond.), https://rm.coe.int/16806bdcd8

- Trends in Arrests for Child Pornography Production: The Third National Juvenile Online Victimization Study (NJOV-3), University of New Hampshire , https://scholars.unh.edu/cgi/viewcontent.cgi?article=1046&context=ccrc
- sexualized Images of Children on the Internet, Ethel Quayle and Terry Jones, https://www.researchgate.net/publication/50195884_Sexualized_Images_of_Children_on_the_Internet

- Cyber-Crime in Sri Lanka, Dinithi Jayasekara, https://www.researchgate.net/publication/294725446_Cyber-Crime_in_Sri_Lanka
- Protecting Children from Online Sexual Exploitation, ECPAT International 328/1 Phaya Thai Road Bangkok,10400,Thailand,https://www.unicef.org/protection/files/FBO_Guide_for_Religious_Leaders_and_Communities_ENG(1).pdf
- Internet use, pornography and sex crime, Manudeep Bhuller,Tarjei Havnes, Edwin Leuven, Magne Mogstad§,https://www.uib.no/filearchive/havnes11.pdf
- A brief study on Cyber Crime and Cyber Law’s of India, Animesh Sarmah, Roshmi Sarmah , Amlan Jyoti Baruah, https://irjet.net/archives/V4/i6/IRJET-V4I6303.pdf
- The Impact of the internet on choldrens Daily lives:Physical,Social and Psychologycal well-being,yeora kim,

https://getd.libs.uga.edu/pdfs/kim_yeora_200305_phd.pdf

- Online Grooming of Children for Sexual Purposes: Model Legislation & Global Review, 2017, International Centre for Missing & Exploited Children.,https://www.icmec.org/wp-content/uploads/2017/09/Online-Grooming-of-Children_FINAL_9-18-17.pdf
- The True prevalence of "Sexting" k Aitlin L Ounsbury , K Imberly J . Mitchell & David F Inkelhor, http://www.unh.edu/ccrc/pdf/Sexting%20Fact%20Sheet%204_29_11.pdf
- A qualitative study of children, young people and 'sexting': a report prepared for theNSPCC**.** Jessica Ringrose, Rosalind Gill, Sonia L ivingstone and Laura Harve,https://www.nspcc.org.uk/globalassets/documents/research-reports/sexting-research-summary.pdf
- Child Safety Online: A Practical Guide for Providers of Social Media and Interactive Services, https://www.gov.uk/government/publications/child-safety-online-a-practical-guide-for-providers-of-social-media-and-interactive-services/child-safety-online-a-practical-guide-for-providers-of-social-media-and-interactive-services
http://www.icmec.org/wp-content/uploads/2016/09/UNICEF-Child-Protection-Online-India-pub_doc115.pdf

- Convention on Cybercrime Budapest,, European Treaty Series, https://rm.coe.int/1680081561
- Cyber Crime Investigation Manual,Data security Council in India, https://uppolice.gov.in/writereaddata/uploadedcontent/Web_Page/28_5_2014_17_4_36_Cyber_Crime_Investigation_Manual.pdf
- Cyber Criminology Exploring Internet Crimes and Criminal Behavior, K. Jaishankar, http://citeseerx.ist.psu.edu/viewdoc/download?doi=10.1.1.463.9196&rep=rep1&type=pdf
- Establishing a Theory of Cyber Crimes K.Jaishankar,http://www.cybercrimejournal.com/Editoriaijccjuly.pdf
- Cyber Crime and Cyber Terrorism Investigator's Handbook,Babak Akhgar, Andrew Staniforth FrancescaBosco,http://indexof.es/Miscellanous/LIVRES/Syngress.Cyber.May.2014.ISBN.0128007435.pdf

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මනෝ විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධිධරයෙකු වන චම්පික කේ අයගම මහතා විශ්වවිද්‍යාල සමයේ සිට මා ඉතා හොඳින් දන්නා හඳුනන දක්ෂ විද්‍යාර්ථයෙකි. එසේම මොහු කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨය මගින් මෙහෙයවනු ලබන ළමා ආරක්ෂාව හා ළමා අයිතිවාසිකම් පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාධාරියෙකුද වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපරාධවිද්‍යාව පිළිබඳ පස්චාත් උපාධි ඩිප්ලෝමාව හදාරමින් සිටින මොහු සයිබර් අපරාධ සම්බන්ධයෙන් ඉන්ටර්පෝල් ආයතනය, ප්‍රංශ සයිබර් විමර්ශන පොලීසිය, යුරෝපා සංගමය මෙන්ම දෙස් විදෙස් පුහුණුවීම් රැසක් ලබා ඇති අතර ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ජාතික සම්පත් සංචිතයේ සාමාජිකයෙකුද වේ.වත්මන් විමර්ශන හා අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය භාර නිලධාරියා ලෙස කටයුතු කරන මොහු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වසර 16 ක අත්දැකීම් ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි. මෙම සේවා කාලය තුල ළමයින්, වැඩිහිටියන්, විවිධ වෘත්තිකයන්. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් මෙන්ම වින්දිතයින්, අපරාධකරුවන් සමග වැඩකටයුතු කිරීමෙන් ලබා ගත් පරිචය මෙම කෘතිය පුරා පැහැදිලිව දැකිය හැකිය. ළමා ආරක්ෂාවේ ප්‍රධාන මුල් ලෙස හඳුන්වනු ලබන මනෝවිද්‍යාව; සමාජවිදයාව සහ නීතිය පිළිබඳ රාජකාරී වපසරිය තුලින් ලබාගත් ප්‍රායෝගික හසල අත්දැකීමක් මොහු සතු වේ. ළමා ආරක්ෂාව පිළිබඳ අත්දැකීම් ඇති අයෙකු ලෙස මොහුගේ මෙම කෘතිය හුදෙක් ළමා ආරක්ෂාව සම්බන්ධ නිලධාරීන්ට පමණක් නොව නීතීඥයින්, පොලිස් නිලධාරීන් හා යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය තුල නිරත සියලූ දෙනාටත් අපරාධ විද්‍යාව, මනෝවිද්‍යාව, සමාජවිද්‍යාව ඇතුලූ සමාජීයවිද්‍යාවන් හදාරනු ලබන විද්‍යාර්තයින් මෙන්ම දෙමාපියන් හා ළමයින් සදහාද නිර්දේශ කළ හැකිය.

නීතිවේදී, සමාජවිද්‍යාඥ
ශානිකා මලල්ගොඩ
(ශාස්ත්‍රවේදී ගෞරව සමාජවිද්‍යාව, පේරාදෙණිය, ඉංග්‍රිසි මාධ්‍ය)
(ශාස්ත්‍රපති සමාජවිද්‍යාව, පේරාදෙණිය, ඉංග්‍රීසි මාධ්‍ය)
(නීතිවේදී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)
(ආයතනික කළමණාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, පේරාදෙණිය)
(භාෂා පරිවර්ථන පිළිබඳ පස්චාත් උපාධි ඩිප්ලෝම, පේරාදෙණිය)
(ශ්‍රී ලංකා වරලත් වෘර්තීය කළමණාකරුවන්ගේ ආයතනයේ සාමාජික)

ISBM-978-624-94561-0-5
කතෘ ප්‍රකාශන-මිළ රු 2500.00